



# නැගෙනහිර පළාතේ නැවත පදිංචි වූ ප්‍රජාවන්ගේ ජීවනෝපාය හා වෙළඳපොළ පිළිබඳ අධ්‍යයනයක්

## මඩකලපු සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල තෝරාගත් ග්‍රාම නිලධාරි කොට්ඨාසවල තත්ත්වය තක්සේරු කිරීම


**මොහමඩ් මුනාස්**

**ගයත්‍රි ලොකුගේ**



2015 අගෝස්තු

අධ්‍යයන මාලා අංක 6

cepa

centre for poverty analysis

# නැගෙනහිර පළාතේ නැවත පදිංචි වූ ප්‍රජාවන්ගේ ජීවනෝපාය හා වෙළඳපොළ පිළිබඳ අධ්‍යයනයක්

මඩකලපු සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල තෝරාගත් ග්‍රාම නිලධාරී කොට්ඨාසවල තත්ත්වය තක්සේරු කිරීම


**මොහමඩ් මුනාස්**
**ගයත්‍රි ලොකුගේ**



දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ (CEPA) ප්‍රකාශනයකි

2015 අගෝස්තු

2015 - අධ්‍යයන මාලා අංක 6

ආසියා පදනමේ අනුග්‍රහයෙනි

© දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2015

පළමුවන මුද්‍රණය - 2015

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

මුනාස්, මොහමඩ්
නැගෙනහිර පළාතේ නැවත පදිංචි වූ ප්‍රජාවන්ගේ ජීවනෝපාය හා වෙළෙඳපොළ පිළිබඳ අධ්‍යයනයක්: මඩකලපුව සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල තෝරාගත් ග්‍රාම නිලධාරි කොට්ඨාශවල තත්වය තක්සේරු කිරීම / මොහමඩ් මුනාස් සහ ගයත්‍රි ලොකුගේ - කොළඹ : දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, 2015 පි. 105; සෙමී. 26 - (අධ්‍යයන මාලා ; අංක 06/2015)

ISBN 978-955-1040-88-8

i. 331.2 ඩිවි 23 ii. ග්‍රන්ථ නාමය
iii. ලොකුගේ, ගයත්‍රි සම කර්තෘ. iv. ග්‍රන්ථ මාලාව
1. ශ්‍රම වෙළෙඳපල
2. ආර්ථික සංවර්ධනය

මෙම ප්‍රකාශනයේ ප්‍රකාශන හිමිකම දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය සතුය. මෙම පොතේ යම් කොටසක් ප්‍රතිනිෂ්පාදනය කරන්නේ නම් ඊට පෙර කතුවරයාගෙන් සහ ප්‍රකාශකගෙන් නිසි අවසරය ලබා ගත යුතු වේ.

CEPA ප්‍රකාශන මාලාව මේ වන විට අධ්‍යයනයන්ගෙන්, සංස්කරණය කරන ලද වෙළුම්වලින්, කාර්ය පත්‍රිකාවලින් හා සංක්ෂිප්ත ලියවිලිවලින් සමන්විත වේ. මෙම අධ්‍යයනයෙහි ලා ප්‍රකාශිත අර්ථ නිරූපණ හා නිගමන ඒ ඒ කතුවරයාගේ වන අතර, CEPA ආයතනයේ හෝ ප්‍රකාශන අනුග්‍රාහකයන්ගේ දැක්මවල් හෝ ප්‍රතිපත්ති නියෝජනය නොකරයි.

මෙම ප්‍රකාශනයෙහිලා යොදා ගෙන ඇති ඡායාරූපවල අයිතිය CEPA කාර්යමණ්ඩලය සතුය.

ISBN: 978-955-1040-88-8

මෙම ප්‍රකාශනය පිළිබඳ සියලු විමසීම් පහත සම්බන්ධතා වෙත යොමු කළ යුතුය:
දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය
29, ආර්.ජී. සේනානායක මාවත,
කොළඹ 7
ශ්‍රී ලංකාව.
දුර: +94(011) 4690200, 2676955
විද්‍යුත් තැපැල: info@cepa.lk
වෙබ් අඩවිය:www.cepa.lk

**මොහමඩ් මුනාස්** දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ වෘත්තිකයෙකි. කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලද්දෙකි. සංක්‍රමණය නමැති තේමාත්මක ක්ෂේත්‍රය සම්බන්ධ විශිෂ්ටතම තේමාත්මක පර්යේෂකයා ඔහුය. මුනාස්ගේ පර්යේෂණ පුහුණුව හා අත්දැකීම් ක්ෂේත්‍ර කිහිපයක විහිදුණකි: දරිද්‍රතාව, ගැටුම්, ජීවනෝපාය, ධීවර කර්මාන්තය, සංක්‍රමණය හා ආර්ථික විද්‍යාවයි. දරිද්‍රතාව ආශ්‍රිත ගැටලු පිළිබඳ පර්යේෂණ පැවැත්වීමෙහිලා වසර අටකට වැඩි අත්දැකීම් ඔහු සතුය. ශ්‍රී ලංකාවේ ගැටුමෙන් පීඩාවට පත් ප්‍රදේශවල තක්සේරු කටයුතුවල යෙදීම සම්බන්ධයෙන්ද ඔහුට අත්දැකීම් ඇත.

**ගයත්‍රි ලොකුගේ** දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ වෘත්තිකයෙකි. නෙදර්ලන්තයේ වැගෙනින්ගන් විශ්ව විද්‍යාලයට සම්බන්ධ දර්ශන ශූරී උපාධි අපේක්ෂිකාවකි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ඇතුළු අනන්‍යතාව පිළිබඳ පර්යේෂණ කටයුතු, ධීවර කර්මාන්තයට විශේෂ අවධානයක් යොමු කෙරෙන ජීවනෝපාය, දරිද්‍රතාව, ගැටුම් හා පශ්චාත් ගැටුම් සංවර්ධනය ගයත්‍රි උනන්දු වන ක්ෂේත්‍රවලට ඇතුළත් වෙයි. ගුණාත්මක පර්යේෂණ විධික්‍රම පිළිබඳ පුහුණුකාරිනියකද වන ඇයට වසර අටකට වැඩි පර්යේෂණ අත්දැකීම් ඇත.

**දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA)** දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ගැටලු පිළිබඳව වඩා යහපත් අවබෝධයක් ඇති කිරීමෙහි නිරත ස්වාධීන, ශ්‍රී ලාංකික බුද්ධිමය සාමූහිකයකි. දරිද්‍රතාව යනු ජයගත යුතු අසාධාරණයක් බවත්, දරිද්‍රතාව පරාජය කළ හැකි වන්නේ ජාතිකව සහ ජාත්‍යන්තරව ප්‍රතිපත්ති සහ පරිචයන් වෙනස් කිරීමෙන් මෙන්ම දරිද්‍රතාවට පත්ව සිටින ජනයා සමග එක්ව වැඩකිරීමෙන් බවත් CEPA විශ්වාස කරයි. ආයතනයේදී අපගේ අවධානය යොමුවන්නේ ස්වාධීන විශ්ලේෂණ සම්පාදනය, සංවර්ධන ක්‍රියාකාරිකයන්ගේ හැකියාවන් ගොඩනැගීම හා ප්‍රතිපත්තිමය බලපෑම් සඳහා අවස්ථාවන් සොයාගැනීම කෙරෙහිය. අප පෙළඹී සිටින්නේ වෙළඳපොළ අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්වන අතරතුර තර්කානුකූල අනුභූතික සාක්ෂි මත පදනම්ව සේවා සැපයීමේ ප්‍රබල නැඹුරුවකිනි. CEPA ආයතනය, සේවා දායකයන්ගේ ඉල්ලීම් මාර්ගයෙන් මෙම වෙළඳපොළ නැඹුරුව පවත්වාගෙන යන අතරතුර, ඊට සමාන්තරව පුළුල් තේමාත්මක ක්ෂේත්‍ර පහක් පදනම් කරගෙන ස්වාධීන පර්යේෂණ න්‍යායපත්‍රයක් සපුරා ගැනීමට උත්සාහ කරයි: එනම්, පශ්චාත් ගැටුම් සංවර්ධනය, ගොදුරු වීමට ඇති ඉඩ, සංක්‍රමණය, යටිතල පහසුකම් හා පරිසරයයි. අවසන් වශයෙන් ගත් කල CEPA පරිශ්‍රම දරන්නේ ජාතික, කලාපීය, ආංශික, වැඩසටහන් හා ව්‍යාපෘති මට්ටම්වලදී දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ප්‍රතිපත්ති කෙරෙහි බලපෑම් කිරීම සඳහා දායක වීමටය.

## ස්තුතිය

2010 නොවැම්බරයේදී මෙම අධ්‍යයනය සඳහා අරමුදල් හා සහාය සම්පාදනය කිරීම සම්බන්ධයෙන් **තාක්ෂණික සහයෝගිතාව හා සංවර්ධනය පිළිබඳ ආයතනයට** (ACTED) කතුවරුන් සිය ස්තුතිය පුද කරයි. ප්‍රකාශනයේ අන්තර්ගතයට යෙදවුම් සැපයීම සම්බන්ධයෙන් අස්රා අබ්දුල් කාදර්ට සහ ප්‍රියන්ති ප්‍රනාන්දුට තම හෘදයංගම ස්තුතිය පළ කර සිටියි.

ද්විතීය දත්ත රැස් කළ සහ ආයතනික හා ප්‍රජා මට්ටම්වලදී සිංහල හා දෙමළ භාෂා දෙකෙන්ම දත්ත රැස් කළ බසිත් ඉනැඩීන්ට සහ පර්යේෂණ සහායකයන් කණ්ඩායමටද ස්තුතියි.

සංවර්ධන ආර්ථික විද්‍යාඥ, පේදුරුතුඩුව සංවර්ධන ආයතනයේ ප්‍රධාන පර්යේෂක ආචාර්ය මුත්තුක්‍රිෂ්ණ සර්වානන්දන්, කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්ය අමලාද සිල්වා, ශ්‍රී ලංකා මුදල් කොමිසමේ හිටපු සභාපති අසෝක ගුණවර්ධන මහතා සහ ශ්‍රී ලංකා පරිපාලන සේවය මෙම ලියවිල්ලේ විවිධ කෙටුම්පත් සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් කතුවරුන්ගේ කෘතඥතාව හිමි කර ගනු ලබයි.

අවසන් පිටපත ලිවීමේදී පළ කළ ඉවසීම හා කැපවීම සම්බන්ධයෙන් තුල්ෂානි කළුගල්ගෙදර මෙනෙවියට, මේ අවසන් නිමැවුම සැබෑවක් කර ගැනීමේදී තීරණාත්මක දිරිගැන්වීම කළ චතුරංගා වීරසේකරට සහ අවසන් පිටපත සංස්කරණය කොට මුද්‍රණය සඳහා සූදානම් කළ රොෂ්නි අලස්ටද ස්තුතිය හිමි විය යුතුය.

මෙම අධ්‍යයනය මුද්‍රණය කිරීම සඳහා අරමුදල් සැපයූ ආසියා පදනමට කෘතඥතා පූර්වක ස්තුතිය හිමි විය යුතුය.

## පෙරවදන

2009 දී ගැටුම අවසන් වූ පසුව ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්වල ප්‍රජාවෝ තම ජීවිත හා ජීවනෝපායයන් නැවත ගොඩනැගීම ආරම්භ කළහ. මේ ප්‍රජාවන්ගෙන් බහුතරය උතුරු නැගෙනහිර තම මුල් පදිංචි ස්ථාන කරා ආපසු පැමිණෙමින් සිටි අවතැන් වූ ජනයා වූහ. මොවුන්ගේ ජීවනෝපාය අවශ්‍යතා, විශේෂයෙන්ම යුද්ධයෙන් විනාශ වූ ප්‍රදේශවල නැවත පදිංචි වෙමින් සිටි ප්‍රජාවන්ගේ ජීවනෝපාය අවශ්‍යතා අනෙක් ප්‍රදේශවල එම අවශ්‍යතාවන්ට වඩා වෙනස් වේ. නැවත පදිංචිවෙමින් සිටි මෙම ප්‍රජාවන්ට උපකාර කිරීම ආරම්භ කළ තාක්ෂණික සහයෝගිතාව හා සංවර්ධනය පිළිබඳ ආයතනය (ACTED) එම මුලපිරීමේ කොටසක් ලෙස ගැටුමෙන් පීඩාවට පත් මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක දෙකෙහි පවත්නා ලාභදායක විය හැකි ආර්ථික ක්‍රියාකාරකම් හඳුනාගැනීමේ අධ්‍යයනයක් සඳහා 2010 වසරේදී දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) සමග ගිවිසුමකට එළඹිණ. විශ්ලේෂණයේ අභිමතාර්ථය වූයේ මේ ප්‍රදේශවල පවත්නා ජීවනෝපාය රටාවනුත් වෙළඳපොළ අවස්ථා හා බාධකත් අවබෝධ කර ගැනීමයි. ස්ත්‍රී ගෘහමූලිකයන් සහිත කුටුම්බ, වයස්ගත පුද්ගලයන් සහ ආබාධිත තත්ත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයන් වැනි මෙම ප්‍රජාවන්හි වෙසෙන වඩාත්ම ගොදුරු වීමට ඉඩ ඇතිජනයා ඉලක්ක කර ගැනීමේ හැකියාව හඳුනා ගැනීම මේ ක්‍රියාවලියේ කොටසක් වූයේය. මේ ලියවිල්ලෙහිලා විස්තර කෙරෙන සොයාගැනීම් සහාය අවශ්‍ය විවිධ ජීවනෝපාය ක්ෂේත්‍ර කවරේදැයි ඉස්මතු කර දක්වයි. මේ අධ්‍යයනයේ ප්‍රතිඵල මෙම ප්‍රදේශවල හා ගැටුමෙන් පීඩාවට පත් වෙනත් ප්‍රදේශවල ප්‍රජාවන් උදෙසා ජීවනෝපාය සංවර්ධන මුලපිරීම් මැනවින් සංවිධානය කිරීමට හා තවත් සාර්ථකව ඉලක්ක කිරීමට යොදාගත හැකි වේ.

අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ ජීවනෝපාය ක්‍රියාකාරකම් කෙරෙහි බලපාන විවිධ සාධක හඳුනාගැනීම සඳහා ඉලක්ක දිස්ත්‍රික්කවල ආර්ථික පරිසරය කෙරෙහි බලපාන විවිධ බලවේග විමසා බැලීමයි. ආර්ථිකය වැඩිදියුණු කිරීම සඳහා පවත්නා නීතිමය හා පරිපාලනමය ව්‍යුහයන් විමසා බැලීම සහ මේ ප්‍රදේශවල සේවාවන්ට ප්‍රවේශ වීමේදී මුහුණපාන (ග්‍රාමීය ක්‍රියාපටිපාටි යටතේ යොදාගෙන ඇති ක්‍රමෝපායයන්ද ඇතුළු) ප්‍රධාන බාධක හා ඒවාට අදාළව යොදාගෙන ඇති ප්‍රායෝගික විසඳුම් හඳුනා ගැනීමද අධ්‍යයනයේ කොටසක් විය.

මෙම අධ්‍යයනය පශ්චාත් ගැටුම් තත්වයක් තුළ මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක සඳහා වටිනාකම් දාම වර්ධනය කළේය. පවත්නා වූද, පුළුල් වන්නා වූද ජීවනෝපායන්ගේ ලාභදායකත්වය වැඩි කිරීමට දායක වන ප්‍රධාන පැතිකඩවල් හඳුනාගැනීම සඳහා එය වටිනාකම් දාම විශ්ලේෂණය ඇසුරින් සකස් කර ගත් සාංකල්පික රාමුවක් යොදා ගත්තේය. මෙම අධ්‍යයනයේදී ප්‍රධාන වශයෙන් සලකා බලන්නේ අවසන් වෙළඳපොළයි. නිමැවුම් වෙළඳපොළවල්, වෙළඳපොළ ප්‍රවණතා, උප අංශයන්ගෙන් සමන්විත ප්‍රධාන අංශ සහ විවිධ පාර්ශ්වකරුවන් එම අංශ තුළ ඉටු කරන කාර්ය භාරයට අදාළව ඔවුන් අතර පවත්නා සම්බන්ධතාව විමසා බැලීම උප-ආංශික විශ්ලේෂණයේ තීරණාත්මක අංග විය.

විශ්ලේෂණයේ පළමු මට්ටම ලෙස මේ අධ්‍යයනයට අදාළ ඉලක්ක කණ්ඩායමේ ගොවි සහ කෘෂිකාර්මික නොවන ජීවනෝපාය විකල්ප හඳුනාගෙන සටහන් කර ගත් අතර, වඩාත්ම කැපී පෙනෙන ජීවනෝපාය මාදිලි විශ්ලේෂණය සඳහා උපඅංශ ලෙස තෝරා ගැනිණ. මේ වෙළඳපොළ අධ්‍යයනය සඳහා හඳුනාගත් වැදගත් උපඅංශ වූයේ වී වගාව, එළවළු වගාව, සත්ව පාලනය, අභ්‍යන්තරික ධීවර කර්මාන්තය, සාගරික ධීවර කර්මාන්තය හා කෘෂිකාර්මික නොවන ජීවනෝපාය මාර්ග (ගඩොල් සෑදීම) යි.

ක්‍රියාපටිපාටි පැවතියේ වටිනාකම් දාමයේ පහළ මට්ටම්වල පමණක් බවත් (ඒවායින් බොහොමයක් නිෂ්පාදන මට්ටමට අදාළ විය) එමගින් වටිනාකම් දාමය තුළ ඒවායේ ලාභදායකත්වය, ඒවා ඉටුකරන කාර්යභාරය හා ඒවා සතු පාලනය සීමා වන බවත් සඳහන් කෙරිණ. මේ ප්‍රදේශවල ප්‍රජාවන්ට හා ප්‍රාදේශීය නිෂ්පාදකයන්ට පවත්නා ප්‍රධාන බාධක ලෙස හඳුනා ගන්නා ලද්දේ ප්‍රාග්ධනය, තාක්ෂණය හා සහායන ව්‍යුහයන් නොමැතිකම (මාර්ග පහසුකම් හා විදුලි බලය - එනම්, ප්‍රදේශ අතර සම්බන්ධතාව – සහ රජයේ දෙපාර්තමේන්තුවලින් සැපයෙන ව්‍යාප්ති සේවා/සහාය) මෙන්ම පශ්චාත් ගැටුම් වාතාවරණයකදී ඔවුන් තවත් ගොදුරු විය හැකි තත්ත්වයට පත් කරන ගංවතුර, නියඟය, වල්අලි ප්‍රහාර වැනි පාරිසරික උවදුරුය.

මේ ප්‍රජාවන් බාහිර කම්පනයන්ට ගොදුරු වීමටද ඉඩ තිබිණ. ගැටුම තිබියදීත් ඔවුන් සාම්ප්‍රදායික ජීවනෝපායන්හි නියැලුණු නමුත් මේ අංශ ඒවායේ උපරිම හැකියාව කරා ළඟා වී නැත. නැවත පදිංචි වූ මෙම ප්‍රජාවන්ට පවතින විශාලතම වාසිය වන්නේ දැනටමත් වර්ධනය කරගෙන තිබෙන නිපුණතා පදනම වන අතර, එය ප්‍රයෝජනයට ගෙන නව තාක්ෂණයේ සහායෙන් ඔවුන් වඩා තරගකාරී තත්ත්වයට පත් කළ යුතුය. ඉලක්ක ගම්මානවල පවත්නා දියුණු කළ හැකි ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ලෙස පහත සඳහන් අංශ හඳුනා ගැනිණ ඉහළ අගයක් සහිත සාම්ප්‍රදායික වී වගාව වෙළඳබෝග වගාව (එළවළු හා පලතුරු) හා ආහාර සැකසීම (නැවුම් පලතුරු පාන වර්ග, ලුණුදෙහි, අච්චාරු); කිරි පදනම් කරගෙන අගය එකතු කිරීම (මුදවපු කිරි, යෝගට්); ගැඹුරු මුහුදේ කෙරෙන ධීවර කර්මාන්තය, මත්ස්‍ය වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය (කුනිස්සා, සී බාස්, කකුළුවා) ධීවර අංශය උදෙසා පවත්නා සහායක සේවා (අයිස් නිෂ්පාදනාගාර, බෝට්ටු අලුත්වැඩියාව/නිෂ්පාදනය, මසුන් ප්‍රවාහනය) හා අගය එකතු කිරීම (කරවල, ටින්මාළු); කෘෂිකාර්මික නොවන ජීවනෝපාය (නඩත්තු හා අලුත්වැඩියා කටයුතු, තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම් කර ගත් සේවා, කුඩා ඇඟලුම් කම්හල්); සංචාරක කර්මාන්තය උදෙසා වන සහායක සේවා (නවාතැන් සැපයීම, අවන්හල්, වික්‍රමාන්විත සංචාරක ව්‍යාපාරය).

අධ්‍යයනයේ සොයාගැනීම් අනුව පැහැදිලි වන්නේ පුනර්ජීවනය කිරීම අවදානම් සහගත වාතාවරණයක් තුළ මුළුමනින්ම නව ජීවනෝපාය ක්‍රියාකාරකම් ආරම්භ කිරීමයි. මේ නිසා එවන් මුලපිරීම් ආරම්භ කළ යුත්තේ මේ නව ජීවනෝපායන් අසාර්ථක වුවහොත් පසු බැසිය හැකි විකල්ප ජීවනෝපාය මාර්ග සහිතවය. පවත්නා උපඅංශ තුළ තිබෙන සහාය සැපයිය හැකි හා වර්ධනය කළ හැකි (වෙළඳබෝග වගාව හෝ මත්ස්‍ය වගාව පදනම් කර ගත් ධීවර කර්මාන්තය වැනි) ක්ෂේත්‍ර හඳුනා ගන්නා ලද අතර, සුළු නිපුණතා පදනම යොදාගෙන සාම්ප්‍රදායික අංශවලට ප්‍රතිලාභ ලැබිය හැකි අවස්ථාද හඳුනා ගැනිණ. උදාහරණයක් ලෙස, ඉහළ අගයක් සහිත සාම්ප්‍රදායික වී වර්ග හඳුන්වා දීමට ඇති ඉඩකඩ සොයා බැලිය යුතුය. ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය වැනි පුළුල් වෙමින් පවතින කර්මාන්තවලට ප්‍රජාවන් සම්බන්ධ කළ හැකි අවස්ථාද අධ්‍යයනය යටතේ විමසා බැලිණ.

මීට අමතරව කිව යුත්තේ මැදිහත් වීම් හැම විටම ඉලක්ක ප්‍රජාවන් තුළ සිදුවීමේ අවශ්‍යතාවක් නැති බවයි. වටිනාකම් දාමයේ අන් තැනක සිදුවන මැදිහත්වීමක් මගින් ඉලක්ක ප්‍රජාවන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු වන ධනාත්මක ආපිට බලපෑම් නිර්මාණය විය හැකිය.

ආපිට බලපෑම් උපරිම කරනු පිණිස වෙළඳ හා නිෂ්පාදන ව්‍යවසායන් වැඩි සංඛ්‍යාවක් පිහිටා ඇති ප්‍රාදේශීය මධ්‍යස්ථාන සමග සම්බන්ධ කිරීමට ඇති ඉඩකඩද සොයා බැලේ. අධ්‍යයන ප්‍රදේශ තුළ මේ ව්‍යවසායන්ගෙන් වැඩි ප්‍රමාණයක් පිහිටා තිබෙන්නේ කාත්තන්කුඩි නගරසභා ප්‍රදේශය සහ ත්‍රිකුණාමල හා මඩකලපු මහනගරසභා ප්‍රදේශ වැනි වඩා නාගරික පෙදෙස්වල මෙන්ම පාසිකුඩා, කල්කුඩා හා නිලාවැලි වැනි ජනප්‍රිය සංචාරක ගමනාන්තවලය. ආහාර සකසන ව්‍යවසායන් සඳහා නැවුම් පලතුරු, එළවළු හා කිරිද කුඩා ඇඟලුම් කම්හල් හා වෙනත් කුඩා කර්මාන්ත සඳහා අවශ්‍ය දෑද සපයමින් අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් ලෙස කටයුතු කළ හැකි වන පරිදි ඉලක්ක ප්‍රතිලාභීන් මෙම මධ්‍යස්ථාන සමග සම්බන්ධ කිරීමට සංවර්ධන මුලපිරීම්වලදී පියවර ගත යුතුයැයි නිර්දේශ කරනු ලැබේ. කාත්තන්කුඩි වැනි මෙවැනි ඇතැම් මධ්‍යස්ථානවලට පුළුල් වීමට ප්‍රමාණවත් භෞතික ඉඩකඩක් නොමැතිවීමේ ගැටලුව ජය ගැනීමටද මෙම පියවර උපකාර වනු ඇත.

මෑතදී නැවත පදිංචි වූ ප්‍රජාවන් උදෙසා ජීවනෝපාය මැදිහත් වීම් සැලසුම්/ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණක් නම් ව්‍යාපෘති චක්‍රය පුරා ගැටුම් සංවේදී ප්‍රවිෂ්ටයක් යොදා ගැනීම තීරණාත්මක බවයි. සැපයෙන සහායේ තිරසරභාවය සහතික කරනු පිණිස ඊට අදාළව ප්‍රජාවන් අඛණ්ඩව නිරීක්ෂණය, අදහස් විමසුමට හා පසු විපරමට ලක් කිරීම කළ යුතුය. සාර්ථක මුලපිරීම්වලින් ඉගෙනීමට හා ඒ ආකාරයෙන් තමන්ද කටයුතු කිරීමට හැකි වන පරිදි එක් ඉලක්ක ප්‍රජාවක සාර්ථකත්වය පිළිබඳ කතා අනෙක් ඉලක්ක ප්‍රජාවන් සමග බෙදාහදා ගැනීමද වැදගත් වේ.

ප්‍රවාහනය කඩාකප්පල් කිරීම, යටිතල පහසුකම් විනාශ කිරීම, එහා මෙහා යාමේ නිදහස සීමාකිරීම හා වටිනාකම් දාමයේ ක්‍රියාකාරකයන් අතර සම්බන්ධතා බිඳදැමීම මගින් ගැටුම ආර්ථික සංවර්ධනයට හා වටිනාකම් දාමවලට විවිධාකාරයෙන් බලපායි. මෙම අධ්‍යයනය ඒ තුළදී හඳුනාගත් විවිධ උපඅංශවල නිරත ප්‍රජාවන් මුහුණ දෙන නොයෙක් අන්තර් සම්බන්ධිත ගැටලු සොයා ගත්තේය. මෙම ප්‍රජාවන්හි ප්‍රධාන නිෂ්පාදකයන් වන්නේ ගොවි හා ධීවර කණ්ඩායම් බැවින්ද වර්තමානයේදී වටිනාකම් දාමය තුළ ඔවුන්ට හිමි වී ඇත්තේ සීමිත බලයක් හා කාර්යභාරයක් බැවින්ද වටිනාකම් දාමය තුළ සිටින මෙම කණ්ඩායම්වල කාර්යභාරය පුළුල් කොට ශක්තිමත් කළ යුතුය. අගය එකතු කිරීමෙහි හා අලෙවිකරණයෙහි නියැලීමට ප්‍රජාවන් බලගැන්විය යුතු අතර, මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මෙන්ම තත්ත්ව පාලනය සම්බන්ධයෙන්ද ඔවුන්ට පුහුණුව සැපයිය යුතුය. ඇති විය හැකි උවදුරුවලට හා පාරිසරික ගැටලුවලට මුහුණ දීමේ/පිළියම් යෙදීමේ නව්‍ය සාර්ථක නිෂ්පාදන තාක්ෂණයන් හා විධික්‍රම පිළිබඳ පුහුණුවද සම්පාදනය කළ යුතුය. ප්‍රදේශයේ නිෂ්පාදන ඉන් බැහැර වෙළඳපළවලට අලෙවි කිරීම සඳහා නිර්මාණය කළ ගම් මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි කොටසක් බවට ප්‍රජා මට්ටමේ නිෂ්පාදන කණ්ඩායම්ද පත් විය යුතුය. වැඩිදියුණු ග්‍රාමීය මාර්ග, පොදු ප්‍රවාහන පහසුකම්, විදුලිබල සැපයුම, භෞතික වෙළඳ මධ්‍යස්ථාන හා කුඩා වැව් ප්‍රතිසංස්කරණය අවශ්‍යව ඇති බැවින් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තීරණාත්මක වේ. උපඅංශ තිරසරවීමට නම් මූල්‍ය සේවාවන් වෙත ඇති ප්‍රවේශයද වැඩිදියුණු කළ යුතුය. ගොවි මෙන්ම කෘෂිකාර්මික නොවන නිෂ්පාදකයන් හා ව්‍යවසායකයන් සඳහාද ක්ෂුද්‍ර ණය පහසුකම් සැපයිය යුතු අතර, ඒ යටතේ දුප්පත්, එනම් ඵලදායක දුප්පත් ගොවීන් සඳහා ඒ ඒ ගොවීන්ට ගැළපෙන අයුරින් සකසන ලද ක්ෂුද්‍ර ණය පහසුකම්ද පවත්නා මූල්‍ය සේවාවන් හා අයැදුම් කිරීමේ ක්‍රියා පටිපාටි පිළිබඳ ප්‍රජා දැනුවත්කම ඉහළ නැංවීමේ පරිශ්‍රමයන්ද සම්පාදනය විය යුතුය.

මේ අනුව ගත් කල, උතුරු නැගෙනහිර නැවත පදිංචි වූ ගැටුමෙන් පීඩාවට පත් ප්‍රජාවන් අතර ජීවනෝපායන් වැඩිදියුණු කිරීමටත් පුළුල් කිරීමටත් විශාල ඉඩකඩක් හා හැකියාවක් පවතින බව පැහැදිලිය. එහෙත් මෙම අධ්‍යයනයේ තක්සේරුව අනුව ගත් කල, මෑතදී නැවත පදිංචි වූ ප්‍රජාවන්ට තම හැකියාව හා ව්‍යාපාරික ව්‍යවසාය නව නිෂ්පාදන ක්ෂේත්‍රවලට යොමු කිරීමට සැලකිය යුතු කාලයක් ගතවනු ඇත. පවත්නා නිපුණතා පදනම් කර ගැනීමට කුඩා නිෂ්පාදකයන් දිරිගැන්විය යුතු බවත් එලෙස තමන්ගේ දැනට පවත්නා ජීවනෝපායන්ගේ වටිනාකම් දාමවල ඉහළට නැග නැගීමට ඔවුන්ට සහාය විය යුතු බවත් අධ්‍යයනය නිර්දේශ කරයි. පවත්නා තත්ත්වය තුළ ඔවුන්ගේ ව්‍යාපාරවලට අගයක් එකතු කිරීමටත් එසේම දිස්ත්‍රික්ක දෙක තුළ සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීම හරහා කළ හැකි වෙනස්කම්වලින් ප්‍රතිලාභ අත් කර ගැනීමටත් විශාල හැකියාවක් පවතී.

## කෙටි යෙදුම් මාලාව

| | |
|---|---|
| ACAP | ගැටුම් බලපෑ පුද්ගලයන් සඳහා සහාය |
| ACTED | තාක්ෂණික සහයෝගීතාව හා සංවර්ධනය සඳහා වන ආයතනය |
| AI | කෘෂි උපදේශක |
| CBO | ප්‍රජා-මූල සංවිධාන |
| CEPA | දරිද්‍රතා විශ්ලේශණ කේන්ද්‍රය |
| CFS | පාරිභෝගික මූල්‍ය සමීක්ෂණය |
| DAPH | පශු නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| DCS | ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
| DOA | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| DOAS | කෘෂිකාර්මික සේවා දෙපාර්තමේන්තුව |
| DS | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| FAO | එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය |
| FGD | ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා |
| FHHs | ස්ත්‍රී ගෘහමූලික නිවැසියන් |
| GN | ග්‍රාම නිලධාරී වසම් |
| GoSL | ශ්‍රී ලංකා රජය |
| HIES | පශු නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| IDMC | අභ්‍යන්තර අවතැන්වීම් විපරම් මධ්‍යස්ථානය |
| KPI | ප්‍රධාන පුද්ගල සම්මුඛ සාකච්ඡා |
| LTTE | දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය |
| MFAR | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය |
| MOP | මියුරේට් ඔෆ් පොටෑෂ් |
| MPCS | විවිධ සේවා සමූපකාර සමිති |
| OFCs | වෙනත් ක්ෂේත්‍ර අස්වනු |
| PLR | කුඹුරු ඉඩම් ලියාපදිංචිය |
| PwDs | ආබාධිත පුද්ගලයන් |
| SMEs | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත |
| TSP | ත්‍රිත්ව සුපර් පොස්පේට් |

# පටුන


1. හැඳින්වීම 1

2. සංකල්පීය රාමුව සහ ක්‍රමවේදය 3
   2.1 වටිනාකම් දම විග්‍රහය: අධ්‍යයනයට ප්‍රවේශයක් 3
   2.2 ගැටුම් බලපෑ සන්දර්භයක් තුළ වටිනාකම් දම 3
   2.3 සංකල්පීය රාමුව 4
   2.4 ක්‍රමවේදය 6

3. වාතාවරණය: මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක 9
   3.1 අධ්‍යයනිත දිස්ත්‍රික්කයන්හි ජනසංඛ්‍යාන ගති ලක්ෂණයන්ගේ ඇඟවුම් 9
   3.2 දරිද්‍රතාව හා ආදයම් අසමානතාව 13
   3.3 ත්‍රිකුණාමල හා මඩකලපු දිස්ත්‍රික්කයන් හිඅධ්‍යයනිත කොට්ඨාශවල දරිද්‍රතාව හා සුභසාධනය 14
   3.4 අනාරක්ෂිතභාවය 15
   3.5 ත්‍රිකුණාමලයේ හා මඩකලපුවේ ජීවනෝපායන් කෙරේ ගැටුම් බලපෑම 18
   3.6 ආයතන 20

4. මඩකලපුවේ හා ත්‍රිකුණාමලයේ ප්‍රධාන ජීවනෝපායයන් සඳහා වටිනාකම් දම විශ්ලේෂණය 23
   4.1 වී වගාවේ වටිනාකම් දම විශ්ලේෂණය 41
   4.2 එළවළු සහ පලතුරු 47
   4.3 කිරි සහ සත්වපාලනය 54
   4.4 අභ්‍යන්තරික ධීවර කර්මාන්තය 62
   4.5 සාගරිකා ධීවර කර්මාන්තය 68
   4.6 කෘෂිකාර්මික නොවන ජීවනෝපායන් 71

5. ප්‍රතිපත්තිමය අවස්ථා සහ නිර්දේශ 71
   5.1 ප්‍රතිපත්ති සහ ආයතන 75
   5.2 ස්වාභාවික උවදුරු හා ඒවායේ බලපෑම අවම කිරීම සඳහා යොදා ගත හැකි විධික්‍රම 77
   5.3 නිර්දේශයන් 97
   5.4 ඉලක්ක ප්‍රජාවන්ගේ අනාගත ප්‍රවණතා හා වැදගත් ජීවනෝපාය ක්‍රියාකාරකම් ඇති විය හැකි අනාගත ප්‍රවණතා 97
   5.5 නිගමනය 98

විමර්ශන 101

ඇමුණුම

# 1. හැඳින්වීම

ගැටුමෙන් පීඩාවට පත් මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල පවත්නා ලාභදායක විය හැකි ආර්ථික ක්‍රියාකාරකම් හඳුනාගෙන අධ්‍යයනය කිරීම සඳහා තාක්ෂණික සහයෝගිතාව හා සංවර්ධනය පිළිබඳ ආයතනය (ACTED) දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) සමග ගිවිසුමකට එළඹිණ. එහිදී ACTED ආයතනය වැඩකටයුතුවල නියැලී සිටින භූගෝලීය ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමටද ගිවිසගැනිණ. අධ්‍යයනය සිදු කරන ලද්දේ තිස් අවුරුදු යුද්ධය අවසන් වීමෙන් වසරකට පසුව 2010දීය. විශ්ලේෂණයේ අභිමතාර්ථය වූයේ අධ්‍යයන ප්‍රදේශවල පවත්නා ජීවනෝපාය රටාවන් සහ වෙළඳපොළ අවස්ථා හා බාධක පිළිබඳව අවබෝධයක් සම්පාදනය කිරීමයි. ස්ත්‍රී ගෘහමූලිකයන් සහිත කුටුම්බ, වයස්ගත පුද්ගලයන් හා ආබාධිත තත්ත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයන් වැනි මෙම ප්‍රදේශවල වෙසෙන වඩාත්ම ගොදුරුවීමට ඉඩ ඇති ජනයා ඉලක්ක කර ගැනීමට තිබෙන හැකියාව විමසා බැලීමද මීට ඇතුළත් විය.

මෙම අධ්‍යයනයේ සුවිශේෂ අරමුණු වූයේ මේවාය:

1. ආර්ථික වාතාවණය කෙරෙහි හිතකර ලෙස හෝ අහිතකර ලෙස බලපාන බලවේග විමසා බැලීම.
2. ජීවනෝපාය ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑ හැකි ආර්ථික, සාමාජික, සංස්කෘතික, තාක්ෂණික, දේශපාලනික, ආගමික සහ පාරිසරික සාධක හඳුනා ගැනීම.
3. ආර්ථිකය වැඩිදියුණු කිරීම උදෙසා පවත්නා නීතිමය හා පරිපාලනමය ව්‍යුහයන් විමසා බැලීම.
4. ග්‍රාමීය ක්‍රියාපටිපාටි යටතේ යොදාගෙන ඇති ක්‍රමෝපායන්ද ඇතුළුව, සේවාවන්ට ප්‍රවේශවීමේදී (ඒ ඒ ප්‍රදේශවලදී) මුහුණ පාන ප්‍රධාන බාධක හා ඒවාට අදාළව යොදාගෙන ඇති ප්‍රායෝගික විසඳුම් හඳුනා ගැනීම.

මෙම අධ්‍යයනය සිදු කෙරුණු භූගෝලීය ප්‍රදේශ ගැටුමෙන් පීඩාවට පත්ව තිබූ අතර යළි පදිංචි වූ ජනගහනයන්ගෙන් සමන්විත විය. අධ්‍යයනයට ලක් කෙරුණු ප්‍රජාවන්ගේ ප්‍රධාන ජීවනෝපායන් වූයේ වී වගාව, ධීවර කර්මාන්තය, එළවළු හා පලතුරු වගාව සහ කිරිපට්ටි හා සත්ව පාලනයයි. ඉහත සඳහන් ජීවනෝපාය අංශවලට අදාළ විවිධ ක්‍රියාවලි සටහන් කළ අධ්‍යයනය, වටිනාකම් දාම විශ්ලේෂණයක් සිදු කළේය.

ජීවනෝපාය ආශ්‍රිත සුවිශේෂ අභියෝග හා යළි පදිංචි වූ ප්‍රජාවන්ගේ අවශ්‍යතා අවබෝධ කර ගැනීමට උත්සාහ කරන සංවර්ධන ආයතනවලට අධ්‍යයනයේ සොයාගැනීම් ප්‍රයෝජනයට ගත හැකිය.

අධ්‍යයනය කොටස් පහකින් සමන්විතය. පළමුවැන්න අධ්‍යයනය පිළිබඳ හැඳින්වීමකි; දෙවැන්න අධ්‍යයනයේ සාංකල්පික රාමුව, ක්‍රමවේදය හා සීමා විමසුමට ලක් කරයි; තුන්වැන්න අධ්‍යයනයට ලක් කෙරුණු මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල තත්ත්වය විස්තර කරයි; සිව්වැන්න ඉලක්ක ප්‍රදේශවල ප්‍රධාන ජීවනෝපායන්ට අදාළ වටිනාකම් දාම පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් සම්පාදනය කරයි; පස්වැන්න ප්‍රතිපත්තිමය හා සංවර්ධනමය මැදිහත්වීම් සඳහා පවතින අවස්ථාවන් සහ නිර්දේශ සම්පාදනය කරයි.

## 2. සාංකල්පික රාමුව හා ක්‍රමවේදය

### 2.1 වටිනාකම් දාම විශ්ලේෂණය: අධ්‍යයනයේ ප්‍රවිෂ්ටය

වටිනාකම් දාමයක් යනු වටිනාකම් නිර්මාණය කරන යම් ක්‍රියාකාරකමක් ආශ්‍රිතව මූල පුරන ක්‍රියාකාරකම් මාලාවයි. පාරිභෝගික අවශ්‍යතා හා නිෂ්පාදක ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් යෙදවුම් වටිනාකම් එකතු කළ නිමැවුම් බවට පරිවර්තනය කිරීම සඳහා ව්‍යවසායක් ඉටුකරන මූලික හා සහායක ක්‍රියාකාරකම් මාලාවක් ඊට ඇතුළත් විය හැකිය. නිෂ්පාදනය වටිනාකම් දාමයේ නොයෙක් පියවරයන් හරහා ගමන් කරද්දී නිමැවුමේ වටිනාකම ඉහළ යයි: Rengasamy, 2009).

*"වටිනාකම් දාම සමන්විත වන්නේ කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සැලසුම් කිරීමේ පටන් අවසන් වෙළඳපොළවල අලෙවි කිරීම දක්වා රැගෙන යාම සඳහා අවශ්‍ය කරන පූර්ණ ක්‍රියාකාරකම් හා සේවාවන් මාලාවකින්" වන අතර මෙම ක්‍රියාකාරකයන්ට හා පාර්ශ්වකරුවන්ට තාක්ෂණික, ව්‍යාපාරික හා මූල්‍ය සේවා සම්පාදකයන් ගණනාවකගේ සහාය ලැබේ (Saperstein ) Campbell, 2007)'*

වටිනාකම් දාමයේ තිරස් හා සිරස් සම්බන්ධතා වටහාගැනීම වැදගත් වේ. වටිනාකම් දාමයේ එකම මට්ටමේදී විවිධ ක්‍රියාකාරකයන් අතර ඇති වන සම්බන්ධතා තිරස් සම්බන්ධතා ලෙස සැලකේ. තිරස් සම්බන්ධතා හඳුනාගැනීම කුඩා පරිමාණ නිෂ්පාදකයන් උදෙසා පරිමාණානුකූල පිරිමැසුම් බිහි කරන සාමූහික ක්‍රියාව හා සාමූහික නිෂ්පාදනය අවශ්‍ය කරන ඒකාබද්ධ බාධක හඳුනාගැනීමට උපකාර විය හැකිය. වටිනාකම් දාමය හරහා පවතින සිරස් සම්බන්ධතා දැසින් දැකිය හැකි ඒවා වේ. සිරස් සම්බන්ධතා වනාහි අවසන් වෙළඳපොළ කරා ළඟා වන තෙක් භාණ්ඩ හෝ සේවාවන් වටිනාකම් දාමයේ විවිධ මට්ටම් ඔස්සේ පෙරට යැවීම සඳහා දරන ඒකාබද්ධ පරිශ්‍රමයක් ලෙස සලකනු ලැබේ. අභිමතාර්ථය වන්නේ දාම ඔස්සේ පවතින සියලු මට්ටම්වල සිටින ක්‍රියාකාරකයන්ට ප්‍රතිලාභ අත්කර දීමයි. වටිනාකම් දාමයන්හි අවධානය බොහෝ විට යොමු වන්නේ වෙළඳපොළ සම්බන්ධතා ඇති කර ගැනීමට හෝ සැපයුම් දාමය ඔස්සේ නිෂ්පාදනය සඳහා පවත්නා වෙළඳපොළ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමටය (Research into Use වෙබ් අඩවිය[1]).

කිසියම් තනි ජීවනෝපායක වටිනාකම් දාමයක් ආශ්‍රිත ක්‍රියාකාරකම් තනි කණ්ඩායමකට සීමා විය හැකිය. නැත්නම් තනි භූගෝලීය ප්‍රදේශයක් තුළ හෝ ප්‍රදේශ ගණනාවක් පුරා පැතිර සිටින්නා වූත් ඒකාබද්ධ ක්‍රියාව ඇති කිරීම සඳහා සම්බන්ධ කර ගත හැක්කා වූත් විවිධ නිෂ්පාදකයන් අතර බෙදී යා හැකිය (Research into Use වෙබ් අඩවිය). ඒ ඒ අංශවල හෝ උපඅංශවල ජීවනෝපාය ක්‍රියාකාරකයන්/පාර්ශ්වකරුවන් එකිනෙකට වෙනස් බැවින් සෑම ජීවනෝපාය මාදිලියකටම එකිනෙකට වෙනස් වටිනාකම් දාම පැවතිය හැකිය.

### 2.2 ගැටුමෙන් පීඩාවට පත් වාතාවරණයක් තුළ පවත්නා වටිනාකම් දාම

ගැටුම ආර්ථික සංවර්ධනය හා වටිනාකම් දාම කෙරෙහි විවිධාකාරයෙන් බලපායි. ප්‍රවාහනය කඩාකප්පල් වෙයි. යටිතල පහසුකම් විනාශයට හෝ ප්‍රවේශ විය නොහැකි තත්වයට පත් වෙයි. ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම් නිසා එහාමෙහා යාමේ නිදහස සීමා වෙයි. ප්‍රතිපත්තිමය වාතාවරණය වෙනස් වන විට ව්‍යාපාර හා ව්‍යවසායන් සඳහා අවශ්‍ය ස්ථාවරත්වයත් හැකියාව ලබා දෙන වාතාවරණයත් කෙරෙහි බලපාමින් බලය පිළිබඳ සම්බන්ධතාද වේගයෙන් වෙනස් වේ. බොහෝ විට රජයන්ගේ හා ආධාර දෙන්නන්ගේ මැදිහත් වීම්වල ඉලක්කය වන්නේ කෙටි කාලීන පියවරයන්ය. වඩාත්ම සැලකිය යුතු කරුණ නම් ගැටුම වටිනාකම් දාමය තුළ සිටින විවිධ ක්‍රියාකාරකයන් අතර පවත්නා විශ්වාසය නැති භංග කිරීමයි.

පශ්චාත් යුද පසුබිම්වලදී වටිනාකම් දාම ප්‍රවිෂ්ටයක් යොදාගන්නා විට මතු සඳහන් දෑ කළ යුතු වේ: පවතින අවස්ථා ප්‍රයෝජනයට ගැනීමටත් ආරම්භක වේගය ඇති කිරීමටත් වෙළඳ පොළ කොටස්වලට බෙදා වෙන් කිරීම, වටිනාකම් දාමයේ තිරස් හා සිරස් සම්බන්ධතා නැවත ගොඩ නැගීම, සහභාගිකයන්

---

[1] *මූලාශ්‍රය:* http://www.researchintouse.com/nrk/RIUinfo/valuechain/valuechain.htm

උදෙසා ප්‍රවාහනය, මූල්‍යය හා අලෙවිකරණය වැනි සහායක සේවාවන් වෙත ප්‍රවේශය සම්පාදනය කිරීම, විවිධ ක්‍රියකාරකයන් අතර පැවති විශ්වාසය නැවත ඇති කිරීමට කටයුතු කිරීම. ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය වාතාවරණය ගොඩනගනු පිණිස රජයේ ආයතන සමගද උසස් ප්‍රමිතියක් කරා ළඟා වෙමින් පවත්නා විවිධ වටිනාකම් දාම අදියරයන්හි ආයෝජනය කරනු පිණිස දිරිගැන්විය හැකි පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකයන් සමගද එක්ව වැඩ කිරීමේ අවශ්‍යතාවක් පවතී. ආර්ථික ක්‍රියාකාරකම් දැඩි ලෙස සීමා වී ඇත්තා වූත් ආයතන සැලකිය යුතු ලෙස දුර්වල වී ඇත් තාවූත් තත්ත්වයකදී නම් වටිනාකම් දාම ශක්තිමත් කිරීම වඩා පුළුල්, බහුආංශික පරිශ්‍රමයක් බවට පත් විය හැකිය.

අවධානය යොමු වන මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල වටිනාකම් දාම සකස් කිරීම සඳහා මෙම අධ්‍යයනය පශ්චාත් ගැටුම් ප්‍රවිෂ්ටයක් යොදාගනී. මෙම දිස්ත්‍රික්ක දෙකද ඒ සමග නැගෙනහිර පළාතේ අම්පාර හා උතුරු පළාතේ සියලු දිස්ත්‍රික්කද දෙමළ ඊළම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය හා ශ්‍රී ලංකාවේ රජය අතර දශක තුනකට ආසන්න කාලයක් තිස්සේ පැවති යුද්ධයෙන් පීඩාවට පත්ව ඇත. 2007දී නැගෙනහිර පළාතේ විවෘත එදිරිවාදීකම් අවසන් වීම 2009 මැයි මාසයේදී යුද්ධය අවසන් වීමට පෙරම එම ප්‍රදේශය තුළ පශ්චාත් යුද තත්වයක් පැතිර යාමට තුඩු දුන්නේය. වැඩකටයුතු සඳහා උතුරු නැගෙනහිර සමහර ප්‍රදේශ තෝරා ගත් ACTED ආයතනික ACAP (ගැටුමෙන් පීඩාවට පත් පුද්ගලයන්ට සහායවීම) ව්‍යාපෘතිය ප්‍රජාවන් සජීවීකරණය කොට නැවත ගොඩ නැගීමේදී ප්‍රමුඛතාව දිය යුතු යටිතල පහසුකම් හඳුනාගත්තේය. මෙම අධ්‍යයනය වනාහි තෝරා ගන්නා ලද මෑතදී නැවත පදිංචිවූ ප්‍රජාවන්හි ජීවනෝපාය අංශයනුත් සහාය සැපයීම හා අගය එකතු කිරීම සඳහා ක්ෂේත්‍රයනුත් හඳුනා ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් විය.

## 2.3 සාංකල්පික රාමුව

දැනට පවත්නා පුළුල් වෙමින් පවතින ජීවනෝපායන්හි ලාභදායකත්වය වැඩි කිරීමට දායක වන ප්‍රධාන පැතිකඩවල් හඳුනාගැනීම සඳහා මෙහිදී යොදා ගැනුණේ වටිනාකම් දාම විශ්ලේෂණය ඇසුරින් සකස් කර ගත් සාංකල්පික රාමුවකි. වටිනාකම් දාමීය වෙළඳපොළ පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා කරන මැදිහත් වීම් නිෂ්පාදකයන් වෙළඳපොළ සමග සම්බන්ධ කළ යුතුය. නිෂ්පාදකයාගේ ලාභදායකත්වය හා වෙළඳ පොළ බලය වැඩි දියුණු වන්නා වූත් දාමයේ සියලු පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ සැලසෙන්නා වූත් ආකාරයෙන් ඉල්ලුමක් ඇති භාණ්ඩ නිපදවීමට එම මැදිහත් වීම් අතරමැදියන් සමග (වෙනත් වචනවලින් කිව හොත්, සකසන්නන් සහ අලෙවිකරණ හා අලෙවි කාර්ය මණ්ඩල යනාදීන් සමග) එක්ව කටයුතු කළ යුතුය.

මෙම විශ්ලේෂණයේදී ප්‍රධාන අංගය ලෙස සැලකෙන්නේ - ප්‍රාදේශීය, ජාත්‍යන්තර හෝ ගෝලීය - අවසන් වෙළඳපොළයි. සෑම උපඅංශයක්ම විශ්ලේෂණය කරනු ලබන්නේ වටිනාකම් දාම ප්‍රවිෂ්ටයක් යොදා ගනිමිනි. නිමැවුම් වෙළඳපොළ, වෙළඳපොළ ප්‍රවණතා, උපඅංශය සමන්විත ප්‍රධාන අංශ සහ විවිධ පාර්ශ්වකරුවන් අංශ තුළ ඉටු කරන කාර්යභාරයට අදාළව ඔවුන් අතර පවත්නා සම්බන්ධතාව විශ්ලේෂණය කිරීම උපආංශික විශ්ලේෂණයක තීරණාත්මක අංගයවේ. විවිධ වටිනාකම් දාමවලදී මෙම පාර්ශ්වකරුවන් විවිධ විය හැකිය. තාක්ෂණය, වෙළඳපොළ ප්‍රවේශය, ආයතනික ප්‍රතිපත්ති, මූල්‍ය හා ණය පහසුකම් සහ යෙදවුම් සැපයුම සම්බන්ධයෙන් පවත්නා බාධක හා අවස්ථාද උපආංශික විශ්ලේෂණයේ කොටසක් වේ.

බොහෝ දෙනෙකු වටිනාකම් දාමය තමන්ට ගැළපෙන පරිදි සකස් කර ගත්තද වටිනාකම් දාමයට පදනම් වන සංකල්පය එක හා සමානය. මහා බ්‍රිතාන්‍යයේ ඔක්ස්ෆෑම් ආයතනය (Oxfam GB) ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සමග එක්ව මුල පිරූ වී වගා උපඅංශයට අදාළ වටිනාකම් දාම විශ්ලේෂණය වටිනාකම් දාමය සකස්කිරීම සඳහා වී වටිනාකම් දාමයට අදාළ සියලු පාර්ශ්වකරුවන් සැලකිල්ලට ගනිමින් සාම්ප්‍රදායික ප්‍රවිෂ්ටයක් යොදා ගත්තේය. සුවිශේෂ ජීවනෝපාය සහායක්ද වැඩි දියුණුව සඳහා සුවිශේෂ නිර්දේශද සම්පාදනය කළ මෙම අධ්‍යයනය මඩකලපු දිස්ත්‍රික්කයට සීමා විය. USAID ආයතනය ශ්‍රී ලංකාවේ ධීවර අංශය පිළිබඳව සිදු කළ තවත් අධ්‍යයනයක් ගැටුමකට ධීවර අංශයේ තරගකාරිත්ව හැකියාව කෙරෙහි බලපෑ හැකි ආකාරය අවබෝධ කර ගැනීමට වටිනාකම් දාම ප්‍රවිෂ්ටයක්


යොදා ගත්තේය(Arunatilake සහ තවත් අය, 2008). 2008 දී ILOආයතනය සිදු කළ ජීවනෝපාය පරතර විශ්ලේෂණය (Livelihood Gap Analysis) මඩකලපු දිස්ත්‍රික්කයෙන් තෝරා ගත් නැවත පදිංචි වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජීවනෝපාය අවශ්‍යතා හා යටිතල පහසුකම් සම්බන්ධ පරතරයන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු සම්පාදනය කළේය.

පාර්ශ්වකරුවන් හා වටිනාකම් දාමය දිගේ ඔවුන් ඉටු කරන කාර්ය සිතියම්ගත කිරීම සඳහාත් 5වන කොටසේදී සාකච්ඡා කෙරෙන සමහර බාධක හා අවස්ථා හඳුනාගැනීම සඳහාත් අධ්‍යයනයේ විශ්ලේෂණය පදනම් කර ගෙන නිර්දේශ සකස් කිරීම සඳහාත් යොදා ගන්නා ලද්දේ (ඉහත සඳහන් පර්යේෂණ සාහිත්‍යයද ඇතුළු) දැනට පවත්නා සාහිත්‍යයයි.

මෙම අධ්‍යයනයේ වටිනාකම් දාම විශ්ලේෂණය සඳහා උපඅංශ හඳුනා ගත්තේ පවත්නා ද්විතීය හා ප්‍රාථමික දත්ත මගින් රැස් කර ගත් තොරතුරු යොදාගනිමිනි. විශ්ලේෂණයේ පළමු ස්ථරය ලෙස මේ අධ්‍යයනයට අදාළ ඉලක්ක කණ්ඩායමේ ගොවි සහ කෘෂිකාර්මික නොවන ජීවනෝපාය විකල්ප හඳුනා ගෙන සිතියම්ගත කළ අතර, විශ්ලේෂණය සඳහා උපඅංශ ලෙස තෝරා ගන්නා ලද්දේ වඩාත්ම කැපී පෙනෙන ජීවනෝපාය මාදිලීන්ය. මෙම වෙළඳ පොළ අධ්‍යයනය සඳහා හඳුනා ගත් වැදගත් උපඅංශ වූයේ වී, එළවළු, පශු සම්පත්, අභ්‍යන්තර ධීවර කර්මාන්තය, සාගරික ධීවර කර්මාන්තය හා කෘෂිකාර්මික නොවන ජීවනෝපාය මාර්ග (ගඩොල් සෑදීම)යි. අධ්‍යයනය සිදුකළසමයේදී සංචාරක ව්‍යාපාර අංශය වර්ධනය වෙමින් තිබූ නමුත් කැපී පෙනෙන ජීවනෝපාය අංශයක් නොවීය. සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ බොහෝ අය එය ජීවනෝපාය විකල්පයක් ලෙස හඳුනා නොගත්හ. එහෙත්, වෙළඳ පොළ පුළුල් කිරීම සඳහාත් විවිධාංගීකරණය සඳහාත් හඳුනා ගත් උපඅංශවලට සංචාරක අංශය සමග පවත්වා ගත හැකි සම්බන්ධතා කවරේ දැයි අධ්‍යයනය පෙන්වා දෙයි.

යම් වටිනාකම් දාමයක් පවත්නේ යම් සුවිශේෂ වාතාවරණයක් තුළය. වටිනාකම් දාමයේ සියලු මට්ටම්වල දී එහි ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑ හැකි වාතාවරණමය සාධක කවරේදැයි 2.1 රූපයෙහි එන සංකල්පික රාමුවෙන් විස්තර වේ. ගැටුමෙන් පීඩාවට පත් ප්‍රදේශයක ජීවත් වන ගොදුරු විය හැකි කණ්ඩායම්වල ජීවනෝපායන් වැඩිදියුණු කරන විට සලකා බැලිය යුතු තීරණාත්මක සාමාජික, සංස්කෘතික, පාරිසරික, දේශපාලනික හා ආයතනික සාධක පවතී. ගොදුරු වීමට ඉඩඇති කණ්ඩායම්වල සහභාගිත්වය කෙරෙහි ඔවුන්ගේ මානව, සාමාජික, මූල්‍යමය හා භෞතික වත්කම් සහ සහභාගිවීම සඳහා ඔවුන් යොමු වන මට්ටමද බලපායි.

2.1 රූප සටහන: අධ්‍යයනයේ සංකල්පික රාමුව




## 2.4 ක්‍රමවේදය

වෙළඳපොළ විශ්ලේෂණයේදී බොහෝවිට යොදා ගත්තේ ගුණාත්මක ක්‍රමවේදයකි. ද්විතීය ප්‍රමාණාත්මක දත්ත හා සම්පත් යොදා ගෙන එය ඌනපූරණය කෙරිණ. රජයේ වෙබ් අඩවි හා වෙනත් ආයතන ප්‍රසිද්ධ කර ඇති දත්ත සහ ACAP දත්ත උපයෝගි කර ගන්නා ලද අතර, වටිනාකම් දාම විශ්ලේෂණයට අදාළ පසුබිම් තොරතුරු රැස් කිරීමේ අදහස ඇතිව කෙටි සාහිත්‍යමය සමීක්ෂණයක්ද සිදු කරන ලදි. නියැදි සකසා ගත්තේ ACAP ව්‍යාපෘතියෙන් හා දිස්ත්‍රික්ක ලේකම්වරයාගේ සංඛ්‍යාන තොරතුරු පත්‍රිකාවලින් සැපයෙන ගුණාත්මක දත්ත උපයෝගි කර ගනිමිනි (3 වන කොටස නියැදි තෝරාගැනීම සඳහා යොදාගත් නිර්ණායක ඉදිරිපත් කරයි).

දත්ත රැස් කිරීමේ පළමු අදියරේ අවධානය යොමු වූයේ දිස්ත්‍රික්ක මට්ටමේ දත්ත රැස් කිරීම කෙරෙහිය. - ප්‍රතිචාරකරුවන් වූයේ රජයේ කෘෂිකර්ම, ගොවිජන සේවා, ධීවර හා පශු සම්පත් දෙපාර්තමේන්තුවල නියෝජිතයන් සහ පළාත් හා දිස්ත්‍රික්ක මට්ටමේදී ප්‍රාදේශීය ලේකම්වරුන් වැනි පරිපාලන නිලධාරීන් සහ ACTED හා සේවාලංකා කාර්ය මණ්ඩලයයි.

ද්විතීය හෙවත් වඩා පුළුල් දත්ත රැස් කිරීමේ අදියරට නොයෙක් පියවරයන් ඇතුළත් විය. පළමු පියවර ලෙස (ද්විතීය දත්ත හා ආරම්භක ක්ෂේත්‍ර වැඩ කටයුතු ඔස්සේ කලින් හඳුනාගත්) සෑම ජීවනෝපාය අංශයකම තොරතුරු රැස් වන ආකාරයෙන් දිස්ත්‍රික්ක මට්ටමේ වැඩමුළු සැලසුම් කොට පැවැත්විණ. අවධාන කණ්ඩායම් සාකච්ඡාවල (FGD) මාර්ගෝපදේශක ප්‍රශ්න සැලසුම් කළේ අධ්‍යයනය කළ ප්‍රදේශවල පැවති නොයෙක් ගොවි හා කෘෂිකාර්මික නොවන ජීවනෝපායන් ආශ්‍රිත බරපතළ ගැටලු හසු කරගත හැකි වන පරිදිය. විවිධ ජීවනෝපාය අංශවලට අදාළ වටිනාකම් දාමවල විවිධ අදියරවලට

සම්බන්ධ රාජ්‍ය ආයතනවලින් හා හඳුනාගත් පාර්ශ්වකරුවන්ගෙන් තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රධානීන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමට (KPI) අදාළ මෙවලම් යොදා ගැනිණ. මීට අමතරව, ගොදුරු වීමට ඇති ඉඩ පිළිබඳ ගැටලු ආශ්‍රිත දත්ත ලබා ගැනීම සඳහා කලින් සැලසුම් නොකළ සිද්ධි අධ්‍යයනයක් යොදා ගැනිණ.

කාලය පිළිබඳ සීමාකම් නිසා අධ්‍යයනය කළ ප්‍රදේශවලට සුවිශේෂ වූ එක් මූලාශ්‍රයකින් ලබාගත් තොරතුරු හැම විටම ත්‍රිකෝණීකරණය කළ නොහැකි විය. දිස්ත්‍රික්ක මට්ටමේ වැඩමුළු, ප්‍රධාන තොරතුරුකරුවන් සමග සම්මුඛ සාකච්ඡා හා ප්‍රජා මට්ටමේ සාකච්ඡා යන දත්ත රැස්කිරීමේ නොයෙක් මට්ටම් මෙම හිදැස යම් තරමකට පිරවීමට උදව් විය. අධ්‍යයනය සිදු කළ සමයේදී මෑතදී නැවත පදිංචි වූ ප්‍රජාවන්ගේ වාතාවරණය වේගයෙන් වෙනස් වෙමින් පැවති හෙයින් ප්‍රාථමික දත්ත රැස් කිරීම කඩිනම් කිරීමේ අවශ්‍යතාව මතු විය.

## 3. වාතාවරණයඃ මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක

අධ්‍යයනයේ මේ කොටස මෙම වෙළඳපොළ විශ්ලේෂණයේදී අවධානය යොමුවන - මඩකලපු හා ත්‍රිකුණාමල - දිස්ත්‍රික්ක දෙක කෙටියෙන් විස්තර කරයි. ලියවිල්ලේ අන්තර්ගත පහත දැක්වෙන කොටස්වලට අවශ්‍ය පසුබිම සම්පාදනය කරන එය මෙම ප්‍රදේශවල ජීවනෝපායන් හා ජීවනෝපායන් නැවත ගොඩනැගීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අදාළ වන (යහපැවැත්ම, ගොදුරුවීමට ඇති ඉඩ, භෞතික යටිතල පහසුකම් පැවතීම සහ නොයෙක් ජීවනෝපායන් කෙරෙහි ගැටුමේ බලපෑම පිළිබඳ ගැටලු වැනි) පසුබිම් සුවිශේෂතා මතුකර දක්වයි.

### 3.1 අධ්‍යයනය කළ දිස්ත්‍රික්ක ජන විකාශ ලක්ෂණවල ඇඟවුම්

ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස ජනගහන විකාශය දශක ගණනාවක් තිස්සේ සැලකිය යුතු ලෙස වෙනස් වී ඇත. මෙය ප්‍රදේශයේ ජීවත් වන ජන සංඛ්‍යාව හා ජනවාර්ගික කණ්ඩායම් සංඛ්‍යාව කෙරෙහි බලපා ඇත. වර්තමානයේ දැකිය හැකි පරිදි, පශ්චාත් ගැටුම් තත්වයකදී ආපසු පැමිණෙන්නන් කරණකොටගෙන ප්‍රදේශවල ජන විකාශ ලක්ෂණ වෙනස් විය හැකිය. එමෙන්ම, ජන විකාශය මෙසේ වෙනස් වෙමින් පවත්නා තත්ත්වය තුළ ජීවනෝපාය කණ්ඩායම් ක්‍රියාත්මක වන ආකාරය කෙරෙහි බලපෑ හැකිය.

එදිරිවාදීකම් අවසන් වීමෙන් පසුව ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (DCS) 2007දී කළ විශේෂ ගණන් ගැනීමකින් අනාවරණය වූයේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 334,363ක් බවත් ඒ අනුව 1981දී පැවැත්වූ අවසන් සංගණනයෙන් (DCS, 2007b) මෙපිටදී ජනගහනය 30.6%කින් වැඩි වී ඇති බවත්ය. මෙය එම කාල පරිච්ඡේදය තුළ මඩකලපු දිස්ත්‍රික්කයෙහි සිදුව ඇති වැඩි වීම සමග සසඳන විට පහළ මට්ටමක් විය. ජනගහනයේ 56.2%ක වැඩි වීමක් අත්දුටු එම දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 515,857ක් විය (DCS, 2007a). 2012 සංගණනයේදී මඩකලපු දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 525,142ක්ද ත්‍රිකුණාමලයේ 378,182ක්ද විය. මෙය පෙන්වාදෙන්නේ ගැටුම අවසන්වී මෙන් මෑත සමයේදී මඩකලපුවේ 1.76%කට ආසන්න වූත් ත්‍රිකුණාමලයේ 0.11%කට ආසන්න වූත් වැඩිවීමකි.

දිස්ත්‍රික්ක දෙකම ගැටුමෙන් පීඩාවට පත්ව ඇතත් පසු ගිය දශක පහේදී ජනවාර්ගික සංයුතිය සැලකිය යුතු ලෙස වෙනස් වී ඇත්තේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙහි පමණකිඃ 1981න් මෙපිටදී ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ මුස්ලිම් ජනගහනය 2007 දී 45.4%කින් හා 2012 දී 40.41%කින් ආන්තිකව පහත වැටුණද එම දිස්ත්‍රික්කයේ වඩාත්ම ප්‍රමුඛ ජනවාර්ගික කණ්ඩායම බවට පත් වෙමින් එම ජනගහනය 16%කින් වැඩි වී ඇත (එම). මඩකලපු දිස්ත්‍රික්කයෙහි ප්‍රමුඛ කණ්ඩායම තවදුරටත් ශ්‍රී ලාංකික දෙමළ ජනවාර්ගික කණ්ඩායම ලෙසම පවතී. ජනගහනය තුළ සිංහල ජනයාගේ ප්‍රතිශතය මඩකලපු දිස්ත්‍රික්කයෙහි 1963දී පැවති 3.4% සිට 2012දී 1.19% දක්වා පසු ගිය දශක 5 තුළ පහත වැටී ඇති අතර, 2007 සිට 2010 දක්වා කාලය තුළ දිස්ත්‍රික්ක දෙකෙහිම එනම් මඩකලපුවෙහි 0.69%කින් හා ත්‍රිකුණාමලයෙහි 1.56%කින් ආන්තිකව වැඩි වී ඇත. 2007 සිට 2012 දක්වා කාලයේ දී ත්‍රිකුණාමල හා මඩකලපු දිස්ත්‍රික්කවල ශ්‍රී ලාංකික දෙමළ ජනගහනය අනුපිළිවෙළින් 1.56%කින් හා 2.60%කින් ආන්තිකව වැඩි වී ඇත. යුද්ධය අතරතුරදී පැවතියේ මීට බෙහෙවින් වෙනස් තත්වයකි. එනම්, මඩකලපුවෙහි සියලු ජනවර්ගවල ජන සංඛ්‍යා සැලකිය යුතු ලෙස පහළ මට්ටමක පැවතිණ. මින් පෙනෙන්නේ සටන් අවසන්වී මෙන් පසුව මඩකලපුවෙහි නැවත පදිංචි වීමේ ක්‍රියාකාරකම් වැඩි වී ඇති බවයි. පශ්චාත් යුද සමයේ ආපසු පැමිණෙන්නන් අතර සෑම ජන වර්ගයකම අය සිටින නමුත් නැගෙනහිර පළාතේ දෙමළ බහුතරයක් වෙසෙන ප්‍රදේශවල නැවත පදිංචි වී ඇති සිංහල ජනයා ජනවාර්ගික ආතතීන් ඉහළ යාමට හේතු වී ඇත. මෙම ජනගහන වෙනස් වීම් පෙන්නුම් කරන්නේ නැවත පදිංචි වීම නිසා සමහර අභ්‍යන්තර අවතැන්වූවන් එකම ඉඩමට හා දේපොළට උරුමකම් කියා ගන්නා සංකීර්ණ තත්වයක් නිර්මාණය වී ඇතිබවයි. පහත දැක්වෙන 3.1 හා 3.2 වගුවලින් අධ්‍යයනය කළ දිස්ත්‍රික්කවල ජනවාර්ගික මිශ්‍රණය පිළිබඳ තොරතුරු පූර්ව යුද හා පශ්චාත් යුද දැක්මකින් යුතුව සම්පාදනය වේ.

**3.1 වගුව: ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙහි ජනවාර්ගිකත්වය අනුව ජනගහනය**

| වර්ෂය | මුළු ජනගහනය | සිංහල ජනයා (%) | ශ්‍රී ලාංකික දෙමළ (%) | ඉන්දියානු දෙමළ (%) | ශ්‍රී ලාංකික මරක්කල (%) | වෙනත් (%) |
|---|---|---|---|---|---|---|
| 1963 | 138,553 | 28.8 | 36.9 | 2.4 | 29.4 | 2.5 |
| 1971 | 188,245 | 29.1 | 35.4 | 2.7 | 31.8 | 1 |
| 1981 | 255,948 | 33.4 | 34.3 | 2.1 | 29.3 | 0.9 |
| 2007 | 334,363 | 25.4 | 28.6 | 0.1 | 45.4 | 0.5 |
| 2012 | 378,182 | 27 | 30.6 | 1.7 | 40.4 | 0.3 |

මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2007b, 2012

**3.2 වගුව: මඩකලපු දිස්ත්‍රික්කයෙහි ජනවාර්ගිකත්වය අනුව ජනගහනය**

| වර්ෂය | මුළු ජනගහනය | සිංහල ජනයා (%) | ශ්‍රී ලාංකික දෙමළ (%) | ඉන්දියානු දෙමළ (%) | ශ්‍රී ලාංකික මරක්කල (%) | වෙනත් (%) |
|---|---|---|---|---|---|---|
| 1963 | 196,189 | 3.4 | 71.1 | 0.8 | 23.5 | 1.2 |
| 1971 | 256,721 | 4.5 | 69.1 | 1.7 | 23.7 | 1.1 |
| 1981 | 330,333 | 3.4 | 70.8 | 1.2 | 23.9 | 0.7 |
| 2007 | 515,857 | 0.5 | 74 | 0 | 25 | 0.5 |
| 2012 | 525,142 | 1.2 | 72.6 | 0.2 | 25.5 | 0.5 |

මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2007a, 2012

ඉහත සාකච්ඡා කළ ආකාරයෙන් ජනසංයුතීන්හි සිදු වූ වෙනස් වීම බොහෝ ආකාරවලින් පැහැදිලි කළ හැකිය. යුද්ධයේ බලපෑම හා එහි ප්‍රතිඵලයක් ලෙස මෙම දිස්ත්‍රික්කවල සුළුතර ප්‍රජාවන් අවතැන් වීම පදනම් කරගෙන මෙම වෙනස් වීම් පැහැදිලි කළ හැකිය. මෙම ප්‍රදේශවලට අභ්‍යන්තර අවතැන් වූවන් ගලා ඒම නිසාද ජනසංයුතිය වෙනස් වී තිබිය හැකිය.[2] සමහර ජනවාර්ගික කණ්ඩායම් (උදාහරණයක් ලෙස මුස්ලිම් ජනයා) පොදුවේ ගත් කල වඩා ඉහළ වාර්ෂික ජනගහන වර්ධනයක් පෙන්නුම් කිරීම වැනි වෙනත් පැතිකඩවල්ද මීට දායක වන තවත් සාධකයක් විය හැකිය.

මේ වෙනස් වීම් තිබියදීම විශේෂයෙන්ම නැගෙනහිර නැවත පදිංචි වීම් ජනවාර්ගික රේඛා ඔස්සේ ගොනු වෙයි. බොහෝ ප්‍රදේශවලදී නැවත පදිංචි වන්නන් හා වට වූ සුවිශේෂ ජනවාර්ගික භූමිභාගවල පදිංචි වී සිටින ප්‍රජාවන් අතර අන්තර් ක්‍රියාකාරිත්වයන් සිදුවන්නේ දිස්ත්‍රික්කය තුළ පවතින වඩා නාගරික වාතාවරණයන්හිදී බව පෙනේ. නොයෙක් මාදිලියේ ජීවනෝපායන්හි නිරත වීම නිසා ප්‍රදේශය පුරා ජනවර්ග අතර අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි වේ. මෙම අධ්‍යයනය මේ බවද ඉඟි කළේය. ආතතීන් සිත තුළ දරා සිටින බව ප්‍රචලිත කණ්ඩායම් එකම වටිනාකම් දාමයේ විවිධ අදියරයන්හි සමගියෙන් යුතුව වැඩ කරන බව පෙනේ.

> *'අපේ කිරි වෙළඳපොළට යන්න කලින් තුන්දෙනෙකුගේ අත්වලට යනවා. කිරි දෙවීමේ කටයුතුවල යෙදෙන දෙමළ ජනතාව ඒ කිරි, මුස්ලිම් ජනතාවට විකුණනවා. මුස්ලිම් ජනතාව ඒවා සිංහල කඩහිමියන්ට විකුණනවා.'*
>
> (අවධාන කණ්ඩායම් සාකච්ඡාව, එරාවුර් පත්තු)

මේ ජනගහන වෙනස් වීම්ද යුද්ධය අවසන් වීම හා ආපසු පැමිණෙමින් සිටින ජනයා හේතුවෙන් ජනගහනය අඛණ්ඩව වෙනස් විය හැකි වීමද නැගෙනහිර පුනරුත්ථාපන කටයුතු සම්බන්ධයෙන් සඳහන් කළ යුතු කරුණුය. කෙසේ වෙතත්, දිස්ත්‍රික්ක දෙකෙහි සිංහල ජනගහනය නැවත පදිංචි වීම නිසා

[2] අවතැන් වීම හා නැවත පදිංචි වීම සම්බන්ධයෙන් ජනවාර්ගිකත්වය පදනම් කර ගත් දත්ත නොමැතිකම නිසා දිස්ත්‍රික්ක දෙකෙහි පවත්නා අනියම් කම්හල් පිළිබඳව නිගමනවලට එළඹීම දුෂ්කරය.

ඉඩම් අයිති වාසිකම් ආරක්ෂා කර ගැනීමට සම්බන්ධිතව සුළුතරයන් මුහුණ දෙන අනාරක්ෂිතතාවන්ද ඉහළ නැග ඇත. ජීවනෝපායන් සම්බන්ධයෙන් ගත් කල, යෙදවුම් කළමනාකරණය හා නිෂ්පාදන ක්‍රියාකාරකම් මෙන්ම අර්ථාන්විත වෙළඳපොළ සම්බන්ධතා පවත්වාගැනීම කෙරෙහිද ඉන් අනතුරුව සම්පත් වෙත ප්‍රවේශ විය හැකි හා බැහැර කරනු ලබන කණ්ඩායම් කෙරෙහිද ජනගහන වෙනස්වීම් හා ජනගහන ගලායාම් බලපානු ඇත.

ජනවාර්ගිකත්වය වැනි ප්‍රධාන අනන්‍යතා කණ්ඩායම් ඇතුළත් කර ගැනීමට හා බැහැර කිරීමට අදාළව ප්‍රාදේශීය වාතාවරණය හා බලවේග අවබෝධ කර ගැනීමේත් මෙම අවබෝධය ව්‍යාපෘති සැලසුම්කරණයට අන්තර්ගත කර ගැනීමේත් වැදගත්කම ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය සමග සහයෝගීව CEPA ආයතනය කළ අධ්‍යයනයකින් ඉස්මතු කර දක්වා ඇත. සංවර්ධන ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ හා වැඩසටහන් සම්පාදනය කිරීමේ වඩාත්ම විවාදාත්මක පැතිකඩවල් පවතින්නේ - ව්‍යාපෘතිවලදී කණ්ඩායම් ඇතුළත් කර ගැනෙන හා බැහැර කෙරෙන - ඉලක්ක කිරීමේ ක්‍රියාවලියෙහි යැයිද මේ පැතිකඩවල් ප්‍රාදේශීය බලවේගයන් හා ප්‍රජා අන්තර් ක්‍රියාවන් කෙරෙහි බලපාන ආකාරයෙහි හා පාලනය නොකළහොත් කණ්ඩායම් අතර ආතතීන් වැඩි විය හැකි ආකාරයෙහි යැයිද එය තර්ක කරයි (Diprose සහ තවත් අය, 2010). මෙලෙස මේ අධ්‍යයනය, ක්‍රමවේදය සකස් කරන විට හා සිතියම්ගත කිරීම්වල යෙදෙන විට මඩකලපුවේ හා ත්‍රිකුණාමලයේ ප්‍රාදේශීය වාතාවරණයත් සමාජ-ආර්ථික හා ජන විකාශයීය බලවේගත් සලකා බැලීය.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2007දී කළ සමීක්ෂණය අනුව, ත්‍රිකුණාමලයෙහි (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 7කට අයත්) ග්‍රාම නිලධාරි කොට්ඨාස 24ක ජනතාවද මඩකලපුවෙහි (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 3කට අයත්) ග්‍රාම නිලධාරි කොට්ඨාස 23ක ජනතාවද අවතැන් වූහ. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ගැටුමයි. ත්‍රිකුණාමලයෙහි අවතැන්වූවන්ගෙන් 74%ක් හා මඩකලපුවෙහි අවතැන්වූවන්ගෙන් 85.8%ක්ද එසේ අවතැන් වූයේ ගැටුම නිසයි. ඉතිරි ජනතාව අවතැන් වී තිබුණේ සුනාමි ව්‍යසනය නිසයි (DCS, 2007a, 2007b).

**3.3 වගුවඃ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙහි අවතැන් වූ ජනතාව, 2007**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | මුළු ජනගහනය | ගැටුම නිසා අවතැන් වූ ජනගහනය | අවතැන් වූ ජනගහනය මුළු ජනගහනයේ %ක් ලෙස |
|---|---|---|---|
| පදවිසිරිපුර | 10,666 | 16 | 0 |
| කුච්චවේලි | 26,327 | 531 | 2 |
| ගෝමරන්කඩවල | 5,879 | 6 | 0 |
| මොරවැව | 5,563 | 886 | 16 |
| නගර හා කඩවත් | 89,046 | 5,391 | 6 |
| තඹලගමුව | 27,572 | 467 | 2 |
| කන්තලේ | 42,861 | 287 | 1 |
| කින්නියා | 61,558 | 379 | 1 |
| සේරුවිල | 11,142 | 787 | 7 |
| මුතූර් | 47,132 | 2,714 | 6 |
| වේරුගල් | 6,617 | 0 | 0 |

මූලාශ්‍රයඃ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2007b

3.4 වගුව: මඩකලපු දිස්ත්‍රික්කයෙහි අවතැන් වූ ජනතාව, 2007

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | මුළු ජනගහනය | ගැටුම නිසා අවතැන් වූ ජනගහනය | අවතැන් වූ ජනගහනය මුළු ජනගහනයේ %ක් ලෙස |
|---|---|---|---|
| කෝරලේ පත්තු උතුර | 21,263 | 1,093 | 5 |
| කෝරලේ පත්තු දකුණ | 20,985 | 27 | 0 |
| කෝරලේ පත්තු | 24,589 | 2,702 | 11 |
| එරාවූර් පත්තු | 75,886 | 17,276 | 23 |
| එරාවූර් නගරය | 25,024 | 84 | 0 |
| මන්මුනේ උතුර | 88,459 | 9,081 | 10 |
| කාත්තන්කුඩි | 39,523 | 237 | 1 |
| මන්මුනේ පත්තු | 30,747 | 874 | 3 |
| මන්මුනේ නිරිත | 23,988 | 357 | 1 |
| පොරතීවු පත්තු | 38,282 | 442 | 1 |
| මන්මුනේ දකුණ හා එරුවුල් පත්තු | 57,917 | 1,967 | 3 |
| කෝරලේ පත්තු මධ්‍යම | 24,510 | 582 | 2 |
| කෝරලේ පත්තු දකුණ | 19,659 | 6,107 | 31 |
| මන්මුනේ බටහිර | 25,025 | 4 | 0 |

මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2007a

නැගෙනහිර ගැටුම අවසන් වීමෙන් පස්වසරකට වැඩි කාලයකට පසුව දැන් ගැටුමේ විවිධ අදියරයන්හිදී අවතැන් වූ බොහෝ ජනයා තම මුල් පදිංචි ප්‍රදේශ වෙත ආපසු පැමිණ ඇත. කෙසේ වෙතත්, නැවත පදිංචි වීම තිරසර වූවක් නොවීම පිළිබඳ ගැටලුව ගැටුමෙන් පීඩාවට පත් ජනගහනයේ බොහෝ දෙනාට තවමත් තීරණාත්මක ගැටලුවකි. යුද්ධයෙන් පසුව සියලු ජනවාර්ගික ප්‍රජාවන් නැවත පදිංචි වීම හේතුවෙන් නොයෙක් සංකීර්ණතාවන් නිර්මාණය වී ඇත. තරගකාරී ලෙස ඉඩම්වලට උරුමකම් කීම, සීමාමායිම් පිළිබඳ මතභේද, නීතිමය ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වීම හා ඉඩම් නොමැතිකම ඉන් කිහිපයකි. අභ්‍යන්තර අවතැන් වූවන් හා ආපසු පැමිණියවුන් පිළිබඳ රාජ්‍ය තොරතුරු පහසුවෙන් ලබාගත නොහැකි වීමත් 2007න් මෙපිටදී කිසිදු පුළුල් විස්තර කිරීමක් කර නොතිබීමත් "සැඟවුණු අර්බුදයක්" බවට පත්ව ඇත. ආපසු පැමිණි බොහෝ දෙනාට ආහාර, ජලය, වාසස්ථාන හා සනීපාරක්ෂාව වැනි මූලික අවශ්‍යතාවන්ට ප්‍රවේශ වීමත් තම සිවිල් අයිතිවාසිකම් පාවිච්චි කිරීමත් දුෂ්කරය.

අවතැන් වීම හා නැවත පදිංචි වීම සංක්‍රමණයටද හේතුවක් විය. මඩකලපුවේදීට වඩා ත්‍රිකුණාමලයේදී එසේවී ඇත. 2012දී මඩකලපු දිස්ත්‍රික්කයේ සංක්‍රමණික ජනගහනය 22,975ක්ද ඉන් 3,034ක් අවතැන් වූවන් හා 1,153ක් අවතැන් වීමෙන් පසුව නැවත පදිංචි වූවෝද වූහ. ත්‍රිකුණාමලයේදී මේ සංඛ්‍යා හා ජනගහනය මීට වඩා ඉහළ අගයක් ගත්තේය. දිස්ත්‍රික්කයේ සංක්‍රමණික ජනගහනය 73,640ක්ද ඉන් 3,476ක් අවතැන් වූවන් හා 28,225ක් අවතැන් වීමෙන් පසුව නැවත පදිංචි වූවෝද වූහ.

ඉතා බොහෝ අවස්ථාවලදී අභ්‍යන්තර අවතැන්වූවන් හා ආපසු පැමිණියවුන් ඇතුළු තනිතනි කුටුම්බවලට ප්‍රතිලාභ සැලසෙන එතරම්ම අවශ්‍ය යටිතල පහසුකම් සහායට වඩා ප්‍රමුඛස්ථානය ලැබෙන්නේ (ක්‍රියාත්මක කිරීම සඳහා උදව් වීමට/සෘජුව ප්‍රතිලාභ ලැබීමට හැකි නිපුණතා ප්‍රාදේශීය ජනගහනය සතුව නැති) මහා පරිමාණ ආර්ථික ව්‍යාපෘතිවලටය. සමහර නැවත පදිංචි කිරීම් සිදු වන්නේ බලාත්කාරයෙන්දැයිද දේශීය හා ජාත්‍යන්තර සංවිධානවලට සැකයක් පවතී. උතුරු පළාත තරම් නොවුවද නැගෙනහිර පළාතද බෙහෙවින් මිලිටරීකරණය වී ඇත. අභ්‍යන්තර අවතැන් වූවන්,

ආපසු පැමිණියවුන් හා ගැටුමෙන් පීඩාවට පත් වෙනත් අය සමග තරග කරමින්ද ආධාරවලින් ආර්ථික ස්වාධීනත්වයට බාධා කරමින්ද හමුදාව අඛණ්ඩව ආර්ථික ක්‍රියාකාරකයෙකු ලෙස කටයුතු කරයි. කෙසේ වෙතත්, මෙම තත්වය වැඩියෙන් පැතිර පවත්නේ නැගෙනහිරෙහි නොව උතුරෙහිය.

ත්‍රිකුණාමල අධිආරක්ෂිත කලාප හේතුවෙන් (සාම්පූර් ප්‍රදේශයෙන්) අවතැන් වූවන්ට අධ්‍යයනය සිදු කළ කාලය වන විට තම මුල් පදිංචි ස්ථාන කරා ආපසු පැමිණීමට නොහැකිව තිබිණ. බොහෝ විට ඔවුන් නැවත පදිංචි කර තිබුණේ ඔවුන්ගේ මුල් ඉඩම්වලට සමීප සත්කාරක ප්‍රජාවන් තුළය. එමෙන්ම, බොහෝ අවස්ථාවලදී මෙසේ පදිංචි කර තිබුණේ ඉතා දරුණු කොන්දේසි යටතේය. තමන්ගේ ඉඩම්වලට නැවත යාමට ඉඩ දෙනලෙස ආපසු පැමිණියවුන් එක දිගටම ඉල්ලා ඇත.

රජය එක දිගටම මානුෂීය ප්‍රජාවට සීමා පැනවීමෙන් අදහස් වන්නේ උතුරු හා නැගෙනහිර, ගැටුමෙන් පීඩාවට පත් ප්‍රදේශවල එකඳු පුළුල් අවශ්‍යතා තක්සේරුවක්වත් කර නොමැති බවත්, මෙම ජනයා අවශ්‍යතා හා පවත්නා සම්පත් අතර ඇති වෙනසින් අඛණ්ඩව පීඩා විඳින බවත්ය. මීට අමතරව, උතුරේ හා නැගෙනහිර මානුෂීය හා සංවර්ධන ආධාර දැඩි නිරීක්ෂණයකට ලක් වන අතර, හමුදාව විසින් පාලනය කරනු ලැබේ. එම නිසා, අවතැන්වූවන්ට ආධාර බෙදාහැරීම හා ඔවුන් සුදුසු පරිදි නැවත පදිංචි කිරීම කිසිසේත් පොදු තත්වය නොවේ. 2011 වසරේදී උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම ඉදිරිපත් කළ වාර්තාව හා ඉන් අනතුරුව නිකුත් කළ නිර්දේශ රජයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නැත (IDMC, 2012). අවතැන් වූවන් සඳහා කල් පවත්නා විසඳුමක් ලැබීමට මෙම නිර්දේශ තීරණාත්මක විය.

### 3.2 දරිද්‍රතාව හා ආදායම් අසමානතාව

විශේෂයෙන්ම[3] ආදායම් හා සම්පත්, සුභසාධන පැවරීම, භෞතික යටිතල පහසුකම් වෙත ප්‍රවේශය හා වෙනත් යෙදවුම් පිළිබඳ තේරීම්/හිඟකම් නිසා අනෙක්වාට වඩා සමහර ජීවනෝපාය මාදිලිවල වැඩි වශයෙන් නියැලීම තේරුම් ගැනීමට උත්සාහ කිරීමේදී යහපැවැත්ම ඇති වන්නේ කුමකින්දැයි තීරණය කිරීම වැදගත්ය. ඉලක්ක ප්‍රජාව හා (ජීවනෝපාය සහායන මාදිලි හෝ අවශ්‍ය යටිතල පහසුකම් මාදිලි වැනි) සුවිශේෂ ව්‍යාපෘතිමය මැදිහත්වීම් ආදිය තීරණය කිරීමේදීද මෙම පැතිකඩවල් වැදගත් වේ.

සර්වානන්දන් (2005) ලියූ ලියවිල්ලක් උතුරු නැගෙනහිර දරිද්‍රතා තත්වය පිළිබඳ සමස්ත අවබෝධයක් සම්පාදනය කරයි. රට තුළ ඒකපුද්ගල ආදායම අවාසනාවන්තම මට්ටමේ පවතින්නේ උතුරු හා නැගෙනහිර පළාත්වල බව ඔහු නිගමනය කරයි. ණය ගැනීම්, භාණ්ඩ ණය හා ආදායම් පැවරීම වැනි සාපේක්ෂ දරිද්‍රතාව නියෝජනය කරන දර්ශක පදනම් කර ගෙන ඔහු නිගමනය කරන්නේ අහිමි වීම ජාතික සාමාන්‍යයට වඩා බෙහෙවින් ඉහළ මට්ටමක පවතින බවයි. 2003/04 පාරිභෝගික මූල්‍ය සමීක්ෂණය (CFS) යටතේ රැස් කළ දත්ත පෙන්වා දෙන්නේ සියලු පළාත් අතරින් ආදායම් අසමානතාව ඉහළම මට්ටමේ පවතින්නේ නැගෙනහිර පළාතේ බවත් 2009/10දීද අසමානතාව පැවතීගෙන ගිය බවත්ය.

2009/10 කුටුම්බ ආදායම් හා වියදම් සමීක්ෂණයේ (HIES) දත්ත (DCS, 2011) අනුව, අනෙක් පළාත්වලට සංසන්දනාත්මකව නැගෙනහිර පළාත පහළම දරිද්‍රතා මට්ටමක් පෙන්නුම් කරයි. මධ්‍යස්ථ ඒකපුද්ගල ආදායම රු. 5,663ක්ද එක් නිවසක සිටින ආදායම් උපයන්නන් සංඛ්‍යාව හුදෙක් 1.5ක්ද විය. බොහෝ විට මෙය යම් පළාතක මසකට උපයන අඩුම ආදායම විය හැකිය (DCS, 2011).

කෙසේ වෙතත්, මෙම සමීක්ෂණය මඩකලපු හා අම්පාර දිස්ත්‍රික්කවල ඉතා දුරබැහැර ප්‍රදේශවලින් සමහරක් ආවරණය කර නැති බවත් පැවති ආරක්ෂක තත්වයන් නිසා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය මුළුමනින්ම බැහැර කර ඇති බවත් සඳහන් කිරීම වැදගත්ය. මෙසේ දුප්පත්ම ප්‍රදේශවලින් සමහරක් බැහැර වී ඇති අතර මේ කාලවලදී පළාතේ දරිද්‍රතාව වාර්තා වී තිබෙනවාට වඩා ඉහළ මට්ටම්වල පවතින්නට ඇති බව සිතිය හැකිය.

3.5 වගුව: පළාත් අනුව දරිද්‍රතා පුද්ගලයන් සංඛ්‍යාව පිළිබඳ දර්ශකය

| පළාත | පුද්ගලයන් සංඛ්‍යාව පිළිබඳ දර්ශකය | |
|---|---|---|
| | 2006/07 | 2009/10 |
| බස්නාහිර | 8.2 | 4.2 |
| මධ්‍යම | 22.3 | 9.7 |
| දකුණු | 13.8 | 9.8 |
| උතුරු | 12.8 | |
| නැගෙනහිර | 10.8 | 14.8 |
| වයඹ | 14.6 | 11.3 |
| උතුරුමැද | 14.2 | 5.7 |
| ඌව | 27.0 | 13.7 |
| සබරගමුව | 24.2 | 10.6 |

මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2011 මැයි

2009/10 කුටුම්බ ආදායම් හා වියදම් සමීක්ෂණය තුළ ප්‍රකාශිත පරිදි මඩකලපු දිස්ත්‍රික්කයෙහි දරිද්‍රතා පුද්ගලයන් සංඛ්‍යාව පිළිබඳ දර්ශකය 20.3%කි. එනම්,මුළු ජනගහනයෙන් 20.3%ක් (3.5 වගුව) ජීවත් වන්නේ නිල දරිද්‍රතා රේඛාවෙන් පහළය (DCS, 2011). දරිද්‍රතා පරතර දර්ශකයේ ජාතික සංඛ්‍යාව සමඟ සසඳන විට මඩකලපු දිස්ත්‍රික්කය තුළ දරිද්‍රතා රේඛාවෙන් පහළ දිවි ගෙවන දුප්පත් කුටුම්බ ගොනුවී සිටින්නේ දරිද්‍රතා රේඛාවට වඩා සමීපවය. දිස්ත්‍රික්කය තුළ වෙසෙන දුප්පත් කුටුම්බවල කැලරි පරිභෝජනය ජාතික සංඛ්‍යාවට මෙන්ම නැගෙනහිර පළාත් සංඛ්‍යාවටද ඉහළ මට්ටමක පවතී (එම).

3.6 වගුව: දරිද්‍රතා පුද්ගලයන් සංඛ්‍යාව පිළිබඳ දර්ශකය හා දරිද්‍රතා තත්ත්වය

| වර්ෂය | ශ්‍රී ලංකාව | නැගෙනහිර පළාත | මඩකලපුව | ත්‍රිකුණාමලය |
|---|---|---|---|---|
| 2006$07 | 15.2 | 10.8 | 10.7 | - |
| 2009$10 | 8.9 | 14.8 | 20.3 | 11.7 |

මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2008, 2011

(මෙම දත්ත උතුරු පළාත හා නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය බැහැර කරයි)

## 3.3 ත්‍රිකුණාමලයේ හා මඩකලපුවේ අධ්‍යයනය කළ ග්‍රාම නිලධාරි කොට්ඨාසවල දරිද්‍රතාව හා සුභසාධනය

මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල දරිද්‍රතා මට්ටම් රටේ සෙසු පළාත්වලට වඩා බෙහෙවින් ඉහළය. මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල සාමාන්‍ය කුටුම්බ ආදායම සමග සසඳන විට මෙම අධ්‍යයනයට ඇතුළත් බොහෝ පවුල් ඉපැයුවේ ඊට වඩා පහළ සාමාන්‍ය මාසික ආදායමකි. ඉලක්ක කරගත් මඩකලපු දිස්ත්‍රික්ක කුටුම්බවලින් 50%ක් පමණ ඉපැයුවේ මසකට රු. 1,500කට වඩා අඩු ආදායමක් වන අතර, ඉන් පෙනෙන්නේ ඉලක්ක ප්‍රජාව තුළ පවතින ඉහළ මට්ටමේ ආදායම් දරිද්‍රතාවයි. එහෙත් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ තත්වය මීට තරමක් වෙනස්ය. එහි රු. 1,500ට වඩා අඩුවෙන් ඉපැයුවේ ඉලක්ක ජනගහනයෙන් 28%කට ආසන්න ප්‍රමාණයක් වුවත් බහුතරය (40%ක්) මසකට ඉපැයුවේ රු.1,500ත් රු.3,000ත් අතර ආදායමක් පමණකි. මෙලෙස දිස්ත්‍රික්ක දෙකෙහිම ජනගහනයෙන් විශාල කොටසකට දරිද්‍රතාව බලපාන බව පැහැදිලිය. රැස් කළ දත්ත අනුව පෙනී යන්නේ අධ්‍යයනය කළ ජනගහනය අතර අහිමි වීම පිළිබඳ හැඟීමක් හා මූලික අවශ්‍යතා සපුරාගැනීමට ප්‍රමාණවත් ආදායමක් ලැබිය නොහැකිකමක් පැවති බවයි.

*"අවමඟුල් උත්සවයක් කරන්නවත් අපට මුදල් නැහැ. ඒක කරගන්නේ අපි අතරෙන් මුදල් එකතු කරලා."*

අවධාන කණ්ඩායම් සාකච්ඡාව, වාකරේ

*"මට ස්ථිර නිවසක් නැහැ. අපි ජීවත් වෙන්නේ කුඩා පැල්පතක. මගේම කියලා ගෙයක් හදා ගන්න මට සල්ලි නැහැ."*

සිද්ධි අධ්‍යයනය, ආබාධිත, කිරන්

අධ්‍යයන දත්ත අනුව පැහැදිලි වන්නේ මෙම ප්‍රදේශවල පවත්නා පහළ ආදායම් මට්ටම් කෙටිකාලීන හා දිගුකාලීන යන දෙයාකාරයේම ප්‍රතිඵල උපදවන ජීවනෝපාය සහායක අවශ්‍යතාව අවධාරණය කරන බවයි. පහළ ආදායම් මට්ටම්වලට හේතුව මෝසම් දේශගුණය බලපාන ජීවනෝපායන් මත බොහෝදුරට රඳා පවතින එදිනෙදා ජීවත් වීමේ රටාව සහ මේ කණ්ඩායම්වල ඉතිරිකිරීම් හා ආයෝජන හැකියාව ඉතා පහළ මට්ටමක පැවතීමයි. මෙය දරිද්‍රතාවෙන් ගොඩ ඒමට ඔවුන්ට තිබෙන හැකියාව අවහිර කරන අතර (එබැවින් ඊට සමාන්තරව) ඔවුන් (පහත කොටස්වලදී විශ්ලේෂණය කෙරෙන) රුදුරු ණය චක්‍රයට බැඳ දමන නොවිධිමත් මූල්‍ය සේවාවන් දෙසට තල්ලු කරයි. අහිමි වීම ඉහළ මට්ටම්වලින් සිදුවීමෙන් හැඟෙන්නේ සාම්ප්‍රදායික ජීවනෝපාය ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට නම් කවර හෝ ව්‍යාපෘතිමය මැදිහත් වීමකින් අරමුදල් සම්පාදනය විය යුතු බවත් ඉලක්ක පවුල් සඳහා බහුවිධ ආදායම් මූලාශ්‍ර සම්පාදනය කිරීම සඳහා විවිධාංගීකරණයටද සහාය දිය යුතු බවත්ය.

මේ ප්‍රජාවන් දශක තුනකට වැඩි කාලයක් තිස්සේ විනාශකාරී බලවේගවලට මුහුණ පා ඇති හෙයින් සංවර්ධන මුලපිරීම් සැලසුම් කරන විට මූලික අවශ්‍යතාවන්ද සැලකිල්ලට ගතයුතු වේ. කෙසේ වෙතත්, මූල්‍ය දරිද්‍රතාව පිළිබඳ පැතිකඩවලින් ඔබ්බට යන විට හා පවත්නා මූලික යටිතල පහසුකම් විශ්ලේෂණය කරන විට ප්‍රජාවෝ ඉලක්ක ජනගහනයේ යහපැවැත්ම සම්බන්ධ තත්වය ගැන වඩා පුළුල් විස්තර සැපයූහ. එමෙන්ම, එම ප්‍රදේශය උදෙසා සැලසුම් කරන ලද මැදිහත්වීම්වල ස්වභාවය හා පරිමාණය සම්බන්ධ සමහර අදහස්ද සම්පාදනය කළහ.

පහත දැක්වෙන කොටස අධ්‍යයනය කළ නියැදියේ හා කාල පරිච්ඡේදයේ මූලික අවශ්‍යතා සම්බන්ධ තත්වය ඉදිරිපත් කරයි.

### 3.4 අනාරක්ෂිතභාවය

ඉහත කොටස්වලදී සාකච්ඡා කළ පරිදි සමස්ත ඉලක්ක ප්‍රජාවම බාහිර කම්පනයන්ට ගොදුරු වීමට ඉඩ ඇතැයි සැලකිය හැකි නමුත් ව්‍යාපෘති සැලසුම්වලදී හා මැදිහත් වීමේ මාදිලිය තීරණය කිරීමේදී මෙම කොටස තුළ හඳුන්වා දෙන කණ්ඩායම් කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. ACAP ආයතනික ඉලක්ක ප්‍රදේශවල වෙසෙන අවතැන්වූවන්ගේ හා මෑතදී නැවත පදිංචි වූ ප්‍රජාවන්ගේ තත්වය විශ්ලේෂණය කිරීමේදී යැපෙන්නන් සංඛ්‍යාව, ස්ත්‍රී ගෘහමූලිකයන් සහිත කුටුම්බ, ආබාධිතත්වය, වයස්ගත පුද්ගලයන් හා අනාථ දරුවන් වැනි නිර්ණායක මාලාවක් සැලකිල්ලට ගෙන ඇත. මෙම කොටස ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් සම්පාදනය කරයි.

ආබාධිතත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයන්ගෙන් විශාල සංඛ්‍යාවක් වාර්තා වන්නේ ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මීලාවැව ගම්මානයෙනි. පොදුවේ ගත්කල, ආබාධිතත්වයන් සමග දිවි ගෙවන කාන්තාවන්ට වඩා එවැනි පිරිමින් සිටින බව පෙනේ. මෙය පැහැදිලි කළ හැකි වන්නේ ඔවුන් කෙරෙහි යුද්ධය බලපෑ තරම මෙන්ම ඔවුන් සිය ජීවනෝපායන්හි නිරත වීමේදී මුහුණපෑමට සිදු වූ හදිසි අනතුරු අනුව විය හැකිය.

ඉලක්ක ග්‍රාම නිලධාරි කොට්ඨාසවල දිවි ගෙවන වැන්දඹු පිරිමින්/කාන්තාවන් විශාල සංඛ්‍යාවක්ද ගොදුරු වීමට ඉඩ ඇත. මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නල්ලූර් ග්‍රාම නිලධාරි කොට්ඨාසය මින් බැහැර වන්නේ වැන්දඹුවන් ස්වල්ප සංඛ්‍යාවක් සිටින බැවිනි. පහත දැක්වෙන 3.71a සහ 3.7b වගු දෙක CAP ව්‍යාපෘතිවලින්ද එම නිසා මෙම අධ්‍යයනය විසින්ද ඉලක්ක කර ගන්නා ලද ග්‍රාම නිලධාරි කොට්ඨාස තුළ වෙසෙන ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් පෙන්වා දෙයි.

**3.7a** වගුව: අධ්‍යයනය කළ ග්‍රාම නිලධාරි කොට්ඨාසවල වෙසෙන ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් (ස්ත්‍රී-පුරුෂ භාවය අනුව), ත්‍රිකුණාමලය, 2010

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | ආබාධිතත්වයන් සමග දිවි ගෙවන ජනයා | | වැන්දඹු පිරිමි/වැන්දඹු ගැහැනු | | අනාථ දරුවෝ | |
|---|---|---|---|---|---|---|
| | පිරිමි | ගැහැනු | පිරිමි | ගැහැනු | පිරිමි | ගැහැනු |
| සුමේධංකරපුර S | 8 | 2 | 0 | 24 | 0 | 0 |
| නල්ලූර් T | 10 | 12 | 0 | 62 | 0 | 0 |
| කඩකරචේනයි T | 40 | 17 | 62 | 6 | 5 | 8 |
| අයිලාඩි M | 28 | 18 | 0 | 72 | 4 | 5 |
| නදූත්තු M | 20 | 8 | 0 | 85 | 0 | 0 |
| විල්ගම්විහාරය | 9 | 5 | 0 | 10 | 4 | 0 |
| තිරියායS, T | 22 | 12 | 4 | 27 | 0 | 0 |
| කිතුලුදූව S | 11 | 6 | 5 | 26 | 5 | 1 |
| මීලාවැව S | 46 | 18 | 1 | 17 | 0 | 0 |

මූලාශ්‍රය: ACAPදත්ත, 2010

**3.7b** වගුව: ACAP ආයතනික ඉලක්ක ග්‍රාම නිලධාරි කොට්ඨාසවල වෙසෙන ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් (ස්ත්‍රී-පුරුෂ භාවය අනුව) - මඩකලපුව

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | ආබාධිතත්වයන් සමග දිවි ගෙවන ජනයා | | වැන්දඹුවෝ | | අනාථ දරුවෝ | |
|---|---|---|---|---|---|---|
| | පිරිමි | ගැහැනු | පිරිමි | ගැහැනු | පිරිමි | ගැහැනු |
| පූනානි නැගෙනහිර | 23 | 21 | නැත | 98 | නැත | නැත |
| මදුරන්කර්නිකුලම් | 8 | 5 | 2 | 40 | නැත | 3 |
| පෙරිල්ලාවැලි | 4 | 7 | 16 | 64 | නැත | නැත |
| පූලක්කාඩු | 6 | 5 | 3 | 52 | නැත | 2 |
| කිතුල්වැව | 8 | 6 | නැත | 84 | 14 | 31 |
| කෝපාවේලි | 4 | 1 | 10 | 59 | නැත | 9 |
| අයිදියාමලේ උතුර | 43 | 23 | නැත | 53 | නැත | 1 |
| නැඩයාමඩු | 9 | 3 | නැත | 12 | නැත | නැත |
| පණ්ඩාරියවේලි | 8 | 4 | 11 | 51 | 15 | 31 |
| අම්බලන්තුරේ බටහිර | 5 | 10 | 3 | 53 | 20 | 18 |
| නවකිරිනගර් | 5 | 5 | 9 | 15 | නැත | නැත |
| පාලියාඩිවඩ්ඩේ | 13 | 6 | 4 | 83 | 49 | 42 |
| විලන්තෝට්ටම් | 4 | 4 | 15 | 29 | 1 | 5 |

මූලාශ්‍රය: ACAP දත්ත, 2010

ප්‍රදේශ අතර සම්බන්ධතාව සලකන කල වඩාත්ම හුදෙකලා ප්‍රදේශය වන්නේ ගෝමරන්කඩවල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයෙන් කි.මී.45ක් පමණ දුරින් පිහිටි මීලාවැව ගම්මානයයි. තිරියාය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පිහිටි කුච්චවේලි ගම්මානයත් එමෙන්ම විලන්තෝට්ටම් ගම්මානයත් ප්‍රධාන බස් පාරට සමීපවම පිහිටා ඇති ඒවා වේ. පාලම් පාරු හා බස්රථ වැනි විවිධ ප්‍රවාහන මාධ්‍ය යොදා ගැනීමට සිදු වීමද එහි ප්‍රතිඵලයක් ලෙස අස්වැන්නේ ගුණාත්මකත්වය හා කාලයේ ඵලදායිතාව අහිමි වීමද ජීවනෝපායන් කෙරෙහි බලපාන ප්‍රදේශ අතර සම්බන්ධතාව පිළිබඳ ගැටලු ලෙස අවධාන කණ්ඩායම් සාකච්ඡාවලදී ඉස්මතු කොට දැක්විණ (1වන වගුව හා 1වන ඇමුණුම යටිතල පහසුකම් ප්‍රවේශය පිළිබඳ වැඩි දුර තොරතුරු සපයයි).

*"අපි පාන්දර ටවුන් එකට ගියොත් ආපහු එන්නේ හැන්දෑවේ 6ට."*

අවධාන කණ්ඩායම් සාකච්ඡාව, වාකරේ

*"අපි නිපදවන එළවළු හා වී ගඟෙන් එගොඩ වෙන තැනට වෙනකල් ගෙනියන්නේ ඔළුව උඩ තියාගෙන. ගඟෙන් එතෙර වෙන්නේ පහුරෙන්. ඒකට රු.10ක් යනවා. එතැන ඉඳන් වාලච්චේන මාර්කට් එකට ගෙනියන්නේ ඔළුව උඩ තියාගෙන."*

සිද්ධි අධ්‍යයනය, ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ, කිරන්

මහජනතාව අධ්‍යාපනය හා සෞඛ්‍යය වැනි මූලික අවශ්‍යතා වෙත ප්‍රවේශ වීමට ප්‍රදේශ අතර සම්බන්ධතා පිළිබඳ ගැටලුද බාධා කරයි. මේ අධ්‍යයනයෙහිලා වඩා වැදගත් කරුණ නම්: ප්‍රදේශ අතර සම්බන්ධතාව අවහිරවීම යනු තම නිෂ්පාදන වෙළඳපොළවල් වෙත ගෙන යාමේදීත් තම යෙදවුම් සපයා ගැනීම සඳහා නාගරික මධ්‍යස්ථාන වෙත ප්‍රවේශ වීමේදීත් ප්‍රජාවන්ට අමතර පිරිවැයවල් දැරීමට සිදුවීමය යන්නයි. මීට විකල්පයක් ලෙස ඔවුන්ට සැපයුම්කරුවන් හා මිලදීගන්නන් මත රඳා පැවතීමට සිදු වේ. එය ඔවුන්ගේ කේවෙල් කිරීමේ ශක්තිය අඩුකර අවසානයේදී නිෂ්පාදකයා ලබන ලාභය අවම කරයි.

*"අපට බස් සේවාවක් නැහැ. කජුවත්ත හන්දියට යනකන් කි.මී.12ක් පයින් යන්න වෙනවා. ඔටෝ එකෙන් (ත්‍රිරෝද රථයෙන්) ගියොත් රු. 300ක් ගන්නවා."*

සිද්ධි අධ්‍යයනය, ආබාධිත, වාකරේ

ප්‍රජාවන් තුළ විදුලි බල සැපයුම නොමැතිකම සඳහන් කළ යුතු වැදගත් කරුණකි. ප්‍රධාන ජාලයට තරමක් දුරට සම්බන්ධ වූත් සුනාමියෙන් පසුව ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක් විසින් කොටසකට සූර්ය බලයෙන් විදුලි බලය සැපයෙන්නා වූත් කුච්චවෙලි ගම්මානය හැරුණු විට මෙම අධ්‍යයනය තුළ ඇති අන් කිසිදු ප්‍රජාවකට විදුලි බල සැපයුම වෙත ප්‍රවේශය නොවීය. වී කෙටීම හෝ කිරි පදනම් කර ගත් නිෂ්පාදන වැනි අගය එකතු කිරීමේ ක්‍රියාවලිවලට මෙය බාධාකාරී ලෙස බලපා ඇත.

*"අපට යෝගට් නිපදවන්න විදුලි බලය නැහැ. අපි මුදවපු කිරි නිෂ්පාදනය කෙරුවොත් වාහන නැති හින්දා විකුණාගන්න බැරි වෙනවා."*

අවධාන කණ්ඩායම් සාකච්ඡාව, එරාවූර් පත්තු

තමන්ට විදුලි බලය නොමැති අතර තම ගම්මානවලට යාබද වෙනත් ජනවර්ග වෙසෙන ගම්මානවලට විදුලි බලය සැපයී තිබීම නිසා සමහර ප්‍රජාවන්ට තමන් යම්තාක් දුරකට කොන් වී ඇති බවක් හැඟේ.

*"අපේ ගම උඩින් සිංහල මිනිස්සු පදිංචි වෙලා ඉන්න ඊළඟ ගමට විදුලි කම්බි යනවා. අපි නැවත පදිංචි වුණේ 2007දී වුණත් තාමත් විදුලි බලය නැහැ."*

අවධාන කණ්ඩායම් සාකච්ඡාව, එරාවූර් පත්තු


කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අයිලියාඩි ග්‍රාම නිලධාරි කොට්ඨාසය හැරුණු විට මෙම අධ්‍යයනයට අයත් අන් සියලු ප්‍රජාවන්ට ප්‍රධාන වශයෙන් නළළිං හා භූගත ළිං මාර්ගයෙන් පානීය ජල සැපයුමකට ප්‍රවේශය තිබිණ. කෙසේ වෙතත්, ප්‍රජා මට්ටමේදී ජීවනෝපායන් සඳහා (විශේෂයෙන්ම බෝග වගාව සඳහා) ජලය සපයා ගැනීම තීරණාත්මක බාධාවක් ලෙස පැවතිණ. බොහෝ ප්‍රජාවන්ට යටත් පිරිසෙයින් කුඩා වැවකින්වත් ජලය ලබාගැනීමේ හැකියාව තිබුණත් මේවා පුනරුත්ථාපනය කිරීමේ දැවෙන අවශ්‍යතාවක් පැවති අතර ඔවුන්ට රඳා පැවතිය හැකි එකම අනෙක් විකල්පය වූයේ වැසි ජලයයි. මෙම වැසි ජලය මත පමණක් රඳා පැවතීම ඉඩම හා ශ්‍රමය වැනි පවත්නා කෘෂිකාර්මික සම්පත්වලින් උපරිම ඵලදායිතා මට්ටමක් කරා ළඟා වීමේදී බාධාවක් විය.

ඉහත සාකච්ඡා කළ උග්‍ර ආදායම් දරිද්‍රතා මට්ටම්වලට අමතරව ප්‍රදේශ අතර සම්බන්ධතාව සහ ජලය හා විදුලි බලය වැනි යහපැවැත්මට අදාළ වෙනත් දරිද්‍රතා පැතිකඩවල්ද සලකා බලන විට, ජීවනෝපාය තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා සැපයෙන ව්‍යාපෘතිමය මැදිහත්වීම්වලදී ඉලක්ක ප්‍රජාවන්ට බහුවිධ ප්‍රවිෂ්ටයන් අවශ්‍ය බව පැහැදිලිය. උදාහරණයක් ලෙස, වැව ප්‍රතිසංස්කරණය කිරීම දැවෙන අවශ්‍යතාවක් වුවත් ප්‍රවාහන පහසුකම් වැනි වෙනත් සහායක ව්‍යුහයන් සම්පාදනය කිරීම ගැනද සැලකිලිමත් විය යුතුය. වෙනත් ඉන්ධන වර්ග මත ක්‍රියාත්මක විය හැකි මෝල් සම්පාදනය කිරීම හෝ ගොවි පොළ අස්වැන්න සාමූහිකව ප්‍රවාහනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා නිෂ්පාදක කණ්ඩායම් සංවිධානගත කොට ශක්තිමත් කිරීම වැනි නව විධික්‍රම මගින් යටිතල පහසුකම් අවහිරතාවලට විසඳුම් සෙවීමේ හැකියාව පිළිබඳව ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලදී විමසා බැලිය යුතුය.

### 3.5 ත්‍රිකුණාමලයෙහි හා මඩකලපුවෙහි ජීවනෝපායන් කෙරෙහි ගැටුමේ බලපෑම

කර්මාන්තවලට පසුව සේවා අංශය තුළ වැඩිම ජන ප්‍රතිශතයකට රැකියා සපයන්නේ මඩකලපු දිස්ත්‍රික්කයයි. ත්‍රිකුණාමලය කෘෂිකර්මයෙන් පසුව සේවා අංශය තුළ වැඩිම ජන සංඛ්‍යාවකට රැකියා සපයයි (3.1 රූප සටහන බලන්න).

3.1 රූප සටහන: ප්‍රධාන කර්මාන්තවලින් රැකියා සැපයෙන ජනගහනය




මූලාශ්‍රයඃශ්‍රම බලකාය පිළිබඳ සමීක්ෂණය, 2010

මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කද ඇතුළුව පළාත තුළ වගා කෙරෙන ප්‍රධාන කෘෂිකාර්මික බෝග වන්නේ වී, එළවළු හා වෙනත් ක්ෂේත්‍ර බෝගවර්ගය. සාගරික ධීවර කර්මාන්තය දිස්ත්‍රික්ක දෙකෙහි ධීවර කර්මාන්තයේ වැදගත් කොටසකි. මීට වෙරළබඩ හා ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තයද ඇතුළත්ය. රට තුළ පිහිටි විශාලතම වෙරළබඩ කලපු පරිසර පද්ධතිය පවතින්නේ මඩකලපුවෙහිය. එය දිස්ත්‍රික්කයෙහි අභ්‍යන්තර ධීවර කර්මාන්තයට විශාල වශයෙන් දායක වේ (Diprose සහ තවත් අය, 2010).

උතුරු පළාත සමග සසඳන විට නැගෙනහිර පළාත ගැටුමෙන් වේගයෙන් යථා තත්වයට පත් වෙමින් පැවතියත් ගැටුමේ බලපෑම් හා සලකුණු තවමත් පවතී. කෘෂිකර්ම හා ධීවර කර්මාන්ත අංශවලදී නිෂ්පාදනය හා ඵලදායිතාව යන දෙකම කෙරෙහි ගැටුම සෘණාත්මකව බලපා ඇත. කෘෂිකාර්මික ඉඩම් වෙත ප්‍රවේශය සීමිත වීම හා ප්‍රවාහනයට පනවා ඇති සීමාකම් නිසා නිෂ්පාදනයේ හා ඵලදායිතාවේ මෙම අහිමි වීම තවත් නරක අතට හැරේ. ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිව තිබෙන භෞතික සුරක්ෂිතතාවක් නොමැතිකමද කෘෂිකර්මය සඳහා ආයෝජන බෙහෙවින් අඩු වීමට හේතුවී ඇත. ගොවිතැන ආශ්‍රිත මූලික යටිතල පහසුකම් විනාශ වීමද මෙම අංශයට පවතින ප්‍රධාන බාධාවකි (Diprose සහ තවත් අය, 2010).

ශ්‍රී ලංකාවේදී ක්‍රමෝපායාත්මක ප්‍රදේශ අධිආරක්ෂිත කලාප ලෙස වර්ග කිරීම කෘෂිකර්මය කෙරෙහි සැලකිය යුතු අයුරින් සෘණාත්මකව බලපා ඇත. එය ගොවිතැන හා පශු සම්පත් තණ බිම් උදෙසා

ඵලදායක ඉඩම් වෙත ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කරයි. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙහි පමණක් කුඹුරු ඉඩම් අක්කර 2,500ක් අධිආරක්ෂිත කලාපයක් ලෙස තක්සේරු කර ඇත (අධ්‍යයනය සිදු කළ සමයේදී මෙය හඳුන්වන ලද්දේ 'ආර්ථික කලාපයක්'[3] ලෙසය) (ප්‍රධානීන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවලින් හා දිස්ත්‍රික්ක මට්ටමේ වැඩ මුළුවලින් රැස් කර ගත් තොරතුරු අනුවය). ගැටුම අතරතුර දී අධිආරක්ෂිත කලාප යටතේ ප්‍රවේශ විය නොහැකි වූ විශාල ඉඩම් ප්‍රමාණයක් පැවතිණ.

දවසේ ඇතැම් වේලාවලදී මසුන් ඇල්ලීමට පනවා ඇති හමුදාමය බාධක හා වෙනත් බාධක හේතුවෙන් සමහර අඩවිවලට ගොඩ බැසිය නොහැකි වීම ධීවර කර්මාන්ත අංශයේ ඵලදායිතාව කෙරෙහි බලපෑවේය. යුද්ධය අවසන් වීමෙන් පසු මෙම බාධාවන් අඩු කරමින් සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇත (ප්‍රධානීන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව, ත්‍රිකුණාමලය).

වෙරළබඩ යටිතල පහසුකම් (විශේෂයෙන්ම මාර්ග, පාලම් හා විදුලි බල සැපයුම් මාර්ග), ධීවර කර්මාන්තයට අදාළ ගොඩනැගිලි හා (බෝට්ටු ඇතුළු) ධීවර ආම්පන්න විශාල ප්‍රමාණයක් විනාශ වූ අතර, මෙය බොහෝ ධීවර ප්‍රජාවන් කෙරෙහි බලපා ඔවුන් සහාය අවශ්‍ය කරන තත්ත්වයට පත් කර ඇත. අයිස් නිෂ්පාදනාගාර, ගොඩ බැසිය හැකි අඩවි හා වරායවල් වැනි ධීවර කර්මාන්ත යටිතල පහසුකම් විනාශ වීම දිස්ත්‍රික්ක දෙකෙහි ධීවර කර්මාන්ත අංශයට බාධා කළේය. මඩකලපු දිස්ත්‍රික්කය සීමා පැනවීම් පැවතියදීම නිෂ්පාදන මට්ටම් ඉහළ තලයක පවත්වා ගැනීමට සමත් විය. මහා, මධ්‍ය හා සුළු පරිමාණ වැව් විනාශ වීම අභ්‍යන්තර ධීවර කර්මාන්තයේ උපඅංශවල නිෂ්පාදනයට බලපෑවේය (CEPA, උතුරු නැගෙනහිර කෘෂිකාර්මික හා ධීවර ජීවනෝපායන් පිළිබඳව සිදු කළ ප්‍රකාශයට පත්නොකරන ලද අධ්‍යයනය, 2009). කෙසේ වෙතත්, 3.8 වගුවෙහි පෙන්වා ඇති පරිදි ත්‍රිකුණාමල හා මඩකලපු දිස්ත්‍රික්කවල නිෂ්පාදන මට්ටම් (2005 සිට 2007 දක්වා) ගැටුමේ උත්සන්න අවධියේදී පහත වැටිණ. එදිරිවාදීකම් අවසන් වීමෙන් පසුව නිෂ්පාදන මට්ටම් යම් තත්වයට පත් වී වැඩිදියුණු විය.

3.8 වගුවː ඒ ඒ ධීවර දිස්ත්‍රික්කය නිෂ්පාදනය කළ සාගරික අංශයේ මත්ස්‍ය ප්‍රමාණය, 2004-2009

| ධීවර දිස්ත්‍රික්කය | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 |
|---|---|---|---|---|---|---|
| පුත්තලම | 16,520 | 11,670 | 14,910 | 17,130 | 16,960 | 20,010 |
| හලාවත | 14,220 | 9,360 | 18,720 | 24,180 | 22,060 | 21,950 |
| මීගමුව | 22,780 | 16,940 | 29,070 | 35,710 | 35,820 | 37,490 |
| කොළඹ | 1,640 | 560 | 590 | 510 | 1,030 | 830 |
| කළුතර | 20,690 | 11,560 | 30,520 | 39,950 | 39,580 | 33,100 |
| ගාල්ල | 17,530 | 11,210 | 15,530 | 17,820 | 14,800 | 24,930 |
| මාතර | 27,990 | 17,090 | 38,480 | 48,460 | 47,810 | 44,180 |
| තංගල්ල | 21,960 | 6,220 | 15,590 | 20,990 | 20,850 | 20,990 |
| කල්මුනේ | 19,790 | 7,940 | 11,480 | 12,810 | 22,050 | 16,260 |
| මඩකලපුව | 16,160 | 7,650 | 8,930 | 11,710 | 21,850 | 24,530 |
| ත්‍රිකුණාමලය | 16,540 | 6,790 | 6,270 | 8,150 | 17,980 | 27,690 |
| මුලතිව් | 2,200 | 780 | 850 | 360 | 260 | - |
| යාපනය | 33,980 | 12,790 | 11,220 | 5,130 | 5,830 | 13,080 |
| කිලිනොච්චිය | 3,130 | 1,460 | 830 | 590 | 360 | - |
| මන්නාරම | 17,060 | 8,380 | 12,990 | 9,170 | 7,390 | 8,130 |

මූලාශ්‍රයː ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2009, 5.34 වගුවෙන් උපුටා ගැනිණ

[3] අවධානයේ වෙනසක්ද සාමය අඛණ්ඩව පවතින බවද ඇඟවෙන හෙයින් ප්‍රදේශ ගැන සඳහන් කරන විට (ආරක්ෂක කලාපයේ සිට ආර්ථික කලාපය දක්වා) වචන කෝෂය වෙනස් වීම ධනාත්මක වේ.

යුද්ධය අතරතුරදී රසායනික පොහොර හා ඉන්ධන වැනි ගොවි යෙදවුම් ප්‍රවාහනයද සීමා විය. එය භූමියේ ඵලදායිතාව පහළ යාමට හා නිෂ්පාදන පිරිවැය ඉහළ යාමට හේතු විය. මෙම ඉඩම්වල රසායනික පොහොර භාවිත නොකිරීමේ ධනාත්මක පැතිකඩ නම් ඉල්ලුම ඉහළ යමින් පවතින කාබනික ආහාර නිෂ්පාදනයට මෙම ගොවීන්ට අවස්ථාවක් තිබීමයි. කෙසේ වෙතත්, දිස්ත්‍රික්ක මට්ටමේ වැඩමුළුවලදී සාකච්ඡා කළ පරිදි අවාසනාවන්ත ලෙස පොහොර වෙත ප්‍රවේශය වැඩිවීම නිසා මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල රසායනික පොහොර භාවිතය වැඩි වී ඇත. එහෙත්, වගා නොකළ හා අත්හැර දැමූ ඉඩම් රසායනික පොහොරවලින් තොර කාබනික ගොවිතැන සඳහා යොදා ගැනීමේ හැකියාව තවමත් පවතී.

ප්‍රජාවන් නැවත නැවතද දිගින් දිගටමද අවතැන් වීම උතුරු නැගෙනහිර නිපුණ කෘෂිකාර්මික හා ධීවර ශ්‍රම සංචිතයට බෙහෙවින් බලපා ඇත. හමුදා මෙහෙයුම් අවසන් වීමෙන් පසුව ස්ථාවරත්වය නැවත ළඟා වීම අවතැන්වූවන්ට ආපසු පැමිණීම සඳහා හිතකර තත්වයන් නිර්මාණය කර ඇත. නිපුණ ශ්‍රම සංචිතය වැඩි වීම මෙම පළාත් දෙකෙහි කෘෂිකර්මය හා ධීවර කර්මාන්තය යළි පණගැන්වීමට උදව් වනු ඇත.

ගැටුම අතරතුරදී භෞතික වෙළඳ මධ්‍යස්ථාන හා වෙළඳ ජාල විනාශ වීමද කෘෂිකර්ම, ධීවර කර්මාන්ත හා පශු සම්පත් අංශවලට බාධා කළේය. "නැගෙනහිර නවෝදය" නමැති ලියවිල්ලේදී සාකච්ඡා කළ පරිදි, නැගෙනහිර පළාත සංවර්ධනය කිරීමේ රජයේ ක්‍රමෝපායාත්මක සැලැස්ම[4] සහ වෙළඳපොළ හා ගබඩා පහසුකම් නොමැතිකම හැම විටම ඉහළ මට්ටමේ අපතේ යාමකට තුඩු දුන් බැවින් විශේෂයෙන්ම අස්වනු ගොඩගැසෙන සමයේදී ගොවීන් නිෂ්පාදනයෙහි නිරත වීම අධෛර්යමත් කළේය. ගබඩා හා සැකසුම් යටිතල පහසුකම්වලටද හානි සිදු විය. සාම්ප්‍රදායික අලෙවිකරණ ජාල අහිමි විය. කිරි එකතු කිරීමේ ජාල අහිමි වීම නිසා පශු සම්පත් උපඅංශය විශේෂයෙන්ම කිරිපට්ටි අංශය ඍණාත්මක ලෙස බලපෑමට ලක් විය (දිස්ත්‍රික්ක මට්ටමේ වැඩමුළුව, මඩකලපුව).

ගැටුම ආශ්‍රිත බාධාවන්හි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකර්මය හා ධීවර කර්මාන්තය අජීව තත්ත්වයට පත්වීම ගැටුමට පෙර මේ ප්‍රදේශවල පැවති සාම්ප්‍රදායික දැනුම් පදනම සෝදාපාළු කර තරුණ පරම්පරාව වෙනත් විදියේ රැකියා සොයා යාමට යොමුකළේ ය. පාරම්පරික රැකියා රටාවන් වෙනස්වී ඇති අතර, මේ අංශයට නව නිෂ්පාදකයන් පරම්පරාවක් ආකර්ෂණය කරගැනීම අභියෝගයකි. සංක්‍රමණයේ ප්‍රතිඵලයක් ලෙස මේ ප්‍රදේශවලට ගලා එන මුදල් ප්‍රමාණයද ඉහළ ගොස් ඇති අතර එය ප්‍රදේශයේ සංවර්ධනයට ප්‍රයෝජනවත් වියහැකිය (CEPA, උතුරු නැගෙනහිර කෘෂිකාර්මික හා ධීවර ජීවනෝපායන් පිළිබඳව සිදුකළ ප්‍රකාශයට පත්නොකරන ලද අධ්‍යයනය, 2009).

### 3.6 ආයතන

කෘෂිකර්මය සම්බන්ධ ප්‍රතිපත්ති හා ගැටලුවලට අදාළව ක්‍රියාත්මක වීම පැවරී ඇති ප්‍රධාන රජයේ ආයතනය කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය (MADAS) යි. එම ආයතනයේ විධිනියෝගයෙන් ආවරණය වන්නේ එහි දෙපාර්තමේන්තුද ව්‍යවස්ථාපිත මණ්ඩලද මාර්ගයෙන් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමයි.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය යටතේ පවතින කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DOA) සතුව විවිධ පළාත්වලට සේවාවන් සැපයිය හැකි යටිතල පහසුකම් ඇත. කෘෂිකර්මය බෙදී ගිය විෂයක් වන අතර, සියලු ගොවිජන කේන්ද්‍රවල/මධ්‍යස්ථානවල කෘෂිකර්ම උපදේශකයන් සහිත පළාත් කෘෂිකර්ම කාර්යාල ඇත (De Silva, 2009). සියලු ගොවි දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මට්ටමේදී හමු වන මේ මධ්‍යස්ථාන වගා කිරීමේ සිට, අලෙවි කිරීම දක්වා මුළු කාලය පුරාම කෘෂිකාර්මික සහායක සේවාවන් හා ව්‍යාප්ති සේවාවන් සපයයි. පර්යේෂණ හා පුහුණු ආයතන ගණනාවක්ම

[4] රජය විසින් ක්‍රියාත්මක නැගෙනහිර නවෝදය වැඩ සටහනට (වෙබ් අඩවිය www.neweast.lk අභ්‍යන්තර අවතැන් වූවන් නැවත පදිංචි කිරීම, බිම්බෝම්බ ඉවත් කිරීම, පුනරුත්ථාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් මෙන්ම නව මාර්ග ජාල, පාලම්, වරායවල්, විදුලිබල නිෂ්පාදනාගාර, විදුලිබලය බෙදා හැරීමේ ජාල, රෝහල් හා පාසල් වැනි දැවැන්ත යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති බඳු, සමාජ සහායන වැඩ සටහන් ගණනාවක් ඇතුළත්ය. 2010දී අවසන් වීමට නියමිතව තිබූ මෙම තුන් වසර වැඩ සටහනේ සමස්ත අයවැය ආයෝජනය රු.මිලියන 197,219ක් (එ.ජ.ඩො. මිලියන 1,840ක්) විය (මූලාශ්‍රයඃ නිව්යෝර්ක්හි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා ස්ථාවර දූත කණ්ඩායම, 2008)

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්වලට සහාය දෙයි. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පළාත් සභාවට පැවරී ඇති බලතල යටතේ බෝග වගා අංශයේ සංවර්ධනය ආශ්‍රිත කෘෂිකර්ම ව්‍යාප්ති ක්‍රියාකරකම් සහ සන්නිවේදන හා පර්යේෂණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරයි. නිලධාරීන් සංක්‍රමණය වීම වැඩි වීමෙන් හා භෞතික යටිතල පහසුකම් විනාශ වීමෙන් මානව සම්පත් හිඟ බැවින් රටේ අනෙක් ප්‍රදේශ සමග සසඳන විට යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශවලදී මෙම ආයතනවල (ගොඩනැගිලි, රථවාහන හා වෙනත් වත්කම් වැනි) හැකියාවන් පහත වැටී ඇත.

සෑම පළාතකම ඇති සහ පශු සම්පත් සංවර්ධනය ආශ්‍රිත සේවාවන් සපයන සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු සමග එක්ව පශු සම්පත් අංශයේ මූලික වගකීම දරන්නේ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයයි. මිල්කෝ හා නෙස්ලේ සමාගම් රට තුළ කිරිපට්ටි අංශයෙහි නිරතව සිටින වඩාත්ම කැපී පෙනෙන පෞද්ගලික අංශ නියෝජිතයන්ය.

පහත දැක්වෙන්නේ ධීවර අංශය වගකීම දරන ක්ෂේත්‍රයන්ය. ඒවාට අදාළ අධීක්ෂණ/ක්‍රියාත්මීකරණ ආයතන වරහන් තුළ දැක්වේ. ධීවර අංශයට නායකත්වය දෙන්නේ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය (MFAR) යි. ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම (ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ වෙරළ සංරක්ෂණ දොපර්තමේන්තුව), පර්යේෂණය (NARA), අධ්‍යාපනය (NIFNE), සංවර්ධනය හා ව්‍යාප්තිය (NAQDA) යනාදී වශයෙන් වගකීම් දරන්නේ එම ආයතනයයි. රජයේ ප්‍රාදේශීය පර්යේෂණ හා සංවර්ධන ආයතනවලින් බොහොමයක් (NARA සහ NAQDA) මේ වන විට පවත්නේ බරපතළ ජරාවාස තත්වයකය. සමහර අවස්ථාවලදී මේවා හමුදාව විසින් අත්පත් කර ගෙන ඇත (FAO, 2007).

කෘෂිකර්ම, පශු සම්පත් හා ධීවර කර්මාන්ත අංශවලට සම්බන්ධ වෙනත් සේවා සම්පාදක ආයතන ගණනාවක්ද පවතී. වාරිමාර්ග දෙපාර්තමේන්තුව ජාතික මට්ටමින් හා පළාත් මට්ටමින් මේ මෑත නැවත පදිංචි වූ ප්‍රදේශවල කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරීමෙහිලා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

කෙසේ වෙතත්, 2009 දක්වා පැතිර පැවති ගැටුම නිසා උතුරු නැගෙනහිරදී මේ ආයතන පැහැදිලිව නොදිස්වන තත්වයක් ඇත. පුනරුත්ථාපන ක්‍රියාවලියේදී මේ ආයතනවලට මේ ප්‍රදේශවල මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා දිරි දීම් කළ යුතුය. ආධාර දෙන්නන් විසින් අරමුදල් සැපයෙන හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන විසින් ක්‍රියාත්මක කෙරෙන සර්වෝදය, සණස හා සමහර වාණිජ බැංකු වැනි වැඩසටහන් ගණනාවක් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සම්පාදනය කරන නමුත් ජීවනෝපාය ආශ්‍රිත රක්ෂණය දක්නට ලැබෙන්නේ අඩුවෙනි. ආදායම් උපයන ව්‍යාපාරික ව්‍යවසායන්හි ආයෝජනය කිරීම සඳහා ගොවීන්ට හා ධීවරයන්ට ප්‍රාග්ධනය සැපයීමට උදව් වනු පිණිස මෙම පරිශ්‍රමයන් තවදුරටත් දීර්ඝ හා පුළුල් කළහැකිය.

## 4. මඩකලපුවේ හා ත්‍රිකුණාමලයේ ප්‍රධාන ජීවනෝපායන්ට අදාළ වටිනාකම් දාම විශ්ලේෂණය කිරීම

වටිනාකම් දාම විශ්ලේෂණය නිෂ්පාදකයන්ට තම භාණ්ඩ වෙළඳපොළට රැගෙන යාමට ඉඩ සැලසෙන ක්‍රියාකාරකම් හා සම්බන්ධතා දාමයක්ද දාමය දිගේ පෙරට යාමට හා අගය එකතු කිරීමට පවත්නා බාධකද විමසා බලයි. මෙම අධ්‍යයනය මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල වෙසෙන ඉලක්ක කණ්ඩායම්වල ජීවනෝපායන්ට අදාළ ගොවි හා කෘෂිකාර්මික නොවන  වටිනාකම් දාම කිහිපයක් විමසා බැලීය. මෙම කොටස විවිධ වටිනාකම් දාම දිගේ ඉහළට නැගීමෙන් ඉලක්ක ප්‍රජාවන් වළක්වන සාධක මෙන්ම එසේ ඉහළට නැගීමට පවත්නා අවස්ථාවන්ද හඳුනා ගනියි. එය අවසන් වන්නේ බාධාවන් ජය ගැනීමේ හා අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීමේ උපායන් හඳුනා ගැනීමෙනි. ඉලක්ක කණ්ඩායම ප්‍රධාන වශයෙන් නිපදවූයේ ප්‍රාදේශීය පාරිභෝගිකයා හෝ ප්‍රාදේශීය වෙළෙන්දා ලෙස හැඳින්වෙන ප්‍රාදේශීය වෙළඳපොළ සඳහා බව සෑම නිෂ්පාදනයක් සම්බන්ධයෙන්ම නිරීක්ෂණය විය. අතරමැදියා ආධිපත්‍යය දරයි. අගය එකතු කිරීම සිදු වූයේ ඉතා අඩුවෙනි. ගැටුම අතරතුරදී සියලු ප්‍රාග්ධන සම්පත් විනාශ වීමෙන් හා යටිතල පහසුකම් (උදාහරණයක් වශයෙන්, මාර්ග හා විදුලි බල සැපයුම) පිරිහීමෙන් අගය එකතු කිරීම සීමා විය. මූල්‍ය ප්‍රාග්ධනය නොමැතිකම හා මූල්‍ය සේවාවන් වෙත අප්‍රමාණවත් ප්‍රවේශය/මූල්‍ය සේවාවන් නොපැවතීම සිය වත්කම් පදනම ප්‍රබල ලෙස බාදනය වී ඇති ජනගහනයකට උග්‍ර ගැටලුවකි. ගංවතුර වැනි ස්වාභාවික ආපදාවලින්ද ජීවනෝපායන්ට තර්ජන එල්ල වේ.

නැගෙනහිර ජනතාව සතුව කෘෂිකර්මය, ධීවර කර්මාන්තය, සත්ව පාලනය මෙන්ම ගඩොල් කැපීම වැනි කෘෂිකාර්මික නොවන  ක්‍රියාකාරකම්වලද නිරත වීම සඳහා අවශ්‍ය සාම්ප්‍රදායික නිපුණතා, උනන්දුව හා උද්‍යෝගය ඇත. ආයතනික සහාය විශේෂයෙන්ම ක්ෂුද්‍ර මට්ටමේ ජීවනෝපාය ක්‍රියාකාරකම් සහාය පවත්නේ අවම අඩියකය. අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනය සඳහාත් ජීවනෝපායන්ට හිතකර වාතාවරණයක් නිර්මාණය කිරීම සඳහාත් ඉඩක් පවතී. එමගින් නිෂ්පාදනය වැඩි දියුණු වනු ඇත, අගය එකතු කිරීමට සහායක් සැපයෙනු ඇත, අතරමැදියන් සමග සම්බන්ධතා අඩු සූරාකෑමක් සහිත තත්වයට පත් වනු ඇත.

### 4.1 වී වගා වටිනාකම් දාමය විශ්ලේෂණය කිරීම

ප්‍රාථමික හා ද්විතීය දත්ත පදනම් කර ගත් වටිනාකම් දාම විශ්ලේෂණය අවධාරණය කරන්නේ අධ්‍යයනය කළ ග්‍රාම නිලධාරි කොට්ඨාසවල ගොවීන් ප්‍රධාන වශයෙන් සිටින්නේ වටිනාකම් දාමයේ නිෂ්පාදන මට්ටමේ බවයි. තම අස්වැන්න සඳහා වඩා ඉහළ වටිනාකමක් ලබාගැනීමට නම් ඔවුන් වටිනාකම් දාමයේ ඉහළට නැගගත යුතුය. එසේ නැත්නම්, වටිනාකම් දාමයේ එම අදියර තුළ දීම අස්වැන්නේ ලාභදායකත්වය වැඩි කර ගත හැකි නව විධික්‍රම ඔවුන්ට හඳුන්වා දියයුතුය.


හඳුනා ගත් ප්‍රධාන බාධාවන් ඵලදායිතාවේ අඩුකමට, අගය එකතු කිරීමේ අඩුකමට හා අලෙවි කිරීමේ හැකියාවේ අඩුකමට සම්බන්ධ ඒවාය. ඵලදායිතාව සම්බන්ධ බාධාවන් ප්‍රධාන වශයෙන් විසඳිය හැක්කේ ඉඩම වෙත ප්‍රවේශය විධිමත් කිරීම, බෝග විවිධාංගීකරණය, ජල සැපයුම සහතික කිරීම හා යෙදවුම් හෙවත් පොහොර, බිත්තර වී හා යන්ත්‍රසූත්‍ර වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීමෙනි.

ප්‍රාදේශීය මට්ටමේදී අගය එකතු කිරීම සඳහා වැඩි ඉඩකඩක් සලසා දීමෙන් අගය එකතු කිරීමේ අඩුකම පිළිබඳ ගැටලුව විසඳෙන බවත් එවිට අන් තැන්වලට ඇදීයන ලාභය නිෂ්පාදකයා හා ඉලක්ක ප්‍රජාවන් අත රැඳෙන බවත් යෝජනා කරනු ලැබේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිහිටුවීමට හා පවත්නා එවැනි ව්‍යවසායන් ශක්තිමත් කිරීමට සහාය සපයා ප්‍රාදේශීය වී මෝල් ප්‍රවර්ධනය කළ විට අලෙවි මිල ඉහළ යනු ඇත. දහයියා හා නිවුඩ්ඩ වැනි වී ආශ්‍රිත අපතේ යන ද්‍රව්‍යවලින් භාණ්ඩ නිපදවීමට ඇති හැකියාවද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ කළ හැකිය. එමෙන්ම, සහල් පදනම් කර ගත් නිෂ්පාදන ප්‍රාදේශීය මට්ටමේදී අලෙවි කළ යුතුයැයි සහ දිගු කාලයේදී අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම සඳහා දිස්ත්‍රික්කයෙන් බැහැරට අපනයනය කළ යුතු යැයිද යෝජනා කරනු ලැබේ. තරගකාරී වෙළඳපොළ මට්ටමක් තුළ අගය එකතු

කිරීමේ ක්‍රියාවලිය තිරසර කිරීමට විදුලි බලය හා ගොවිපොළපාරවල් වැනි යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවක්ද පවතී.

සාමූහික අලෙවිකරණය ප්‍රවර්ධනය කිරීම හා පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වය දිරිගැන්වීම මගින් ප්‍රධාන වශයෙන් නිෂ්පාදන හිඟයක් පවතින දිස්ත්‍රික්ක තුළ පවත්නා බාහිර වෙළඳ පොළවල් ඉලක්ක කර ගැනීම අලෙවි කිරීමේ හැකියාවේ අඩුකම වැඩි දියුණු කිරීම සඳහා යොදා ගත හැකි එක් විධික්‍රමයකි. ලාභදායක වෙළඳපොළවලට පිවිසීම (උදාහරණ ලෙස, නාගරික මධ්‍යස්ථානවලට හා සංචාරක අංශයෙහි සාම්ප්‍රදායික සහල් වර්ග අලෙවි කිරීම) සඳහා ගබඩා පහසුකම්ද භාණ්ඩ විවිධාංගීකරණයද වැඩි කිරීමෙන් ඉහළ ලාභ අත්වනු ඇත. ණය අවම කිරීම සඳහා වඩා විධිමත් මූල්‍ය සේවාවන්ට පහසුකම් සැපයීමෙන් හා අවාරයේ කළ හැකි ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සපයා දීමෙන් නිෂ්පාදකයාට වැඩි කේවෙල් කිරීමේ ශක්තියක් අත්වනු ඇත. එමෙන්ම, ඔහුගේ අලෙවිකරණ විකල්ප වැඩි වනු ඇත.

4.1 රූප සටහන: වටිනාකම් දාමය ඔස්සේ ක්‍රියාකාරකයන් හා නිෂ්පාදනයේ වටිනාකම සිතියම්ගත කිරීම*




මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහ බැංකුව, HARTI, ප්‍රාථමික අධ්‍යයන දත්ත අලෙවි මිලගණන් හා ලාභ පදනම් වන්නේ අධ්‍යයනය අතරතුරදී රැස් කර ගත් ප්‍රාථමික දත්ත මතය

ඉහත රූප සටහන, වී වගා වටිනාකම් දාමය දිගේ සිටින ක්‍රියාකාරකයන් සිතියම්ගත කරයි. එමෙන්ම, භාණ්ඩය වටිනාකම් දාමය ඔස්සේ අවසන් පාරිභෝගිකයා අතට ගමන් කරද්දී එහි වටිනාකම වෙනස් වන ආකාරය පෙන්වා දෙයි. මෙම අධ්‍යයනය සඳහා රැස් කළ දත්ත අනුව, යෙදවුම් මට්ටමේ සිටින සේවා සම්පාදකයන්, එනම් මහා පරිමාණ හා සුළු පරිමාණ මෝල්කරුවන් හා වෙළඳුන් සියලු දෙනාම පිරිමින්ය. කාන්තාවෝ ප්‍රධාන වශයෙන් අඳ ගොවීන් හා බදු ගොවීන් ලෙසද වඩා පොදුවේ ගත්කල වැටුප් ශ්‍රමිකයන් ලෙසද වී නිෂ්පාදනයෙහි නිරතව සිටියහ. සේවා නියුක්තිකයන් අතර සිටි ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් - ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ, ආබාධිතත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයන් හා වයස්ගත පුද්ගලයන් - ප්‍රධාන වශයෙන් වී වගාවෙහි නිරත වූයේ දෛනික වැටුපට හෝ භාණ්ඩවලින් හෝ සේවාවලින් කෙරෙන ගෙවීමකට අඳ ගොවීන් ලෙසය. වී සහල් කිරීමේද ප්‍රජාව හෝ අසල්වැසි ගම්මාන තුළ ඒවා අලෙවි කිරීම්ද නිරතව සිටි ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බද පැවතිණ.

4.1 රූප සටහනේ දැක්වෙන පරිදි, නිෂ්පාදකයා උපරිම පරිශ්‍රමය දැරුවත් ඔහු/ඇය සිය අස්වැන්නෙන් ලබන ලාභය වටිනාකම් දාමයේ පවතින අඩුම ලාභ ප්‍රමාණයයි. මෝල්කරුවෝ සහල් අලෙවි කිරීමෙන් ලබන ලාභය හැරුණු විට දහයියා හා නිවුඩ්ඩ වැනි වී කෙටීමෙන් ලැබෙන අතුරු නිෂ්පාදනයන් අලෙවි කිරීමෙන්ද අමතර ලාභයක් ලබති. ඉහත රූප සටහනෙහි පැහැදිලිව ප්‍රකාශිත පරිදි, වටිනාකම් දාමයේ ඉහළම මට්ටමේ සිටින තොග වෙළඳුන් හා සිල්ලර වෙළෙන්දෝ එම දාමයේ ඔවුන්ට පහළින් සිටින්නන්ට වඩා වැඩි වටිනාකමක් සහල් කිලෝවකින් ලබති.[5] මේ වටිනාකම් දාමයෙන් ඉදිරිපත් වන්නේ වී කෙටීම හෙවත් ආසන්නම අගය එකතු කිරීම පමණක් බව සඳහන් කළ යුතුය. සහල් සඳහා වෙනත් ආකාරයේ අගය එකතු කිරීම්වල නිරතවන්නන්ට සහල් කිලෝවකින් ඊටත් වැඩි ලාභයක් ලැබිය හැකිය. ලැබිය හැකි උපරිම ලාභය සම්පාදනය නොකරන ප්‍රාදේශීය මට්ටමේ සුළු පරිමාණ වී කෙටීම හැරුණු විට අධ්‍යයනය කළ ප්‍රජාවෝ වෙනත් අගය එකතුකිරීමක නිරත නොවූහ.

වටිනාකම් දාමයේ ප්‍රබලතම ස්ථාන දරා සිටින්නේ මෙම ප්‍රජාවන්ගෙන් පිටත සිටින වෙළඳුන්, අතරමැදියන් හා මහා පරිමාණ මෝල් හිමියන්ය. මිල තීරණය කරන්නේ ඔවුන්ය. වටිනාකම් දාමය දිගේ සිටින අනෙක් ක්‍රියාකාරකයන්ට ඇත්තේ සුළු කේවෙල් කිරීමේ බලයකි. අඳ ගොවීන්, ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ හා ආබාධිතත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයන් වැනි ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් වලට තිබුණේ ඊටත් වඩා අඩු කේවෙල් කිරීමේ බලයකි. ඊට හේතුව ඔවුන් වටිනාකම් දාමයේ අනෙක් ක්‍රියාකාරකයන් මත රඳා පැවතීම, සහනාධාර යෝජනා ක්‍රම පිළිබඳව ඔවුන්ට දැනුවත්කමක් නොමැතිකම සහ ඔවුන්ගේ වෙනස් තත්වය හා ඔවුන් වැටුප් ශ්‍රමිකයන් ලෙස තාවකාලික රැකියාවල නිරත වීමයි. සමහර ශ්‍රමිකයන් වැටුප් ලෙස ලබන්නේ මුදල් නොවන භාණ්ඩ හෝ සේවාවන්ය යන කරුණ ඔවුන්ගේ තත්වය පැහැදිලිව පෙන්නුම් කරන්නකි.

වටිනාකම් දාමය දිගේ වඩා සාධාරණ ගනුදෙනු ක්‍රියාවලියක් හඳුන්වා දීමේ පැහැදිලි අවශ්‍යතාවක් පවතී. අදාළ විශේෂඥයන් සමග පැවැත්වූ සාකච්ඡාවලදී අවධාරණය කෙරුණේ වෙළඳුන්ගේ හා අතරමැදියන්ගේ බලපෑම හා ආධිපත්‍යය එක්වරම තුරන් කළ නොහැකි නමුත් වැඩියෙන් ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්වලට තම ව්‍යාපාරික ව්‍යවසායන්ගෙන් ප්‍රතිලාභ ලැබිය හැකි අයුරින් එය මැදිහත්වීම් සැලසුම් කිරීමේ ක්‍රියාවලියට ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවක් පවතින බවයි. උදාහරණයක් ලෙස, වී කෙටීම පිණිස ප්‍රජාව තුළ සුළු හෝ මධ්‍ය පරිමාණ ව්‍යවසායක් ආරම්භ කිරීම සඳහා අතරමැදියාට සහාය සැපයෙන්නේ නම් ප්‍රජාව තුළ සිටින වී නිෂ්පාදකයන් ඔහුට ඍජුව සම්බන්ධ කළ යුතුය.

**ඵලදායිතාව වැඩි කිරීම** - ඉහතදී සඳහන් කළ පරිදි, දිස්ත්‍රික්ක දෙකේම නැවත පදිංචි වූ ප්‍රජාවෝ වී වගාවෙහි නිරත වෙති. 2006 හා 2007 වසරවලදී හමුදාමය ක්‍රියාකාරකම් වැඩි වීම හා දිස්ත්‍රික්ක දෙකේ වාරිමාර්ග විනාශ වීම නිසා නිෂ්පාදනයෙහි හා වැපිරූ ප්‍රමාණයෙහි සිදුවූ වෙනස් වීම් 4.1 හා 4.2 වගුවලින් පෙන්නුම් කෙරේ. යුද්ධය අවසන් වීමට ආසන්න 2008 වසර වෙද්දී, වගා නොකළ හා

[5] ක්‍රියාකාරකයන් ලබාගන්නා ලාභය නිශ්චිතව ගණනය කිරීමට නම් තොග වෙළඳුන්ට හා සිල්ලර වෙළඳුන්ට ප්‍රවාහනය, ශ්‍රමය හා ගබඩා කිරීම ආශ්‍රිතව දැරීමට සිදු වන පිරිවැය ඉවත් කළ යුතුය. මේ දත්ත නොමැති නිසා ලාභදායකත්වය පිළිබඳ වැඩිදුර විශ්ලේෂණයක් කළ නොහැකිය.

අත්හැර දැමූ ඉඩම් වගා කිරීමත් සමග වී වගාවද වැපිරූ ප්‍රමාණයද වැඩි වීමක් පෙන්නුම් කරයි. වැපිරූ ප්‍රමාණය වැඩි වීමත් නිෂ්පාදනයේ වැඩි වීමත් සමග 4.3 වගුවෙහි පෙන්වා ඇති පරිදි වර්තමානයේදී දිස්ත්‍රික්ක දෙකම පරිභෝජනය අවශ්‍යතාව ඉක්මවා වී නිෂ්පාදනය කරයි. වෙළඳපොළ මිල ගණන් වැනි බාහිර සාධක සිත තබාගෙන වගා කරන ප්‍රමාණය වැඩි කිරීමෙන් සහ/හෝ ඵලදායිතාව වැඩි කිරීමෙන් වී වගාවෙන් නිෂ්පාදකයාට ලැබෙන ලාභය වැඩි කළ හැකිය. ප්‍රජා මට්ටමේ සම්මුඛ සාකච්ඡා හා ප්‍රධාන පුද්ගලයන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා අනාවරණය කරන්නේ වගාව සඳහා යොදා ගත හැකි තවත් ඉඩම් තිබෙන බව වුවත් විසඳුම් සෙවිය යුතු ඵලදායිතාව සම්බන්ධ බොහෝ බාධකද පවතී. පවත්නා කුඹුරු ඉඩමේ ඵලදායිතාව වැඩි කරන ක්‍රමෝපායක් යොදා ගැනීමෙන්හා (පසේ තාක්ෂණික හැකියාව හා වෙනත් තත්වයන් සැලකිල්ලට ගනිමින්) මේ දක්වා වගා කළ ඉඩම් වෙනත් බෝග වගා සඳහා යොදාගෙන තම කෘෂිකාර්මික ජීවනෝපායන් විවිධාංගීකරණය කර ගැනීමෙන් ගොවි පවුල්වලට වැඩි ප්‍රතිලාභ ලැබිය හැකිය.

**4.1 වගුව: මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල වී නිෂ්පාදනය**

| වර්ෂය | නිෂ්පාදනය (මෙ.ටො.) | | | |
|---|---|---|---|---|
| | මඩකලපුව | | ත්‍රි කුණාමලය | |
| | යල | මහ | යල | මහ |
| 2004 | 50,594 | 112,951 | 29,109 | 90,300 |
| 2005 | 50,882 | 94,394 | 62,603 | 89,880 |
| 2006 | 49,031 | 131,830 | 43,370 | 85,439 |
| 2007 | 49,039 | 37,476 | 42,147 | 63,039 |
| 2008 | 61,609 | 55,020 | නො පවතී | 73,505 |

මූලාශය: මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, 2008

**4.2 වගුව: ත්‍රිකුණාමල හා මඩකලපු දිස්ත්‍රික්කවල වැපිරූ වී ප්‍රමාණය**

| වර්ෂය | වැපිරූ ප්‍රමාණය (හෙක්.) | | | |
|---|---|---|---|---|
| | මඩකලපුව | | ත්‍රිකුණාමලය | |
| | මහ | යල | මහ | යල |
| 2004 | 46,050 | 46,182 | 25,022 | 7,795 |
| 2005 | 46,182 | 16,719 | 23,743 | 16,321 |
| 2006 | 46,772 | 15,498 | 16,287 | 11,027 |
| 2007 | 18,469 | 2,705 | 18,987 | 10,368 |
| 2008 | 19,134 | 17,728 | 25,022 | 7,795 |

මූලාශය: ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, 2008 සහ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

4.3 වගුව ජාතික සාමාන්‍යය සමග සසඳමින් දිස්ත්‍රික්ක දෙකේ සාමාන්‍ය අස්වැන්න පෙන්වා දෙයි. මඩකලපුව ජාතික සාමාන්‍යයට සැලකිය යුතු ලෙස පහළින් පවතින නමුත් ත්‍රි කුණාමලය ඊට සමීපය. කෙසේ වෙතත්, මේවා දිස්ත්‍රික්ක මට්ටමේ දත්ත බැවින් ඉලක්ක ප්‍රජාවන්ගේ සාමාන්‍ය අස්වැන්න බෙහෙවින් පහළ මට්ටමක පවතින්නේ ඔවුන් මුහුණදෙන බාධාවන් හේතුවෙන්යැයි අනුමාන කිරීම පරිස්සම් සහගත වේ.

**4.3 වගුව: සාමාන්‍ය වී අස්වැන්න (හෙක්ටයාරයට කි.ග්‍රෑ.)**

| වර්ෂය | ත්‍රි කුණාමලය | මඩකලපුව | ජාතික |
|---|---|---|---|
| 2004 | 4,050 | 2,997 | 4,086 |
| 2005 | 4,131 | 2,654 | 3,963 |
| 2006 | 4,104 | 3,316 | 4,137 |
| 2007 | 4,306 | 2,991 | 4,386 |
| 2008 | 4,440 | 3,805 | 4,184 |

මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (නොයෙක් වසරවල දත්ත)[6]

*වාරිමාර්ග*

මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක දෙකෙහිම මහ වැව් හා මධ්‍ය පරිමාණ වැව් තිබෙන බැවින් දිස්ත්‍රික්ක දෙකටම වී වගාව සඳහා ජල සම්පත් වෙත ප්‍රවේශ විය හැකිය (4.4 වගුව). කෙසේ වෙතත්, සියලු ප්‍රදේශවලට වසර පුරා ජල සැපයුම් වෙත ප්‍රමාණවත් ප්‍රවේශයක් තිබෙන බවක් මින් සහතික නොවේ. ජලය වෙත ප්‍රවේශ වීමට උත්සාහ කරන විටත් කලින් කල නියඟය/ගංවතුර බලපාන විටත් බොහෝ ප්‍රදේශ ගැටලුවලට මුහුණ දෙන බව සඳහන් කෙරිණ.

**4.4 වගුව: මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල පිහිටි මහ වැව් හා මධ්‍ය පරිමාණ වැව්**

| මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග යෝජනා ක්‍රම | |
|---|---|
| මඩකලපු දිස්ත්‍රික්කය | |
| ප්‍රාදේශීයලේකම් කොට්ඨාසය | සංඛ්‍යාව |
| කෝරලේ පත්තු උතුර | 3 |
| කෝරලේ පත්තු දකුණ | 2 |
| මන්මුනේ නිරිත | 3 |
| මන්මුනේ බටහිර | 2 |
| මන්මුනේ දකුණ හා එරුවිල් පත්තු | 1 |
| පොරතිව් පත්තු | 2 |

| මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග යෝජනා ක්‍රම | |
|---|---|
| ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සංඛ්‍යාව |
| කන්තලේ | 3 |
| සේරුවිල | 2 |
| මොරවැව | 4 |
| පදවිශ්‍රීපුර | 1 |
| නගරය හා කඩවත් | 1 |
| කුච්චවේලි | 5 |
| තම්පලකාමම් | 2 |
| මුතූර් | 2 |
| ගෝමරන්කඩවල | 5 |
| කින්නියා | 1 |

මූලාශ්‍රය: මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක ලේකම් කාර්යාල, 2008

වැව්වලින් සමහරක් ගැටුම් සමය පුරාම ක්‍රියාත්මකව පැවති නමුත් ගැටුමේ උත්සන්නතම අදියරේදී නිසි පරිදි නඩත්තු නොකෙරිණ. සටන් අවශ්‍යතා හේතුවෙන් විනාශ කෙරුණු වාරිමාර්ග යටිතල පහසුකම් අලුත්වැඩියා කළ යුතුය. වාරිමාර්ග පද්ධතිය එහි උපරිම හැකියාව කරා ළඟා වීමට හා දිස්ත්‍රික්කවල සියලු වී වගා ඉඩම්වලට ජලය සැපයීමට නම් වාරිමාර්ග නඩත්තුව හා කළමනාකරණය නැවත හඳුන්වා දිය යුතුය. රාජ්‍ය හා රාජ්‍ය නොවන යන දෙයාකාරයේම ආයතන වාරිමාර්ග හැකියාව වැඩි දියුණු කිරීමෙහි නිරතව සිටින නමුත් කුඩා වැව් විශාල ඒවා තරම් පුනරුත්ථාපනය කෙරෙන බවක් පෙනෙන්නට නැත. කුඩා වැවකින් ජලය සැපයිය හැකි වපසරිය ඉඩම් අක්කර 50-150 පමණ වන අතර, ගම්මාන හෝ ග්‍රාම නිලධාරි කොට්ඨාස කිහිපයක් ඉන් ප්‍රතිලාභ ලබනු ඇත. මෙම වැව් නඩත්තුව පළාත් පාලන බලධාරීන්ගේ වගකීමකි. එහෙත් ඒවා පුනරුත්ථාපනය සඳහා ආයෝජනය කළ යුතු වන්නේ බෙහෙවින් සුළු මුදලක් වුවත් අරමුදල් වෙන් කිරීමට පළාත් පාලන බලධාරීන්ට හැම විටම හැකියාවක් නැත.

[6] ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය, www.statistics.gov.lk/agriculture/Paddy%20Statistics/PaddyStatsPages/Production.html

තවත් ගැටලුවක් වන්නේ සම්බන්ධීකරණයක් නොමැතිකමයි. වැව් ක්‍රියාත්මක වන තැන්වලදී ගොවි සංවිධාන හා ඉඩම් සැකසීමට ජලය නිකුත් කිරීමේ වගකීම දරන නිලධාරීන් අතර සම්බන්ධීකරණයක් නොමැතිකම පමාවන්ට හේතු විය හැකිය. එමෙන්ම, වී වැපිරීම හා අස්වනු නෙළීම කෙරෙහි බලපෑ හැකිය.

නැගෙනහිර පළාතේ වී වගාව යල මහ කන්න දෙකේදීම සිදුවේ. වැඩිම ඉඩම් ප්‍රමාණයක් වගා කෙරෙන්නේ වැසි ජලයෙන් කෙරෙන වී වගාවේ ස්වරූපයෙන් මහ කන්නයේදීය. කෙසේ වෙතත්, ගංවතුරට ගොදුරු විය හැකි ප්‍රදේශවලදී වී හා වෙනත් බෝග වගාවන් සිදුවන්නේ වර්ෂාව අඩු යල කන්නයේදී පමණකි. මඩකලපු දිස්ත්‍රික්කයේ කිරන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මෙම තත්ත්වය බලපවත්වයි. වැසි කාලයේදී වී වගා කළ නොහැකි ගොවීහු කෘෂිකාර්මික නොවන ව්‍යවසායන්හි වැටුප් ශ්‍රමිකයන් ලෙස හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පිටත පිහිටි කෘෂි ඉඩම්වල වැටුප් ශ්‍රමිකයන් ලෙස වෙනත් විකල්ප ජීවනෝපායන්හි නිරත වෙති. වාරිමාර්ග වෙත ප්‍රවේශය පැවතීම නිසා යල කන්නයේදී වී වගාවෙහි නියැලීමට කුටුම්බවලට ඉඩ සැලසේ. වාරිමාර්ග ජලය ප්‍රමාණවත් නොවන්නේ නම් ගොවීහු එළවළු හා ජලය අඩුවෙන් අවශ්‍ය කරන වෙනත් ක්ෂේත්‍ර බෝග වගාකරති. කෘෂිකාර්මික ආයෝජන විවිධාංගීකරණයට උදව් වන්නක් වන මෙය වී ඉඩම්වල ඵලදායිතාව වැඩි කරන බැවින් මෙම පරිචය ප්‍රබල ලෙස දිරිගැන්විය යුතුය.

වාරිමාර්ග පහසුකම් නොපවතින සමහර ප්‍රදේශවලදී ප්‍රජාවෝ කෘෂි ළිං යොදා ගනිමින් ජලය අඩුවෙන් අවශ්‍ය කරන එළවළු හා වෙනත් ක්ෂේත්‍ර බෝග වගාකරති. එහෙත් කෘෂි ළිං සියලු ප්‍රදේශවලට ගැළපෙන්නක් නොවේ. විශේෂයෙන්ම භූගත ජල මට්ටම අතිශයින්ම පහළ මට්ටමක පවතින එරාවූර් පත්තු කොට්ඨාසයේ කිතුල්වැව ගම්මානය වැනි ප්‍රදේශවලට නොගැළපේ.

### *වී ගොවිතැන සම්බන්ධ නිපුණතා හා අත්දැකීම් පැවතීම*

වී නිෂ්පාදන හැකියාව ශක්තිමත් කරන ප්‍රධාන සාධකවලින් එකක් නම් නොකඩවා වී වගාවෙහි නිරත වීමට කැමති නිපුණතා හා අත්දැකීම් සහිත ගොවීන් සිටීමයි. ගැටුම් සමය පුරාම වී ගොවිතැන පිළිබඳ නිපුණතා ගොවීන් සතුව තිබිණ. සමහර ගොවීහු ගැටුම අතරතුරදීද වගා කටයුතුවල නිරත වීමට සමත්වූහ. තරුණයෝ පවා කෘෂිකර්මයෙහි ආයෝජනය කිරීමට කැමැත්තක් පෙන්නුම් කරති. නිපුණතා හා අත්දැකීම් සහිත ශ්‍රමය දිස්ත්‍රික්ක දෙකේ ඵලදායිතා මට්ටම් උපරිම කිරීමට යොදාගත හැකිය.

> *"දිගු කාලයක් එකම කුඹුරේ එක දිගටම වැඩ කරන වැටුප් ශ්‍රමිකයන් ඉන්නවා. ඒ හින්දා ඔවුන් ඉන්න බව සහතිකයි."*
>
> අවධාන කණ්ඩායම් සාකච්ඡාව, කින්නියා

### *යෙදවුම් වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම*

නිසි කාලයේදී ගුණාත්මක බිත්තර වී හා පොහොර වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීමෙන් මෙන්ම යන්ත්‍රසූත්‍ර වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීමෙන් වී වගාවේ ඵලදායිතා මට්ටම ඉහළ යනු ඇත. රජයේ සහනාධාර යෝජනා ක්‍රම පිළිබඳව දැනුවත්කම නොමැතිකමේ හා මූල්‍ය ප්‍රාග්ධනය නොමැතිකමේ ප්‍රතිඵලය වන්නේ ගුණාත්මකත්වයෙන් හීන බීජ හා පොහොර යොදාගැනීමයි.

### *බිත්තර වී*

බිත්තර වී යනු වී වගාවේ ප්‍රධාන යෙදවුම්වලින් එකකි. විවිධ ප්‍රජාවන් බිත්තර වී ලබා ගන්නේ විවිධ ස්ථානවලිනි. සමහරු ඒවා රජයේ ගොවි පොළවලින් ලබාගනිති. අනෙක් අය තමන්ගේම බිත්තර වී භාවිත කරති. නැතිනම්, රජයේ බිත්තර වී භාවිත කර ඒකාකාර කුඹුරු (එකම ගුණාත්මක බීජ වර්ගයක් යොදාගෙන වී නිපදවන කුඹුරු) පවත්වාගෙන යන පුද්ගලයන්ගෙන් මිලදී ගනිති. බිත්තර වී මුදල් ගෙවා රජයෙන් හෝ ගුණාත්මක ප්‍රමිතියෙන් යුත් වී සම්පාදනය කර ගැනීමෙන් ලබාගත හැකිය. මේ අනුව, ගොවියාට කන්නයක වී නිෂ්පාදනයෙන් කොටසක් ගබඩා කර තබාගත හැකි නම් ඔහුට/ඇයට එය රජයේ බිත්තර වී සඳහා හුවමාරු කළහැකිය. අධ්‍යයනය කළ දිස්ත්‍රික්කවලදී ලබාගත හැකි වීම,

ප්‍රවේශ විය හැකි වීම, ගුණාත්මකත්වය හා බිත්තරවීවල පිරිවැය සම්බන්ධයෙන් අඩුපාඩුකම් පවතින අතර (පහත විස්තර වේ), එහි ප්‍රතිඵලයක් ලෙස උපරිම නිෂ්පාදන හා ඵලදායිතා හැකියාව කරා ළඟා වීමේදී බොහෝ බාධාවන්ට මුහුණ පෑමට සිදුවී ඇත.

රජයෙන් සැපයෙන බිත්තර වී ගොවීන්ගේ බිත්තර වී වලට වඩා හොඳ ගුණාත්මකත්වයකින් යුක්තය. ගොවීන්ගේ වී බොහෝ විට වල් පැළෑටි බීජ සමග මිශ්‍ර වී ඇති අතර, බහුකාර්ය ගොයම් කැපීමේ යන්ත්‍ර යොදා ගතහොත් බීජවලට හානි වී පැළවන ප්‍රමාණය අවම වී ඵලදායිතාව පහත වැටිය හැකිය. ගුණය වඩා හොඳ නමුත් රජයේ බිත්තර වී වෙත ප්‍රවේශ වීමේදී සමහර බාධා පවතී. ඒවා ලබා ගත හැක්කේ තමන්ගේම ඉඩම්වල වගා කරන ගොවීන්ට පමණකි. අඳ ගොවීන් රජයේ බිත්තර වී ලබාගැනීමට නම් ඊට පෙර ඉඩම් හිමියාගෙන් ලිපියක් ලබාගත යුතු බැවින් ක්‍රියාවලිය පමා වේ. බොහෝ සුළු පරිමාණ ගොවීහු රජයේ ගොවි පොළවලින් බිත්තර වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳවද නොදනිති. රජයෙන් සැපයෙන බිත්තර වීවල මිල සමහර දුප්පත් ගොවීන්ට ඔරොත්තු නොදේ. එබැවින් ඔවුහු තමන්ගේම බිත්තර වී භාවිත කරති. මෙය ඵලදායිතාව අහිමි වීමට හේතු වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති සේවාවන් (සම්පත් පිළිබඳ ගැටලු නිසා) සීමා වී ඇති අතර, ලබා ගත හැක්කේ කිනම් සේවාවන් දැයි ගොවීන් තව දුරටත් දැනුවත් කිරීමට ඊට තිබෙන හැකියාව එමගින් සීමා වී ඇත.

*පොහොර*

වී ගොවිතැන සඳහා සැපයෙන පොහොර සහනාධාරය වී වගාවෙහි නිරත වීම සඳහා ගොවීන්ට සැපයෙන විශාල දිරි ගැන්වීමකි. ගැටුමෙන් පීඩාවට පත් වූත්, නැවත පදිංචි වී ඇත්තා වූත් වී වගාවට මුල පිරීම ආරම්භ කිරීමට සිදුව තිබෙන්නා වූත් ගොවීන්ට මෙය විශේෂයෙන්ම අදාළ වේ. කි.ග්‍රෑ.50 යූරියා පොහොර ගෝනියක සහනාධාර අලෙවි මිල රු.350ක් වන නමුත් ගොවීන්ට අලෙවි කෙරෙන මිල ප්‍රවාහන වියදම අනුව වෙනස් වේ.

> *"රජයේ සහනාධාරය රු 35 යි. ප්‍රවාහන වියදම් එක්ක ගත්තාම රු 450ක් රු.500ක් වෙනවා."*
>
> අවධාන කණ්ඩායම් සාකච්ඡාව, ගෝමරන්කඩවල

කුඹුරු ඉඩම් ලියාපදිංචියක් නොමැති අඳ ගොවීන්ට බිත්තර වී මෙන්ම පොහොර සහනාධාරයද ලබා ගත නොහැකිය. ඉඩම් හිමියන්ගෙන් අනුමැතිය පළකරන ලිපියක් ලබාගැනීමේ ක්‍රියා පටිපාටිය බොහෝ දෙනෙකු නොදන්නා අතර, මෙය අවසන් වන්නේ ඉහළ මිල ගණන්වලට පොහොර මිලදී ගැනීමෙනි. කුඹුරු ඉඩම් ලියාපදිංචියක් (PLR) නොමැති ගොවීන්ට සහනාධාර මිල යෝජනා ක්‍රමයට ප්‍රවේශ විය නොහැකිය. අධ්‍යයනය කළ ප්‍රජාවන් තුළ වෙසෙන බොහෝ ගොවීන් අඳ ගොවීන් බැවින් හා සමහර අයට කුඹුරු ඉඩම් ලියාපදිංචියක් නොමැති බැවින් පවත්නා පහසුකම් පිළිබඳව දැනුවත්කම ඇති කිරීමත් හොඳ ගුණාත්මක පොහොර වෙත ප්‍රවේශ වීමට සහාය වීමත් තීරණාත්මක වේ.

අනෙක් බාධාවන් වන්නේ පොහොරවල ගුණාත්මකත්වය පිරිහෙමින් තිබෙන බව පෙනීයාම හා පොහොර ගබඩා කරන ස්ථානය ගොවි ඉඩම්වලට තරමක් දුරින් පිහිටා තිබීමයි.

> *"රජයෙන් ලබා දෙන පොහොරවල ගුණාත්මකත්වය ඉතා හොඳ මට්ටමක තිබුණා. ඒත් දැන් ඒ මට්ටම ටිකක් පහත වැටිලා. දේශීය වශයෙන් පොහොර සංස්ථාවේදී නිපදවෙන යූරියා පොහොර ගුණාත්මකව ඉතා හොඳයි. ඒත් දැන් අපට ලැබෙන පොහොර ගේන්නේ මලයාසියාවෙන්. ඒවා ඉතා හොඳ ගුණාත්මක මට්ටමක නැහැ."*
>
> අවධාන කණ්ඩායම් සාකච්ඡාව, ගෝමරන්කඩවල

මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල පොහොර ගබඩා කිරීමේ පහසුකම් නොපවතී. ගබඩා පහසුකම්වලින් බොහොමයක් යුද්ධයේ බලපෑමට ලක් විය. එය මේ දිස්ත්‍රික්ක දෙකෙහි ගොවීන්ට බලපායි.

කාබනික පොහොර භාවිත කිරීමේ වාසි හා අකාබනික පොහොරවල අහිතකර ප්‍රතිවිපාක ගැන දැන සිටියත් වගාව සඳහා කාබනික පොහොර භාවිතය ගොවීන් අතර දක්නට ලැබෙන්නේ අවම වශයෙනි. වී සහ එළවළු වගාව සඳහා කාබනික ක්‍රම භාවිත කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ව්‍යාප්ති සේවාවන් හා පුහුණු සපයයි. එහෙත්, කාබනික ක්‍රම යටතේ කෙරෙන නිෂ්පාදනය සඳහා වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය වීම හා ලාභ ලැබීමට කල් යාම වගාව සඳහා කාබනික ක්‍රම යොදා ගැනීමෙන් මේ ගොවීන් වළක්වන ප්‍රධාන හේතු ලෙස පවතී.

බෙදාහැරීම පමා වීම, විශාල ප්‍රවාහන වියදම හා ගුණාත්මකත්වය පිරිහෙමින් පැවතීම පොහොර සහනාධාරයේ අපේක්ෂිත ප්‍රතිඵල මුදුන් පමුණුවා ගැනීම වළක්වන තවත් පැතිකඩවල් කිහිපයකි. වැරදි මූල්‍ය කළමනාකරණය, දූෂණය හා ඍජු හෝ වක්‍ර අල්ලස් ගැනීම් යනු මෙම ජාතික ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක වීමට බාධා කරන තැතිගන්වනසුලු සාධක වේ. මුදල් හැසිරවීම සමග ඍජුව සම්බන්ධ මේ ප්‍රතිපත්තිමය මුල පිරීම වඩා හොඳින් නිරීක්ෂණය කිරීම අත්‍යවශ්‍යය.

*කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර*

යුද්ධයෙන් පසුව ප්‍රවාහනය පිළිබඳ සීමාවන් ක්‍රමයෙන් ලිහිල් කිරීම දිස්ත්‍රික්ක දෙකේ කෘෂිකර්මය යාන්ත්‍රීකරණයට ආධාර වී ඇත. බහුකාර්ය ගොයම් කැපීමේ යන්ත්‍රය වැනි මහා පරිමාණ යන්ත්‍රසූත්‍ර දැන් දිස්ත්‍රික්කය තුළ පැවතීම හා යන්ත්‍රසූත්‍ර යොදා ගැනීම ශ්‍රම හිඟය ජය ගැනීමටත් කාර්යක්ෂමතාව වැඩි කිරීමටත් උපකාර වී ඇත. වී වගාව මේ දැන් ආරම්භ වී තිබූ ප්‍රදේශවල ගොවීන්ට (උදාහරණයක් ලෙස, ගෝමරන්කඩවල) සීසෑම හා අස්වනු නෙළීම සඳහා යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීමට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් නැත.

යන්ත්‍රසූත්‍ර භාවිතය නිසා කුඹුරු ඉඩම්වල ඵලදායිතාව වැඩිවිය හැකි නමුත් එහි ඍණාත්මක බලපෑම්ද පැවතිය හැකි බව ගොවීහු දැන සිටියහ. බහුකාර්ය ගොයම් කැපීමේ යන්ත්‍රයෙන් අස්වනු නෙළා ලබා ගන්නා වී අතින් අස්වනු නෙළා ලබා ගන්නා වීවලට වඩා ගුණාත්මකත්වයෙන් අඩු විය. එමෙන්ම, යන්ත්‍රය නිසා බීජවලට හානි වී ඒවා බිත්තර වී ලෙස ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයට පත් විය හැකිය.

*"මේ ගමේ අපට එක ට්‍රැක්ටරයක් වත් නැහැ. සමහර හදිසි අවස්ථාවල අපි යොදා ගන්නේ බහුකාර්ය ගොයම් කැපීමේ යන්ත්‍රය. උදාහරණයක් විදියට, වැස්ස එනවා නම් ඊට ඉස්සර වෙලා අස්වනු නෙළා අවසන් කර ගන්න අපට වුවමනා නම් අපි බහුකාර්ය ගොයම් කැපීමේ යන්ත්‍රයක් කුලියට ගන්නවා. ඒත් අපි බහුකාර්ය ගොයම් කැපීමේ යන්ත්‍රය යොදා ගත්තොත් අස්වනු ගුණාත්මකත්වය හොඳ නැහැ. අනෙක් කාරණේ තමයි අපට යන්ත්‍රයක් කුලියට ගන්න වෙන්නේ මැදවච්චියෙන්."*

අවධාන කණ්ඩායම් සාකච්ඡාව, ගෝමරන්කඩවල

කුඹුරු ඉඩම් සමග පවත්නා සම්බන්ධතාව දුර්වල නිසා යන්ත්‍රසූත්‍ර භාවිතය සීමා වේ. යෙදවුම් ගොවිපොළ වෙත ප්‍රවාහනය කිරීම හා අස්වනු ගොවි පොළෙන් බැහැරට ගෙන යාමද සීමා වේ. ගැටුම අතරතුර දී බොහෝ මාර්ග හානි විය. ඒවා නැවත ගොඩනැගිය යුතුව ඇත. මාර්ගවල තත්වය දුර්වල වීම නිසා අමතර ප්‍රවාහන පිරිවැය දැරීමට සිදු වීමෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යයි.

*පාරිසරික සාධක*

අධ්‍යයනය කළ සෑම ප්‍රජාවකදීම පැවති වඩාත්ම පොදු තර්ජනය එල්ල වූයේ කුඹුරු හා වෙනත් කෘෂිකාර්මික බෝග විනාශ කරන වල් අලින්ගෙනි. රට තුළ මෙම ප්‍රශ්නයට මුහුණ දෙන වෙනත් ප්‍රදේශවලදී විදුලි වැටවල් යෙදීමෙන් වඩා ධනාත්මක බලපෑම් ඇති වී තිබුණත් ඒවා නොමැති තත්වය තුළ ගොවීහු අලින් හඹා යාම සඳහා සාර්ථකත්වයෙන් අඩු සාම්ප්‍රදායික විධික්‍රම යොදා ගනිති. වගා රක්ෂණය වැනි රජයෙන් ලබාගතහැකි වන්දි යෝජනා ක්‍රම ආශ්‍රිත පමා වීම් හා ඒ සඳහා දැරීමට සිදු වන පිරිවැය නිසා ගොවීන් ඒවා නිරර්ථක යැයි සලකන තත්වයක් පවතී.

*"අස්වනු හානි වුණාම වන්දි ගෙවන්න ගොවිජන සේවා එකෙන් හඳුන්වා දුන් රක්ෂණ යෝජනා ක්‍රමයක් තියෙනවා. වන්දි ඉල්ලීමේ ක්‍රියාවලිය දීර්ඝයි, දුෂ්කරයි, වියදම්කාරීයි. වන්දි ලබා ගන්න නම් සිද්ධිය පිළිබඳ සාක්ෂි ඉල්ලනවා. ඉතිං අපි ඡායාරූප ඉදිරිපත් කළ යුතුයි. හොරොව්පතානේ ස්ටුඩියෝ එකෙන් එන කට්ටිය ඡායාරූපවලට රු.7,000ක් ඉල්ලනවා. අපට දරන්න සිද්ධ වෙන පිරිවැයත් එක්ක බලන කොට වන්දිය සෑහෙන්නේ නැහැ."*

අවධාන කණ්ඩායම් සාකච්ඡාව, ගෝමරන්කඩවල

ගංවතුර හා නියගයද ගැටලුවකි. ගංවතුරට වඩාත්ම ගොදුරු වීමට ඉඩ තිබෙන්නේ කිරන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි. වැසි සමයේදී කුඹුරු ඉඩම් සියල්ලම ජලයෙන් යට වේ. මහ කන්නයේ වී වගාව කළ නොහැකි තත්වයක් නිතරම පාහේ ඇති වේ. ගංවතුර අගල් පද්ධතිවලට හා කණ්ඩිවලට හානි කරයි. ඉඩම් සැකසීම දුෂ්කර තත්වයට පත්වෙයි. මේ නිසා සෑම කන්නයකදීම ඉඩම් සැකසීමට වැඩි කාලයක් හා ආයෝජනයක් අවශ්‍ය වෙයි.

### *ඉඩම වෙත ප්‍රවේශය*

දිස්ත්‍රික්ක මට්ටමේ වැඩමුළුවලදී හා ප්‍රධාන තොරතුරුකරුවන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවලදී සාකච්ඡා කළ පරිදි මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල වගා කිරීම සඳහා ඉඩම් පැවතීම වී වගාව පුළුල් කිරීමට පමණක් නොව වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරීම සඳහාද අවස්ථාවක් ලෙස හඳුනා ගත හැකිය.

කෙසේ වෙතත්, විධිමත් නීතිමය හිමිකම් නොමැතිකම, අධිආරක්ෂිත කලාප වෙන් කිරීම හා විසම භූවිෂමතා ලක්ෂණ වැනි සාධක නිසා මෙම ඉඩම් වෙත ප්‍රවේශය සීමා වී ඇත. වැඩි ඉඩම් ප්‍රමාණයක් වැපිරීම වී වගාවේ නිරතව සිටින දුප්පත් ගොවීන්ට වැඩි ඉඩම් හිමිකමක් ලැබීමේ ප්‍රතිඵලයක් නොවන බව අධ්‍යයනය කළ ප්‍රදේශවල වෙසෙන ගොවීන්ට දැනේ. මේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති කුඹුරු ඉඩම්වල හිමිකරුවන් පිටස්තරයන්ය. කුඹුරු ඉඩම්වල අයිතිය තිබෙන ගම්මුන් සිටින්නේ සීමිත සංඛ්‍යාවක් පමණකි.

මඩකලපුව හා ත්‍රි කුණාමලය යන දිස්ත්‍රික්ක දෙකේදීම ඉඩම විවාදාත්මක ගැටලුවක් බවට පත් වී ඇත. සමහර ඉඩම් හිමියෝ ගැටුම අතරතුරදී තම කුඹුරු ඉඩම් අතහැර දමා දිස්ත්‍රික්කයෙන් පිටතට සංක්‍රමණය වූහ. වෙනත් පුද්ගලයන් හිමිකරුවන්ට නොදන්වා මේ ඉඩම්වල ගොවිතැන් කිරීමට පටන් ගෙන ඇත. දේශීය වශයෙන් හෝ විදේශීය වශයෙන් සංක්‍රමණය වී අඳ ගොවීන් ලෙස ඉඩම් වගා කරන තවත් ගොවීහු කණ්ඩායමක්ද ඉඩම්වල සිටිති. යුද්ධය අවසන් වීමත් සමග හිමිකරුවන් ආපසු පැමිණ තම ඉඩම්වල හිමිකම නැවත ඉල්ලා දිගු කලක් මෙම ඉඩම් වගා කිරීමට අවස්ථාවක් ඇතැයි සිතා සිටි අය ඉවත් කරමින් සිටින බව පෙනේ. හිමිකම නොමැතිකම නිසා ගොවීන් තමන් වගා කරන ඉඩමේ ඵලදායිතාව වැඩි දියුණු කිරීමට ආයෝජනය කිරීමෙන් වැළකීමේ අනතුරද පවතී. එමෙන්ම, ඉහත සාකච්ඡා කළ රජයෙන් සැපයෙන (පොහොර වැනි) යෙදවුම් සහනාධාර යෝජනා ක්‍රම වෙත ප්‍රවේශ වීම කෙරෙහිද එය බලපායි. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේදී ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක් අධිආරක්ෂිත කලාප ලෙස ප්‍රකාශයට පත් කෙරිණ. ගල් අඟුරු බලාගාරයක් ඉදි කිරීම සඳහා සහ දැන් සාම්පූර් ඇතුළු ග්‍රාම නිලධාරි කොට්ඨාස පහක් ඇතුළත් වන පරිදි ගොඩනැගෙමින් තිබෙන 'ආර්ථික කලාපය' සඳහාද කුඹුරු ඉඩම් අක්කර 2,500ක් වෙන් කර ඇත. මෙය ප්‍රදේශය තුළ ඉඩම් නොමැතිකම පිළිබඳ ගැටලුවක් නිර්මාණය කර ඇත.

මඩකලපුව විෂම භූ විෂමතා ලක්ෂණ පිළිබඳ ගැටලුවට මුහුණ දෙන බැවින් භූමිය සමතලා කිරීමට සැලකිය යුතු ප්‍රාග්ධන ආයෝජනයක් අවශ්‍ය වේ. ඉඩම සමතලා නොවීම වාරිමාර්ගවල කාර්යක්ෂමතාව අඩු කරයි. එමෙන්ම, ඵලදායිතාව හීන වීමට හේතු වේ. මඩකලපු දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශවල හා ත්‍රිකුණාමලයේ කින්නියා කොට්ඨාසයේ ඇති පසේ ලවණ ගතියද ඵලදායිතාව කෙරෙහි බලපායි. බෝග මාරු කිරීමක් සිදු නොවීම හා එකදිගටම වී වගා කිරීම නිසා මෙම ගැටලුව උග්‍ර වී ඇත.

### *අගය එකතු කිරීම වැඩි කිරීම*

වැඩි වශයෙන් වී අලෙවි කෙරෙන්නේ කිසිදු අගයක් එකතු නොකර වී හැටියටමය. වී කොටන තැන්වලදී - උදාහරණයක් ලෙස අයිලාඩි හා කින්නියා ප්‍රදේශවලදී - එය කෙරෙන්නේ ග්‍රාමීය මට්ටමේ සුළු පරිමාණ සහල් මෝල්වලය. වෙළඳපොළේ අලෙවි කරනවාට වඩා පරිභෝජනය සඳහා ප්‍රයෝජනයට ගැනේ. (ප්‍රධාන තොරතුරුකරුවන් පැවසූ පරිදි) අධ්‍යයනය කළ ප්‍රදේශවල සිටි ගොවීන්ගෙන් 98% කටත් වඩා කිසිදු සකස් කිරීමකින් තොරව අමු වී අලෙවි කළ අතර, වී ගබඩා කර පසුව සැකසීමට හැකියාව තිබුණේ 2%කට පමණකි.

සහල් ලෙස ප්‍රාදේශීය මට්ටමේදී අගය එකතු කිරීම, සහල් පදනම් කරගත් නිෂ්පාදන සහ දහයියා හා නිවුඩ්ඩ වැනි වී ආශ්‍රිත අපතේ යන ද්‍රව්‍ය නිෂ්පාදකයන්ට ඉහළ ලාභ අත් කර දෙනු ඇත. මෙය ඔවුන්ට තම ණය චක්‍රයෙන් ගොඩ ඒමට උපකාර වන අමතර ආදායම් මූලාශ්‍රයන්ද සම්පාදනය කරනු ඇත. අගය එකතු කිරීමට පවතින ප්‍රධාන බාධාවන් වන්නේ ආරම්භක ප්‍රාග්ධනය නොමැතිකම, පවත්නා අගය එකතු කිරීමේ මධ්‍යස්ථානවලට පවතින දුර හා අගය එකතු කළ නිෂ්පාදන සඳහා සහතික වෙළඳපොළක් නොමැතිකමයි.

මේ මට්ටමේදී අගය එකතු කිරීමක් නොමැති වීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ ප්‍රදේශය තුළ නව තාක්ෂණය සහිත විශාල මෝල් නොමැතිකමයි. විශාල මෝල් පිහිටා තිබෙන්නේ ප්‍රජාවන්ගෙන් ඈත බැවින් (ආසන්නතම වාණිජ පරිමාණ මෝල පිහිටා තිබෙන්නේ යාමට පැය 2ක් ගතවන හොරොව්පතානේ ගෝමරන්කඩවලයේ) ඒ සඳහා ගොවීහු උනන්දුවක් නොදක්වති. ප්‍රවාහන පිරිවැය දැරීමටද ඔවුන්ට හැකියාවක් නැත.

> *"කිට්ටුව මෝල් තියෙනවා නම් අපට පුළුවන් මෝලට යන්න ගතවෙන කාලය ඉතුරු කරගෙන ඒ කාලය වෙනත් ඵලදායක වැඩකට යොදාගන්න."*
>
> අවධාන කණ්ඩායම් සාකච්ඡාව, ගෝමරන්කඩවල

මාර්ගවල තත්වය දුර්වල නිසා තත්වය තවත් උග්‍ර වේ. උදාහරණයක් ලෙස, අයිලාඩි ගමේ මායිමේ මෝලක් පිහිටා ඇතත් මාර්ගවල තත්වය දුර්වල බැවින් ප්‍රවේශ විය නොහැකිය.

> *"මේ ගමේ කුඩා මෝලක් තියෙනවා. ඒගොල්ලෝ මහා පරිමාණයෙන් වී කොටන්නේ නැහැ. මේ මෝලේ කොටන්නේ පරිභෝජන අවශ්‍යතාවලට විතරයි. ඒක කරන්නේ ගාස්තුවක් අය කරලා. අපි වී කිලෝවකට රු.5ක් ගෙවනවා."*
>
> අවධාන කණ්ඩායම් සාකච්ඡාව, අයිලාඩි, කින්නියා

වාණිජ පරිමාණයකින් සහල්පිටි නිපදවීම සඳහාද පහසුකම් නැත. අගය එකතු කළ නිෂ්පාදන සැකසීමක් කළ හොත් ඒවා මිලදී ගන්නා බවට පෞද්ගලික අංශයෙන් සහතිකයක් ලැබී නැත. මීට අමතරව, සහල් පදනම් කර ගත් නිෂ්පාදන සකස් කිරීම සම්බන්ධ පුහුණුව හා තාක්ෂණය සැපයීමේ අවශ්‍යතාවක්ද පවතී. පෞද්ගලික අංශය හෝ රාජ්‍ය නොවන සංවිධාන කොන්ත්‍රාත්තු ගොවිතැනෙහි යෙදීමට ප්‍රයත්නයක් දරන්නේ නම් ව්‍යාප්ති සේවාවන් සැපයීමට රජය බලාපොරොත්තු වන බව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ වැඩමුළුවලින් ලද තොරතුරුවලින් හෙළි වේ. සහල් පදනම් කරගත් අගය එකතු කළ නිෂ්පාදන සඳහා අවශ්‍ය තාක්ෂණය ප්‍රාදේශීය මට්ටම තුළ නැත. මෙම ඉලක්ක ප්‍රජාවන්ගෙන් බොහොමයක විදුලි බලය නොමැතිකම (කලින් සාකච්ඡා කෙරිණ) බාධකයක් ලෙස ක්‍රියා කරයි.

සාමාන්‍ය නිෂ්පාදන කණ්ඩායම් සමග සසඳන විට ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ වැනි සමහර ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් ඉතා සුළු පරිමාණයෙන් නමුත් වී හා සම්බන්ධ අගය එකතු කිරීමේ ක්‍රියාවලිවල නිරත වෙති. පළමු වන ඇමුණුමෙහි ඇතුළත් 3වන වගුවේ (ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් විස්තර කරන වගුවේ) දක්වා ඇති පරිදි, කිරන්හි ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ එක්කෝ අස්වනු නෙළන කාලයේදී වී මිලදී ගෙන හෝ වී ආශ්‍රිත වැටුප් ශ්‍රම ක්‍රියාකාරකම් සඳහා

ගෙවීම් ලෙස ලැබෙන වී රැස් කරගෙන නිවසේ ගබඩා කර ගනිති. ඔවුහු ඒවා නිවසේදී තම්බා කොටා අවාරයේදී අසල්වැසි ගම්මානවල අලෙවි කරති.

අගය එකතු කිරීමේ මෙම ක්‍රියාවලි ශක්තිමත් කොට තවදුරටත් වැඩි දියුණු කිරීම දෙයාකාරයකින් කළ හැකිය: සහල් කෙටීම, සහල් පදනම් කරගත් නිෂ්පාදන හා වී ආශ්‍රිත අපතේ යන ද්‍රව්‍ය පදනම් කරගත් නිෂ්පාදන සඳහා ප්‍රජාවන් තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ඇති කළ හැකිය. නොඑසේ නම්, තම ක්‍රියාකාරකම් වර්ධනය කරගැනීම සඳහා සහ ගොවි කුටුම්බවලින් ශ්‍රමය හා වී සපයාගෙන වටිනාකම් දාමයේ තමන්ට පහළින් සිටින ක්‍රියාකාරකයන් සමග එක්වීම සඳහා වටිනාකම් දාමයේ තව දුරටත් ඉහළට නැගගැනීමට පුද්ගලයන්ට (උදා. මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට) සහාය විය හැකිය. ප්‍රජාමූල මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පාලනය කිරීම හා ක්‍රියාත්මක කිරීම ලාභ බෙදාහදා ගැනීමේ පදනමක් මත නිෂ්පාදක කණ්ඩායම් මාර්ගයෙන් සිදුවීමට සැලැස්විය හැකි අතර, සහල් කෙටීම හා ඉඳිආප්ප වැනි සහල්පිටි පදනම් කරගත් නිෂ්පාදන පිළිබඳව දැනටමත් අත්දැකීම් තිබෙන, ගොදුරු වීමට ඉඩ ඇති ප්‍රජාවන්ගේ නිෂ්පාදකයන්ද ඊට ඇතුළත් කරගත හැකිය.ගොදුරු වීමට ඇති ඉඩකඩ/ආබාධිතත්වය අනුව වටිනාකම් දාම ක්‍රියාවලිය ඔස්සේ විවිධ කණ්ඩායම් විවිධ ක්‍රියාකාරකම්වල නිරතව සිටින තැන්වලදී සාමූහික නිෂ්පාදනය හඳුන්වා දිය හැකිය.

දිගු කාලයේදී නාගරික මධ්‍යස්ථාන කරා ව්‍යාප්ත කිරීමේ අභිමතාර්ථය ඇතිව කෙටි කාලයේදී ඉලක්ක ප්‍රජාවන් තුළ තිරසර කරනු පිණිස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වඩා යහපත් සැපයුම් හා වෙළඳපොළ මාර්ග සමග සම්බන්ධ කිරීමත් සමස්ත නිෂ්පාදන හා වටිනාකම් දාම ක්‍රියාවලියට ඒකාබද්ධ කිරීමත් කළ යුතුය. සහල් පදනම් කරගත් නිෂ්පාදන හා වී ආශ්‍රිත අපතේ යන ද්‍රව්‍ය පදනම් කරගත් නිෂ්පාදන සඳහා කුකුළු ගණයේ සතුන්ට ආහාර මිල දී ගන්නන් හා විස්කෝතු නිෂ්පාදකයන් අතර වෙළඳ පොළක් පැවතිය හැකි බැවින් ඔවුන් හඳුනාගෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සමග සම්බන්ධ කළ යුතුය.

### *වී අලෙවි කිරීමේ හැකියාව වැඩි කිරීම*

අධ්‍යයනයේ ඉලක්ක කණ්ඩායම සමන්විත වූයේ වැඩි වශයෙන් පරිභෝජනය සඳහා නමුත් අතිරික්තය අලෙවි කිරීමේ අදහසද ඇතිව වී නිපදවන කුඩා ගොවීන්ගෙනි. කෙසේ වෙතත්, වෙළඳපොළ බොහෝ දුරට මිලදී ගන්නන්ගේ වෙළඳ පොළක් වන බැවින් මිල තීරණය කිරීමේදී සහ/හෝ විකල්ප වෙළඳ පොළ අවස්ථාවන් වෙත ප්‍රවේශ වීමේදී ගොවීන්ට ඇත්තේ සුළු පාලනයකි. මේ සඳහා බලපාන බොහෝ හේතු පහත විස්තරාත්මකව දැක්වෙන අතර, ජීවනෝපාය හා අගය එකතු කිරීමේ මැදිහත් වීම් සඳහා වන නිර්දේශ ලෙසද ඒවා යොදාගත හැකිය.

මඩකලපුවේදී හා ත්‍රිකුණාමලයේදී අපගේ ඉලක්ක කණ්ඩායමෙහි සිටි බොහෝ ගොවීන් සිය වී අලෙවි කරන්නේ දිස්ත්‍රික්කය තුළ ය. ප්‍රධාන මිලදී ගන්නෝ දෙදෙනෙකි: එනම්, සහතික මිල යෝජනා ක්‍රමය යටතේ රජය වෙනුවෙන් මිලදී ගන්නා විවිධ සේවා සමුපකාර සමිති (MPCS) (මිලදී ගන්නේ මුළු නිෂ්පාදනයෙන් 5-10%ක් පමණකි, ලියාපදිංචි ගොවීන්ගෙන් පමණකි) සහ ප්‍රාදේශීය වෙළඳුන්ය. මහා පරිමාණ පෞද්ගලික අංශයේ බොහෝ ආයතන කෘෂි රසායනික යෙදවුම් අලෙවියෙහිලා සම්බන්ධ වන නමුත් වී අලෙවියෙහිලා සම්බන්ධ වන්නේ සුළු වශයෙනි.

දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදකයන් තම වී දිස්ත්‍රික්කය තුළ අලෙවි කිරීමට කැමැත්තක් දක්වතත් අධ්‍යයනය සිදු කළසමයේදී (ත්‍රිකුණාමලයේ මෙ.ටො. 74,293ක් හා මඩකලපුවේ මෙ.ටො. 157,335ක් වශයෙන්) දිස්ත්‍රික්ක දෙකෙහිම අතිරික්ත වී නිෂ්පාදනයක් පැවතිණ. ජාතික මට්ටමේ නිෂ්පාදනය 4.5 වගුවේ දක්වා ඇති පරිදි විය. කෙසේ වෙතත්, හිඟයක් පෙන්නුම් කරන දිස්ත්‍රික්ක පවත්නා බැවින් නැගෙනහිර පළාත රටේ සෙසු ප්‍රදේශ සමග සම්බන්ධ කර රජය විසින් සිදු කෙරෙන මාර්ග යටිතල පහසුකම් සංවර්ධනයත් සමග ත්‍රිකුණාමලයේ හා මඩකලපුවේ අතිරික්ත වී බස්නාහිර පළාත හා මධ්‍යම පළාත වැනි ප්‍රදේශවලට සැපයිය හැකිය.

අලෙවිකරණ ක්‍රියාවලියේදී මීට වඩා විශාල කාර්යභාරයක් ඉටු කිරීමට පෞද්ගලික අංශය දිරි ගැන්වීමෙන් දිස්ත්‍රික්කයෙන් පිටත වී අලෙවිය ප්‍රවර්ධනය කළ හැකය. පෞද්ගලික වෙළඳුන් හා පුද්ගලයන් වී මිල දී ගැනීමෙහි නිරත වන නමුත් ඔවුහු අංශය උදෙසා දිගු කාලීන සහායක් සම්පාදනය නොකරති. ඔවුන් දකිනු ලබන්නේ වී අංශයට සහාය දෙන්නන් ලෙස නොව එය සූරා කන්නන් ලෙසය. සැලකිය යුතු ගොවි ජාලයක් වෙත ප්‍රවේශ වීමේ හැකියාව ඔවුන්ට තිබෙන නිසා නිෂ්පාදකයාට හා මිල දී ගන්නාට යන දෙදෙනාටම සාධාරණ හා ලාභදායක වන අයුරින් මෙම හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කළහැකිය. මෙම පෞද්ගලික අලෙවිකරුවන් වෙත සාමූහිකව අලෙවි කිරීමට ගොවීන් දිරිගැන්විය යුතුය. ඉන් ඔවුන්ගේ කේවෙල් කිරීමේ බලය වැඩි වනු ඇත. එමෙන්ම, පෞද්ගලික අංශයට අඛණ්ඩ සැපයුමක්ද සහතික වනු ඇත.

**4.5 වගුව: 2010දී දිස්ත්‍රික්ක අනුව වී අතිරික්තය/හිඟය (මෙ.ටො.)**

| දිස්ත්‍රික්කය | මහ 2009/10 | යල 2010 | 2010 වසර සඳහා එකතුව | මානව පරිභෝජනය සඳහා වාර්ෂික වී අවශ්‍යතාව | එකතුව |
|---|---|---|---|---|---|
| ත්‍රිකුණාමලය | 106,727 | 39,752 | 146,479 | 61,965 | 74,293 |
| මඩකලපුව | 193,274 | 74,563 | 267,837 | 90,421 | 157,335 |
| ජාතික එකතුව | 2,629,566 | 1,559,493 | 4,189,059 | 3,443,419 | 473,718 |

මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2010

අස්වනු නෙළූ වහාම වී අලෙවි කිරීමට හේතුව ගබඩා පහසුකම් නොමැතිකම හා නිෂ්පාදකයන් දරා සිටින ණය පියවා ගැනීමේ අවශ්‍යතාවයි. මේ අනුව මෙය මෙම කාල පරිච්ඡේදය තුළ පවතින ඉහළ සැපයුම නිසා ඔවුන්ට අඩු මිලක් ලැබීමට හේතු වේ. විවිධ සේවා සමුපකාර සමිති සම්බා සහල් සඳහා ඉතා අඩු මිලක් ගෙවන නමුත් අනෙක් සහල් වර්ග සඳහා පිරිනමන මිල ගණන් පෞද්ගලික වෙළඳුන් ගෙවන මිල ගණන්වලට වඩා ඉහළ මට්ටමක පවතින අතර, ගැටලුව වී ඇත්තේ ඔවුන් ඉතා ඉහළ ගුණාත්මකත්වයක් සහිත වී ඉල්ලා සිටීමයි. එමෙන්ම, ඔවුන් කරන ගෙවීම් ලබාගැනීමට සතියක සිට දින 10කට ආසන්න කාලයක් ගතවේ. මේ හේතු නිසා බොහෝ නිෂ්පාදකයෝ වඩා අඩු මිලකට වුවත් ප්‍රාදේශීය වෙළඳුන්ට වී අලෙවි කිරීමට කැමැත්තක් දක්වති. ප්‍රජාවට වඩා සමීප ස්ථානයක ගබඩා පහසුකම් සම්පාදනය කිරීමෙන් සහ වඩා විධිමත් හා ප්‍රවේශ විය හැකි මූල්‍ය සේවා යෝජනා ක්‍රම සඳහා පහසුකම් සැපයීමෙන් වී ගබඩා කරගෙන මිල ඉහළ යන අවාරයේදී ඒවා අලෙවි කිරීමට නිෂ්පාදකයාට අවස්ථාවක් ලැබෙනු ඇත.

ගැටුමට පෙර බොහෝ ප්‍රජාවන් තුළ පැවති භෞතික වෙළඳපොළ යටිතල පහසුකම් යුද්ධයෙන් විනාශ වී ඇත. තම අස්වැන්න ප්‍රාදේශීය වෙළඳ මධ්‍යස්ථානවල අලෙවි කරන විට තමන්ට වැඩි කේවෙල් කිරීමේ බලයක් ලැබෙන බව ගොවීන්ට හැඟිණ. ඊට හේතුව මෙම මධ්‍යස්ථාන හරහා ඔවුන්ට පිටස්තර වෙළඳපොළවල මිල තොරතුරු ලබා ගැනීමට අවස්ථාව ලැබීමයි. 'පොළ' වැනි සමහර භෞතික වෙළඳපොළවල් තවමත් පවතින නමුත් ඒවායේ වැඩි අවධානය යොමු වන්නේ ප්‍රජාවේ අස්වැන්න පිටස්තර වෙළඳපොළ සමග සම්බන්ධ කිරීමට නොව පිටස්තර ප්‍රදේශවලින් ලබා ගත් භාණ්ඩ ප්‍රදේශය තුළඅලෙවි කිරීම කෙරෙහිය. මෙම ප්‍රාදේශීය වෙළඳපොළවල් ප්‍රවර්ධනය කිරීම තම නිෂ්පාදන තම ප්‍රදේශ තුළ ඍජුවම අලෙවි කර ගැනීමට නිෂ්පාදකයන්ට අවස්ථාවක් ලබා දෙනු ඇත.

*"ප්‍රාදේශීය වෙළඳපොළ වඩා පුළුල් අලෙවිකරණ ජාලයට සම්බන්ධ කළ හැකි කිසිම ප්‍රාදේශීය වෙළඳ මධ්‍යස්ථානයක් මේ ප්‍රදේශයේ නැහැ. එළවළු විකිණිය හැකි පොළ වගේ වෙළඳපොළවල් විතරයි තියෙන්නේ."*

අවධාන කණ්ඩායම් සාකච්ඡාව, කින්නියා

මනා ප්‍රවාහන පහසුකම් නොමැතිකම නිසා වෙළඳපොළ වෙත ළඟා වීමේදී නිෂ්පාදකයෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙති. බොහෝ ප්‍රදේශවලදී කෘෂිකාර්මික ඉඩම් මෝටර් වාහන ගමන් කළ හැකි ප්‍රධාන මාර්ගවලට සම්බන්ධ නැති අතර, ප්‍රවාහනය සඳහා යොදා ගත හැකි වාහනවල හිඟයක් පවතී.

*"මෙහේ ඉඳන් ගෝමරන්කඩවලට වී ප්‍රවාහනය කිරීමේදී මල්ලකට රු.50ක් වැය වෙනවා. කුඩා ට්‍රැක්ටර් හැරුණු කොට මේ ගමේ කිසිම ට්‍රැක්ටරයක් නැහැ."*

අවධාන කණ්ඩායම් සාකච්ඡාව, ගෝමරන්කඩවල

විධිමත් යටිතල පහසුකම් නොමැතිකම ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්වලට තම අස්වැන්න අලෙවි කරගැනීම සඳහා බාධාවක් ලෙස දක්නා ලදි. අස්වැන්න ගමෙන් බැහැරට ප්‍රවාහනය කිරීමේ ගැටලුව දිස්ත්‍රික්ක මට්ටමේ වැඩමුළුවලදී හා ප්‍රජා මට්ටමේ දී සාකච්ඡාවට ලක් වූයේ තම අස්වනු අලෙවි කර ගැනීමට බාධාවක් ලෙස සලකමිනි. තම අස්වනු තම ප්‍රජාවෙන් පිටත ස්ථාන කරා (තම හිස තබා ගෙන) රැගෙන යාමේදී අමතර කායික පරිශ්‍රමයක් දැරීමට සිදුවීම නිසා ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බවලට මෙය විශේෂයෙන්ම ගැටලු සහගත වේ. විධිමත් මාර්ග හා රජයේ ප්‍රවාහනය නොමැතිකම නිසා අස්වනු ප්‍රවාහනය කිරීම විශේෂයෙන්ම කාන්තාවන්ට දුෂ්කර දෙයක් බවට පත් වේ. ප්‍රවාහනය කුලියට ගැනීම ඔවුන්ට මූල්‍යමය වශයෙන් කළ හැකි දෙයක් නොවේ. කිරන්හි කාන්තාවෝ තම ගෙවත්තේ අස්වැන්න හිසමත තබාගෙන වාලච්චේනයට රැගෙන යන්නේ පයින් හා පාලම් පාරුවෙන් ගමන් කරමිනි. එහාමෙහා යාමේ හැකියාව සීමිත නිසා ආබාධිතත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයෝද එම බාධාවටම මුහුණ පාති. සාමූහික අලෙවිකරණය දිරි ගැන්වීමෙන් සහ ගොවි සංවිධාන හා අලෙවිකරණ ජාල ශක්තිමත් කිරීමෙන් ප්‍රවාහනය ආශ්‍රිත බාධාවන් යම් පමණකට අඩු කළ හැකි වනු ඇත.

### *මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය*

බොහෝ විට ගොවීන්ට සිය වගාව සඳහා ණය සපයන්නේ ප්‍රාදේශීය වෙළඳුන්ය. ණයගැතිකම නිසා සමහර ගොවීන්ට වෙළඳුන් පිරිනමන කවර හෝ මිලකට තම අස්වැන්න ඔවුන්ට අලෙවි කිරීමට සිදු වේ. අනෙක් වෙළෙන්දෝ ගොවිපොළටම පැමිණ වී සඳහා ස්ථානීය මිලක් ගෙවති. මෙමගින් ගොවීන්ගේ ගබඩා සහ/හෝ ප්‍රවාහන අවශ්‍යතා අහෝසි වේ. අලෙවිකරුවා හා මිලදීගන්නා අතර, ඇතිව තිබෙන නිෂ්පාදකයන්ට සහායක් වනවාවෙනුවට ඔවුන් සූරාකනසුලු මෙම සම්බන්ධතාවලින් මිදීම දුෂ්කර බව ගොවීන්ට වැටහේ. වැඩි ප්‍රවේශයක් සහිත විධිමත් මූල්‍ය මූලාශ්‍රයන් හා විකල්ප ජීවනෝපාය විකල්පයන් හඳුන්වා දීම මෙම බාධාව අවම කිරීමට උපකාර වනු ඇත.

වාණිජ බැංකු, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන වැනි ගොවීන්ට ප්‍රවේශ විය හැකි විධිමත් මූල්‍ය මූලාශ්‍ර පැවතියද ණය සඳහා දැරීමට සිදුවන පිරිවැය, දුෂ්කර ලියකියවිලි කටයුතු නිසා සිදුවන පමාව, ක්‍රියාවලි හා අවශ්‍යතා පිළිබඳව නිසි දැනුවත්කමක් නොමැතිකම හා පාර්ශ්වකරුවන් සැපයීමට සිදු වීම නිසා නොවිධිමත් මූලාශ්‍ර වෙත ප්‍රවේශ වීමට ගොවීන්ට බල කෙරේ. කඩපිල් (කුඩා වෙළඳ සල්) පවත්වාගෙන යන්නන්, සිල්ලර පොහොර වෙළඳුන්, මිලදීගන්නන් හා අතරමැදියන්ගේ සිට ප්‍රාදේශීය වෙළඳුන් දක්වා පරාසයක මෙම නොවිධිමත් මූලාශ්‍ර පැතිරේ. මෙම නොවිධිමත් මූලාශ්‍රවලින් මූල්‍ය සේවාවන් ලබාගැනීම ප්‍රාදේශීය වෙළඳුන් සමග සූරාකෑමට ලක් විය හැකි අලෙවිකරණ සම්බන්ධතාවල ගොවීන් සිර වීමට හේතු විය හැකිය.

සමෘද්ධි වැඩ සටහන ජීවනෝපාය ණය සම්පාදනය කරයි. ණය සීමාව, ණය ලබාගන්නා පුද්ගලයා නිරත වන ක්‍රියාකාරකමේ මාදිලිය මත රු.10,000 සිට 20,000 දක්වා විය හැකිය. අධ්‍යයනය කළ ප්‍රදේශවල සිටින සුළු ගොවීහු රජය හා වාණිජ බැංකු වැනි සාම්ප්‍රදායික විධිමත් මූල්‍ය මූලාශ්‍රවලින් නොව මෙම මූලාශ්‍රවලින් ණය ලබාගැනීම කෙරෙහි වැඩි විශ්වාසයක් තැබූහ. ක්‍රියාවලිය සඳහා එතරම් ලියකියවිලි අවශ්‍ය නොවේ (අවශ්‍ය වන්නේ සමෘද්ධි ප්‍රතිලාභීන් කණ්ඩායමක් මාස හයක් තිස්සේ ඉතිරි කිරීම් පවත්වා ගෙන යාම පමණකි). පොලී අනුපාතිකය 10%ක් වන අතර, ආපසු ගෙවීමේ කාල සීමාව මාස 6කි. කෙසේ වෙතත්, කලට වේලාවට ආපසු ගෙවීම් කිරීමේ ගැටලුව පවතී.

*"අපට අවශ්‍ය වේලාවට රජයේ ණය ලබාගන්න බැහැ. අපි එක් කන්නයකට ඉල්ලුම් කළාම ඔවුන් ණය ලබා දෙන්නේ අනෙක් කන්නයේදී. අනුමත කිරීමේ කාලයට කලින් ඉතා බොහෝ රෙගුලාසි සැපිරීමට සිදුවීමත් රජයේ ණය ලබාගැනීම දුෂ්කර වීමට හේතුවක්."*

අවධාන කණ්ඩායම් සාකච්ඡාව, කින්නියා

වඩා විධිමත් ණය මූලාශ්‍ර සඳහා පහසුකම් සැපයීම හා කණ්ඩායම්ක ණය සැපයීම නිෂ්පාදකයන් බැඳ තබන දුෂ්ට ණය චක්‍රය බිඳ දැමීමේ ක්‍රමයක් විය හැකිය. කලින් සඳහන් කළ පරිදි මීට සමාන්තරව බෝග විවිධාංගීකරණය හරහා විකල්ප ආදායම් මූලාශ්‍ර හඳුන්වා දීමෙන් නිෂ්පාදකයන්ට වී කන්න දෙකක් අතරතුරදී මෙන්ම අඩු අස්වැන්නක් සහිත යල කන්නයේදීද ආදායමක් ලැබෙනු ඇත.

*ඉහළ වටිනාකමක් සහිත බෝග වර්ග*

ප්‍රධාන වශයෙන් රටේ අනෙක් ප්‍රදේශවල වී නිෂ්පාදකයන් අතර සාම්ප්‍රදායික වී වර්ග වගා කිරීමේ නැඹුරුවක් පවතී. වර්තමානයේදී වඩා පොදුවේ වගා කෙරෙන දෙමුහුම් වී වර්ග සමග සසඳන විට අස්වැන්න අඩු වුවත් ඒ හේතුවෙන්ම මෙම වී වර්ගවල මිල ගණන් ඉතා ඉහළය. දහනල, දේවාරද්දිරි, හීනටි, හොඬරවාලු, මාවී, මුරුනගකායම්, පච්චපෙරුමාල්, සුදුවී හා සුවඳැල් ශ්‍රී ලංකාව තුළ හමු වන සාම්ප්‍රදායික වී වර්ග සමහරකි. මෙම සාම්ප්‍රදායික වී වර්ගවල වෙළඳපොළ හැකියාව කෙටියෙන් විමසා බැලීමෙන් වඩා නාගරික ප්‍රදේශවල පවතින විශේෂ අලෙවි අවස්ථාව මෙන්ම රට තුළ සංචාරක කර්මාන්තය සමග ඊට පවතින සම්බන්ධයද අවධාරණය විය. අධ්‍යයනය සිදුකළ කාලයේදී සුවඳැල්, මඩතවාලු හා කළුහීනටි වැනි වඩා සාම්ප්‍රදායික වර්ගවල සාමාන්‍ය වෙළඳ පොළ මිල කිලෝවකට රු.170.00 සිට රු.185.00 දක්වා තරම් ඉහළ මට්ටමක පැවතිණ. මෙම සාම්ප්‍රදායික වී වර්ග වඩා පෝෂ්‍යදායීද රසයෙන් පොහොසත්ද පලිබෝධ ප්‍රතිරෝධීද වේ. ඒ සඳහා කෘත්‍රිම, පෙට්‍රෝලියම් පදනම් කරගත් පොහොර වර්ග අවශ්‍ය නොවේ. එමෙන්ම, ඒ සඳහා වඩා ඉහළ වටිනාකමක් ලැබීම යනු නිෂ්පාදකයාට වැඩි ලාභයක් ලැබීමයි. කෙසේ වෙතත්, පෞද්ගලික අංශය සමග හවුල්කාරිත්වයන් ගොඩනගා ගනිමින් වෙළඳපොළ සම්බන්ධතාවලට පහසුකම් සැපයිය යුතු අතර, නව බෝගයක් ආශ්‍රිතව ඇති විය හැකි අවදානම් නිසා මධ්‍ය කාලයේදී පුළුල් කිරීමේ දැක්මකින් යුතුව පළමුව සුළු පරිමාණයෙන් හඳුන්වා දිය හැකිය.

*ගබඩා කිරීම*

භෞතික ගබඩා යටිතල පහසුකම් නොමැතිකම වී ගොවීන්ට ඇති සීමිත වෙළඳපොළ ප්‍රවේශය හා අගය එකතු කිරීම සඳහා පවතින සීමිත අවස්ථා පිළිබඳ ගැටලු අතරට තවත් ගැටලුවක් එකතු කරයි. එමෙන්ම, වෙළඳපොළේදී වී මිල පහත හෙළයි. ප්‍රාදේශීය මට්ටමෙන් ගබඩා සැපයීමෙන් මෙම බාධාව ඉවත් වනු ඇත. ACAP ආයතනය රැස් කළ දත්තවලින්ද ප්‍රකාශ වන්නේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ නාදූත්තුහි තිබෙන වී ගබඩාව හැරුණු විට ඉලක්ක ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් එකක වත් ගබඩා පහසුකම් නොමැති බවයි. යුද්ධයෙන් විනාශ වීමට පෙර එරාවුර්හි පූලාක්කාඩු වැනි ප්‍රදේශවල විශාල ගබඩා පහසුකම් තිබිණ. අධ්‍යයනය සිදු කළ කාලය වන විට, මෙම වී ගබඩා පහසුකම් නැවත ගොඩනැගීමට රජය හෝ රාජ්‍ය නොවන සංවිධාන කිසිදු ප්‍රයත්නයක් දරා නොතිබිණ.

> *"අපි ගබඩා කරන්නේ එක වී බුසලක් විතර. ඒක අපට සතියකට සෑහෙනවා. අපගේ ගෙවල්වල වී ගබඩා කරන්න වෙනම තැනක් නැහැ. ඉතා සීමාසහිත ඉඩකඩක් තියෙන්නේ. අපි ගබඩා කරන්නේ ගෙයි කාමරවල."*
>
> අවධාන කණ්ඩායම් සාකච්ඡාව, ගෝමරන්කඩවල


අලින්ගෙන් ප්‍රහාර එල්ල වේ යැයි බියෙන් ගොවීහු නිවසේ වී ගබඩා කිරීමට පසුබට වෙති. මේ මොහොතේ නැගෙනහිර පළාත තුළ අතිරික්ත වී නිෂ්පාදනයක් පවතින නිසා (4.5 වගුව බලන්න) ගබඩා පහසුකම් නොමැතිකම තීරණාත්මක ගැටලුවකි. ගබඩා පහසුකම් නොමැතිකම මගින් ගොවීන්ට ඊළඟ කන්නය සඳහා අවශ්‍ය කරන බිත්තර වී ගබඩා කර තබාගැනීමට නොහැකි බවද අදහස් වේ. නිෂ්පාදක කණ්ඩායම් සමග කළ සාකච්ඡාවලින් අනාවරණය වූයේ ප්‍රාදේශීය මට්ටමෙන් ගබඩා පහසුකම් ඇති කිරීම මිල කම්පනවලින් නිෂ්පාදකයන් ආරක්ෂා කිරීමට උදව් වනු ඇති බවයි. පොදු ගබඩා පහසුකම් ඇති කිරීම සඳහා ප්‍රජා මට්ටම තුළින් පුද්ගලයන් හඳුනාගත හැකිය.

ඉහත විස්තරාත්මක විශ්ලේෂණය අවසන් කරමින් යෝජනා කළ හැක්කේ මෙම ගොදුරු වීමට ඉඩ ඇති ප්‍රජාවන් සඳහා මැදිහත් වීම් සැලසුම් කිරීමේදී බහුදිශාගත ප්‍රවිෂ්ටයක් අවශ්‍ය බවයි. පහත දැක්වෙන රූප සටහනේදී සාකච්ඡා කර ඇති පරිදි, වටිනාකම් දාමයේ සියලුම මට්ටම්වල පවතින

බාධාවන්ට විසඳුම් සෙවිය යුතුය. එමෙන්ම, ඊට සමාන්තරව ප්‍රතිලාභීන්ට ධනාත්මක බලපෑම් දැනිය යුතුය. උදාහරණයක් ලෙස, ඵලදායිතාව වැඩි කිරීම සඳහා මැදිහත් වීම් ක්‍රියාත්මක කරන අතරතුර ප්‍රජාවන්ට මූල්‍ය සේවාවන් හා තාක්ෂණයද ඒ සමග ක්‍රියාත්මක යටිතල පහසුකම් හා වෙළඳපොළ සම්බන්ධතාද සලසා ගතහැකි විය යුතුය.


පහත දැක්වෙන රූප සටහන් මගින් බාධාවන්, හේතු හා පැවතිය හැකි විසඳුම්ද එම විසඳුම් ක්‍රියාත්මක කිරීම උදෙසා පවත්නා ආයතනද සිතියම්ගත කෙරේ.

**4.2 රූප සටහන: වී වගා උපඅංශයේ අඩු ඵලදායිතාව ආශ්‍රිත බාධාවන් හා පැවතිය හැකි විසඳුම් සිතියම්ගත කිරීම**





මූලාශ්‍රය: අධ්‍යයන දත්ත

**4.3 රූප සටහන: වී වගා උපඅංශයේ අගය එකතු කිරීම අඩු වීම ආශ්‍රිත බාධාවන් හා පැවතිය හැකි විසඳුම් සිතියම්ගත කිරීම**




මූලාශ්‍රය: අධ්‍යයන දත්ත

4.4 රූප සටහන: වී වගා උපඅංශයේ අලෙවි කිරීමේ හැකියාව අඩු වීම ආශ්‍රිත බාධාවන් හා පැවතිය හැකි විසඳුම් සිතියම්ගත කිරීම




මූලාශ්‍රය: අධ්‍යයන දත්ත

## 4.2 එළවළු හා පලතුරු

මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක මිරිස්, කව්පි, මුං ඇට, කුරක්කන්, බඩ ඉරිඟු හා සෝගම් වැනි වෙනත් ක්ෂේත්‍ර බෝග (OFC) නිෂ්පාදනය කරයි. වම්බටු, බෝංචි, බණ්ඩක්කා, කරවිල, පතෝල හා රතු ලූනු වැනි පහත රට එළවළු මඩකලපු දිස්ත්‍රික්කයේ වගා කෙරේ. මෙම වෙනත් ක්ෂේත්‍ර බෝග හා එළවළු බොහෝ විට නිෂ්පාදනය කෙරෙන්නේ වී වගාව සඳහා ජලය නොමැති යල කන්නයේදී ගෙවතුවලය. වගා කෙරෙන වෙනත් ක්ෂේත්‍ර බෝග සමග සසඳන විට පවත්නා අලෙවි කිරීමේ හැකියාව හා ලැබෙන ප්‍රතිලාභ සැලකිල්ලට ගත් විශේෂඥයෝ රතු ලූනු, ලොකු ලූනු හා මිරිස් ප්‍රමුඛතා බෝග ලෙස සඳහන් කළහ.

වෙනත් ක්ෂේත්‍ර බෝග යල කන්නයේදී හේන් වගාව යටතේද නිෂ්පාදනය කෙරේ. අඹ, කෙසෙල් හා පැපොල් වැනි පලතුරු ප්‍රදේශය තුළ මහා පරිමාණයෙන් වගා කෙරෙන අතර, ව්‍යාප්ත කිරීමේ හැකියාවක් පෙන්නුම් කරයි. ත්‍රිකුණාමලයේදී නියමු ව්‍යාපෘතියක් ලෙස අන්නාසි වගාව ආරම්භ කර වෙනත් ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීමේ අදහස ඇතිව අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත. ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් විශේෂයෙන්ම ඉලක්ක ප්‍රජාවන් තුළ සිටින ස්ත්‍රී ගෘහ මූලික කුටුම්බ ගෙවතු මට්ටමේ එළවළු වගාවෙහි නිරත වන බව අධ්‍යයනය සොයාගත්තේය. වාරිමාර්ග පහසුකම් නොමැතිකම හා ඉඩම සකස් කිරීම හා ගුණාත්මක බීජ මිලදී ගැනීම සඳහා ආයෝජනය කිරීමට ප්‍රාග්ධනය නොමැතිකම ගොවීන් මුහුණ පාන බාධාවන් ලෙස හඳුනා ගැනිණ. ක්ෂුද්‍ර ණය පහසුකම් සැපයීම මෙම සමහර බාධාවන් ජයගැනීමටත් ඔවුන්ගේ ආදායම් වැඩි දියුණු කිරීමටත් උදව්වක් වනු ඇත.

දිස්ත්‍රික්ක දෙකෙහි වගා කෙරෙන එළවළු හා පලතුරුවල නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා සැලකිය යුතු ආයෝජනයක් අවශ්‍යය. පවත්නා දත්ත පෙන්වා දෙන්නේ වෙනත් දිස්ත්‍රික්ක සමග සසඳන විට පලතුරු හා එළවළු වගාවේ නිෂ්පාදනය ප්‍රමාණවත් තරමට තරගකාරී නොවන බවයි (පහත 4.6 වගුව බලන්න). අගය එකතු කිරීම සඳහා අවස්ථා නොමැතිකමද බාධාවකි. පහතරට එළවළු අස්වනු ගොඩගැසෙන කාලයේදී අස්වැන්න අලෙවි කිරීම නිෂ්පාදනය පුළුල් වන විට විසඳුම් සෙවිය යුතු ගැටලුවකි.

**4.6 වගුවː තෝරාගත් එළවළු බෝග කිහිපයක් ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස**

| බෝගය | ජාතික නිෂ්පාදිතයේ % | | බෝගය | ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|
| | ත්‍රිකුණාමලය | මඩකලපුව | | ත්‍රිකුණාමලය | මඩකලපුව |
| මඤ්ඤොක්කා | 2% | 6% | මිරිස් | 1% | 1% |
| රට කජු | 3% | 4% | අළු කෙසෙල් | 1% | 1% |
| බණ්ඩක්කා | 3% | 4% | කුරක්කන් | 1% | 0% |
| රතු ලූනු | 4% | 2% | තල | 1% | 0% |
| පතෝල | 3% | 2% | මුං ඇට | 1% | 0% |
| වම්බටු | 2% | 3% | වට්ටක්කා | 1% | 0% |
| කරවිල | 2% | 2% | පිපිඤ්ඤා | 1% | 0% |
| බඩ ඉරිඟු | 1% | 1% | අළු පුහුල් | 1% | 0% |
| බතල | 1% | 1% | කළු කඩල | 0% | 1% |

මූලාශ්‍රය Samaratunge, Sommers and Varley, 2009

**4.7 වගුව: තෝරාගත් පලතුරු බෝග කිහිපයක් ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස**

| බෝගය | ත්‍රිකුණාමලය | මඩකලපුව |
|---|---|---|
| දොඩම් | 1% | 2% |
| අඹ | 1% | 2% |
| කෙසෙල් | 1% | 1% |
| පැපොල් | 1% | 1% |
| දෙහි | 1% | 0% |

මූලාශ්‍රය: Samaratunge, Sommers and Varley, 2009

බීජ හා රෝපණ ද්‍රව්‍ය, පොහොර, මූල්‍ය සේවාවන් හා තාක්ෂණය වැනි ගුණාත්මක යෙදවුම් වෙත ප්‍රවේශය වැඩි කිරීමෙන් නිෂ්පාදනය හා ඵලදායිතාව පිළිබඳ ගැටලු ජයගත හැකිය. වගා කිරීමේ සූක්ෂ්මතාව වැඩි කිරීමෙන් ඉඩම් හා ජල භාවිතය උපරිම කිරීමද වැදගත් වේ. අන්තර් වගා විධික්‍රම හා බෝග විවිධාංගීකරණය හඳුන්වා දීමෙන් වගා කිරීමේ සූක්ෂ්මතාව වැඩි කළ හැකිය. ගුණය හා ආවරණය සම්බන්ධ ව්‍යාප්ති සේවාවන්ද වැඩිදියුණු කළ යුතුය.

## *නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩිදියුණු කිරීම*

### *බීජ හා රෝපණ ද්‍රව්‍ය*

දෙමුහුම් එළවළු බීජ නොමැතිකම එළවළු වගාව සඳහා උනන්දුවක් නොමැති වීමට හේතුවක් ලෙස සඳහන් කෙරිණ. දෙමුහුම් බීජ වර්ග සමග සසඳන විට ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් සැපයෙන බීජවල ඵලදායිතාව අඩුය. එමෙන්ම, මධ්‍යස්ථානයට ඉල්ලුමට ගැළපෙන අයුරින් බීජ සැපයිය නොහැකිය. ගොවීහු ආනයනය කළ දෙමුහුම් බීජ පෞද්ගලික අංශයෙන් මිලදී ගනිති. දෙමුහුම් බීජ යොදා ගැනීමේ ඍණාත්මක පැතිකඩ වන්නේ අස්වනු වශයෙන් නෙළා ගත් රෝපණ ද්‍රව්‍ය ඊළඟ කන්නයේ වගාව සඳහා භාවිත කළ නොහැකි වීමයි. කෙසේ වෙතත්, ඉහළ ඵලදායිතාව නිසා ගොවීහු දේශීය බීජ වර්ගවලට වඩා ඉතා ඉහළ මිලකට දෙමුහුම් බීජ මිලදී ගැනීමට පෙලඹෙති.

ලාභ ලැබීමට කල් යන නිසා ගොවීහු පලතුරු වගා කිරීමට පසුබට වීමක් පෙන්නුම් කරති. අඹ වගාවේ පළමු අස්වැන්න ලබාගැනීමට ආසන්න වශයෙන් රෝපණය කළදා සිට වසර 3ක් පමණ ගතවේ. වඩා වේගයෙන් ලාභ ලැබෙන ඉහළ ඵලදායිතාවක් සහිත නව දෙමුහුම් බීජ වර්ග හඳුන්වා දිය යුතුය. වෙනත් වගා සමග අන්තර්බෝගයක් ලෙස පලතුරු වගා කිරීමද මෙම බාධාව ජය ගැනීමට උදව් විය හැකිය. වෙනත් බහුවාර්ෂික පලතුරු බෝග සමග කෙසෙල් වැනි ඉක්මනින් ප්‍රතිලාභ සැලසෙන පලතුරු වර්ග හඳුන්වා දිය හැකිය.

### *පොහොර*

වී වගාවට මෙන් එළවළු හා පලතුරු වගාවට කිසිදු පොහොර සහනාධාරයක් නැත. ට්‍රිපල් සුපර් පොස්පේට් (TSP) හා මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) මිලදී ගැනීම සඳහා දැරීමට සිදුවන පිරිවැය ඉහළය. ඉහළ පිරිවැය ගොවීන් රසායනික පොහොර යොදා ගැනීම අධෛර්යමත් කරයි. මෙය කාබනික වගාව සඳහා අවස්ථාවක් ලෙස සැලකිය හැකි අතර, කාබනික පොහොර සුලභ කළ යුතුය. ගෙවතු වගා මට්ටමේදී එළවළු හා අන්නාසි, කෙසෙල් හා පැපොල් වැනි කෙටි කාලීන බෝගවලට අදාළව කාබනික ගොවිතැන ප්‍රවර්ධනය කළ හැකිය. සුළු පරිමාණව වගා කිරීමෙන් මෙය වඩා සාර්ථක වන අතර, නිෂ්පාදකයන්ට සංචාරක අංශයේ මෙන්ම නාගරික පාරිභෝගික කණ්ඩායම් අතර කාබනික පලතුරු හා එළවළු සඳහා වැඩෙන වෙළඳපොළ ඉල්ලුමද සැපිරිය හැකිය. කාබනික වගාව හා වෙළඳ පොළ සම්බන්ධතා පිළිබඳ පුහුණු සැපයීමට පහසුකම් සැපයිය යුතුය. ප්‍රවාහන පහසුකම් නොමැතිකම, යෙදවුම් සැපයුම, ගොවි ඉඩම් වෙත ප්‍රවේශ වීම හා අස්වැන්න වෙළඳ පොළට ප්‍රවාහනය කිරීම කෙරෙහි බලපායි. මාර්ගවල දුර්වල තත්වය, සුදුසු රථවාහන නොමැතිකම හා සමහර එළවළු ප්‍රවාහනයේදී නරක් විය හැකි වීම එළවළු නිෂ්පාදනය කෙරෙහි බලපාන ප්‍රවාහනය ආශ්‍රිත ප්‍රධාන බාධාවන්ය. පොදු ප්‍රවාහනය යොදාගැනීම නරක් විය හැකි එළවළු සම්බන්ධ බරපතළ පශ්චාත් අස්වනු හානිවලට හේතුවේ.

### *ඉඩම් ප්‍රමාණවත් ලෙස උපයෝගී කර නොගැනීම හා වාරිමාර්ග ප්‍රමාණවත් නොවීම*

දිස්ත්‍රික්ක දෙකෙහි පවත්නා (වගා නොකළ හා අත් හැර දමන ලද) ඉඩම්වල එළවළු වගාව ආරම්භ කිරීමට අවස්ථාවක් පවතී. එළවළු වගාව සඳහා අවශ්‍ය කරන ආරම්භක ප්‍රාග්ධනය වී වගාවට වඩා අඩුය, ලාභදායකත්වය වැඩිය, අවදානම අඩුය. ජල හිඟය ගැටලුවක් මෙන්ම යල කන්නයේදී ඉඩම් භාවිතය සීමා කරන්නක්ද වන අතර, අධ්‍යයනය කළ බොහෝ ප්‍රජාවන් තුළ වාරිමාර්ග පහසුකම් නොතිබූ නිසා එතරම් ජල ප්‍රමාණයක් අවශ්‍ය නොකරන එළවළු වගා කෙරුණු බව අධ්‍යයනය සඳහන් කළේය. කෘෂි ළිං ඉදි කර ඇත්තේ භූගත ජලය ඉතා අඩු ප්‍රදේශවල නිසා වරක් ජලය ඇදගත් පසු ඒවා නැවත පිරීමට දිගු කලක් ගත වේ, එසේ නැතිනම් අත් හැර දමා ඇත.

බින්දු ක්‍රමය හා වතුර මල වැනි නූතන ක්ෂුද්‍ර වාරිමාර්ග තාක්ෂණික ක්‍රම කිසිදු ප්‍රජාවක් තුළ භාවිත නොවේ. පිටාර වාරිමාර්ග ක්‍රමය සමග සසඳන විට ජල භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ මට්ටමක පවතින නිසා මෙම නූතන තාක්ෂණික ක්‍රම ජල හිඟයට පිළියමක් වේ. මිරිස් හා ලූනු වගාවේදී වගා ඉඩමේ උපරිම හැකියාව අත් කර ගැනීමට නම් ක්ෂුද්‍ර වාරිමාර්ග තාක්ෂණය අවශ්‍යය. ප්‍රාග්ධනය නොමැතිකම හා මෙම නූතන තාක්ෂණයන් පිළිබඳ දැනුවත්කම අඩු වීම ඒවා සඳහා ආයෝජනය කිරීමෙන් ගොවීන් වළක්වයි.

### *බෝග විවිධාංගීකරණය*

යම් එළවළු වර්ගයක මිල කම්පන අවම කිරීමට බෝග විවිධාංගීකරණය තවත් විසඳුමකි. එක් බෝගයක් වගා කිරීමට වඩා අවදානම අඩු ක්‍රමයක් වන එය පසේ පෝෂණ තත්වය වඩා හොඳින් පවත්වා ගෙන යාමට උදව් වනු ඇත. අස්වනු නෙළාගැනීමෙන් පසු එතරම් ජල සම්පාදනයකින් තොරව කුඹුරු ඉඩම් එළවළු වගා කිරීමට යොදාගත හැකිය. පසේ ඉතිරිව තිබෙන තෙතමනය කව්පී, මුං ඇට හා සෝගම් වැනි නියඟයට ඔරොත්තු දෙන බෝග වගා කිරීමට ප්‍රමාණවත්ය. මෙම පරිචය භූමියෙන් වඩා ඉහළ ප්‍රතිලාභ අත්කර දෙන අතර, මෙම බෝග නයිට්‍රජන් උපයෝගී කරගෙන පසේ සාරවත් බව වැඩිදියුණු කරයි.

### *ව්‍යාප්ති සේවා*

ව්‍යාප්ති සේවා නොමැතිකම එළවළු අංශයට බාධාවකි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට සිටින්නේ එක් කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන නිලධාරියකු පමණකි. මෑතම තාක්ෂණය සම්පාදනය කිරීම හා බෝගවලට වැළඳෙන රෝගවලට ප්‍රතිකාර කිරීම සඳහා සහාය වීමේදී මෙම සේවාවන් හා නිලධාරීහු වැදගත් වෙති. නව නිෂ්පාදකයන්ට එළවළු ගොවිතැන හඳුන්වා දී ප්‍රවර්ධනය කිරීමේදී ව්‍යාප්ති සේවාද වැදගත් වේ. අදාළ අංශ තුළ සිදුව ඇති නූතන වැඩිදියුණු වීම්වලට අනාවරණය කිරීම සඳහා නව තාක්ෂණය පිළිබඳ පුහුණු සපයා ව්‍යාප්ති සේවා නිලධාරීන් ශක්තිමත් කිරීම දිගු කාලයේදී ජීවනෝපාය මැදිහත් වීම් තිරසර වීමට හේතු වනු ඇත.

### *සැකසීම, ගබඩා කිරීම හා අගය එකතු කිරීම*

අධ්‍යයනය සිදුකළ සමයේදී ප්‍රජාවන් තුළ මහා පරිමාණ නිෂ්පාදනයක් සිදු නොවූ බැවින් ප්‍රාදේශීය නිෂ්පාදනය සඳහා ගබඩා පහසුකම් අවශ්‍ය නොවීය. කෙසේ වෙතත්, නැගෙනහිර පළාත තුළ කෘෂිකර්මයේ ව්‍යාප්තිය වැඩි වන විට ගබඩා පහසුකම් අවශ්‍ය වනු ඇත.

බඩඉරිඟු වැනි බෝග සඳහා බීජ වෙන් කිරීමේ යන්ත්‍රසූත්‍ර අවශ්‍ය වේ. යන්ත්‍රසූත්‍ර නොමැතිකම නිසා වර්තමානයේදී බඩඉරිඟු අලෙවි කෙරෙන්නේ ඉරිඟු කරල් ලෙස පමණකි. කුකුළු පාලන කර්මාන්තයෙන් බඩ ඉරිඟු බීජ සඳහා ඉල්ලුමක් පැවතියද නාරටියෙන් බීජ වෙන් කිරීම සඳහා යන්ත්‍රසූත්‍ර නොමැතිකම බඩඉරිඟු කරල් සැකසීමට බාධා කරයි. රැස් කරගත් ප්‍රාථමික දත්ත අනුව, අධ්‍යයනය සිදුකළ සමයේදී ඉරිඟු කරල් අලෙවි වූයේ රු.5ත් 6ත් අතර මිලකටය. එහෙත්, බීජ වෙන් කෙරෙන්නේ නම් එහි වටිනාකම ඉහළ යා හැකිය. වර්තමානයේදී බීජ වෙන් කිරීම සඳහා යොදාගන්නා තාක්ෂණය බීජවලට විශාල හානියක් සිදුකර වැඩි අපතේ යාමකට හේතු වෙයි. මේ වන විට නැගෙනහිර පළා තතුළ බඩ ඉරිඟු වගාවෙහි නිරතව සිටින පෞද්ගලික සමාගම් සිය අස්වැන්න යොදා ගන්නේ සත්ව ආහාර වශයෙනි.

වියළි මිරිස්, මිරිස් කුඩු හා සාම්ප්‍රදායික අච්චාරු ලෙස මූලික මට්ටමේදී එළවළු සැකසීමෙන් එළවළු ගොවීන් සඳහා එකතු කළ අගයක් සම්පාදනය කළ හැකිය. ප්‍රාදේශීය මට්ටමේ සුළු පරිමාණ ඇඹරුම්හල් හඳුන්වාදීම අස්වනු නෙළන සමයේදී අස්වනු අපතේ යාම වැළැක්වීමටත් ගොවිපොළෙන් පිටත රැකියා අවස්ථා බිහි කිරීමටත් උදව් වනු ඇත. තාක්ෂණය හා ආරම්භක ප්‍රාග්ධනය සපයා දී ප්‍රජා මට්ටමේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රවර්ධනය කළ හැකිය. ලේබල් කිරීම, ඇසිරීම හා තත්ත්ව පාලනය පිළිබඳව පුහුණුවලටද පහසුකම් සැපයිය යුතුය.

පලතුරු සැකසීම අනාගත දියුණුව ගැබ් කරගත් අවධානය යොමු කොට සහාය දිය යුතු තවත් ක්ෂේත්‍රයකි. ඉහත සාකච්ඡා කළ පරිදි ආරම්භක පරිශ්‍රමය වන්නේ නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩිදියුණු කිරීමට සම්බන්ධිතව වගාව පුළුල් කිරීමයි. ප්‍රාදේශීය නිෂ්පාදකයන් පලතුරු නොසපයන බැවින් පලතුරු සැකසීම සඳහා ත්‍රිකුණාමලයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව දරන පරිශ්‍රමයට බාධා එල්ලවේ. වර්තමානයේදී පලතුරු සපයාගනු ලබන්නේ දඹුලු හෝ කොළඹ වෙළඳපොළෙනි. කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තාක්ෂණය ප්‍රජා මට්ටමේ හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සමග බෙදාහදා ගත හැකි අතර, ආරම්භක ප්‍රාග්ධනය සැපයීමත් සමග නිෂ්පාදකයන්ට තම පලතුරු සඳහා වැඩි මිලක් ලබාගත හැකි වේ. සැපයුම්කරුවන් සීමිත නිසා දිස්ත්‍රික්කය තුළ ස්වාභාවික පලතුරු බීම අලෙවි කිරීමේ හැකියාව ඉහළ මට්ටමක පවතී.

> *"ස්වාභාවික බීම සඳහා ඉහළ ඉල්ලුමක් තියෙනවා. රජයේ දෙපාර්තමේන්තු හා පාසල් විශාල ප්‍රමාණයක් ඉල්ලන නමුත් මේ මොහොතේ අපට ඒ ප්‍රමාණය සපයාගන්න බැහැ. අපට ප්‍රදේශයේ පැවැත්වෙන සම්මන්ත්‍රණ, වැඩමුළු හා රැස්වීම් සඳහාත් සපයන්න පුළුවන්."*
>
> ප්‍රධානීන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව, ත්‍රිකුණාමලය

### *වෙළඳපොළ*

මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයන්හි එළවළු හා පලතුරු සඳහා පවතින ඉල්ලුම සපුරා නැත. එම ඉල්ලුම සැපිරෙන්නේ දිස්ත්‍රික්කවලට පිටතින් එළවළු හා පලතුරු ආනයනය කිරීමෙනි. එහෙත් දිස්ත්‍රික්ක දෙක තුළ නිපදවෙන එළවළුවලට වඩා ඒවායේ මිල අධිකය. උඩරට එළවළු සැපයෙන්නේ දඹුලු වෙළඳපොළෙනි. ප්‍රාදේශීය වෙළඳපොළ වෙත පහතරට එළවළු සැපයුම ඉහළ යන විට, ප්‍රදේශයේ නිපදවෙන බැවින් මිල ගණන් පහළ මට්ටමක පැවතීම හා ඒවායේ නැවුම් බව නිසා දිස්ත්‍රික්ක තුළ පරිභෝජන රටාවන් වෙනස් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වාරික හෙවත් කන්න ක්‍රමයට වගා කිරීම එළවළුවල මිල කෙරෙහි බලපායි. යල කන්නයේදී බොහෝ ගොවීන් එකම වර්ගයේ එළවළු වගා කරන නිසා අතිරික්ත සැපයුම අස්වැන්නේ මිල බෙහෙවින් පහත හෙළයි. මඩකලපු දිස්ත්‍රික්කයේ කලවන්චිකුඩි ප්‍රදේශයේ ගොවීන් බෝග මාරු කිරීමෙහි නිරත වන බැවින් අස්වනු ගොඩගැසෙන සමයේදී සිදු වන මිල ඉහළ පහළ යාම් එම ප්‍රජාවට බල නොපායි. බෝග මාරු කරන විට වගා කරන බෝගය තීරණය කරන්නේ ඒ ඒ කාල පරිච්ඡේදයේ පවතින ඉල්ලුම පදනම් කරගනිමිනි. රජය 'එක ගමකට එක බෝගයක්' ප්‍රවිෂ්ටය හඳුන්වා දුන්නේ මිල ඉහළ පහළ යාම් හා අතරමැදියන් මැදිහත් වීම තුරන්කිරීමේ අදහස ඇතිවය. මෙම වැඩසටහන යටතේ පලතුරු සහ එළවළු යන දෙවර්ගයම වගා කෙරේ. මෙය එළවළු හා පලතුරු නිෂ්පාදනය කරන අනෙක් ප්‍රදේශ වෙතද ව්‍යාප්ත කළ හැකිය. 'එක ගමකට එක බෝගයක්' ප්‍රවිෂ්ටයෙහි ඇතුළත් වන්නේ කන්න ක්‍රමයට වගා කෙරෙන බෝග නිසා ගොවීන්ට වසරක් තුළවෙනස් බෝග වර්ග කිහිපයක් වගා කළ හැකිවේ (එහෙත්, එක් කන්නයකදී වගා කළ හැක්කේ එක් බෝගයක් පමණකි).


දිස්ත්‍රික්කය තුළ නිපදවන එළවළු හා පලතුරු අලෙවි කෙරෙන්නේ ගම් මට්ටමේ වෙළඳපොළවලය. ප්‍රාදේශීය ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැගීම පළාතේ විවිධ ප්‍රදේශවල භාණ්ඩ එක් තැනකට යොමු කොට වඩා විධිමත් නාලිකා හරහා ඒවා අලෙවි කිරීමට හැකියාව ලබාදෙනු ඇත. එමගින් සූරාකනසුලු අතරමැදියන්ගේ මැදිහත්වීම අවම කර නිෂ්පාදකයන්ගේ කේවෙල් කිරීමේ බලය වැඩි කෙරෙනු ඇත. එමෙන්ම, එය වඩා යහපත් වෙළඳපොළ තොරතුරු ක්‍රියාවලියක් සඳහා පහසුකම් සපයා නිෂ්පාදකයාට වඩා ඉහළ ප්‍රතිලාභ අත්කර දෙනු ඇත.

එළවළු, පලතුරු හා වෙනත් බෝග උපඅංශවල නිරිත වීමට පෞද්ගලික අංශයට අනුබලදීම ප්‍රබල ලෙස දිරිගැන්වේ. අධ්‍යයනය සිදුකළ සමයේදී ඒ වන විට ක්‍රියාත්මකව පැවති USAID-CORE ව්‍යාපෘතිවලින් බොහොමයක් සංකල්පගත කර තිබුණේ පෞද්ගලික අංශයේ ආපසු මිලදී ගැනීම් පද්ධති පදනම් කරගෙනය.[7] මෙම පෞද්ගලික අංශ හවුල්කාරිත්වයෙන් ලැබෙන අත්දැකීම් හා පාඩම් අධ්‍යයනය කිරීම ප්‍රයෝජනවත් වනු ඇත. කාගිල්ස් වැනි සුපිරි වෙළඳසැල් ජාලද ත්‍රිකුණාමලයේ පලතුරු නිෂ්පාදනය දිරි ගන්වමින් සිටින අතර, මෙම ව්‍යාපාරික ව්‍යවසායන් එකිනෙකට සම්බන්ධ වීමෙන් නිෂ්පාදකයන් සඳහා පවත්නා වෙළඳපොළ පුළුල් වනු ඇත. මීට අමතරව, පුළුල් වෙමින් පවතින සංචාරක කර්මාන්තය කාබනික අස්වනු සඳහා වෙළඳපොළක් විය හැකි බව සැලකිය යුතුය.

අවසන් වශයෙන් කිව යුත්තේ, දිස්ත්‍රික්ක දෙක තුළ වගා කෙරෙන එළවළු හා පලතුරු ප්‍රමාණය ඉල්ලුම සැපිරීමට ප්‍රමාණවත් නොවන බවයි. එම නිසා, කෙටි කාලයේදී නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩි කිරීම සඳහා තව දුරටත් ආයෝජනය කිරීමත් ඒ අතරතුර අගය එකතු කිරීමේ විකල්ප හා වෙළඳපොළ සම්බන්ධතා පිළිබඳව විමසා බැලීමත් වැදගත් වේ.

[7] ව්‍යාපෘති පිළිබඳ තොරතුරු යනාදිය USAID-CORE වෙබ් අඩවියෙන් සපයා ගත හැකි යඃ www.core.zunepile.com

4.5 රූප සටහන: එළවළු හා පලතුරු අංශයේ බාධාවන් හා පැවතිය හැකි විසඳුම් සිතියම්ගත කිරීම





මූලාශ්‍රය: අධ්‍යයන දත්ත

### 4.3 කිරි පට්ටි හා පශු සම්පත

පශු සම්පත් හා කුකුළු පාලනයට මුල පිරෙන්නේ අතිරේක ජීවනෝපාය ක්‍රියාකාරකමක් ලෙසය. එය බොහෝ විට ප්‍රයෝජනයට ගැනෙන්නේ වී නිෂ්පාදනයට අතිරේක ක්‍රියාකාරකමක් වශයෙනි. වඩාත්ම පොදුවේ දැකිය හැකි ජීවනෝපාය මූලාශ්‍රය ගව පාලනයයි. එහෙත්, සැලකිය යුතු නිෂ්පාදකයන් සංඛ්‍යාවක් එළු පාලනයට හා කුකුළු පාලනයටද මුලපුරා ඇත. මඩකලපු දිස්ත්‍රික්කයේ සියලු ඉලක්ක ග්‍රාම නිලධාරී කොට්ඨාස තුළ පශුසම්පත් පාලනය වැදගත් ආදායම් මූලාශ්‍රයකි. එහෙත් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ එය දක්නට ලැබෙන්නේ ඊට අඩුවෙනි. ගව පාලනය ප්‍රධාන වශයෙන් සිදු වන්නේ කිරි ලබා ගැනීම සඳහාය. දුප්පත් කුටුම්බ බොහොමයක් අතිරේක ක්‍රියාකාරකමක් ලෙස ගවයන් දෙතුන් දෙනෙකුගේ පට්ටියක් ඇතිකරයි. එරාවූර් පත්තුවේ වඩා පොහොසත් කුටුම්බවලට අයත් විශාල ගව පට්ටි වී වගා සමයේදී රැක බලා ගැනෙන්නේ වැටුපක් ලබන ගොවීන් විසිනි.

**4.6 රූප සටහන: කිරි පට්ටි වටිනාකම් දාමය ඔස්සේ ක්‍රියාකාරකයන් හා නිෂ්පාදනයේ වටිනාකම සිතියම්ගත කිරීම**




මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහ බැංකුව, HARTI, ප්‍රාථමික දත්ත

* අලෙවි මිල ගණන් හා ලාභ සඳහා පදනම් කර ගැනුණේ අධ්‍යයනය අතරතුරදී රැස් කර ගත් ප්‍රාථමික දත්තය

කිරි පට්ටි වටිනාකම් දාමයේ නිරත ප්‍රධාන ක්‍රියාකාරයන් 4.6 රූප සටහනෙහි සිතියම්ගත කර ඇත. යෙදවුම් හා සේවා සම්පාදකයන්ගෙන් වැඩි කොටස පිරිමින් වුවත් නිෂ්පාදනයේදී හා ප්‍රාදේශීය මට්ටමේ සැකසීම්වලදී කාන්තාවෝ වැදගත් කාර්යභාරයක් ඉටු කරති. නියැදියට අයත් ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්වලින් එකක් වත් ඍජුව කිරි පට්ටි වටිනාකම් දාමයේ කොටස්කරුවෝ නොවූහ. එහෙත්, වර්තමානයේදී උපඅංශය තුළ කාන්තාවන් සම්බන්ධ වීම පෙන්නුම් කරන්නේ උපඅංශය ප්‍රවර්ධනය කිරීමේදී ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ ඉලක්ක කරගත හැකි බවයි. එම කුටුම්බ සම්බන්ධ නොවන්නේ වර්තමානයේ ක්‍රියාත්මක නිදහස් ගව පාලන ක්‍රමය නිසා විය හැකිය. එනමුත්, වැඩි දියුණු කළ සත්ව වර්ග හඳුන්වා දෙන විට ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බයන්ද ඉලක්ක කරගත හැකිය.

කිරිපට්ටි අංශයේ ඉල්ලුමට හා සැපයුමට වර්තමානයේදී සීමා පැනවී ඇත. දේශීය සත්ව වර්ගවල ඵලදායිතාව අඩුකම, කළමනාකරණ දැනුම සීමාසහිත වීම හා ව්‍යාප්ති සේවාවන් වැනි ආයතනික සහායන් නොමැතිකම නිසා කිරි සැපයුම සීමා වේ. කිරිපිටි නිෂ්පාදකයන් සමග පවතින තරගය හා අගය එකතු කිරීම සඳහා පහසුකම් නොමැතිකම නිසා නැවුම් කිරි සඳහා පවතින ඉල්ලුම සීමා වේ.

කිරිවල ගොවිපොළ මිල ප්‍රධාන වශයෙන් තීරණය කෙරෙන්නේ MILCO සමාගම හරහා රජය විසිනි. කෙසේ වෙතත්, අතරමැදියන් හෝ ප්‍රාදේශීය වෙළඳුන් ලීටරයකට ගෙවන්නේ ඊට වඩා අඩු මිලකි. පහසුවෙන් ප්‍රවේශ විය හැකි එකතු කිරීමේ මධ්‍යස්ථාන නොමැතිකම නිසා නිෂ්පාදකයන් කිරි අලෙවි කරන්නේ අඩු මිලකටය. ප්‍රාදේශීය වෙළඳුන් නිෂ්පාදකයන්ට වඩා අඩු ලාභයක් උපයාගන්නා බව පෙනේ. නිෂ්පාදකයන්ට වැඩිම ගොවිපොළ මිලක් ගෙවන්නේ ප්‍රාදේශීය සකසන්නන් බව පෙනෙන නමුත් ඔවුන් මිලදී ගන්නා ප්‍රමාණය සාමාන්‍යයෙන් පවතින්නේ පහළ මට්ටමකය.

### *සැපයුම වැඩිදියුණු කිරීම*

#### *නිෂ්පාදනය*

උනන්දුව දක්වන හා පශු සම්පත් පාලනයේ නිරත විය හැකි මානව සම්පත් පැවතීම මඩකලපුවෙහි හා ත්‍රිකුණාමලයෙහි මෙම අංශය සංවර්ධනය කිරීමට අවස්ථාවකි.

කිරි පට්ටියක සාමාන්‍ය විශාලත්වය 9.5ක් වන අතර, ස්වදේශීය සත්ව වර්ගවලින් ලබා ගන්නා සාමාන්‍ය කිරි අස්වැන්න දිනකට ලීටරයකි. නැගෙනහිර වියළි කලාපයේදී වැඩිදියුණු කළ සත්ව වර්ගවලින් ලබා ගන්නා සාමාන්‍ය අස්වැන්න එමෙන් 5 ගුණයක් වේ (Ibrahim 2000, 188 පි'). කෙසේ වෙතත්, අධ්‍යයනය කළ ප්‍රජාවන් තුළ සිටි බොහෝ පශු සම්පත් ගොවීන් සතුන් 2-3ක් සහිත සුළු අයිතිකරුවන් වූ අතර, ගවයෙකුගෙන් ලබාගත් සාමාන්‍ය අස්වැන්න දිනකට ලීටර 2-3 අතර විය. සතුන් 25-150ක් සහිත විශාල පට්ටි අයිතිකරුවෝ කිහිප දෙනෙක් සිටිති. එහෙත් ඉන් එක් අයෙක්වත් අධ්‍යයනය කළ ප්‍රජාවන්ට අයත් නොවීය. කිරි පට්ටි ගොවිතැනේ යැපුම් ස්වභාවය ගොවීන්ට ඉහළ මට්ටමේ ලාභයක් අත්කර නොදෙයි. එන්.එෆ්.සී. රණවීර 2009දී සිදු කළ අධ්‍යයනය අනුව, සැලකිය යුතු ආදායමක් ලැබීමට නම් සුළු අයිතිකරුවෙකු කිරි පට්ටි ගොවිතැනෙන් දිනකට ලීටර 15ක කිරි නිෂ්පාදනයක් උපයාගත යුතුය. එහෙත් මේතරම් කිරි ප්‍රමාණයක් නිපදවීමට නම් වැඩි දියුණු කළ සතුන් තිදෙනෙකුත් සත්ව ආහාර පාන ඉඩම් පර්චස් 20කුත් අවශ්‍ය වේ.

අධ්‍යයනය කළ ප්‍රජාවන් තුළ පැතිර පවත්නා කොන්දේසි මෙකී නිෂ්පාදන මට්ටම අත්කර ගැනීම සඳහා ඔවුන්ට තිබෙන හැකියාවට බාධා කරයි. පොහොසත් ගොවීන්ට සාමාන්‍යයෙන් පොළොන්නරුවෙන් ප්‍රදේශයට ගෙන්වා ගන්නා ඉහළ අස්වැන්නක් සහිත සත්ව වර්ග මිලදී ගැනීමට තරම් මුදල් ඇත. එහෙත් සුළු ගොවීන්ට වැඩිදියුණු කළ සත්ව වර්ග මිලදී ගැනීමේ හැකියාවක් නැත. පට්ටියක සතුන් අඩු සංඛ්‍යාවක් සිටීම හා වැඩි දියුණු කළ සතුන් මිලදී ගැනීමේ නොහැකියාව ගොවියාගේ ප්‍රතිලාභ අඩු කරයි. අභිජනන මධ්‍යස්ථාන හා උසස් තත්වයේ ස්වාභාවික අභිජනන නොමැතිකම දිස්ත්‍රික්ක දෙකෙහි ගව සම්පත වැඩිදියුණු වීම වළකයි.

*"අපි පොළොන්නරුවෙන් ගුණාත්මක තත්වයෙන් උසස් ගවයන් ලබාගන්නේ රු.80,000කට. මේ ගවයන් අප ළඟ දැනට ඉන්න ගවයන්ට වඩා වැඩි කිරි ප්‍රමාණයක් ලබාදෙනවා. මේ ගමේ ඉන්න හැම කෙනෙකුටම මේ ගුණාත්මක තත්වයෙන් උසස් සතුන් මිලදී ගන්න හැකියාවක් නැහැ."*

අවධාන කණ්ඩායම් සාකච්ඡාව, එරාවූර් පත්තු

කෙසේ වෙතත්, වැඩිදියුණු කළ සත්ව වර්ග සැපයීමෙන් අදහස් වන්නේ කළමනාකරණ පද්ධති හා ලීටරයක නිෂ්පාදන පිරිවැය වෙනස් වන බවයි. එය පහත වගුවේ පෙන්වා ඇති පරිදි පුළුල් කළමනාකරණ පද්ධති සමග සසඳන විට සූක්ෂ්ම හෝ අර්ධ සූක්ෂ්ම කළමනාකරණ පද්ධතිවලද ලීටරයක නිෂ්පාදන පිරිවැය ඉහළ යාමකද අවශ්‍යතාව මතු කරනු ඇත. මීට ප්‍රධාන හේතුව සූක්ෂ්ම පද්ධති තුළ පවත්නා උසස් ශ්‍රමය හා ඉහළ පෝෂණ පිරිවැයයි. අස්වැන්න 2-5 ගුණයකින් ඉහළ යනු ඇති අතර, වැඩිදියුණු කළ සත්ව වර්ග හඳුන්වා දීමෙන් නිෂ්පාදකයන්ට වැඩි ලාභයක් ලැබෙනු ඇත.

**4.8 වගුව: කළමනාකරණ පද්ධති අනුව වියළි කලාපයේ කිරි (ලීටරයක) නිෂ්පාදන පිරිවැය**

| කලාපය/දිස්ත්‍රික්කය | කළමනාකරණ පද්ධතිය | | |
|---|---|---|---|
| | සීමිත | අර්ධ සීමිත | පුළුල් |
| වියළි කලාපය | 23.3 | 14.51 | 9.23 |

මූලාශ්‍රය: සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, 2009

සාම්ප්‍රදායික කිරි පට්ටි කළමනාකරණ විධික්‍රම වැඩිදියුණු කිරීමෙන් කිරි අස්වැන්නද සත්වාහාරවල හා තණ භූමියේ ගුණාත්මකත්වයද වැඩි කළ හැකිය. නිර්දේශ ක්‍රියාත්මක කෙරෙන්නේදැයි පිරික්සීම සඳහා මෙම නව කළමනාකරණ පරිචයන් නිරීක්ෂණය කිරීම අස්වැන්න වැඩි කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. දැනට පවත්නා ගව සම්පත හොඳ තත්ත්වයේ දෙමුහුම් සතුන් යොදාගනිමින් වැඩිදියුණු කළ හැකිය. ඵලදායිතාව වැඩි වීම කිරි පට්ටි ගොවිතැනේ යෙදීමට සුළු අයිතිකරුවන් දිරි ගන්වනු ඇත.

### *තණ බිම්*

තණ බිම් වැඩිදියුණු කිරීම පවත්නා සත්ව ආහාර ප්‍රමාණය වැඩි කරනු ඇත. දිස්ත්‍රික්ක දෙකෙහි පැවති තණ බිම් යුද්ධයෙන් විනාශ විය. ඇතැම් ප්‍රදේශවලදී නිසි කළමනාකරණයකින් තොරව අත් හැර දමනු ලැබිණ. සත්ව පාලනයේ ඵලදායිතාව වැඩි කිරීම සඳහා මෙම ප්‍රදේශවලට ගුණාත්මකත්වයෙන් උසස් තෘණ වර්ග හඳුන්වාදීමේ අවශ්‍යතාවක් ඇත. වැඩිදියුණු කළ තෘණ වර්ග වගා කිරීමට නම් බින්දු ක්‍රමයේ හෝ වතුර මල් ක්‍රමයේ ජල සම්පාදනයත් මනා කළමනාකරණ පරිචයනුත් අවශ්‍යය.

ආහාර හා ජලය සොයා සතුන්ට නිදහස් භූමිභාග වෙත යාම සඳහා ඉඩ දීමට ගොවීහු පෙලඹෙති. මෙය ශක්තිය අපතේ යැවීමක් වන අතර, නිපදවෙන කිරි ප්‍රමාණය අඩු විය හැකිය. කිරි එකතු කරන්නෝ සතුන් සඳහා ප්‍රමාණවත් තරම් පානීය ජලය නොමැතිකම ගසා කති. ඔවුහු බවුසරවලින් ජලය රැගෙන විත් සපයා කිරි අන් කිසිවෙකුට නොව තමන්ටම අලෙවි කරන බව සහතික කර ගනිති. මෙය නිෂ්පාදකයාට පවත්නා වෙළඳපොළ විකල්ප සීමා කරයි. එමෙන්ම, ඔවුන්ගේ කේවල් කිරීමේ බලය අඩු කරයි.

### *ව්‍යාප්ති සේවා*

පශු සම්පත් නිෂ්පාදකයන් සඳහා සේවාවන් සපයන එකම රජයේ දෙපාර්තමේන්තුව වන සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මානව සම්පත් හිඟකම නිසා සත්ව පාලනය සඳහා ලැබෙන ආයතනික සහාය අප්‍රමාණවත්ය. දෙපාර්තමේන්තුව තුළ පශු වෛද්‍යවරුන් හා ක්ෂේත්‍ර නිලධාරීන් සිටින්නේ සීමිත සංඛ්‍යාවකි. මඩකලපු දිස්ත්‍රික්කයේදී එක් පශු සම්පත් සංවර්ධන නිලධාරියෙකු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 2-3ක වගකීම දැරිය යුතුය.

කාර්ය මණ්ඩල හිඟකම සතුන් රැක බලා ගැනීම කෙරෙහි මෙන්ම වැඩිදියුණු සත්ව වර්ග සඳහා පවතින ඉල්ලුම සැපිරීම කෙරෙහිද බලපායි. උදාහරණයක් ලෙස, කාලීන කෘත්‍රිම සිංචන (AI) සේවාවන් නොමැතිකමේ තේරුම දෙපාර්තමේන්තුව කෘත්‍රිම සිංචන සේවාවන් සැපයීමට පෙර ස්වාභාවික අභිජනනය සිදු වන බවයි.

පශු සම්පත් නිෂ්පාදකයන්ගේ පුහුණු කිරීම හා ඔවුන්ගේ හැකියාවන් ගොඩ නැගීම සිදු වන්නේ රජය හා රාජ්‍ය නොවන සංවිධාන මාර්ගයෙනි. එහෙත් වැඩිදියුණු කිරීම් සඳහා ආයෝජනය කළ යුතු ප්‍රාග්ධන යෙදවුම් සැපයීමෙන් එය පසු විපරමට ලක් කිරීමක් සිදු නොවේ. පුහුණු වැඩසටහන් සඳහා ඉලක්ක කර ගන්නා ආකාරයද පැහැදිලි නැත. සහභාගි වීම සඳහා තමන්ට සුදුසුකම් තිබෙන බව දුප්පත් ගොවීන්ගෙන් බොහෝ දෙනෙක් නො දනිති.

*මූල්‍ය සේවා*

වර්තමානයේදී සුළු ගොවීන්ට පහසුවෙන්ම ණය ලබා ගත හැකි මූලාශ්‍රය වන්නේ කිරි එකතු කරන්නන්ය. මේ අනුව, මෙම ණය නිසා නිෂ්පාදකයන් කිරි එකතු කරන්නන්ට බැඳ තැබෙන නමුත්, ඔවුන්ට තම කිරි අඩු මිල ගණන් යටතේ කිරි එකතු කරන්නන්ට අලෙවි කිරීමට සිදු වන නමුත්, විධිමත් ආයතනවලින් මූල්‍ය සේවාවන් ලබා ගන්නවාට වඩා ඔවුන්ගෙන් ණය ලබා ගැනීමෙන් දිගු කාලයේදී යහපතක් සිදුවන බවක් නිෂ්පාදකයන්ට හැඟේ.

රජයෙන් හෝ විධිමත් බැංකුකරණ අංශයෙන් මූල්‍ය සේවාවන් ලබාගැනීමේදී බොහෝ බාධාවන්ට මුහුණ දීමට සිදුවේ. රජය නැගෙනහිරදී සත්ව පාලනයට සහාය වීම සඳහා ණය සපයයි. කෙසේ වෙතත්, සියලු අයැදුම්පත් පශු වෛද්‍යවරයා විසින් සහතික කළ යුතු බැවින්ද නිෂ්පාදකයන්ට හැම විටම පශු වෛද්‍යවරුන් වෙත ප්‍රවේශය සලසා ගත නොහැකි නිසාද රජයේ මූල්‍ය සහාය වෙත ප්‍රවේශ වීම දුෂ්කර වේ. රාජ්‍ය හා වාණිජ බැංකුද සත්ව පාලනය සඳහා ණය සම්පාදනය කරතත් ක්‍රියා පටිපාටි ඉතා සංකීර්ණ බැවින් සුළු නිෂ්පාදකයන්ට මෙම ණය වෙත ප්‍රවේශ විය නොහැකිය.

*වෙළඳපොළ*

මඩකලපුව එම දිස්ත්‍රික්කයෙහි පරිභෝජනය කරනවාට වඩා කිරි නිපදවන බවත් ත්‍රිකුණාමලයෙහි එම තත්වය නොපවතින බවත් සත්‍යයකි. ඇතැම් කොට්ඨාසවල අතිරික්ත නිෂ්පාදනයක් ඇති හා අනෙක් ඒවායේ හිඟයක් පවතින දිස්ත්‍රික්කවලද මෙම වෙනස්කම් පවතී.

මෙම තත්වය තුළ, නිපදවන කිරි ප්‍රමාණය වැඩි කිරීමද එම අතිරික්ත කිරි ප්‍රමාණය සහ කිරි පදනම් කර ගත් වෙනත් අගය එකතු කළ නිෂ්පාදන සඳහා ප්‍රාදේශීය වෙළඳපොළක් සොයා ගැනීමද දුප්පත් කුටුම්බ සඳහා ජීවනෝපාය විකල්පයන් වැඩි දියුණු කිරීමේ වැදගත් ක්‍රමයකි.

වර්තමානයේදී කිරි මිලදී ගන්නේ රජයේ දෙපාර්තමේන්තු, රජය සතු මිල්කෝ සමාගම හා නෙස්ලේ වැනි පෞද්ගලික සමාගම්ය. සමාගම් කිරි මිලදී ගන්නේ ගොවි සංවිධාන හරහාය. ප්‍රාදේශීය එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙත කිරි රැගෙන ගිය විට සමාගම් එම ස්ථානවලින් ඒවා එකතු කරගනියි. කෙසේ වෙතත්, එකතු කිරීමේ මධ්‍යස්ථාන ජාලය නිපදවෙන සියලු කිරි එකතු කර ගැනීමට ප්‍රමාණවත් නැත: එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා පවත්නේ එක් එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පමණකි. ප්‍රදේශ අතර සම්බන්ධතාව දුර්වල වීම හා ප්‍රවාහන සීමාසහිතකම් නිසා ගැටලුව උග්‍ර වේ. මෙම සාධක ගොවීන් අධෛර්යමත් කොට කිරි දෙවීමේ නිරන්තරතාව පහත හෙළයි.

> *"කිරි දොවන්නේ උදේ කාලයේ විතරයි. ගොවීන්ට කිරි අලෙවි කර ගන්න විදියක් තියෙනවා නම් හවසත් දොවන්න පුළුවන්."*
>
> දිස්ත්‍රික්ක මට්ටමේ වැඩ මුළුව, මඩකලපුව

ගැටුම අතරතුරදී ආරක්ෂාව නොමැතිකම නිසා කිරි එකතු කිරීමේ ජාලය පුළුල් නොවීය. අධ්‍යයනය සිදු කළ සමයේදී සමහර කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන නඩත්තුවක් නොමැතිකම නිසා සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක නොවීය.

විධිමත් කිරි එකතු කිරීමට අමතරව අතරමැදියෝ/ප්‍රාදේශීය වෙළෙන්දෝද කිරි මිලදී ගැනීමෙහි නිරත වෙති. ඒ මොහොතේම ගෙවීම් කිරීමත් දුෂ්කර අවස්ථාවලදී ණය ලබාදී සහාය වීමත් හේතුවෙන් නිෂ්පාදකයෝ ප්‍රාදේශීය එකතු කරන්නන්ට කිරි අලෙවි කිරීමට පෙලඹෙති. එහෙත් ඔවුන් ගෙවන මිල රජය, නෙස්ලේ සමාගම හෝ මිල්කෝ සමාගම ගෙවන මිලට වඩා අඩුය. වටිනාකම් දාමයේ ඉහළ මට්ටම්වල සිටින්නේ වෙනත් ජනවර්ගවල ක්‍රියාකාරකයන් නිසා නිෂ්පාදන අදියරේදී තමන්ට අවාසියක් වන බවක් මඩකලපුවේ දෙමළ ගොවීන්ට හැඟේ.

අගය එකතු කිරීමක් සිදු නොවන නිසා වටිනාකම් දාමය තුළදී වඩා ඉහළ ප්‍රතිලාභ අත් කර ගත හැකි අදියර වන්නේ වෙළඳාමයි. වෙළඳාමෙහි ආයෝජනය කිරීමට ප්‍රාග්ධනය නොමැතිකම නිෂ්පාදකයන් වෙළඳාමෙහි නිරත වීම වළකයි.

*"අපි නිපදවන කිරි වෙළඳපොළට යන්න කලින් තුන් දෙනෙකුගේ අත්වලට යනවා. නිෂ්පාදකයන් හුග දෙනෙක් දෙමළ අය. කිරි අලෙවි කරන්නේ මුස්ලිම් අයට. මුස්ලිම් වෙළෙන්දෝ සිංහල කඩ හිමියන්ට කිරි අලෙවි කරනවා."*

අවධාන කණ්ඩායම් සාකච්ඡාව, එරාවූර් පත්තු

ත්‍රිකුණාමලයේදී රජය කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන පුළුල් කරමින් සිටී. එමෙන්ම, කිරිවල පෝෂණීය මට්ටම ආරක්ෂා කිරීමට අවම මට්ටමේ සැකසීමක් සිදුකරයි. මෙම සැකසුම් මධ්‍යස්ථානවලට විශාල කිරි ප්‍රමාණයක් සැකසීමේ හැකියාවක් නොමැති බැවින් නිෂ්පාදකයන්ට එකතු කරගත් අතිරික්ත කිරි ප්‍රමාණය නෙස්ලේ හෝ මිල්කෝ වැනි පෞද්ගලික සමාගම්වලට අලෙවි කිරීමට සිදුවේ. එහෙත්, සකසා පැකට් කළ කිරි නිෂ්පාදනය කර පැය 48ක් ඇතුළත පරිභෝජනය කළ යුතු බැවින් මධ්‍යස්ථානවල හැකියාව වැඩි කිරීමට නම් අඛණ්ඩ කිරි සැපයුමකුත් ප්‍රබල වෙළඳපොළ සම්බන්ධතාවකුත් තිබිය යුතුය.

### *නැවුම කිරි සඳහා පවතින ඉල්ලුම*

වර්තමානයේදී, කිරිපිටි පරිභෝජනය ඉහළ යාමේ ප්‍රවණතාව නිසා නැවුම් කිරිවල/දියර කිරිවල පෝෂණීය වටිනාකම වඩා ඉහළ මට්ටමක පැවතියද ඒ සඳහා පවතින ඉල්ලුම අඩු වී ඇත. මෙම ආකල්පය වෙනස් කර ග්‍රාමීය හා නාගරික ප්‍රජාවන්ගේ පරිභෝජන රටාව වෙනස් කිරීමට නම් දියර/නැවුම් කිරි පරිභෝජනය කිරීමේ ප්‍රතිලාභ පිළිබඳව දැනුවත්කම ඇති කළ යුතුවේ.

*"අපි ගොවි පවුල් හමු වෙන්න ගියාම නිවසේ නැවුම් කිරි තිබුණත් ඔවුන් අපට කිරිපිටි බොන්න දෙනවා. ඔවුන් හිතන්නේ අමුත්තන්ට නැවුම් කිරි දෙන එක ඔවුන්ට අගෞරව කිරීමක් කියලා."*

ප්‍රධානීන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව, මඩකලපුව

කෙසේ වෙතත්, කාලයත් සමග කුටුම්බවල ආදායම ඉහළ යන විට අනාගතයේදී නැවුම්/දියර කිරි සඳහා පවතින ඉල්ලුම ඉහළ යනු ඇති බව සඳහන් කළ යුතුය. මෙය ප්‍රාදේශීය මට්ටමේ කිරිපට්ටි කර්මාන්තය තුළ සිටින සුළු අයිතිකරුවන්ට වාසියක් සලසා ගතහැකි අවස්ථාවකි.

### *අගය එකතු කිරීම*

සාම්ප්‍රදායික මුදවපු කිරි වර්ග ප්‍රාදේශීයව නිපදවා අලෙවි කෙරේ. ප්‍රධාන වශයෙන් මනා ප්‍රවාහන සේවාවක් නොමැතිකම නිසා ඒවා ප්‍රදේශයෙන් බැහැරට ප්‍රවාහනය නොකෙරේ. තාක්ෂණය සඳහා ආයෝජනය කිරීමට ප්‍රාග්ධනය නොමැතිකමද මෑතදී නැවත පදිංචි වූ ප්‍රජාවන් තුළ විදුලි බලය නොමැතිකමද අගය එකතු කිරීමට බාධාවක් ලෙස දක්නා ලැබේ.

*"කිරිවලට අගය එකතු කිරීමක් සිදු වෙනවා නම් රු. 40ක් වටිනා කිරි රු. 100කට විකුණන්න පුළුවන්."*

දිස්ත්‍රික්ක මට්ටමේ වැඩ මුළුව, මඩකලපුව

අධ්‍යයනය කළ කිසිදු ප්‍රජාවක් තුළ යෝගට් නිෂ්පාදනය සිදු නොවේ. එහෙත්, එය අවම ප්‍රාග්ධන සහායක් අවශ්‍ය කරන අගය එකතු කිරීමේ ශිල්ප ක්‍රමවලින් එකකි. ප්‍රජා මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්/ගොවි සංවිධාන මාර්ගයෙන් මෙය හඳුන්වා දිය හැකිය. ප්‍රජාවෙන් පිටත සිටින ආයෝජනය කිරීමේ හැකියාව ඇති පෞද්ගලික අංශයේ පුද්ගලයෝ රස කළ කිරි නිෂ්පාදනය කිරීමෙහි නිරත වන නමුත් එය සිදු වන්නේ ප්‍රජා මට්ටමේදීය.

පෞද්ගලික අංශයේ සම්බන්ධය දක්නට ලැබෙන්නේ කිරි එකතු කිරීමේදී හා නැවුම් කිරි අලෙවි කිරීමේදී පමණකි. යෝගට් හා චීස් හා රස කළ කිරි සෑදීම සිදු වන්නේ ඉලක්ක ප්‍රජාවන්ට ළඟා විය නොහැකි බැහැරකය. පහත දැක්වෙන උපුටා දැක්වීම ප්‍රජා මට්ටමේදී සිදු වන අගය එකතු කිරීමේ වර්තමාන මට්ටම පිළිබිඹු කරයි.

> *"සමහර අවස්ථාවල අතරමැදියා දවස ඇතුළතදී කිරි ලීටර 5,000 සිට 7,000 දක්වා ප්‍රමාණයක් එකතු කර ගන්නවා, ඒවායින් මුදවපු කිරි හදනවා, හවස ආපහු අපටම විකුණනවා."*
>
> අවධාන කණ්ඩායම් සාකච්ඡාව, එරාවූර් පත්තු

### *අනෙක් පශු සම්පත්*

පිළිකන්නේ කෙරෙන කුකුළු පාලනය හා නිදහස් පරිසරයක එළුවන් ඇති කිරීම යන දෙකම දිස්ත්‍රික්ක දෙකෙහි දැකිය හැකිය. වඩා විශාල ප්‍රාග්ධනයක් ඇති ගොවීහු බ්‍රොයිලර් නිෂ්පාදනයේ නිරතව සිටිති. ඒ සඳහා ඉහළ ඉල්ලුමක් පවතින අතර, වත්මන් නිෂ්පාදනයට එම ඉල්ලුම සැපිරිය නොහැකිය.


මහා පරිමාණයෙන් නිපදවෙන හා මිල ගණන් වඩා අඩු ප්‍රදේශවලින් දිස්ත්‍රික්ක දෙකට කුකුළු පාලනය සඳහා කුකුළෝ ආනයනය කෙරෙති. මෙය මිල පහත හෙළන අතර, අධ්‍යයනය කළ දිස්ත්‍රික්කවල කුකුළු පාලනය සඳහා වාණිජ පදනමකින් කුකුළන් ඇති කිරීම අධෛර්යමත් කරයි.

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය නොවන සංවිධාන දිස්ත්‍රික්ක දෙක තුළ කුකුළු පාලනය දිරි ගන්වමින් සිටියි. එය කරනු ලබන්නේ විශේෂයෙන්ම මෑතදී නැවත පදිංචිවූ පවුල් අතර ද්විතීය/තාවකාලික ආදායම් මූලාශ්‍රයක් ලෙස කුකුළු පැටවුන් ලබාගැනීමේ ඉඩකඩ වැඩි කිරීමේ මැදිහත් වීම්වල නිරත වීම මගින් හා කුකුළු පාලනය සඳහා ක්ෂුද්‍ර ණය සැපයීමෙනි. ත්‍රිකුණාමලයෙන් කුකුළු පැටවුන් වඩා පහසුවෙන් ලබාගත හැකිය. උප්පුවේලි ප්‍රදේශයේ බෝ කරන තැනක් ඇත. එහෙත් වාණිජ පරිමාණයකින් කුකුළු පාලනය සිදුවන්නේ නම් එම ඉල්ලුම සැපිරීමට මෙයද ප්‍රමාණවත් නොවේ. මඩකලපුවේදී, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හඳුනාගත් නිෂ්පාදකයන්ට ක්ෂුද්‍ර පරිමාණ බෝ කිරීමේ ස්ථාන සැපයීමට බලාපොරොත්තු වේ.

ප්‍රාදේශීය වෙළඳපොළෙහි එළු මස් සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. එබැවින් බොහෝ කුටුම්බ අතිරේක ක්‍රියාකාරකමක් ලෙස එළුවන් ඇතිකරයි. එය පවුල්වලට අඛණ්ඩ ආදායමක් සපයන අතර, බෝග වගාවේ කන්න ස්වභාවය නිසා ඇති වන බලපෑම අඩු කරයි. එළුවන් ඇතිකිරීම සඳහා පවතින ප්‍රධාන බාධාව වන්නේ වැඩිදියුණු කළ සත්ව වර්ග නොමැති වීමයි.

අවසන් වශයෙන් කිව යුත්තේ, එලදායිතාව, අගය එකතු කිරීම, ආයතනික සහාය හා අලෙවි කිරීමේ හැකියාව සම්බන්ධ බාධාවන් ඉවත් කිරීමෙන් ගොවීන්ට ලැබෙන ප්‍රතිලාභ වැඩි වනු ඇති බවයි. උපඅංශය තුළ පවතින බාධාවන් සිතියම්ගත කරන රූප සටහන ඉහත සාකච්ඡා කරන ලද බාධාවන් සාරාංශගත කරයි. එසේම, ඒවාට විසඳුම් ලෙස සිදුකළ හැකි මැදිහත් වීම් පෙන්වා දෙයි.

**4.7 රූප සටහන: කිරි පට්ටි හා පශු සම්පත් අංශයේ බාධාවන් හා පැවතිය හැකි විසඳුම් සිතියම්ගත කිරීම**




මූලාශ්‍රය: අධ්‍යයන දත්ත

*ධීවර කර්මාන්තය*

අභ්‍යන්තර ධීවර කර්මාන්තය හා සාගරික ධීවර කර්මාන්ත දිස්ත්‍රික්ක දෙකෙහි සිදු වන ඉතා වැදගත් ජීවනෝපාය ක්‍රියාකාරකම් දෙකකි. ධීවර කර්මාන්තය අංශය තුළ පුද්ගලයන්ගෙන් බහුතරය නිරතව සිටින්නේ සාගරික ධීවර කර්මාන්ත උපඅංශයෙහිය. වැව් හා කලපු සහිත මඩකලපු දිස්ත්‍රික්කයේ භූ විෂමතාව ත්‍රිකුණාමලයට සාපේක්ෂව එම ප්‍රදේශය අභ්‍යන්තර ධීවර කර්මාන්තයට හිතකර කරයි.

## 4.4 අභ්‍යන්තර ධීවර කර්මාන්තය

සාගරික ධීවර කර්මාන්තය වාරික ස්වභාවයක් ගන්නා නමුත් අභ්‍යන්තර ධීවර කර්මාන්තය මත්ස්‍ය සම්භාරය මත පදනම්ව මුළු වසර පුරාම ක්‍රියාත්මක ක්‍රියාකාරකමකි. අභ්‍යන්තර හා සාගරික යන ධීවර කර්මාන්ත දෙකෙහි නිරත පවුල් පශු සම්පත් පාලනය සහ වී හා වෙනත් බෝග වගා කිරීම වැනි ද්විතීය ජීවනෝපාය ක්‍රියාකාරකම් හරහා අමතර ආදායමක් උපයා ගනිති. උදාහරණයක් ලෙස, අභ්‍යන්තර ධීවර කර්මාන්තයේ වටිනාකම් දාමය ගොඩනැගීම සඳහා මඩකලපුවේ මදුරන්කර්නිකුලම් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කුන්ජාන්කට්කුලම් ගම්මානය අධ්‍යයනය කෙරිණ. කොට්ඨාසය තුළ අභ්‍යන්තර ධීවර කර්මාන්තයෙහි නියැලෙන පවුල් 60ක් වාසය කරන අතර, ඔවුහු වීවගාව, මීපැණි එකතු කිරීම හා ගෙවතු වගාව වැනි ද්විතීය ජීවනෝපාය විකල්පයන්හිද නිරත වෙති.

අධ්‍යයනය කළ ග්‍රාම නිලධාරි කොට්ඨාසවල අභ්‍යන්තර ධීවර කර්මාන්තයේ නියැලෙන ධීවරයන්ගෙන් වැඩි කොටසක් කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අයිලාඩි හා නදූත්තු ගම්මානවලින්ද මඩකලපු දිස්ත්‍රික්කයේ කිතුල්වැව හා මදුරන්කර්නිකුලම් ගම්මානවලින්ද පැමිණි අය වෙති. මඩකලපුවේ පූනානි නැගෙනහිර හා පූලක්කාඩු ගම්මානවලදී අභ්‍යන්තර ධීවරයෝ වසර පුරා මසුන් ඇල්ලීමෙහි නිරත වෙති. කිතුල්වැව ගම්මානය ධීවරයන් බොහෝ ගණනකට රැකියා සපයයි. වී වගාවේ අවාරය වන අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ධීවරයෝ 101 දෙනෙකු තරම් සංඛ්‍යාවක් අභ්‍යන්තර ධීවර කර්මාන්තයෙහි නියැලෙති.

රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන යන දෙඅංශයම ඉක්මනින් ප්‍රතිලාභ ලබාදීම හා ප්‍රෝටීන අතිරේකයක් ලෙස පවතින පෝෂණීය වටිනාකම නිසා ගැටුමෙන් පීඩාවට පත් ප්‍රදේශවල වෙසෙන ගම්බද දුප්පතුන්ගේ ජීවනෝපායන් වැඩි දියුණු කිරීමේ සහායක් වශයෙන් යොදා ගත හැකි ක්ෂේත්‍රයක් ලෙස මිරිදියේ මසුන් ඇල්ලීම හඳුනාගෙන ඇත. මසුන් ඇල්ලීම ප්‍රජාවන්ට ද්විතීය ආදායම් මූලාශ්‍රයක් සම්පාදනය කරන අතර, ආදායමට බාහිර කම්පනයන්ගෙන් ඇති වන බලපෑම අවම කිරීම සඳහා වැඩි හැකියාවක් ඇති මිශ්‍ර ජීවනෝපායක් පවත්වාගෙන යාමට ඔවුන්ට උපකාර වෙයි. දැනටමත් පවත්නා රජයේ කෘෂිකාර්මික හා වාරිමාර්ග ව්‍යුහයන් හරහා ක්‍රියාත්මක වෙමින් අභ්‍යන්තර ධීවර කර්මාන්තය කෘෂිකාර්මික පද්ධතිය සමග ඒකාබද්ධ කොට ගම්බද ජීවනෝපාය විකල්පයක් ලෙස ප්‍රවර්ධනය කළ හැකිය. මෙම සාධකද පළාත තුළ අභ්‍යන්තර ජල මූලාශ්‍ර විශාල සංඛ්‍යාවක් පැවතීමද නැගෙනහිරදී අභ්‍යන්තර ධීවර කර්මාන්ත උපඅංශයට වර්ධනය විය හැකි බව අඟවයි.

**4.9 වගුව: නැගෙනහිර පවත්නා වැව් සංඛ්‍යාව (ස්වභාවය අනුව)**

| දිස්ත්‍රික්කය | බහුවාර්ෂික | වාරික | | |
|---|---|---|---|---|
| | | ක්‍රියාත්මක | අත් හළ | මුළු ගණන |
| මඩකලපුව | 18 | 206 | 96 | 296 |
| අම්පාර | 53 | 181 | 87 | 268 |
| ත්‍රිකුණාමලය | 10 | 428 | 196 | 624 |

මූලාශ්‍රය: සංඛ්‍යාන තොරතුරු, උතුරු නැගෙනහිර පළාත් සභා, 2005 සහ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, 2007 සහ මඩකලපු දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය, 2011

මැතක නැවත පදිංචි වූ ප්‍රදේශවල මිරිදිය මසුන් ඇල්ලීම කෙරෙන්නේ වාරිකව මූලික ශිල්පක්‍රම යොදාගෙන වැව්වලය. නිවසේ පරිභෝජනය සඳහා මෙන්ම ප්‍රාදේශීය වෙළඳපොළ පුළුල් කිරීමේ

අරමුණද ඇතිවය. එනම්, යැපීම ප්‍රධාන අරමුණ වන අතර, අල්ලාගත් අතිරික්තය අලෙවි කරනු ලැබේ. මේ අනුව, මසුන් ඇල්ලීමේදී ප්‍රධාන වශයෙන් යොදාගනු ලබන්නේ සාම්ප්‍රදායික/ස්වදේශීය සුළු පරිමාණ ශිල්ප ක්‍රමය. නැගෙනහිර දිස්ත්‍රික්ක තුනේ මිරිදිය මසුන් අල්ලන වැඩිම ජන ප්‍රතිශතය සිටින්නේ මඩකලපුවෙහිය. නිෂ්පාදනයේ වැඩිම ප්‍රතිශතය පවතින්නේ අම්පාරෙහි වන අතර, ඒ අනුව වඩා වැඩි ශ්‍රම ඵලදායිතාවක් ඇත්තේ එහිය. ගල්ඔය යෝජනා ක්‍රමය යටතේ සිටින මිරිදිය මසුන් අල්ලන ජනයාට සැපයූ පුහුණු වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස වඩා හොඳ ධීවර ශිල්ප ක්‍රම යොදා ගැනීමත්, බහුවාර්ෂික වැව් වැඩි සංඛ්‍යාවක් පැවතීමත් නිසා වියළි කාලයේදීද මසුන් ඇල්ලීමට ඇති හැකියාව අම්පාරෙහි ඉහළ ඵලදායිතාවට හේතුවක් වන්නට ඇත. අම්පාරේ උදාහරණය මඩකලපුවේ ත්‍රිකුණාමලයේ මිරිදිය ධීවර කර්මාන්තයටද අදාළ කළ හැකිය. තාක්ෂණය පැවරීම, යටිතල පහසුකම් සංවර්ධනය හා ආයතන ශක්තිමත් කිරීම හරහා ඵලදායිතාව වැඩි දියුණු කිරීම හැරුණු විට පරිසරය සුරැකීම හා අංශය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජ භාවයීය අසමතුලිතතා අවම කිරීම වැනි සමස්ත ක්‍රමෝපායන්ද අංශය සංවර්ධනය කිරීමේදී සැලකිල්ලට ගතයුතු වේ.

වර්තමාන වෙළඳපොළ පිළිබඳ විශ්ලේෂණය මිරිදිය ධීවර කර්මාන්ත උපඅංශයේ නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩි කිරීමේ හැකියාව හඳුනාගනියි. කෙසේද යත්, ඉහළ ඉල්ලුමක් සහිත ගුණාත්මක ''ඇඟිල්ලන්'' සැපයුම වැඩි දියුණු කිරීම මගින්, වාරිමාර්ග හා ප්‍රදේශ අතර සම්බන්ධතාවට අදාළ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මගින්, වැව හා මත්ස්‍ය සම්භාරය සැලකිල්ලට ගනිමින් සාමූහික තීරණ ගැනීම හරහා සම්පත් කළමනාකරණය කිරීම මගින් සහ විශේෂයෙන්ම හඳුනා ගත් ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්වලට ධීවර ආම්පන්න සැපයීම මගිනි. සාම්ප්‍රදායික ක්‍රමයට සකස් කළ සමහර කරවල වර්ග සඳහා ඉල්ලුමක් හෙවත් සහතික වෙළඳපොළක් පවතින බව උපඅංශය පෙන්වා දෙයි. සකස් කරන මාළු ප්‍රමාණය වැඩි කිරීමෙන් හා දිගු කාලයේදී දිස්ත්‍රික්කයෙන් පිටත වෙළඳපොළවලට නිෂ්පාදනය හඳුන්වා දීමෙන් මෙය තව දුරටත් සංවර්ධනය කළ හැකිය. මිරිදිය මසුන් සඳහා ප්‍රදේශය තුළද ඉහළ ඉල්ලුමක් පවතින බව පෙනෙන නමුත් උපඅංශයේ දිගු කාලීන තිරසරතාව සහතික කිරීම සඳහා දිස්ත්‍රික්කයෙන් පිටත වෙළඳපොළවල් සොයා බැලීමට පහසුකම් සැපයිය යුතු වේ.

***මත්ස්‍ය නිෂ්පාදනය***

නැවුම් මාළුවල මිල රු.100-200 පමණ වේ. නිෂ්පාදකයන් මසුන් ඇල්ලීමේදී යාන්ත්‍රික නොවන සාම්ප්‍රදායික විධික්‍රම යොදා ගැනීම නිසා යෙදවුම් පිරිවැය අවමය. මිලදී ගන්නන් ගමට පැමිණ සිල්ලර මිලක් පිරිනමන තත්වයකදී (ශ්‍රමය හා ප්‍රවාහනය සම්බන්ධ) පිරිවැය අවම වන අතර, මුළු ආදායමම ලාභයක් ලෙස සැලකිය හැකිය. ඉහළ වෙළඳපොළ ඉල්ලුමක් පවතින බැවින් සහ නිෂ්පාදකයාට වැඩි ප්‍රතිලාභ ලබා දෙන බැවින් උපඅංශයේ නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩි කිරීමට දිරිගැන්විය යුතුය. කෙසේ වෙතත්, සම්පත් කළමනාකරණ යන්ත්‍රණයන්ද හඳුන්වා දිය යුතුය. එසේ නොකළ හොත්, නිෂ්පාදනය වැඩි කිරීමට යාමේදී තරගකාරිත්වය ඇති විය හැකිය. එමෙන්ම, ස්වාභාවික පරිසර පද්ධතිවලට හානි සිදු විය හැකිය.

නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩි කිරීම සඳහා පවතින ප්‍රධාන බාධාවන් ලෙස හඳුනාගන්නා ලද්දේ වැව් සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක නොවීම හා ගුණාත්මක යෙදවුම් නොමැතිකමයි. අභ්‍යන්තර ධීවර කර්මාන්තයේදී ප්‍රධාන යෙදවුම් වන්නේ ඇඟිල්ලන්, ධීවර යාත්‍රා, ධීවර ආම්පන්න හා ශ්‍රමයයි.

වැවේ ගුණාත්මකත්වය දුර්වල වීම නොකඩවා මසුන් ඇල්ලීමට බාධාවකි. වර්තමානයේදී අධ්‍යයනය කළ ප්‍රජාව තුළ පවතින වැව සමන්විත වන්නේ ජල අක්කර 100කින් පමණක් වුවත් පුනරුත්ථාපනය කිරීමෙන් එය අක්කර 600ක් දක්වා පුළුල් කළ හැකිය. වියළි කාලයේදී එය වියළෙන අතර, සොරොව් නොමැති නිසා ගම්මු වැලි මලු යොදාගෙන ජලයේ ගලා යාම පාලනය කරති. වැව නඩත්තු කිරීමේ වගකීම තිබෙන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට නොව පළාත් සභාවටය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ වැඩමුළුවේදී හා රජයේ නියෝජිතයන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවලදී සාකච්ඡා කළ පරිදි රජය හා රාජ්‍ය නොවන සංවිධාන මේ ප්‍රජාවන් නැවත පදිංචි කිරීමේ සැලසුම්වල කොටසක් ලෙස වැව ප්‍රතිසංස්කරණය කිරීමට සහාය සපයයි. වැව ප්‍රතිසංස්කරණය කිරීමේදී නිෂ්පාදක කණ්ඩායම්ද සම්බන්ධ කරගත යුතුය. එවිට ඔවුන්ට ධීවර සමිති හරහා වැව නඩත්තු කිරීමට හා

කළමනාකරණය කිරීමට දායක විය හැකිය. ජල සම්පත් කළමනාකරණ පද්ධති පිළිබඳව ඔවුන් දැනුවත් කළ යුතු අතර, මෙම මැදිහත් වීම් ක්‍රමෝපායගත කරන විට හා සැලසුම් කරන විට දිගු කාලයේදී ඒවායේ හිමිකාරත්වය ඔවුන් සතු වන පරිදි ඒ සඳහා ඔවුන්ද සහභාගි කරගත යුතුය.

ගම්වැව් තුළ වාරිකව කෙරෙන රෝපණයේදී යොදාගන්නා වඩාත්ම පොදු කළමනාකරණ පියවරයන් අතර මුල් තැන ගන්නේ ඇඟිල්ලන් විශාල වශයෙන් ඇති කිරීමත් අනතුරුව එම අස්වැන්න නෙළා ගැනීමත් බව නිරීක්ෂණය වී ඇත. වර්තමානයේ, එක් වාරිකයකදී ඇතිකළ යුතු ඇඟිල්ලන් ප්‍රමාණය 100,000ක් වියයුතු යැයි අදාළ බලධාරි ආයතන තමන්ට දැනුම්දී ඇති බවත් තමන් එක් කන්නයකදී කි.ග්‍රෑ.1,000ක අස්වැන්නක් නෙළා ගන්නා බවත් ප්‍රජාව ප්‍රකාශ කරයි. වාර්තා අනුව මෙය සාමාන්‍යය ලෙස සැලකිය හැකිය. මසුන්ට අතිරේක ආහාර සැපයීමක් සිදු නොවේ. FAO ආයතනය කළ පර්යේෂණයකදී පෙන්නුම් කෙරුණේ (පොහොර හා ආහාර වැනි) යෙදවුම් එක් කිරීමෙන් හා විශාල සංඛ්‍යාවක් ඇති කිරීමෙන් ඵලදායිතාව වැඩි දියුණු කළ හැකි බව යි (FAO, 2004). කෙසේ වෙතත්, ප්‍රාග්ධනය හා නව තාක්ෂණය නොමැතිකම නිසා මෙම ප්‍රජාවන්ට අතිරේක ආහාර ගැන කල්පනා කළ හැක්කේ දිගු කාලයේදී පමණකි.

ඇඟිල්ලන් සැපයුම හා ඇති කිරීම සම්බන්ධයෙන් ගැටලු පවතී. ධීවර දෙපාර්තමේන්තුව ඇඟිල්ලන් සපයන අතර, ඒවා මිලදී ගැනීම සඳහා අරමුදල් සම්පාදනය කෙරෙන්නේ පළාත් සභාවෙනි. තාක්ෂණය හා ප්‍රාග්ධනය නොමැතිකම නිසා ගොවීන්ට තව මත්තමන් විසින්ම ඇඟිල්ලන් නිපදවීම හෝ තවාන් ආරම්භ කිරීම කළ නොහැකි බැවින් සියලු ඇඟිල්ලෝ දිස්ත්‍රික්කයෙන් පිටත දඹුල්ල, පුත්තලම හෝ අම්පාර වැනි ප්‍රදේශවලින් ආනයනය කෙරෙති. දුර හා ප්‍රවාහනය කරන විධිය නිසා ඇඟිල්ලන්ගෙන් විශාල ප්‍රමාණයක් මිය යති.

> *"වයිරල් හා සුන්ගන් වගේ මනා ගුණාත්මකත්වයක් හා ඉහළ ඉල්ලුමක් සහිත මසුන් අපිට නැහැ. මේ මත්ස්‍ය වර්ගවල කරවල මිල අධිකයි."*
>
> සිද්ධි අධ්‍යයනය, ආබාධිතත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයා, කාන්තා, වාකරේ

ඇති කරන තොගය ප්‍රමාණවත් නොවන බවත් එම තොග සැපයෙන නිරන්තරතාව මන්දගාමී බවත් නිෂ්පාදකයන්ට හැඟේ. එමෙන්ම, වැවට දමන මත්ස්‍ය වර්ග ගැන ඔවුන්ගේ මනාපයක් නැත. ඊට හේතුව ඒවා ඉහළ ඉල්ලුමක් හා ඉහළ වටිනාකමක් ඇති මත්ස්‍ය වර්ග නොවීමයි. දැනට වැවට දමනු ලබන්නේ පවත්නා තත්වයන්ට හොඳින්ම ගැළපෙන මත්ස්‍ය වර්ග නොවේ. මෙම වර්ගවලට ස්වාභාවිකව අභිජනනය විය නොහැකිය. එම මත්ස්‍යයෝ ස්වාභාවිකව අභිජනනය වන සාම්ප්‍රදායික මත්ස්‍ය වර්ගවල ඇඟිල්ලන් හා බිත්තර ආහාරයට ගනිති. ඇඟිල්ලන්ගේ වැඩීම පරිස්සමින් කළමනාකරණය කළ යුතුය. එසේ නොකළ හොත් අභ්‍යන්තර ධීවර කර්මාන්තය තිරසර කළ නොහැකිය. පහසු අඩු වියදම් ආරම්භකත්වයන් සහිත වවාරික වැව් ආශ්‍රිත ජලජ රෝපණය ප්‍රවර්ධනය කිරීම, ජලය රඳවා ගැනීම හා මානව ක්‍රියාකාරකම් නිසා වැව් ජලයේ උසස් පෝෂක පැවතීම සහ අම්පාරේ රජවැව හා කිරවාන වැනි ගොඩබිම පදනම් කර ගත් කුඩා තවාන් ඇති කිරීම ප්‍රජාවට වඩා සමීපව හොඳ ගුණාත්මක ඇඟිල්ලන් නොමැතිකම පිළිබඳ ගැටලුවට යොදාගත හැකි විසඳුම් වේ.

අභ්‍යන්තර ධීවර කර්මාන්තය සාමාන්‍යයෙන් සංවිධානය වන්නේ ධීවර සමිති වටාය. එම සමිති ප්‍රතිලාභ සාධාරණව බෙදී යන බවත් නුසුදුසු ධීවර ආම්පන්න යොදා ගැනීම පාලනය කරන බවත් පමණ ඉක්මවා මසුන් ඇල්ලීම වළක්වන බවත් අලෙවි කිරීමට පහසුකම් සැපයෙන බවත් සහතික කිරීමට උත්සාහ කරයි. මෙම සමිති වැව් නඩත්තු කිරීමටද සම්බන්ධ වෙයි. කුන්ජාන්කට්කුලම් ගම්මානයේ පවුල් 60ක් සමිතියේ ලියාපදිංචි වී ඇත. සමිතිය සතුව බෝට්ටු 25ක් ඇති බැවින් මසුන් ඇල්ලීම ඒකාබද්ධ ක්‍රියාකාරකමක් විය. මසුන් ඇල්ලීමෙහි සහභාගි වීමට අවසර තිබෙන්නේ එක් පවුලකින් එක් සාමාජිකයෙකුට පමණකි. මෙය පමණ ඉක්මවා මසුන් ඇල්ලීමත් සම්පත් ක්ෂය වීමත් පාලනය කළේය. ප්‍රබල මැනවින් ක්‍රියාත්මක ධීවර සමිතියක් පැවතීම නව ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සඳහා අවස්ථාවක් විය හැකිය.

පමණ ඉක්මවා මසුන් ඇල්ලීමෙන් සිදු වන සම්පත් ක්ෂය වීම අභ්‍යන්තර ධීවර කර්මාන්තය සඳහා පවතින ප්‍රධාන බාධාවකි. යොදා ගන්නා ධීවර ආම්පන්න වර්ග පාලනය කරන රෙගුලාසි හා නියාමන ආයතන නොමැති තත්වය තුළ ප්‍රජාවන් තමන්ගේම නියාමන යන්ත්‍රණයන් යොදාගෙන ඇත. කුන්ජාන්කට්කුලම් ගම්මානයේදී ධීවර සමිතිය ආම්පන්න භාවිතය පාලනය කරයි. ප්‍රදේශය තුළ පවත්නා පොලිස් හා හමුදා මුර පොළවල්ද නීති විරෝධී ධීවර ආම්පන්න භාවිතය පිළිබඳව විමසිල්ලෙන් සිටියි. ප්‍රජාවන් එල්ටීටීඊයේ පාලනය යටතේ සිටි සමයේදී එල්ටීටීඊය ධීවර පරිචයන් නියාමනය කිරීමට පියවර ගත්තේය.

ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් හා ඔවුන්ට සහාය වන සමීප ඥාතීහු මූලික මට්ටමකින් අභ්‍යන්තර ධීවර කර්මාන්තයේ නිෂ්පාදන අදියරට සම්බන්ධ වෙති. ඔවුන් සිටින්නේ වටිනාකම් දාමයේ පහළම අදියරෙහි එනම් යොදා ගන්නා ආම්පන්නවල ගුණාත්මකත්වයට හා ඇල්ලිය හැකි මසුන් ප්‍රමාණයට සම්බන්ධ අදියරෙහි බව පෙනේ. ඇගිල්ලන්ගේ ගුණය හා ප්‍රමාණය සම්බන්ධයෙන් ඉහත කොටස්වලදී සාකච්ඡා කළ බාධාවන් හා සුළු පරිමාණ වැව්වල ජරාවාස තත්වය මෙම ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් විසින්ද නැවත ප්‍රකාශ කෙරිණ.

ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බද ආබාධිතත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයන්ද බිලි පිති හා කුඩා දැල් වැනි මූලික ධීවර විධික්‍රම යොදා ගන්නා මෙම ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්වලට සහාය වන අයද ප්‍රධාන වශයෙන් මසුන් ඇල්ලීමෙහි නිරත වන්නේ ඔවුන්ගේ ආදායමට අතිරේකයක් වශයෙනි. ඉහත සඳහන් කළ ප්‍රජා මට්ටමේ බාධාවන්ට අමතරව ධීවර ආම්පන්න මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රාග්ධනය නොමැතිකමද ප්‍රතිචාරකරුවන් බාධාවක් ලෙස සඳහන් කළ අතර, ඔවුන්ට බෝට්ටු වෙත ප්‍රවේශය නොතිබිණ.

> *"මගේ ඇවිලිල්ල නිසා මට කිසි වැඩක් කරන්න බැහැ. මහත්තයා ධීවර රස්සාවේ යෙදෙනවා. ඒත් එයාට සුදුසු ධීවර ආම්පන්න නැහැ. එයාට තියෙන්නේ පරණ දැලක්. අලුත්වැඩියා කර කර පාවිච්චි කරනවා. එයාට බෝට්ටුවක් නැහැ. බෝට්ටුවක් තිබුණා නම් අල්ලන මාළු ප්‍රමාණය වැඩි කර ගන්න තිබුණා. අපේ වැව ඒ තරම් ගැඹුරු නැහැ. ඒ නිසා හොඳ තත්වයේ මාළු නැහැ. වැව ප්‍රතිසංස්කරණය කළොත් අපිට අපේ ලාභය වැඩි කර ගන්න පුළුවනි."*
>
> සිද්ධි අධ්‍යයනය, ආබාධිතත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයා, කාන්තා, වාකරේ

මසුන් ඇල්ලීමෙහි නිරත ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ ධීවර සමිතියේ සාමාජිකත්වය දරයි. එහෙත් ඔවුන් සාමාජික ගාස්තු ගෙවීම අනිවාර්ය නැත. අවශේෂ ධීවර ප්‍රජාව යොදා ගන්නා අලෙවිකරණ විධික්‍රම යොදා ගන්නා ඔවුහු අල්ලා ගත් මසුන් ධීවර සමිතිය හරහා ඉහළම ලංසුවට විකුණති.

ධීවර කර්මාන්ත අංශය සඳහා ඉදිරිපත් කළ දසඅවුරුදු සැලැස්ම අනුව ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය නැගෙනහිර උදෙසා සකස් කළ කලාපීය සැලසුම් යොදාගෙන දැනටමත් නිර්මාණය කර ඇති ආදර්ශ ගොවි පොළෙන් ඔබ්බට යමින් රෝපණ ධීවර කර්මාන්තය සංවර්ධනය කළ හැකිය. මෙම ප්‍රදේශවල පවත්නා ජල මණ්ඩල රෝපණ ධීවර කර්මාන්තය සඳහා පවතින අවස්ථා වැඩි කරයි. රෝපණය කළ ඉහළ වටිනාකමක් සහිත මත්ස්‍ය වර්ග සඳහා පවතින අපනයන ඉල්ලුම ධීවරයාට ලැබෙන මිල ඉහළ නංවයි. පොකිරිස්සන්, සී කියුකම්බර්, සී බාස්, බෙල්ලන් හා කකුළුවන් වැනි ඉහළ වටිනාකමක් සහිත මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළඳපොළේ පවතින ඉල්ලුම සපුරමින් දේශීය නිෂ්පාදනය ඉහළ නැංවිය හැකිය. කෙසේ වෙතත්, රට තුළ කකුළුවන් හා පොකිරිස්සන් අපනයනය කරන ප්‍රමාණය පහත වැටී ඇති අතර, එය මේ ප්‍රදේශවල රෝපණ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අවස්ථාවක් සම්පාදනය කරයි.

ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රම හෝ ජීවනෝපාය සහායන ව්‍යාපෘති මාර්ගයෙන් ආරම්භක ප්‍රාග්ධන පිරිවැය සම්පාදනය වන්නේ නම් ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ වැනි ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්වලට රෝපණය පදනම් කරගත් ධීවර කර්මාන්තය ගැළපෙයි. රෝපණ ධීවර කර්මාන්තය

සඳහා අවශ්‍ය කරන බැර කායික ශ්‍රම ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් අඩුය. එබැවින් එය ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්වලට හොඳින්ම ගැළපෙයි. රෝපණ මත්ස්‍ය කර්මාන්තයේ ලාභදායකත්වය පිළිබඳ දැනුවත්කම ඇති කිරීමට පෞද්ගලික අංශය තුළ, මුලපුරා මේ වෙරළබඩ ප්‍රදේශවල ආයෝජනය කිරීමට ඔවුන් දිරිගැන්විය යුතුය. කෙසේ වෙතත්, රෝපණ ධීවර කර්මාන්තය හඳුන්වාදී කළමනාකරණය කළ යුත්තේ පරිසරයට සිදුවිය හැකි හානිය අවම කිරීම සඳහා පැහැදිලි සම්පත් කළමනාකරණ යන්ත්‍රණයන් යොදාගෙන පරිස්සමිනි.

*අගය එකතු කිරීම*

අභ්‍යන්තර ධීවර කර්මාන්තයේ නිරත ජනයා සමහර මත්ස්‍ය වර්ග සැකසීමෙන් වැඩි මුදලක් උපයති. මෙම අධ්‍යයනයට සහභාගිවූ මත්ස්‍ය නිෂ්පාදකයන් තමන්ට වැඩි ලාභයක් ගෙන දෙන මත්ස්‍ය වර්ග හා වැඩි ඉල්ලුමක් සහිත මසුන් සැකසීමේ විධික්‍රමය හඳුනාගෙන ඇත. ජාඩි කරවල සඳහා ඉල්ලුමක් නැති බව ඔවුන් තේරුම්ගෙන ඇති බැවින් ඔවුහු දර යොදාගෙන දුම් ගසා වියළීමෙන් කරවල සැකසීමේ සාම්ප්‍රදායික විධික්‍රමය යොදාගනිති. මේ සඳහා වැය වන්නේ අවම පිරිවැයකි. ක්‍රියාවලිය දින 3කින් පමණ අවසන් කළ හැකිය. ඉහළ ඉල්ලුමක් ඇති සුන්ගන් හා වයිරල් මසුන්ගෙන් සැකසූ කරවල (අධ්‍යයනය සිදුකළ සමයේදී) නිෂ්පාදකයන්ට අනුපිළිවෙළින් කිලෝවකට රු.800ක් හා රු.600ක් උපයා දුන්නේය.

> *"අපි මාළු කිලෝ 3ක් වේළුවොත් කරවල කිලෝවක් ලැබෙනවා. ඒ හින්දා අපි සකස් කරන්නේ හොඳ ඉල්ලුමක් හා ඉහළ මිලක් තියෙන මාළු විතරයි.... කරවල කිලෝවක් සාමාන්‍යයෙන් අලෙවි වෙන්නේ රු.300 ගානේ. මේවා අමු මාළු විදියට විකුණන එක ඊටවැඩිය ලාභයි."*
>
> අවධාන කණ්ඩායම් සාකච්ඡාව, වාකරේ

ඉහළ ඉල්ලුම නිසා ගබඩා කිරීමට ඇත්තේ සුළු අවශ්‍යතාවකි. කෙසේ වෙතත්, අයිස් නිෂ්පාදනාගාර නොමැතිකම නිසා වැඩිම ඉල්ලුමක් ඇති සමයේදී නිෂ්පාදකයාට ප්‍රදේශයෙන් පිටත වෙළඳපොළවලට මසුන් අලෙවි කිරීමට ඇති හැකියාව සීමාවේ. මෙහි ප්‍රතිඵලය වන්නේ සමහර ධීවර ප්‍රජාවන් තම පරිශ්‍රමයට ලැබෙන වටිනාකම නොතකා මිරිදිය මසුන් සැකසීමයි. අධ්‍යයනය සිදු කළ සමයේදී නිෂ්පාදකයන් සාමාන්‍ය ජාඩි මාළු අතරමැදියන්ට අලෙවි කළේ වෙළඳ පොළ මිලෙන් අඩකටය. කරවල නිෂ්පාදනය කෙරෙන්නේ හුදෙකලා ප්‍රදේශවලය. එබැවින් ප්‍රවේශය ගැටලුවකි. අලෙවි කිරීම හා වෙළඳ පොළ තුළ ඉහළ ඉල්ලුමක් තිබෙන මත්ස්‍ය වර්ග තෝරාගැනීම සම්බන්ධයෙන් ධීවරයාගේ පැත්තෙන් දැනුවත්කමක් නොමැතිකම ප්‍රවාහන පහසුකම් දුර්වල වීමත් සමග එක් වී කරවල අතරමැදියාට විකිණීමට නිෂ්පාදකයන්ට බලකරයි. තම නිෂ්පාදනය සඳහා හොඳ මිලක් ඉල්ලීමට ඔවුන්ට හැකියාවක් නැත.

ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්ද දුම් ගසා වේළා කරවල සාදන විධික්‍රමය යොදා ගෙන මිරිදිය මසුන්ට අගය එකතු කිරීමේ ක්‍රියාවලියේ කොටස්කරුවෝ වෙති. කායික නොහැකියාවන් නිසා මසුන් ඇල්ලීමෙහි නිරත විය නොහැකි අය මසුන් සැකසීමෙහි නිරත වීමට කැමැත්තක් දක්වති.

> *"කරවල සැකසීම ගැන මම ළමා කාලේ ඉඳලාම අත්දැකීම් ලැබුවා. ඒ නිසා මට ඒ කාරිය කරන්න පුළුවන්. මගේ මහත්තයා සමහරදාට කරවල හදන්න මාළු ගේනවා. ඒත් අපේ ගමේ වැවේ ඇතිතරම් මාළු නැහැ."*
>
> සිද්ධි අධ්‍යයනය, ආබාධිතත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයා, කාන්තාව, වාකරේ

දුම් ගසා වේළන ලද කරවල සඳහා හොඳ වෙළඳ පොළක් පැවතීමත් අත්දැකීම හා සාම්ප්‍රදායික දැනුම මගින් ඔවුන් අත්කරගෙන ඇති තාක්ෂණික දැනුමත් එමෙන්ම අගය එකතු කිරීමේදී එතරම් එහා මෙහා යාමට සිදුනොවීමත් වාසියට ගෙන විශේෂයෙන්ම ගොදුරු වීමට ඉඩ ඇති ජනයා මෙම සැකසුම් ක්‍රියාවලියෙහි නිරත කරවිය හැකිය.

*"මම මාළු ඇල්ලුවොත් ඒවා විකුණන්න යන්නේ නැහැ. මාළු විකුණුවොත් ලාභය අඩුයි. මම කරවල වේළනවා. ඒකෙන් වැඩි ලාභයක් ලැබෙනවා. වෙළෙන්දෝ මගේ ගෙදරට ඇවිත් කරවල මිලදී ගන්නවා. සූන්ගන් හා වයිරල් කියන්නේ කරවල වේළන්න හොඳ මාළු වර්ග. ඒත් වැවේ මේ මාළු අඩුයි."*

සිද්ධි අධ්‍යයනය, ආබාධිතත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයා, පිරිමි, වාකරේ

ඉහළ වටිනාකමක් සහිත මිරිදිය හා කිවුල්දිය නිෂ්පාදන හඳුන්වා දීමෙන් සහ තාක්ෂණික හා ආරම්භක මූල්‍ය සහාය සැපයීමෙන් ලාභදායකත්වය අඩු සාම්ප්‍රදායික මිරිදිය ධීවර අංශයෙන් ධීවරයන් ඉවත් වනු ඇත. කකුළුවන් හා කිවුල්දිය පොකිරිස්සන් වැනි මසුන් ඇල්ලීම පිළිබඳව පවත්නා දැනුම හා අත්දැකීම මෙම උපඅංශය පුළුල් කිරීම සඳහා අවස්ථාවක් ලෙස දැකගත හැකිය. ජීවනෝපාය පිළිබඳ කොටසේදී අවධාරණය කළ පරිදි USAID අරමුදල් සැපයූ QCORE ව්‍යාපෘතිය සඳහා කළ අධ්‍යයනයකදී (2009 මැයි) තිලාපියා, මිල්ක්ෆිෂ් හා කාපියා විශේෂයන් වර්ධන අවධියේදී වඩා පහසු හා අඩු වියදම්කාරී යැයිද වෙළඳපොළේදී උපයා දෙන්නේ ඉස්සන්ට වඩා අඩු මිලක් වුවද රෝගවලට ගොදුරු වන්නේ ඉස්සන්ට වඩා අඩුවෙන් යැයිද දක්නා ලැබේ. අයිස් නොදැමූ නැවුම් මාළුවලට කැමති ප්‍රාදේශීය වෙළඳපොළ ඉලක්ක කරගත යුත්තේ මේ මාදිලියේ ජලජ රෝපණයක් උදෙසාය. ඉහළ වටිනාකමක් සහිත රෝපණ ධීවර කර්මාන්තය පිළිබඳ මේ විධික්‍රම අධ්‍යයනය සිදුකළ සමයේත් නැගෙනහිර පළාත පුරා විශේෂයෙන්ම මඩකලපු දිස්ත්‍රික්කය පුරා නියමු අදියරවල පැවති අතර, තව දුරටත් ව්‍යාප්ත කිරීමටත් නියමු අදියරවලින් උගත් පාඩම් උකහාගැනීමටත් පියවර ගත යුතුය.

### *වෙළඳපොළවල්*

මිරිදියෙන් හා කිවුල්දියෙන් අල්ලා ගන්නා මසුන් හා රෝපණ මත්ස්‍යයන් ප්‍රාදේශීය වෙළඳපොළේදී සාගරික මසුන් සමග තරගවදින අතර, අපනයනය හැකියාවක් ඇති බව පෙන්නුම් කර ඇත. නැගෙනහිර දිස්ත්‍රික්කවල සිට අවම කාලයක් තුළ වඩා නාගරික ප්‍රදේශ වෙත ප්‍රවාහනය කර අයිස් නොදැමූ තිලාපියා හා මිල්ක්ෆිෂ් ප්‍රාදේශීය වෙළඳපොළ ඉලක්ක කරගත යුතුය. කුනිස්සන් හා කකුළුවන් වැනි රෝපණ මත්ස්‍යයන්ට සංචාරක කර්මාන්තය මෙන්ම අපනයන වෙළඳපොළද ඉලක්ක කරගත හැකිය. ආපසු මිලදී ගැනීමේ පද්ධති තුළ පෞද්ගලික අංශයේ සම්බන්ධය දිරිගැන්විය යුතු අතර, සමාගම ඇඟිල්ලන් හා ආහාර සපයා තරගකාරී වෙළඳපොළ මිලකට ගොවීන්ගෙන් අස්වැන්න ආපසු මිලදී ගන්නා පද්ධති සමග සම්බන්ධතා ඇති කිරීමට හැකි තැන්වලදී ඒ සඳහා පහසුකම් සැපයිය යුතුය.

වෙළඳ මධ්‍යස්ථාන නොමැතිකම නිසාත් ප්‍රවාහන පහසුකම් හා ප්‍රදේශ අතර සම්බන්ධතාව නොමැතිකම නිසාත් නිෂ්පාදකයෝ තම අස්වැන්න උපරිම මිලට වඩා අඩු මිලකට අතරමැදියන්ට හා එකතු කරන්නන්ට අලෙවි කිරීමට පෙලඹෙති. ධීවර සමිතියක් ඇති කුන්ජාන්කට්කුලම්හිදී පමණක් නිෂ්පාදකයන්ට තම මත්ස්‍ය අස්වැන්න ඉහළම මිලක් පිරිනමන මිලදී ගන්නාට අලෙවි කළ හැකිය. මෙහිදී මිලදී ගන්නා ඔවුන්ට වෙළඳපොළ මිල පිරිනමන අතර, ධීවර සමිතියට කිලෝවකට රු.10ක අමතර ගෙවීමක්ද කරයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ශක්තිමත් වන ධීවර සමිතියට අනතුරුව වාරික වැව් ආශ්‍රිත මත්ස්‍ය රෝපණය ආරම්භ කිරීමටද යොමු විය හැකිය.


දිස්ත්‍රික්ක මට්ටමේ වැඩමුළුවලින් අනාවරණය වූයේ අතරමැදියා ධීවරයාගෙන් රු.90කට මසුන් මිලදී ගෙන රු.190කට සිල්ලර වෙළෙන්දාට අලෙවි කරන බවත් සිල්ලර වෙළෙන්දා පාරිභෝගිකයාගෙන් රු.290ක් අය කරන බවත්ය. සාගරික අංශයේදී මෙන්ම මෙහිදීද අතරමැදියා අගය එකතු කිරීමේ ක්‍රියාවලියට යෙදවුම් සපයා අවසානයේ අස්වැන්න මිලදී ගනියි. අතරමැදියා අයිස් පෙට්ටි රැගෙන එයි, මසුන් එම පෙට්ටිවල ගබඩා කරයි, අස්වැන්න වෙළඳපොළට ප්‍රවාහනය කරයි. නිෂ්පාදකයාට වෙළඳපොළ පිළිබඳව අවබෝධයක් නොමැතිකම, ප්‍රජාවට වඩා සමීපව වෙළඳ මධ්‍යස්ථාන නොමැතිකම හා යටිතල පහසුකම් අතින් ප්‍රදේශ අතර සම්බන්ධතාවක් නොමැතිකම නිසා නිෂ්පාදකයන්ට තම අස්වැන්න අඩු මිලකට අතරමැදියාට හෝ එකතු කරන්නාට අලෙවි කිරීමට සිදු වේ.

අභ්‍යන්තර මත්ස්‍යයන්, එනම් ජාඩි නොදැමූ ඉස්සන් හා කරවල සඳහා ඉහළ (හා වැඩි වන) ප්‍රාදේශීය ඉල්ලුමක් පවතී. දැන් සිදු වන මග දෙපස සිට නැවුම් මාළු අලෙවි කිරීමේ ක්‍රමය වෙනුවට අනෙක් බෝග අස්වනු සඳහා පවතින නිත්‍ය වෙළඳපොළකට ඒකාබද්ධ කළ ප්‍රාදේශීය මට්ටමේ වෙළඳපොළක් සම්පාදනය කිරීමද මැදිහත් වීමක් විය හැකිය. වේගයෙන් සංවර්ධනය වන සංචාරක කර්මාන්තය මේ නිෂ්පාදන සඳහා පැවතිය හැකි වෙළඳපොළක් ලෙස දක්නා ලදි. පෞද්ගලික අංශය හවුල් කර ගන්නා විට තත්ත්වය සහතික කිරීමේ යන්ත්‍රණයන් හඳුන්වා දිය යුතු අතර, සුදුසු වෙළඳපොළවල් ඉලක්ක කර ගැනීමේදී වෙළඳ නාමය හා ලේබල් කිරීම වැනි සන්නාම ක්‍රමෝපායන් දිගු කාලයේදී අත්‍යවශ්‍ය වනු ඇත.

නව වෙළඳපොළවල් හඳුනා ගැනීම සඳහා ධීවර සමිති ශක්තිමත් කිරීම, වෙළඳපොළ සම්බන්ධතා වැඩිදියුණු කිරීම සහ නැවුම් මාළු හා කරවල සාමූහිකව අලෙවි කිරීම නිෂ්පාදකයන්ට ඉහළ ප්‍රතිලාභ අත් කර දෙනු ඇත.

අමුණා ඇති රූප සටහන අභ්‍යන්තර ධීවර කර්මාන්ත අංශය සඳහා පවතින බාධාවන්, ඒවාට හේතු හා පැවතිය හැකි විසඳුම් සංක්ෂිප්තව සිතියම්ගත කරයි.

**4.8 රූප සටහන: අභ්‍යන්තර ධීවර කර්මාන්ත උපඅංශයේ බාධාවන් හා පැවතිය හැකි විසඳුම් සිතියම්ගත කිරීම**





මූලාශ්‍රය: අධ්‍යයන දත්ත

## 4.5 සාගරික ධීවර කර්මාන්තය

ශ්‍රී ලංකාවේ සාගරික ධීවර කර්මාන්ත අංශය උපඅංශ දෙකකින් සමන්විතය - එනම්, වෙරළබඩ උපඅංශය හා ගැඹුරු මුහුදු උපඅංශයයි. රටේ වෙරළබඩ ධීවර උපඅංශය සම්පත් ක්ෂයවීම ආශ්‍රිත බාධාවන්ට මුහුණපායි. නැගෙනහිර වෙරළබඩ ධීවරයන් මීට මුහුණ දෙන්නේ දකුණු වෙරළබඩ ධීවරයන්ට වඩා අඩුවෙනි. ඊට හේතුව නැගෙනහිර හා උතුරු වෙරළබඩ ප්‍රදේශවල යුද්ධය අතරතුරදී මසුන් ඇල්ලීමට පනවා තිබූ සීමාවන් නිසා අනෙක් ප්‍රදේශ තරම් අධික මසුන් ඇල්ලීමකට ගොදුරු වී නොතිබීමයි. කෙසේ වෙතත්, මේ ප්‍රදේශවල මසුන් ඇල්ලීමට පනවා තිබූ සීමාවන් ඉවත් කිරීම හේතුවෙන් තවතවත් ජනයා කර්මාන්තයට පිවිසෙනු ඇත.

පහත රූප සටහනේ දක්වා ඇති පරිදි, රටේ වැඩිම ධීවර ජනතාවක් සිටින්නේ ත්‍රිකුණාමලයෙහි හා මඩකලපුවෙහිය. එනම්, අනුපිළිවෙළින් 18%ක් හා 15%ක් වේ. මඩකලපුවෙහි නිෂ්පාදනය මුළු ජාතික නිෂ්පාදනයෙන් 8.36%ක්ද ත්‍රිකුණාමලයෙහි 9.44%ක්ද වේ. මෙම දිස්ත්‍රික්ක දෙකෙහි ඵලදායිතා මට්ටම් රටේ අනෙක් දිස්ත්‍රික්කවල තරම් ඉහළ මට්ටමක නැත. මෙය සම්පත් ක්ෂය වීමේ තර්ජනය සමග එක්වී, ජනයා තව දුරටත් උපඅංශයට පිවිසීම අධෛර්යමත් කළ යුතුය. එමෙන්ම, ධීවර කර්මාන්ත වටිනාකම් දාමයේ ඇති සැකසීම වැනි වෙනත් අංශවලට මෙන්ම ඉහළ වටිනාකමක් සහිත වෙළඳ බෝග වගාව වැනි වෙනත් ජීවනෝපාය විකල්පයන්ට පිවිසීම දිරිගැන්විය යුතුය.

**4.9 රූප සටහන: දිස්ත්‍රික්ක අනුව ධීවර ජන ප්‍රතිශතය, 2009**




මූලාශ්‍රය: ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, 2009

ධීවර අංශය උදෙසා සකස් කළ දසඅවුරුදු ක්‍රමෝපායාත්මක සැලැස්ම (MFAR, 2007) ටූනා වැනි සමහර මත්ස්‍ය වර්ග සඳහා අපනයන වෙළඳපොළේ පවතින ඉල්ලුම අනුව ඉහළ ප්‍රතිලාභ අත්කරගත හැකි වීමත් සම්පත් පැවතීමත් වැනි නොයෙක් හේතු නිසා දිගු කාලයේදී ගැඹුරු මුහුදු ධීවර කර්මාන්ත උපඅංශය දිරි ගන්වයි. කෙසේ වෙතත්, වෙරළබඩ උපඅංශය ධීවර අංශයෙහි නිරතව සිටින විශාල ජන කොටසකට රැකියා සපයන බැවින් හා සහාය වන බැවින් වත්මන් රාජ්‍ය ප්‍රතිපත්ති සංවාදය තුළදී එම උපඅංශය වැදගත් කොට සැලකේ.

නැගෙනහිර වෙරළබඩ ධීවර කර්මාන්ත වාරයේ උපරිම මට්ටම පවතින්නේ පෙරබරවාරි සිට ජුලි මාසය දක්වාය. සාගරික ධීවර කර්මාන්තයේ අවාරයේදී ධීවරයන්ට ඇති වන බලපෑම අඩු කරන ද්විතීය ජීවනෝපාය මාදිලියක් නොපැවතීම ඔවුන් වඩාත් ගොදුරු වීමට ඉඩ ඇති තත්වයකට පත් කරයි. එමෙන්ම, ණය චක්‍රයේ හිර වෙමින් ඉහළ පොලී අනුපාතික යටතේ ණය ගැනීම හැර වෙන

විකල්පයක් නැති තත්වයකට ඔවුන් ඇදදමයි. සාගරික ධීවර කර්මාන්තයේ අවාරයේදී ඔවුහු කලපුවේ හා පුනීල මෝයේ මසුන් ඇල්ලීමෙහි නිරත වී ඉස්සන්, කකුළුවන් හා මසුන් අල්ලති. සම්පත් ක්ෂයවීම හා පුනීල මෝය ගොඩ කිරීම නිසා මසුන් ප්‍රමාණය ඉතා අඩු බැවින් කිවුල්දියෙහි මසුන් ඇල්ලීමෙන් තමන්ට ලාභයක් උපයා ගත නොහැකි බව මෙම ධීවරයෝ කියා සිටිති. අගය එකතු කිරීම පිළිබඳ කොටසේදී විස්තරාත්මකව සාකච්ඡා කළ පරිදි, රෝපණ ධීවර කර්මාන්තය හඳුන්වා දීම මේ ප්‍රජාවන් සඳහා විකල්ප/ද්විතීය ජීවනෝපායක් විය හැකිය. එපමණක් නොව, එළවළු හා ධාන්‍ය හා පලතුරු වගාව වැනි වෙළඳ බෝග වගාවන් හඳුන්වා දීමෙන්ද ඔවුන්ට අවාරයේදී ආදායම් මූලාශ්‍රයක් සැපයිය හැකිය.

සාගරික ධීවර නිෂ්පාදකයාගේ ප්‍රතිලාභ හෝ නිෂ්පාදන පිරිවැය තීරණය කිරීම මෙම අධ්‍යයනයේදී කළ නොහැකි විය. ඒ සඳහා ප්‍රමාණවත් තරම් ද්විතීය හා ප්‍රථමික දත්ත නොපැවතිණ. අල්ලාගන්නා මසුන් ප්‍රමාණය කලින් කිව නොහැකි වීම මෙන්ම ලැබෙන ආදායම අල්ලාගන්නා මසුන් වර්ගය මතද එහි ප්‍රතිඵලයක් ලෙස මාසයේ කාලය මතද භාවිත කරන ධීවර ආම්පන්න හා යාත්‍රා මතද යාත්‍රාවට අයත් පුද්ගලයන් සංඛ්‍යාව මතද රඳා පැවතීමත් මීට හේතු වන්නට ඇත.

මෙම විශ්ලේෂණයේදී අධ්‍යයනය වෙරළබඩ මසුන් ඇල්ලීම කෙරෙහි අවධානය යොමු කළ අතර, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කල්ලරාව ධීවර ප්‍රජාවෙන් ලබා ගත් උදාහරණ සහිතව වටිනාකම් දාමය නිරූපණය කළේය. මෙම අධ්‍යයනයේ ප්‍රාථමික දත්තවලින්ද පෙන්නුම් කෙරෙන්නේ ප්‍රජාවන්ට උපරිම ආදායමක් ලැබෙන්නේ ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තයෙන් බවයි.

***යෙදවුම්***

ධීවර පවුල් සතුව මෝටර් නොවන බෝට්ටු තිබෙන නමුත් අනෙක් යෙදවුම්වලින් (ධීවර ආම්පන්න හා ඉන්ධන) බොහොමයකට මූල්‍යය සැපයෙන්නේ තොග වෙළෙන්දා විසිනි. මසුන් ඇල්ලීම උපරිම මට්ටමින් සිදුවීමට නම් ධීවරයා සතුව විවිධ වර්ගයේ මසුන් ඇල්ලිය හැකි ධීවර ආම්පන්න තිබිය යුතුය. ඉන්ධන මිලදී ගන්නේ ළඟම ඇති පිරවුම් හලෙන් හෝ ප්‍රජාවට වඩා සමීප නීති විරෝධී සිල්ලර සැපයුම්කරුවන්ගෙනි. දිවයින තුළ වැඩිම සාම්ප්‍රදායික යාත්‍රා සංඛ්‍යාවක් පෙන්නුම් කරන්නේ ත්‍රිකුණාමලය හා මඩකලපුවයි. බහුදින යාත්‍රා අංශයෙන් ත්‍රිකුණාමලය තුන් වන තැන සිටින නමුත් ත්‍රිකුණාමල වෙරළෙන් දියත් කෙරෙන මේ යාත්‍රා ප්‍රදේශයේ ජනයාට අයිති ඒවාද නැත්නම් වයඹ හා දකුණු වෙරළබඩින් පැමිණෙන සංක්‍රමණික ධීවරයන්ට අයිති ඒවාද යන ප්‍රශ්නය පවතී. බෝට්ටු හිමියන් ලෙස නොවේ නම් යටත්පිරිසෙයින් සහාය සේවාවන් සම්පාදනය කරන්නන් ලෙසවත් ඉලක්ක ප්‍රජාවන් ගැඹුරු මුහුදු උපඅංශයට සම්බන්ධ කළ යුතුය.

යෙදවුම් සඳහා මූල්‍යය සපයන නිසා පමණක් නොව ධීවර පවුල්වල ද්විතීය ආදායම් මූලාශ්‍ර ඔවුන්ගේ යැපීම සඳහා ප්‍රමාණවත් නොවන විට අවාරයේදී අත්තිකාරම් දෙන නිසාද ධීවර ප්‍රජාව තොග වෙළෙන්දා සමග සම්බන්ධතාවක සිරවී සිටියි. මත්ස්‍ය අස්වැන්න උපරිම වන සමයේදී ධීවර අස්වනුවලින් සැලකිය යුතු මට්ටමේ ඉහළ ආදායමක් ලැබෙන නමුත් වාරික ස්වභාවය හා දුර්වල මූල්‍ය කළමනාකරණය හා ධීවර ප්‍රජාවන්ගේ ඉතිරි කිරීමේ පුරුදු නිසා අගහිඟ කාල පරිච්ඡේදයේදී ඔවුන්ට මූල්‍ය දුෂ්කරතා ඇති වේ. දේපොළ හා ඇපකාරයන් නොමැති බැවින් ඔවුහු විධිමත් මූල්‍ය සේවාවන් වෙත ප්‍රවිෂ්ට නොවෙති. ඔවුන්ට විධිමත් මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශ විය හැකි එකම ක්‍රමය රන් අබරණ උකස් කිරීම පමණකි.

රජයෙන් ධීවර ප්‍රජාවට සැපයෙන්නේ සුළු සහායකි. ධීවර අමාත්‍යාංශයේ නිලධාරීහු ප්‍රජා මට්ටමේදී සම්බන්ධ නොවෙති. බොහෝ ධීවර ප්‍රජාවන් ධීවර සමිති තුළ සංවිධානයවී සිටින අතර, බොහෝ බාහිර ආයතන මෙම සමිති හරහා ප්‍රජාව වෙත සිය සහාය යොමු කරයි. එහෙත් (කල්ලරාවේදී මෙන්) ඔවුන් සැබෑ නියෝජනයක් නොකරන තැන්වලදීත් ප්‍රජාව හා සමිතියේ නිලතල දරන්නන් අතර සුළු විශ්වාසයක් පවතින තැන්වලදීත් ඔවුන්ගේ කාර්ය භාරය සීමා වේ.

පවත්නා ද්විතීය දත්ත අනුව, දිස්ත්‍රික්ක දෙකම ඒවායෙහි පවත්නා සම්පත් පදනම් කරගෙන අපේක්ෂා කෙරෙන ආකාරයට සාගරික ධීවර කර්මාන්තයේදී අතිරික්ත නිෂ්පාදනයක් පෙන්නුම් කරයි. ඉහළ මට්ටමේ අතිරික්ත නිෂ්පාදනයක් පවතින විට අලෙවි කිරීමේ ජාලයක් අත්‍යවශ්‍ය වේ. කොළඹට නොයවා යටත් පිරිසෙයින් අනුරාධපුරය හා පොළොන්නරුව වැනි යාබද අභ්‍යන්තර දිස්ත්‍රික්කවලටවත් ඍජුව මසුන් යැවිය හැකි වන්නේ එවිටය. ශීත කළ ට්‍රක්රථ යොදාගනිමින් දිස්ත්‍රික්කයෙන් පිටතට නැවුම් මසුන් ප්‍රවාහනය කිරීම සඳහා පැහැදිලි අවස්ථාවක් පවතින නමුත් ඉලක්ක ප්‍රජාවන්ට පවතින ප්‍රාග්ධන සීමාකම් මෙන්ම තොග වෙළෙන්දන්ට පවතින ඒකාධිකාරය නිසා ඔවුන්ට සිය වෙළඳ පොළ හා සේවාවන් පුළුල් කර ගැනීමට සීමා පැනවේ.

සාගරික ධීවර කර්මාන්තය වාරිකව සිදු වන්නක් වන අතර, මසුන් උපරිම ප්‍රමාණයක් ලැබෙන්නේ පෙබරවාරි සිට ජූලි මාසය දක්වා කාලයේ දීය. වැඩිම ආදායම ලැබෙන්නේ ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමෙන් නමුත් ඉලක්ක ප්‍රජාවන් තුළ සිටින ධීවර පවුල්වලින් බොහොමයක් සතුව තිබෙන්නේ මෝටර් නොවන බෝට්ටු බැවින් ඔවුන් නිරත වන්නේ වෙරළබඩ උපඅංශයේ කොටසක් වන එක්දින මසුන් ඇල්ලීමෙහිය. වෙරළබඩ උපඅංශය සමග සසඳන විට වෙරළබඩ උපඅංශයේ ශුද්ධ ආදායම් ව්‍යාප්තිය අඩුය. සෑම වෙරළබඩ ධීවර ක්‍රියාකාරකමකම ඉහළ ජන සංඛ්‍යාවක් නිරතව සිටින නමුත් වෙරළබඩ උපඅංශය සමග සසඳන විට අස්වැන්න පහළ මට්ටමක පවතී. බහුදින යාත්‍රාවක් මිලදී ගැනීමට හා නඩත්තු කිරීමට විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය වන නිසා මෙම ධීවර ජනයාට සීමා පැනවේ. අර්ථාන්විත ආරම්භක ප්‍රාග්ධන සහායකින් තොරව මෙම අධ්‍යයනයේදී ඉලක්ක කරගැනෙන නැවත පදිංචි වූ ප්‍රජාවන්ට ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තයෙහි යෙදිය නොහැකිය. රාජ්‍ය ප්‍රතිපත්තිය ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තයේ සංවර්ධනය දිරි ගන්වන බව පෙනෙන නමුත් ඊට වට්නාකම් දාමයේ පහළම අදියරවල සිටින මේ නිෂ්පාදකයන් ඉලක්ක කර ගත නොහැකි අතර, ඒ වෙනුවට වඩා ප්‍රබල ආරම්භක ප්‍රාග්ධනයක් සහිත ධීවරයන් ඉලක්ක කරගනී. ගැඹුරු මුහුදු ධීවර යාත්‍රා හා ධීවර ආම්පන්න සඳහා දැරීමට සිදුවන ඉහළ පිරිවැයේ අර්ථය වී ඇත්තේ අංශය තුළ ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධානවලටද මේවා පුද්ගල මට්ටමින් සැපයීම සහතික කළ නොහැකි බවයි.

කෙසේ වෙතත්, මඩකලපුවේදී එක් දින යාත්‍රා කිහිපයක් බහුදින යාත්‍රා බවට පරිවර්තනය කර ඇත. තාක්ෂණය හා ප්‍රාග්ධනය පැවරීම හරහා මෙම ප්‍රවණතාව දිරිගැන්විය යුතුය. වෙරළබඩ උපඅංශය වක්‍ර රැකියා අවස්ථා විශාල සංඛ්‍යාවක් සම්පාදනය කරයි. බෝට්ටු නිෂ්පාදනය, බෝට්ටු පිරිසුදු කිරීම, මාළුදැල් නිෂ්පාදනය, අයිස් නිෂ්පාදනය හා ප්‍රවාහනය, ආහාර සැපයීම හා බෝට්ටු එන්ජින් සඳහා යාන්ත්‍රික කොටස් සැපයීම වැනි කර්මාන්තය සඳහා අවශ්‍ය වෙනත් සේවාවන් සැපයීම මීට ඇතුළත් වේ. නොකැමැත්ත, කර්මාන්තයේ ස්වභාවය හෝ නිපුණතා නොමැතිකම නිසා ධීවර ක්‍රියාකාරකම් තුළ තරුණයන්ගේ ඍජු සහභාගිත්වය පහත වැටෙමින් පවතින තත්ත්වය තුළ මේ වක්‍ර රැකියා අවස්ථාවන්ට සහභාගී වීමට ඔවුන් දිරිගැන්විය හැකිය. ප්‍රදේශ තුළ දැනටමත් පිහිටුවා තිබෙන ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතන මාර්ගයෙන් නිපුණතා සංවර්ධනය සම්පාදනය කළ හැකි අතර, එමගින් වර්ධනය වෙමින් පවතින උප අංශයට තරුණයන් උකහා ගැනීමේ හැකියාව ලැබෙනු ඇත.

මඩකලපු හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල මාදැල් ධීවර කර්මාන්තයද සිදුවන නමුත් බොහෝ මාදැල් අයිතිව තිබෙන්නේ වයඹ වෙරළබඩින් පැමිණෙන පුද්ගලයන්ටය. ප්‍රදේශයේ පුද්ගලයන්ට (ගාස්තුව වශයෙන් මසුන් ලැබෙන) තාවකාලික කම්කරුවන් ලෙස හෝ මුදලින් වැටුප් ලැබෙන ස්ථිර කම්කරුවන්ලෙස මාදැල්වල රැකියාවක් ලබාගත හැකිය. කෙසේ වෙතත්, මේ මාදැල්වල සේවය කරන ස්ථිර කම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකු පිටස්තරයන්ය. මාදැල් ක්‍රියාකාරකමේ අවසන් අදියර හෙවත් "ඉලිප්පුවේදී'' කාන්තාවන්ද නිරත වන අතර, ඔවුන්ට මාළු වට්ටි 2-3ක් ගෙවනු ලැබේ. මාදැල්වල රැකියාව කිරීමෙන් ලැබෙන්නේ අඩු ප්‍රතිලාභයක් බව පෙනේ. බොහෝ අවස්ථාවලදී ඔවුන්ට ගෙවීම් කරනු ලබන්නේ භාණ්ඩවලිනි. එම නිසා ප්‍රජාවේ ධීවරයෝ සිය සාම්ප්‍රදායික යාත්‍රා යොදාගෙන මුහුදු යාමටත් මසුන් ඇල්ලීමෙහි නිරත වීමටත් වැඩි කැමැත්තක් දක්වති.

*අගය එකතු කිරීම*

සාගරික ධීවර කර්මාන්ත උපඅංශය තුළ අගය එකතු කිරීම සිදුවන්නේ ඉතා සුළු වශයෙනි. මීට ප්‍රධාන හේතුව නැවුම් මසුන් ඒවා එකතු කිරීමට පැමිණෙන අයට සැපයීමට සිදුවීමයි. කරවල නිෂ්පාදනයද එතරම් ඵලදායක නොවන බව නිෂ්පාදකයන්ට හැඟේ. කෙසේ වෙතත්, නැවුම් හාල්මැස්සන් විකිණීම හැම විටම ලාභදායක නොවන බැවින් හාල්මැස්සන් වියළා අලෙවි කරනු ලැබේ.

> *"බරෙන් තුනෙන් එකක් අහිමි වෙන හින්දා කරවල සැකසීම ලාභදායක නැහැ. මේ මොහොතේ අපි කරවල හදන්නේ නැහැ. නැවුම් හාල්මැස්සන් විකිණීම ලාභදායක නැති හින්දා හාල්මැස්සන් හුගක් අල්ලා ගත්තොත් අපි කරවල වේළනවා."*
>
> අවධාන කණ්ඩායම් සාකච්ඡාව, කල්ලරාව

රටට ආනයනය කරන මසුන්ගෙන් 45%ක් පමණ ටින්මාළුය. එම නිසා, විශේෂයෙන්ම කඳුරට ප්‍රදේශයෙහිද නැවුම් මාළු ගබඩා කිරීමට ශීතකරණ පහසුකම් නොමැති ප්‍රදේශවලද ටින්මාළු සඳහා පැහැදිලි ඉල්ලුමක් පවතී. කෙසේ වෙතත්, සුළු පරිමාණ නිෂ්පාදකයන්ට බහුජාතික සමාගම් සමග තරග කළ හැකිද යන ප්‍රශ්නය මතු වී තිබේ. පෞද්ගලික අංශය හරහා වෙළඳපොළ සම්බන්ධතා තහවුරු කරගත හැකි නම් හා තත්වය සහතික කිරීමේ පද්ධති මාර්ගයෙන් සන්නාමයක් නිර්මාණය කරගත හැකිනම් සාගරික ධීවර කර්මාන්තයේ අගය එකතු කළ නිෂ්පාදනයක් ලෙස ටින්මාළු වෙළඳපොළට ඉදිරිපත් කිරීමේ හැකියාවක් පවතී. කෙසේ වෙතත්, එය හඳුන්වා දිය යුත්තේ සුළු පරිමාණයකිනි. මන්නාරමේදී නැවුම් මාළුවල අඛණ්ඩ සැපයුමක් නොපැවති නිසා මේ කර්මාන්තය හඳුන්වාදීම සඳහා කලින් දරනලද ප්‍රයත්න අසාර්ථක විය. අතින් කෙරෙන, අඩු ප්‍රාග්ධනයක් වැයවන ටින්මාළු සැකසීමේ මධ්‍යස්ථාන/මාළු සැකසීමේ කම්හල් ඇතිකිරීම අමුද්‍රව්‍ය සැපයුම සහතික කරගත නොහැකි වඩා විශාල පරිමාණ යාන්ත්‍රික නිෂ්පාදනාගාරවලට සාර්ථක විකල්පයක් විය හැකිය.

වෙරළබඩ උපඅංශයේ සම්පත් ක්ෂයවීම ඉහළ යාමත් ධීවරයන්ට වහාම ගැඹුරු මුහුදු ධීවර උපඅංශයට පිවිසිය නොහැකි වීමත් නිසා ඉහළ වටිනාකමක් සහිත රෝපණ ධීවර කර්මාන්තය හඳුන්වාදී ඊට පහසුකම් සැපයිය හැකිය. ඉහළ වටිනාකමක් සහිත රෝපණ මත්ස්‍යයන් සඳහා පවතින අපනයන ඉල්ලුම නිසා ධීවරයාට ඉහළ මිලක් ලැබෙනු ඇත. ශීතකළ හා අයිස් දැමූ ටූනා හා පොකිරිස්සන්, සී කියුකම්බර්, සී බාස්, බෙල්ලන් හා කූනිස්සන් වැනි ඉහළ අගයක් සහිත මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉල්ලුමක් පවතින තත්ත්වය තුළ එම නිෂ්පාදන සැපයීම සඳහා දේශීය නිෂ්පාදනය යොමු කළ හැකි වේ. කෙසේ වෙතත්, වයඹ වෙරළබඩ තීරයේ ඉස්සන් ගොවිපොළවල් අසාර්ථක වීමනිසා රට තුළ කූනිස්සන් හා ඉස්සන් අපනයනය කෙරෙන ප්‍රමාණය පහත වැටී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නැගෙනහිර පළාත තුළ රෝපණය පදනම් කරගත් ධීවර කර්මාන්තය සඳහා අවස්ථාවක් පවතී. රෝපණ ධීවර කර්මාන්තයට පිවිසිය යුත්තේ වයඹ ඉස්සන් ගොවි පොළවල් හා ඒවායෙහි නිරත වූ පවුල් ලද අත්දැකීමෙන් උගත් පාඩම් මත පදනම්ව වන අතර, එම නිසා ක්‍රියාත්මක කළ යුත්තේ රෝග කල්තියා හඳුනාගෙන ප්‍රතිකාර කිරීම වැනි අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණයන් සහිතවය.

ඉහළ අගයක් සහිත ධීවර කර්මාන්තය හඳුන්වා දීමට නම් සහායක සේවාවන් හා යටිතල පහසුකම් නිසි පරිදි සම්පාදනය විය යුතුය. එකතු කිරීමේ හා එකලස් කිරීමේ දාමයන් සුමට ලෙස ක්‍රියාත්මක විය යුතු අතර, නිෂ්පාදකයන්ට ප්‍රවාහනය හා අයිස් නිෂ්පාදනාගාර වෙත සෑහෙන තරම් කඩිනම් ප්‍රවේශයක් තිබිය යුතුය. මීට අමතරව, ශෝධක මත්ස්‍යයන් හැසිරවීමේ පරිචයන් හා තත්ව පාලනය පිළිබඳ පුහුණුවද ඒ සමග ව්‍යාපාරික ව්‍යවසායන්හි තිරසරතාව පවත්වාගෙන යාම සඳහා ආරම්භක වෙළඳ පොළ සම්බන්ධතාද සැපයිය යුතුය. අඩු ඵලදායිතාවක් උපදවාගන්නා වෙරළබඩ ධීවර කර්මාන්තයෙහි නිරත වන ධීවරයන් මෙන්ම ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ හා තරුණයන් වැනි ගොදුරු වීමට ඉඩඇති කණ්ඩායම්ද මේ සඳහා ඉලක්ක කරගත හැකිය. උදාහරණයක් ලෙස, කොටු වගාව සඳහා අවශ්‍ය කරන්නේ සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමේ බැර කායික ශ්‍රමයක් වන අතර, ඒ සඳහා ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ ඉලක්ක කරගත හැකිය.

*ගබඩා කිරීම හා ප්‍රවාහනය*

වෙරළට ළඟා වී පැය කිහිපයක් ඇතුළත මිලදී ගන්නන්ට අලෙවි කෙරෙන නිසා වර්තමානයේදී ප්‍රජාවන් තුළ සාගරික ධීවර නිෂ්පාදන ගබඩාකර තැබීමේ අවශ්‍යතාව පවතින්නේ සුළු වශයෙනි. නිෂ්පාදනය උපරිම වන සමයේදී ප්‍රවාහනය සඳහා ශීත කළ ට්‍රක්රථ යොදාගනු ලැබේ. බොහෝ විට මසුන් අසුරනු ලබන්නේ රෙජිෆෝම් පෙට්ටිවලය. ඒවා ප්‍රවාහනය කරනු ලබන්නේ තොග වෙළඳපොළවලටය. ප්‍රවාහන පහසුකම් සපයන්නන් ධීවර ප්‍රජාවේ අය නොව තොග වෙළඳුන් සමග ගිවිස ගෙන ප්‍රජාවේ සිට කොළඹට හා මීගමුවට මසුන් ප්‍රවාහනය කරන පිටස්තරයන්ය. ළඟම අයිස් නිෂ්පාදනාගාරය තිබෙන්නේ ත්‍රිකුණාමලයේ කල්ලරාවෙහිය. මසුන් මිලදී ගන්නා අවස්ථාවේදී අයිස් මිල ත්‍රිකුණාමලයේ මිලට වඩා 25%ක් වැඩිය. එහෙත්, මෙය වියදමක් ලෙස සලකා මසුන් මිලදී ගන්නා අවස්ථාවේදී මසුන් මිලදී ගන්නා විසින් අඩු කෙරෙන සැඟවුණු පිරිවැයක් වේ.

කෙසේ වෙතත්, ඉහත කොටසේදී පැහැදිලි කළ පරිදි, රෝපණ ධීවර කර්මාන්තයට පිවිසීමට නම් වඩා යහපත් ප්‍රවාහනයක් හා ගබඩා පහසුකම් අවශ්‍ය වේ. එමෙන්ම, නිෂ්පාදකයන්ට අපේක්ෂිත ඉහළ ප්‍රතිලාභ අත් වීමට නම් සහායක සේවාවන් ඔවුන්ගේ තනි අයිතිය/කළමනාකරණය යටතේ නොපවතින අවස්ථාවලදී ඒවාද නිෂ්පාදකයන්ට මීට වඩා ප්‍රවේශ වියහැකි තත්ත්වයේ පැවතිය යුතුය. අධ්‍යයනය සිදු කළ සමයේදී මඩකලපුවෙහි තිබුණේ අයිස් නිෂ්පාදනාගාර 3කි. ඉලක්ක ග්‍රාම නිලධාරි කොට්ඨාස තුළ පැවති හුදෙකලාව හා ප්‍රදේශ අතර සම්බන්ධතාව පිළිබඳ සීමාකම් නිසා මෙම අයිස් නිෂ්පාදනාගාර කිසිසේත්ම අරමුණට සේවය නොකළ අතර, ප්‍රජාවන්ට වඩා සමීපව සුළු පරිමාණ අයිස් නිෂ්පාදනාගාර තිබිය යුතු බව අවධාරණය කළ යුතු වේ.

පශ්චාත් අස්වනු හැසිරවීම, වර්ග කිරීම, පිරිසුදු කිරීම, ඇසිරීම හා සහායක සේවාවන් වැනි වටිනාකම් දාම අදියරයන් ඔස්සේ ආයෝජනය කිරීමෙන් නිෂ්පාදක මට්ටමේ ජනයා උදෙසා වඩා විධිමත් රැකියා අවස්ථා නිර්මාණය වීමද වඩා ඉහළ ප්‍රතිලාභ අත් වීමද සිදුවිය යුතුය.

*වෙළඳපොළ*


මාළු වෙළඳපොළෙහි ආධිපත්‍යය දරන්නේ රට තුළ පිහිටි ප්‍රධාන මාළු අලෙවි මධ්‍යස්ථාන වෙත (ප්‍රධාන වශයෙන් සාන්ත ජෝන් මාළු වෙළඳසල වෙත) යැවීමට මෙන්ම අපනයනය සඳහාද මසුන් මිලදී ගෙන දිස්ත්‍රික්කයෙන් බැහැරට ප්‍රවාහනය කරන කොළඹ සිටින තොග වෙළඳුන් හා ඔවුන්ගේ ප්‍රාදේශීය එකතු කරන්නන්ය. සැපයුම් දාමයේ ඉහළම මට්ටමෙහි සිටින තොග වෙළෙන්දෝ මාළුවල වෙළඳ පොළ මිල තීරණය කිරීමේදී ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරති. තොග වෙළඳුන් වෙරළබඩ ධීවර කර්මාන්තයේ විශේෂයෙන්ම මාදැල් ධීවර කර්මාන්තයේ ආධිපත්‍යය දරන තත්ත්වය පැන නගින්නේ අවාරයේදීද ඉන්ධන හා ධීවර ආම්පන්න වැනි යෙදවුම් මිලදී ගැනීම සඳහාද අත්තිකාරම් මුදල් දී නිෂ්පාදකයන් මත පවත්වා ගෙන යන ග්‍රහණය හේතුවෙනි. අවාරයේදී නිෂ්පාදකයන්ට විකල්ප ජීවනෝපාය අවස්ථා සම්පාදනය කිරීමෙන් මෙන්ම විකල්ප මූල්‍ය මූලාශ්‍රයන් පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමෙන් මෙම රඳා පැවතීමේ චක්‍රය බිඳ දැමිය යුතුය.

දිස්ත්‍රික්කය තුළ මාළු සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. මාළු තොග වෙළඳුන් හා ඔවුන්ගේ ප්‍රාදේශීය එකතු කරන්නන් මත රඳා පැවතීම අවසන් කළ හැකි නම් නිෂ්පාදකයන්ට තම ප්‍රදේශය තුළ මාළු අලෙවි කළ හැකි වනු ඇත. වර්තමානයේ, මාළු මිලදී ගෙන පාපැදිවලින් ගොස් අලෙවි කරන සුළු පරිමාණ සිල්ලර අලෙවිකරුවන් සිටින නමුත් ඔවුන් ඒ සඳහා මාළු මිලදී ගන්නේ ධීවරයාගෙන් නොව තොග වෙළෙන්දාගේ නියෝජිතයාගෙනි.

පොකිරිස්සන් හා කකුළුවන් වැනි ඉහළ වටිනාකමක් සහිත නිෂ්පාදන සඳහා හෝටල්කරුවන් හා නාගරික ජනයා වැනි වැඩි මිලදී ගැනීමේ හැකියාවක් සහිත වෙළඳපොළවල් හඳුනාගැනීමටත් ප්‍රජා මට්ටමේදී සාමූහිකව අලෙවි කිරීම හරහා හෝ පෞද්ගලික අංශය හරහා ඍජු වෙළඳපොළ සම්බන්ධතා ප්‍රවර්ධනය කරගැනීමටත් ප්‍රබල ලෙස පහසුකම් සැපයිය යුතුය. අපනයනයේදී 100%ක් ප්‍රමුඛත්වය දරන්නේ ප්‍රධාන වශයෙන් කොළඹ හෝ වයඹ වෙරළබඩ ප්‍රදේශය පදනම් කර ගත් පෞද්ගලික අංශය යි. මෙම අපනයනකරුවන් නැගෙනහිර නිෂ්පාදකයන් සමග සම්බන්ධ කළ යුතුය. එවිට ඔවුන්ට මෙම

වාසිදායක වෙළඳපොළවලට භාණ්ඩ සපයමින් තම ආදායම වැඩි කරගත හැකිය. සාමාන්‍යයෙන් මෙම අපනයනකරුවන් මත්ස්‍ය අලෙවි මධ්‍යස්ථාන වෙත නියෝජිතයෙකු යවා මාළුවල ගුණාත්මකත්වය සහතික කරගන්නා අතර, එමගින් ඉබේම වඩා යහපත් කළමනාකරණ ක්‍රමයක් නිර්මාණය වේ.

**4.10 රූප සටහන: සාගරික ධීවර කර්මාන්තයේ බාධාවන් හා හැකියාවන් සිතියම්ගත කිරීම**




මූලාශ්‍රය: අධ්‍යයන දත්ත

## 4.6 කෘෂිකාර්මික නොවන ජීවනෝපායයෝ

කෘෂිකාර්මික නොවන ජීවනෝපායන් ලෙස සාමාන්‍යයෙන් අදහස් වන්නේ ප්‍රාථමික කෘෂිකර්මයට, වන විද්‍යාවට හෝ ධීවර කර්මාන්තයට අයත් නොවන ක්‍රියාකාරකම්ය. ඇතැම් අවස්ථාවලදී කෘෂිකර්මය පදනම් කරගත් සැකසීම් කටයුතුද කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම් ලෙස සැලකේ. මෙම වෙළඳපොළ අධ්‍යයනයේ පැහැදිලිකම උදෙසා කිවයුත්තේ කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත කෘෂිකාර්මික නොවන අංශයට ඇතුළත් නොවන බවත් ඒවා ඒ ඒ උපඅංශයේ වටිනාකම් දාමය යටතේ සාකච්ඡා කෙරෙන බවත්ය.

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදුකළ කර්මාන්ත සමීක්ෂණය (2004) දිස්ත්‍රික්ක දෙකෙහි පවත්නා කර්මාන්තවල විවිධත්වය පිළිබඳ ඇගයුමක් සම්පාදනය කරයි. දිස්ත්‍රික්ක දෙකෙහි කෘෂිකාර්මික නොවන අංශයේ ආයතන හා රැකියාවලින් වැඩි ප්‍රමාණයක් ප්‍රාදේශීයව වැවුණු කෘෂි අස්වැන්නෙන් ආහාර සැකසීමට හා ඇඟලුම් කර්මාන්තයට සම්බන්ධය. ගෘහභාණ්ඩ හා මැටි පදනම් කර ගත් කර්මාන්ත වැනි ලෝහ නොවන ඛණිජ භාණ්ඩ නිෂ්පාදනය කිරීමද දිස්ත්‍රික්ක දෙක තුළ සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී.

**4.10 වගුව: ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙහි පවත්නා කාර්මික ආයතන - 2003-04**

| කාර්මික අංශය | ත්‍රිකුණාමලය | | මඩකලපුව | |
|---|---|---|---|---|
| | ඒකක % | නියුක්ත පුද්ගලයෝ % | ඒකක % | නියුක්ත පුද්ගලයෝ % |
| පතල් හා කැණීම් | 2.6 | 9.9 | 4.3 | 4.4 |
| ආහාර හා පාන නිෂ්පාදනය | 50.8 | 33.3 | 40.8 | 32.5 |
| දුම්කොළ භාණ්ඩ නිෂ්පාදනය | 0.4 | 0.7 | 0.3 | 0.3 |
| රෙදිපිළි හා නූල් නිෂ්පාදනය | 0.7 | 0.9 | 1.3 | 2.8 |
| ඇඟලුම් නිෂ්පාදනය | 12.8 | 31.2 | 10.3 | 18.3 |
| සම් භාණ්ඩ නිෂ්පාදනය | 0.2 | 0.1 | 1.3 | 1.2 |
| දැව සහ දැව හා ශාක භාණ්ඩ නිෂ්පාදනය | 1.4 | 0.8 | 2.9 | 3.7 |
| ලිඛිත මාධ්‍යය ප්‍රකාශයට පත් කිරීම, මුද්‍රණය හා ප්‍රතිනිෂ්පාදනය | 0.5 | 0.5 | 0.7 | 1.2 |
| මූලික රසායන ද්‍රව්‍ය හා රසායනික භාණ්ඩ නිෂ්පාදනය | 0.2 | 0.2 | 0.9 | 0.6 |
| ලෝහ නොවන ඛණිජ භාණ්ඩ නිෂ්පාදනය | 8.6 | 9.7 | 0.5 | 0.5 |
| එකලස් කළ ලෝහ භාණ්ඩ නිෂ්පාදනය | 8.4 | 4.4 | 12.9 | 12.7 |
| ගෘහභාණ්ඩ නිෂ්පාදනය | 12.7 | 7.3 | 6.5 | 5.4 |
| ජලය එක්රැස් කිරීම, පිරිසුදු කිරීම හා බෙදා හැරීම | 0.4 | 0.7 | 16.9 | 10.3 |
| වෙනත් | 0.5 | 0.4 | 0.3 | 6.0 |
| මුළු ගණන | 100 | 100 | 100 | 100 |

මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2004

මෙම සංඛ්‍යා තොරතුරුවලට දිස්ත්‍රික්ක මට්ටමෙහි පවත්නා විශාල, මධ්‍ය හා සුළු පරිමාණ කර්මාන්ත ඇතුළත්ය. අධ්‍යයනය කළ ප්‍රජාවන් තුළ මෙම කර්මාන්ත පැවතියේ අඩු මට්ටමකිනි. ඉලක්ක ග්‍රාමනිලධාරි කොට්ඨාස තුළ එකද විශාල හෝ මධ්‍ය පරිමාණ කර්මාන්තයක්වත් නොවීය (ACAP, 2009). ඉලක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පැවති ප්‍රධාන සුළු කර්මාන්ත වූයේ අත්යන්ත්‍ර රෙදිපිළි, කොහු, භාණ්ඩ, වඩු කර්මාන්තය හා කුඹල් කර්මාන්තයයි. ලුණුදෙහි අච්චාරු සැදීම වැනි මූලික මට්ටමේ ආහාර සැකසීම්වලද අධ්‍යයනය කළ ප්‍රජාවෝ නිරතව සිටිති. ආහාර සැකසීමේ වත්මන් තත්වය හා කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත ව්‍යාප්ත කිරීමට ඇති හැකියාව ඒ ඒ උපඅංශයට අදාළ වටිනාකම් දාම විශ්ලේෂණය යටතේ සාකච්ඡා කෙරේ.

සංචාරක කර්මාන්තයද දියුණු කළ හැකි කෘෂිකාර්මික නොවන කර්මාන්තයක් ලෙස හඳුනාගැනිණ. විශේෂයෙන්ම වෙරළබඩ ප්‍රදේශවලදී සුළු පරිමාණ සිල්ලර වෙළඳසල් සහ සංචාරකයන්ට නවාතැන් හා වෙනත් සේවාවන් සැපයීම මගින් ප්‍රජාවන්ට සෘජු ප්‍රතිලාභ අත්කර දීමට ඊට හැකියාව ඇත.

> *"සංචාරක අංශය දියුණු වෙනකොට මේ ගම්වලටත් පුළුවන් ඒ ව්‍යාපාරයට සම්බන්ධ වෙන්න. ඔවුන් පුළුවන්ට නවාතැන් සැපයීම වගේ සංචාරක කර්මාන්තයට අදාළ සහායක සේවාවන් සැපයීමෙහි නිරත වෙන්න."*
>
> දිස්ත්‍රික්ක මට්ටමේ වැඩ මුළුව

වෙරළබඩ ප්‍රදේශවල පිහිටි ජනප්‍රිය සංචාරක ගමනාන්තවලින් බැහැර පෙදෙස්වල ප්‍රජාවන් වක්‍රව ජීවත් වන ආකාරය නිසා නැගෙනහිර වේගයෙන් ව්‍යාප්තවෙමින් පවතින සංචාරක කර්මාන්තයෙන් ප්‍රතිලාභ ලැබිය හැකි බව දිස්ත්‍රික්ක මට්ටමේ වැඩමුළුවලදී මෙන්ම ප්‍රධාන තොරතුරුකරුවන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවලදීද කතාබහට ලක් විය. එළවළු හා කිරි නිෂ්පාදන මෙන්ම අලංකරණමය වටිනාකමක් සහිත හස්ත කාර්මික භාණ්ඩ සපයන්නන් ලෙස නිෂ්පාදකයන් සංචාරක කර්මාන්තයේ සේවා සම්පාදකයන් සමග සම්බන්ධ කිරීමට තිබෙන හැකියාව මේ සාකච්ඡාවලදී අවධාරණය කෙරිණ.

ප්‍රදේශයේ විදුලි බලය සැපයීම හා ප්‍රදේශ අතර සම්බන්ධතාව ආශ්‍රිත යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රජය දරන ප්‍රබල පරිශ්‍රමයත් සමඟ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට දිස්ත්‍රික්ක දෙකට ආදායමක් රැගෙන ආ හැකි බව පැහැදිලිය. ආසියා පදනම විසින් සිදුකළ ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ පෞද්ගලික ව්‍යවසායන් සඳහා පවතින සහායක ප්‍රාදේශීය වාතාවරණය පිළිබඳ ගුණාත්මක තක්සේරුව (2009) (විශාල පරිමාණ හා සුළු පරිමාණ) පෞද්ගලික ව්‍යවසායන් මුහුණ දෙන සමහර බාධාවන් ඉස්මතු කර දක්වයි. අවසරපත්‍ර, බලපත්‍ර හා ලියාපදිංචි කිරීම් ලබා ගැනීමේදී රජයේ නිලධාරීන් කරන ඉහළමට්ටමේ නොනිල 'ගාස්තු' හා අය කිරීම්, යොමු වීමක් හා ව්‍යාපාර හිතැති ආකල්පයක් නොමැතිකම, ප්‍රධාන ක්‍රියාකාරකම් (ව්‍යාපාර ලියාපදිංචි කිරීම, නීති හා රෙගුලාසි) පිළිබඳ තොරතුරු හා දැනුම නොමැතිකම, ව්‍යාපාර ලියාපදිංචි කිරීමට බලපත්‍ර/අවසර පත්‍ර ලබා ගැනීමට අදාළ විනිවිද නොපෙනෙන හා පීඩාකාරී ක්‍රියා පටිපාටි මෙම අධ්‍යයනයේදී ඉස්මතු කර දැක්වූ ප්‍රධාන කරුණුය. සමාලෝචනය කළ පළාත් පාලන ආයතන අතරින් වඩාත්ම හිතකර දර්ශක පෙන්නුම් කරන්නේ මඩකලපු මහ නගර සභාවයි. සාර්ථකත්වය පිළිබඳ එම කතාව අනෙක් පළාත් පාලන ආයතන සමගද බෙදාහදා ගත යුතු වේ.

ඉහත අවධාරණය කරන ලද ගැටලු තුළ මෑතදී නැවත පදිංචි වූ ප්‍රජාවන්ට අයත් ජනයාගේ ජීවනෝපායන් වැඩිදියුණු කිරීමට අදාළ සෘජු ඇඟවුම් දෙකක් ගැබ්ව පවතී. මහා පරිමාණ ව්‍යාපාරික ව්‍යවසායන් ප්‍රදේශය තුළ ආයෝජනය කිරීමට පසුබට වන බැවින් තවත් එවැනි ක්‍රියාකාරකයන් ආකර්ෂණය කරගැනීමට පළාත් පාලන ආයතන මට්ටමේ සේවාවන් වැඩිදියුණු කිරීමට පියවර ගත යුතුය. එමෙන්ම, ප්‍රාදේශීය මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීම විශේෂයෙන්ම ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර සැපයීමේ මට්ටම්වල 'අහිතකර' ව්‍යාපාරික වාතාවරණයක් පැවති බව ඔප්පු කරනු ඇති අතර, ව්‍යාපෘතිය හරහා මෙම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අතිරේක සහාය/උපදෙස් සම්පාදනය කළ යුතු වේ.

රජයේ නිලධාරීන් සමග පැවැත්වූ දිස්ත්‍රික්ක මට්ටමේ වැඩමුළු දිස්ත්‍රික්ක තුළ පවත්නා ප්‍රධාන කෘෂිකාර්මික නොවන ජීවනෝපාය මූලාශ්‍ර ලෙස බටපතුරු පදනම් කර ගත් නිෂ්පාදනය, අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය, සුළු පරිමාණ ඇඟලුම් කර්මාන්තය හා පාවහන් නිෂ්පාදනය හඳුනා ගත්තේය. කාත්තන්කුඩි ප්‍රදේශයේ පවතින සුළු පරිමාණ ඇඟලුම් කර්මාන්තය හා පාවහන් නිෂ්පාදනය ආරම්භයේදී නියමු පදනමකින් අනෙක් ප්‍රදේශවලටත් ව්‍යාප්ත කිරීමේ හැකියාව විමසා බැලිය හැකිය. මේ නිෂ්පාදන සඳහා පවතින නිපුණතා පදනම හා වෙළඳපොළ ඉල්ලුම කර්මාන්තය වෙනත් ස්ථානවලත් ඇති කිරීම හා තව දුරටත් වැඩිදියුණු කිරීම මගින් ව්‍යාප්ත කිරීමට පවත්නා අවස්ථාවෝවෙති. ඇඟලුම් අංශය යටතට වැටෙන අත් යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය සහ ඊට අදාළ මැනවින් තහවුරු වූ සැපයුමක් හා

වෙළඳපොළ ජාලයක් වැඩි වශයෙන්ම දක්නට ලැබෙන්නේ මඩකලපු දිස්ත්‍රික්කයෙහිය. කර්මාන්තයේ ස්ථාවරත්වයට හා එය එහි තිබීමට හේතු වී ඇත්තේ තාක්ෂණය පැවරීම සඳහා ආයෝජනය කිරීම හා ප්‍රජාවන් දිස්ත්‍රික්කයෙන් බැහැර වෙළඳපොළවල් සමග සම්බන්ධ කිරීමයි.

අධ්‍යයනය කළ ප්‍රජාවෝ කොහු භාණ්ඩ නිෂ්පාදනයේ නිරත නොවෙති. යෙදවුම වන ''පොල්ලෙලි'' නොමැතිකම නිසා කර්මාන්තය පිරිහෙමින් පවතී. අධ්‍යයනය කළ ප්‍රජාවන් තුළ සුළු පරිමාණ වඩු කර්මාන්තය, පෙදරේරු වැඩ හා කුඹල් කර්මාන්තයද යම්තාක් දුරකට පවතී. මෙම ප්‍රජාවන් තුළ පවතින මැටි පදනම් කර ගත් ප්‍රධාන කර්මාන්තය වන්නේ ගඩොල් සෑදීමයි. මේ කර්මාන්තයට පවත්නා බාධාවන් හා අවස්ථා පහත කොටසේදී විස්තරාත්මකව සාකච්ඡා කෙරේ.

**4.11 වගුව: දිස්ත්‍රික්ක දෙකෙහි සුළු පරිමාණ කර්මාන්ත අංශය**

| | අත් යන්ත්‍ර රෙදිපිළි | කොහු භාණ්ඩ | වඩු කර්මාන්තය | කුඹල් කර්මාන්තය |
|---|---|---|---|---|
| මඩකලපුව | 27 | 9 | 4 | 2 |
| ත්‍රිකුණාමලය | 8 | 0 | 1 | 0 |

මූලාශ්‍රය: දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය, 2009

### *ගඩොල් සෑදීම*

ප්‍රජා සාමාජිකයන් සමග කතාබහ කරද්දී ප්‍රජා මට්ටමේ කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම් ලෙස මැටිගඩොල් සෑදීම, සිමෙන්තිගඩොල් සෑදීම හා බටපතුරු පදනම් කර ගත් නිෂ්පාදනය හඳුනා ගෙන සාකච්ඡා කෙරිණ. පිරම්බඩිතිව්, මිලාවැව හා පනිච්චායියාඩියාරු ප්‍රජාවන් මෙම ක්‍රියාකාරකම්වල නිරත වන නමුත් ඔවුන් එසේ නිරත වන්නේ තම ප්‍රධාන ජීවනෝපායන් කෙරෙහි වාරික වෙනස්වීම් බලපාන විට එම බලපෑම අඩුකරගැනීම සඳහා විකල්ප ජීවනෝපාය ක්‍රියාකාරකමක් ලෙස පමණකි.

**4.12 වගුව: මඩකලපු දිස්ත්‍රික්කයෙහි අධ්‍යයනය කළ ග්‍රාම නිලධාරි කොට්ඨාස තුළ ගඩොල් සෑදීමෙහි නිරතව සිටින ජනගහනය**

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | සංඛ්‍යාව |
|---|---|
| පුනානේ නැගෙනහිර | 29 |
| අම්බලන්තරේ බටහිර | 7 |
| විලන්තෝට්ටම් | 01 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මඩකලපුව, 2011

ගඩොල් නිෂ්පාදනය සඳහා අවශ්‍ය කරන මැටි ලබා ගන්නේ ගමට සමීප කුඹුරු ඉඩම්වලිනි. මැටි ප්‍රවාහන පිරිවැය මග හැරීම සඳහා බොහෝ නිෂ්පාදකයන් තම නිෂ්පාදන අඩවිය පිහිටුවා ගන්නේ ඉඩමට කිට්ටු ස්ථානයකය. පරිසරය කෙරෙහි ඇති විය හැකි බලපෑම වැළැක්වීම සඳහා මැටි ලබාගන්නේ හඳුනාගත් ඉඩම්වලින් බව අවධාන කණ්ඩායම් සාකච්ඡාවලදී සඳහන් විය. අධ්‍යයනය සිදුකළ සමයේදී බලධාරීන් විසින් මැටි හැරීම සම්බන්ධයෙන් කිසිදු සීමාවක් පනවා තිබුණේ නැත.

ගඩොල් සෑදීම කිරන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පූලක්කාඩු ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පිහිටි පිරම්බඩිතිව් ගම්මානයේ ප්‍රධාන ජීවනෝපායන්ගෙන් එකකි. පවුල් 25-30ක් පමණ සෘජුව ගඩොල් සෑදීමෙහි නිරත වෙයි. ප්‍රජා මට්ටමේ සම්මුඛ සාකච්ඡාවලින් අනාවරණය වූයේ ගඩොල් සෑදීමෙන් ප්‍රාග්ධනය හෝ ඉඩම් නොමැති අයට අනියම් ශ්‍රම අවස්ථාවන්ද සම්පාදනය වන බවයි. ඉඩම් අයිති අයද ගඩොල්නිෂ්පාදනයෙහි නිරත වෙති.

### *නිෂ්පාදනය*

ප්‍රදේශය තුළ ගඩොල් සෑදීම සම්බන්ධයෙන් සැලකිය යුතු සාම්ප්‍රදායික දැනුමක් පවතී. ගැටුම නිසා මැටි සැපයුම හා අලෙවිකරණ ජාල වෙත ප්‍රවේශ වීම සීමා විය. එහෙත් දැන් නව අලෙවිකරණ ජාල තහවුරු වී ඇත. එමෙන්ම, මැටි සැපයුම වෙත ප්‍රවේශ වීම තව දුරටත් ගැටලුවක් නොවේ. මේ කර්මාන්තයේ ස්වභාවය මෙසේ පවුල් ශ්‍රමයෙහි හෝ කුලී ශ්‍රමයෙහි නිරත වීමට පිරිමින් හා කාන්තාවන් යන දෙපාර්ශ්වයටම අවස්ථාවක් සම්පාදනය කරයි.

බෝග වගාව සමග සසඳන විට අවදානම අඩු බැවින් ගඩොල් සෑදීම ප්‍රජාවන්ට ස්ථාවර හා ස්ථිර ආදායමක් සපයයි. සාමාන්‍යයෙන් ගඩොල් නිෂ්පාදනය සිදුවන්නේ වගා කටයුතුවලට සමාන්තරවය. මැටි සැකසීම හා ගඩොල් පිලිස්සීම සඳහා නිෂ්පාදකයන් යොදාගන්නේ සාම්ප්‍රදායික තාක්ෂණයයි. මෙම තාක්ෂණය බලශක්තිය, කාලය හා සම්පත් අපතේ යැවීමකි. එමෙන්ම, නිෂ්පාදනය කළ හැකි ප්‍රමාණය අඩුය. කෙසේ වෙතත්, ගඩොල්වල ගුණාත්මකත්වය නම් ඉතා හොඳය.

රැස් කරගත් දත්ත අනුව, සාම්ප්‍රදායික ගඩොල් නිෂ්පාදන අඩවියක් පිහිටුවීමට ගඩොල් පෝරණුව සඳහා යන වියදමද ඇතුළුව දැරීමට සිදුවන ආරම්භක පිරිවැය රු.25,000කි. ගඩොලක් සෑදීමේදී දැරීමට සිදුවන ප්‍රධාන පිරිවැය ශ්‍රමපිරිවැයයි. එය ගඩොලකට රු.2.00කි. අවශ්‍ය අනෙක් යෙදවුම් වන්නේ ජලය හා බලශක්තිය (දහයියා) යි. දහයියා සාමාන්‍යයෙන් ලබා ගන්නේ ගාස්තුවකින් තොරව වීවලිනි. දර සපයා ගන්නේ යාබද කැළෑවලිනි. ප්‍රවාහන පිරිවැයෙන් තොරව කුඩා ගඩොලක වෙළඳපොළ මිල රු.5.50කි. යෙදවුම් සඳහා දැරූ පිරිවැය අනුව ලාභය රු.2-3 අතර වේ. කර්මාන්තයේ ලාභදායකත්වය ගඩොල් සෑදීමෙහි නිරත වීමට බොහෝ පුද්ගලයන් පොලඹවයි.

තාක්ෂණය වැඩිදියුණු කිරීම මාර්ගයෙන් ගඩොල් කර්මාන්තය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවක් පවතී. ගඩොල් සාදන්නන්ට විධිමත් සහාය සැපයෙන්නේ සුළු වශයෙනි. ණය ලබාගන්නේ එකතු කරන්නන් මාර්ගයෙන් හෝ ආයෝජනය සඳහා ලැබෙන ලාභය පිළිබඳව විශ්වාසයක් පවතින නිසා පවුලේ කනකර බඩු උකස් තැබීමෙනි. ගඩොල් සෑදීමට පවතින ප්‍රධාන බාධාව වන්නේ අධික වර්ෂාව හෝ ගංවතුර වැනි ආන්තික කාලගුණික රටාවන්ය.

*වෙළඳපොළ*

සිදු වෙමින් පවතින නැවත ගොඩනැගීම් නිසා වර්තමානයේදී නැගෙනහිර පළාත තුළ ගඩොල් සඳහා හොඳ වෙළඳපොළක් පවතී. දිස්ත්‍රික්කවලින් කෙරෙන සැපයුම ප්‍රමාණවත් නොවීම පිටස්තර දිස්ත්‍රික්කවලින් ගඩොල් ආනයනය කිරීමට තුඩුදී ඇත. මේ ඉල්ලුම සපුරන සක්‍රිය ගඩොල් නිෂ්පාදන කර්මාන්තයක් මඩකලපුවෙහි හා ත්‍රිකුණාමලයෙහි ඇත. අනෙක් භාණ්ඩ අලෙවියේදී මෙන් නොව වෙළඳපොළේ සක්‍රිය ස්වභාවය නිසා නිෂ්පාදකයන්ට නිශ්චිත මිලක්ද ගඩොල් සම්බන්ධ වෙළඳපොළ තොරතුරුද ලැබේ. එකතු කරන්නෝ ප්‍රවාහන යටිතල පහසුකම් අයහපත් තත්වයක තිබියදීත් භාණ්ඩ එකතු කරගැනීම සඳහා ගඩොල් සාදන නොයෙක් ගම්මාන වෙත පැමිණ ගඩොල් සඳහා වෙළඳපොළ මිල ගෙවති. ඔවුහුද අත්තිකාරම් මුදල් දීමට පෙලඹී සිටිති.

ගඩොල් සෑදීම සාර්ථක ජීවනෝපායක් බවට පත්කර ගැනීම සඳහා එම නිෂ්පාදනයන්ට වර්තමානයේ පවත්නා ශක්තිමත් වෙළඳ පොළ සම්බන්ධතා හා අවස්ථාවන් ප්‍රයෝජනයට ගත යුතුය. දිගු කාලයේදී අංශයේ තිරසරතාව හා මේ ව්‍යාප්ත වෙමින් පවතින කර්මාන්තය නිසා ඇති විය හැකි ඍණාත්මක පාරිසරික ප්‍රතිවිපාක සැලකිල්ලට ගැනීමද වැදගත් වේ.

## 5. ප්‍රතිපත්තිමය අවස්ථා හා නිර්දේශ

මෙම අධ්‍යයනයේ අවසන් කොටස නැගෙනහිර පළාතේ විශේෂයෙන්ම අධ්‍යයනය කළ දිස්ත්‍රික්ක දෙකෙහි නැවත පදිංචි වූ ප්‍රජාවන් සම්බන්ධ කරගත් ජීවනෝපාය ව්‍යාපෘතිවලට ක්‍රියාත්මක වීමට සිදුව ඇති විසල් ප්‍රතිපත්තිමය රාමුව ඉදිරිපත් කරයි. එමෙන්ම, ඉලක්ක ප්‍රදේශ ගොදුරු වීමට ඉඩ ඇති පාරිසරික උවදුරුද අවධාරණය කරයි. අවසන් වශයෙන් එය නිර්දේශ ඉදිරිපත් කරයි. ඒවා පොදුවේ ගත් කල ව්‍යාපෘති ආශ්‍රිත තීරණ ගැනීමේ ක්‍රියාවලිවලද සවිස්තරාත්මකව ගත්කල (5.3 වගුවෙහි සාරාංශ කර ඇති) ඒ ඒ ජීවනෝපාය අංශවලටද අදාළ වේ.

### 5.1 ප්‍රතිපත්ති හා ආයතන

නැගෙනහිර සංවර්ධනය කිරීමේ අභිමතාර්ථය පෙන්නුම් කරන ප්‍රධාන ප්‍රතිපත්තිමය ලියවිලි වන්නේ "මහින්ද චින්තනය" හා ඊට සම්බන්ධ දසඅවුරුදු තිරස් සංවර්ධන සැලැස්මයි (GoSL, 2010). පුළුල් වැඩ පිළිවෙළක් වන නැගෙනහිර පළාත සංවර්ධනය කිරීමේ තුන්අවුරුදු සැලැස්ම ශ්‍රී ලංකාව සඳහා 2006-

2016 දසඅවුරුදු තිරස් සංවර්ධන රාමුව හෙවත් "මහින්ද චින්තනයේ" කොටසක් ලෙස ඇතුළත් කර ඇත. වැඩසටහන මෙහෙයවන්නේ ජනාධිපති කාර්යාලය සහ ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයයි. ආංශික ක්‍රමෝපායන් සකස් කිරීමේදී පළාත් බලධාරි ආයතන, අදාළ දිස්ත්‍රික ලේකම් කාර්යාල හා ප්‍රජාමූල මට්ටමේ ප්‍රජාවෝ ගණනාවක් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරති. මෙම කොටස පදනම් වන්නේ "නැගෙනහිර නවෝදය" සඳහා වෙන් වූ වෙබ් අඩවියෙහි පවත්නා තොරතුරු මතය.[8]

නැගෙනහිර නවෝදය වෙබ් අඩවියෙහි සංක්ෂිප්තව දක්වා ඇති පරිදි තුන් අවුරුදු සැලැස්ම ක්ෂණිකව අවධානය යොමු කරන ක්ෂේත්‍ර වන්නේ කෘෂිකර්මය හා වාරිමාර්ග, මාර්ග, බලශක්තිය, ජීවනෝපාය සහාය, ධීවර කර්මාන්තය හා පශු සම්පත් සංවර්ධනය, අධ්‍යාපනය, සිවිල් පරිපාලනය, සෞඛ්‍යය හා සනීපාරක්ෂාව යනාදියයි. මෙම වැඩසටහන අනෙක් ප්‍රදේශ සමග සම්බන්ධතාව වැඩිදියුණු කිරීම ප්‍රධාන අභිමතාර්ථය කරගත් මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති ඇතුළත් ජාතික සංවර්ධන සැලැස්මේ නොවෙන් කළ හැකි කොටසකි.

එම ක්‍රමෝපාය යටතේ ආවරණය වන ප්‍රධාන අංශවලට පහත සඳහන් ඒවා ඇතුළත් වේ: අභ්‍යන්තර අවතැන් වූවන් නැවත පදිංචි කිරීම, බෝග වගාව, වාරිමාර්ග, ධීවර කර්මාන්තය, පශු සම්පත්, කර්මාන්ත, සංචාරක ව්‍යාපාරය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ඇතුළු ඵලදායක අංශ පුනර්ජීවනය කිරීම, විදුලි බලය, මාර්ග, ප්‍රවාහනය (මාර්ග, දුම්රිය මාර්ග), වරායවල්, ජල සම්පාදනය හා සනීපාරක්ෂාව වැනි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. ග්‍රාමීය යටිතල පහසුකම්වලට ඇතුළත් වන්නේ ''ගමනැගුම'',''විමධ්‍යගත අයවැය'', ''ගැමි පුබුදුව'', ''ගැමි අරුණ'' හා ''ග්‍රාමීය වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය'' යටතේ ක්‍රියාත්මක වැඩසටහන්ය.

පහත දැක්වෙන ප්‍රතිපත්තිමය වාතාවරණය සංවර්ධන ව්‍යාපෘති සඳහා උපයෝගි කරගත හැකි විවිධ අංශවලට අදාළව සංවර්ධන අවස්ථා නිර්මාණය කරයි. අධ්‍යයන ප්‍රදේශවලට අදාළ ප්‍රධාන ප්‍රතිපත්තිමය ගැටලු පහත සාකච්ඡා කෙරෙන අතර, සංවර්ධන මුල පිරීම්වලදී එම කරුණු අවශ්‍ය පරිදි සීරුමාරු කරගත හැකි වේ.

**5.1 වගුව: ව්‍යාපෘතියට අදාළ ප්‍රතිපත්ති පිළිබඳ විශ්ලේෂණය**

| ප්‍රතිපත්තිමය ක්‍රමෝපායයෝ | වෙළඳපොළ අධ්‍යයනය පදනම් කරගත් විට සංවර්ධන මුල පිරීම්වලට ඇති අදාළත්වය (නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ ප්‍රතිපත්ති සම්පාදකයන්ගෙන් ලැබෙන සහාය) |
|---|---|
| කෘෂිකර්මය | |
| වගා කරන වපසරිය හා වගා සූක්ෂ්මතාව වැඩි කිරීමෙන් බෝගවගාව, නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩිදියුණු කරනු ලැබේ. | අඩු ප්‍රමාණයක් නිපදවෙන සහ ඉහළ අගයක් එකතු කළ හැකි හා වෙළඳපොළක්පැවතිය හැකි බෝගවල නිෂ්පාදනය වැඩි දියුණු කළ යුතුය.විවිධ බෝග වර්ගවලට අවශ්‍ය කරන්නේ විවිධ ක්‍රමෝපායන්ය. උදාහරණයක් ලෙස, ප්‍රාදේශීය නිෂ්පාදනය පහළ මට්ටමක පවතින බැවින් හා දිස්ත්‍රික්කවල පවත්නා පරිභෝජන ඉල්ලුම සපුරනු පිණිස දිස්ත්‍රික්ක දෙකෙහි කෙරෙන එළවළු, වෙනත් ක්ෂේත්‍ර බෝග හා පලතුරු වගාව ආශ්‍රිත නිෂ්පාදනය පුළුල් කිරීම පිළිබඳව අවධානය යොමු කළ යුතුය. අනෙක් අතට, ප්‍රාදේශීය වෙළඳපොළට අවශ්‍ය ප්‍රමාණයට වඩා නිපදවෙන බැවින් වී වැනි බෝග වෙළඳපොළකෙරෙහි අවධානයක් යොමු කරමින් වගා කළ යුතුය. |

[8] නැගෙනහිර නවෝදය, නිල වෙබ් අඩවිය www.neweast.lk, ප්‍රවේශ වීම 2010 සැප්තැම්බර්

| | |
|---|---|
| ප්‍රධාන වශයෙන්ම ගෙවතු වගාව, පලතුරු වගාව හා බහුවාර්ෂික බෝග වගාව පුළුල් කිරීම මගින් තම බෝග විවිධාංගීකරණය කිරීමට ගොවීන් දිරිගන්වනු ලැබේ. | ගෙවතු වගාව ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ හා ආබාධිතත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයන් නිරත වන වැදගත් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වලින් එකක් බව සඳහන් කළයු තුය. ඒවා රජයෙන් ලබා ගත හැකි සහායන් සමග සම්බන්ධ කළ යුතු වේ. පලතුරු බෝග වගාව පුළුල් කිරීමට වාරිකත්වය හා අලෙවි කිරීමේ හැකියාව සැලකිල්ලට ගත යුතුය. වගාවෙන් ඉහළ ප්‍රතිලාභයක් ලැබෙන බැවින් පලතුරු සඳහා අගය එකතු කළ හැකි අවස්ථා තිබිය යුතුය. බහුවාර්ෂික බෝග කෙටි කාලීන බෝග සමග මිශ්‍ර කිරීමෙන් බහුවාර්ෂික බෝග ආර්ථිකව සාර්ථක වන තෙක් නිෂ්පාදකයාට ආදායමක් උපදවාගත හැකිය. |
| සත්ව ආහාර හා මිශ්‍රණ සඳහා ප්‍රාදේශීයව කරනු ලබන අමුද්‍රව්‍ය නිෂ්පාදනය වේගවත් කිරීම සඳහා පළාතේ අඩු අස්වැන්නක් සහිත ප්‍රදේශවලට තෘණ, බඩ ඉරිඟු, සෝයා බෝංචි, රටකජු, තල, සූරියකාන්ත හා සෝගම් වැනි කාර්මික බෝග හඳුන්වා දිය යුතුය. | නැගෙනහිර පෞද්ගලික අංශය හා සංවර්ධන ආයතනික ව්‍යාපෘති පුළුල් කිරීම මෙම වෙළඳ බෝග වගාවන්හි ආයෝජනය කිරීමට අවස්ථාවක් සම්පාදනය කරයි. වගාව තිරසර කිරීම සඳහා නිෂ්පාදකයන් ප්‍රදේශය තුළ පැවතිය හැකි වෙළඳපොළවල් සමග සම්බන්ධ කළ යුතුය. |
| වැඩි දියුණු වෙළඳපොළ පහසුකම් සම්පාදනය කිරීම සහ ඉහළ වටිනාකමක් සහිත භාණ්ඩ හඳුනාගැනීමේ, නිෂ්පාදනයේ හා අලෙවි කිරීමේ නිරතවීමට ගොවීන්ට පහසුකම් සැපයීම හරහා වෙළඳ පොළවල් වෙත ප්‍රවේශය සැපයීමෙන් කෘෂිකාර්මික අස්වැන්න අලෙවි කිරීම වැඩි කළ යුතුය. | සමීප වෙළඳපොළක් නොමැතිකම, වෙළඳපොළවල් හා වෙළඳ සම්බන්ධතා වෙත පවත්නා ප්‍රවේශය දුර්වල වීම කෘෂිකාර්මික අංශයට සමස්තයක් ලෙස බාධා කරන බව අධ්‍යයනයේ ආංශික විශ්ලේෂණය සොයා ගත්තේය. රජයෙන් සැපයෙන සහාය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහායක වන වාතාවරණයක් නිර්මාණය කරයි. නැගෙනහිර අස්වැන්න එක් ස්ථානයකට රැස් කොට වඩා පුළුල් වෙළඳපොළකට බෙදා හරින ප්‍රාදේශීය වෙළඳ මධ්‍යස්ථානයක් ඇති කිරීම සඳහා රජය දක්වන සහයෝග යට පහසුකම් සැපයීමද වැදගත්ය.<br>කෘෂිකාර්මික අස්වැන්න සාමූහිකව අලෙවි කිරීම නිෂ්පාදකයන්ගේ කේවෙල් කිරීමේ බලය වැඩි කළ හැකි තවත් ක්‍රමයකි.<br>ඉහළ වටිනාකමක් සහිත බෝග ප්‍රවර්ධනය කිරීම සඳහා රජය ප්‍රතිපත්තිමය පරිශ්‍රමයක් දරන බව සඳහන් කළ යුතුය. නියමු පරිශ්‍රමයක් ලෙස ඉහළ වටිනාකමක් සහිත වී වර්ග හඳුන්වා දීම සම්බන්ධයෙන් මෙම අධ්‍යයනය කළ නිර්දේශයට එය සහායකි. |
| නැගෙනහිර පළාත තුළ වේගයෙන් වර්ධනය කළ හැකි බෝග වගා අංශය හඳුනාගෙන එහි අවශ්‍යතා සැපිරිය හැකි කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු හා ව්‍යාප්තික්‍රම සංවර්ධනය කළ යුතු බව විශේෂයෙන් අවධාරණය කරනු ලැබේ. | මෙය සත්ව පාලනය හා එළවළු වගාව සඳහා ව්‍යාප්ති සහායක් නොමැතිකම පිළිබඳ ගැටලුවට විසඳුම් සැපයිය හැකි අවස්ථාවකි. ජීවනෝපාය සංවර්ධන මූලපිරීම්වලදී ප්‍රමාණවත් ව්‍යාප්ති සහායක් සැලසීමට පහසුකම් සැපයීම සඳහා සම්පත් පැවරීම ගැන සලකා බැලිය හැකිය. හැකියා ගොඩනැගීමේ හෝ කාර්යාලීය ඉඩකඩ හා රථවාහන වැනි පරිපාලන යටිතල පහසුකම්වලට මූල්‍ය සහාය සැපයීමේ ස්වරූපයෙන් මෙම සම්පත් පැවරීම කළ හැකිය. |

| | |
|---|---|
| නැගෙනහිර ඵලදායිතාව අඩු වීමට හේතුවක් ලෙස ප්‍රදේශය තුළ විධිමත් ලෙස ක්‍රියාත්මක වාරිමාර්ග යෝජනාක්‍රම නොපැවතීම හඳුනා ගත් වාරිමාර්ග අංශයේ ප්‍රතිපත්ති 'ජලයේ ගුණාත්මකත්වය හා වාරිමාර්ගවල කාර්යක්ෂමතාව, ක්‍රියාකාරිත්වය හා කළමනාකරණය, පවත්නා ඇළවල් හා ඒවාට අදාළ යන්ත්‍රණයන් පුනරුත්ථාපනය කිරීම, ජලාපවහනය හා ගංවතුර රැකවරණය, ලුණු වතුර බැහැර කිරීම හා නව වාරිමාර්ග යෝජනා ක්‍රම ඇතිකිරීම වැඩිදියුණු කිරීමට' අපේක්ෂා කරයි. | වාරිමාර්ග පහසුකම් ක්‍රියාත්මක කරන මධ්‍යම මට්ටමේ ආයතනය වන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි. මේ මොහොතේ වාරිමාර්ග වැඩිදියුණු කිරීමට අදාළව අවධානය යොමුවී ඇත්තේ මහ වැව් හා මධ්‍ය පරිමාණ වැව් කෙරෙහිය. අධ්‍යයනය කළ බොහෝ ප්‍රදේශවලට ප්‍රයෝජන සැලසෙන්නේ කුඩා වැව්වලිනි. සියලු කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීමට සංවර්ධන ව්‍යාපෘති අසමත් වුවහොත් කුඩා වැව් වැඩිදියුණු කරන ලෙස වගකිව යුත්තන්ට බලපෑම් කළ යුතුය. වැව් නඩත්තු කිරීම සඳහා ප්‍රජාව සහභාගි වීමද මේ හා සමානව වැදගත් වේ. |
| බින්දු හා වතුරමල් වාරිමාර්ග ක්‍රම හඳුන්වා දීම, භූගත ජලය හැසිරවීමේ යන්ත්‍රණයන් නියාමනය කිරීම හා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හැකියාව ශක්තිමත් කිරීම වාරිමාර්ග අංශය සංවර්ධනය කිරීම සඳහා ගැනීමට අපේක්ෂිත පියවරයන් කිහිපයකි. | වාරිමාර්ගවල කාර්යක්ෂමතාව සහ එළවළු හා පලතුරු වගාවේ ඵලදායිතාව වැඩි කිරීමට ක්ෂුද්‍ර ජල සම්පාදනය අත්‍යවශ්‍ය වේ. මෙය නිෂ්පාදන පිරිවැය අඩු කිරීමටත් ගොවීන්ගේ තරගකාරිත්වය වැඩි කිරීමටත් උදව් වේ. |
| පශු සම්පත | |
| පශු සම්පත් අංශයේ ඵලදායිතාව වැඩිදියුණු කර පශු සම්පත් පාලනයේ යෙදෙන්නන් ලබන ගොවිපොළ ප්‍රතිලාභ වැඩි කළ යුතුය. | සංවර්ධන මූල පිරිම්වලදී ඵලදායිතාවේ වැඩිදියුණුව උදෙසා අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර වන්නේ අභිජනනය සඳහා යොදාගන්නා සත්ව තොගයේ ප්‍රමිතිය හා ප්‍රමාණය උසස් කිරීම හා වැඩි කිරීමත් සත්ව ආහාරවල ගුණාත්මකත්වය වැඩිදියුණු කිරීමත්ය. |
| පශු සම්පත් අස්වැන්න නිපදවීම හා අලෙවි කිරීම සඳහා අත්‍යවශ්‍ය මූලික යටිතල පහසුකම් සම්පාදනය කිරීම, පශු සම්පත් අංශය විවිධාංගීකරණය කිරීම සඳහා අගය එකතු කිරීම් හඳුන්වා දීම. | ග්‍රාමීය මාර්ග හා ගොවිපොළ පාරවල් පුනරුත්ථාපනයට ප්‍රමුඛතාව දිය යුතුය. මෙම ගැටලුව පිළිබඳව දැනුවත්කම ඇති කළ යුතුය.<br>අවශ්‍ය පුහුණුව හා උපකරණ සපයමින් ප්‍රාදේශීය මට්ටමේ මුදවපු කිරි හා යෝගට් නිෂ්පාදනය වැනි කිරි සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාකාරකම්වලට සහාය දිය යුතුය. අගය එකතුකිරීම, ඇසිරීම මෙන්ම අලෙවිකරණය ආශ්‍රිත පුහුණු සඳහාද අදාළ බලධාරි ආයතනවලින් සැපයෙන තාක්ෂණික සහාය ලබා ගතහැකිය. |
| මස් සඳහා සතුන් ඇති කිරීමේ විස්තෘත කළමනාකරණයත් කිරි නිෂ්පාදනය ආශ්‍රිතව සූක්ෂ්ම කළමනාකරණයත් ප්‍රවර්ධනය කිරීම.<br>පශු සම්පත් ගොවීන් නිෂ්පාදක සමුපකාර ලෙස සංවිධානය කිරීම සහ ගොවිපොළ අස්වැන්න සාමූහිකව අලෙවි කිරීම හා ගොවියාට ලැබෙන ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම සඳහා ඊට සමාන ගොවි සංවිධාන ඇති කිරීම. | නැගෙනහිරදී සූක්ෂ්ම කළමනාකරණ ක්‍රමය භාවිත නොවන බවත් එය හඳුන්වා දීමට කලින් ගොවීන්ට එම කළමනාකරණ පරිචය පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු සම්පාදනය කළ යුතු බවත් සඳහන් කළ යුතුය. හැකියාව සහිත ගොවීන් මෙම පරිශ්‍රමය සමග සම්බන්ධ කිරීම සඳහාත් නූතන ගොවිතැන් ශිල්පක්‍රම පිළිබඳ දැනුම ලබා ගැනීමට පහසුකම් සැපයීම සඳහාත් විශේෂ පරිශ්‍රමයක් දැරිය යුතුය.<br>නොයෙක් කළමනාකරණ ක්‍රමවලට ගැළපෙන අභිජනන සතුන් හඳුන්වා දිය යුතුය. |
| ධීවර කර්මාන්තය | |
| නැංගුරම් පොළවල් ඉදිකිරීම, ගොඩ බැසීමේ අඩවි වැඩිදියුණු කිරීම හා ඉදිකිරීම සහ අයිස් නිෂ්පාදනාගාර සම්පාදනය කිරීම යනාදී වශයෙන් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම. | ධීවර යටිතල පහසුකම්වලට අදාළව රජයේ මෙහෙයවීමෙන් කෙරෙන විශාල ආයෝජනය වෙළඳපොළ සම්බන්ධතා සඳහා පහසුකම් සැපයීම වැනි ධීවර උපඅංශයට අදාළ වෙනත් ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීමට රාජ්‍ය නොවන සංවර්ධන ආයතනවලට ලැබෙන අවස්ථාවකි. ඉලක්ක ප්‍රජාවන් මෙම විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති සමග සම්බන්ධ කළ යුතුය. |

| | |
|---|---|
| විදුලි බලය, පානීය ජලය හා වැසිකිළි වැනි වෙනත් සේවාවන් සම්පාදනය කිරීම සහ ධීවර ප්‍රජාවන්ට මාර්ග ජාල වෙත තිබෙන ප්‍රවේශය වැඩිදියුණු කිරීම. | විදුලිබලය නොමැතිකම බොහෝ ඉලක්ක ප්‍රජාවන්ට පොදුවේ බලපාන බාධාවකි. රජය මගින් මේ ප්‍රජාවන්ට විදුලි බලය සැපයෙන්නේ නම් තවත් අගය එකතු කිරීම් (මාළු සැකසීම) සඳහා මුල පිරීමටත් ජංගම දුරකථන හා පරිගණක අලුත්වැඩියාව වැනි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් සුළු ව්‍යාපාර සහ ත්‍රිරෝද රථ/යතුරුපැදි අලුත්වැඩියාව වැනි සුළුව්‍යාපාර ඇතුළු තවත් කෘෂිකාර්මික නොවන ජීවනෝපාය ක්‍රියාකාරකම් හඳුන්වා දීමටත් සංවර්ධන ව්‍යාපෘතිවලට හැකියාව ලැබේ. |
| නිදහසේ ඇඟිල්ලන් බෝ කිරීම, සී බාස් මසුන් රෝපණය කිරීම සඳහා කුඩු සැපයීම හා ප්‍රජාමූල ක්ෂුද්‍ර පරිමාණ බෝකිරීමේ ස්ථාන ඇති කිරීම වැනි අභ්‍යන්තර අංශ ක්‍රියාකාරකම්වලට සහාය දීම ධීවර කර්මාන්තය තුළදී ප්‍රමුඛතාව දී තිබෙන ක්ෂේත්‍රවලින් සමහරකි. | මෙම ප්‍රතිපත්තිමය පැතිකඩ අභ්‍යන්තර ධීවර කර්මාන්තය පිළිබඳව කළ විශ්ලේෂණයේදී සාකච්ඡා කළ ඵලදායිතාව ආශ්‍රිත බාධාවන්ට විසඳුම් සෙවීමට උපකාර වේ. ක්ෂුද්‍ර පරිමාණ බෝකිරීමේ ස්ථාන හරහා කෙරෙන ප්‍රාදේශීය මට්ටමේ ඇඟිල්ලන් නිෂ්පාදනය මේ අධ්‍යයනය තුළ සිටින ප්‍රජාවන්ද ඉලක්ක කරගත යුතුය. එමෙන්ම සංවර්ධන ව්‍යාපෘති ප්‍රජාවන්ට මේ ක්‍රියාකාරකම් වෙත ප්‍රවේශ වීම සඳහා පහසුකම් සැපයිය හැකි ක්‍රම සොයා බැලිය යුතුය. |
| මාළු වෙළඳපොළක් හා සිල්ලර මාළු අලෙවිසල් ඉදිකිරීම වැනි පරිශ්‍රමයන් හරහා වෙළඳපොළ වැඩිදියුණු කිරීම. | තම අස්වැන්න අලෙවි කිරීමේදී දුෂ්ට ණය චක්‍රයෙන් මිදී වඩා ස්වාධීන තත්වයකට පත්වීම සඳහා දුප්පත් ධීවර ජනයාට ප්‍රාග්ධන සහාය සැපයීමද අත්‍යවශ්‍ය වේ. |
| කර්මාන්ත | |
| ඇඟලුම් කර්මාන්තය පුනර්ජීවනය කිරීම. | රජයේ දෙපාර්තමේන්තුවල මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවලද සහාය ඇතිව සුළු පරිමාණ ප්‍රාදේශීය ඇඟලුම් කම්හල් වැනි කර්මාන්ත වෙනත් ප්‍රදේශවලද ඇති කළ හැකිය. අත් යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයටද නව තාක්ෂණික යෙදවුම් සපයා සහාය දිය හැකිය. |
| රාජ්‍ය-පෞද්ගලික අංශ වැඩිදියුණු කිරීමේ දැක්මකින් යුතුව කාර්මික කලාප පිහිටුවීම හා සහන සැපයීම. | ප්‍රදේශය තුළ විධිමත් රැකියා අවස්ථා සැපයෙන බැවින් මහා පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමෙන් ඉලක්ක ප්‍රජාවන්ට දිගු කාලයේදී ප්‍රතිලාභ සැලසේ. |
| යටිතල පහසුකම් සම්පාදනය කිරීම. | විදුලිබලය, මාර්ග හා ජලය වැනි යටිතල පහසුකම් සම්පාදනය කිරීමෙන් තරගකාරිත්වය වැඩි දියුණු වන අතර, නිෂ්පාදන පිරිවැය අඩු වේ. |

## 5.2 ස්වාභාවික උවදුරු හා ඒවායේ බලපෑම අවම කිරීම සඳහා යොදා ගත හැකි විධික්‍රම

උතුර හා නැගෙනහිර නොයෙක් ස්වාභාවික උවදුරුවලට ගොදුරු විය හැකිය. පහත දැක්වෙන 5.2 වගුව සුවිශේෂ ජීවනෝපාය අංශ කෙරෙහි බලපාන ස්වාභාවික උවදුරු හා ඒවායේ බලපෑම අවම කිරීම සඳහා ප්‍රජාවන්ට යොදාගත හැකි යාන්ත්‍රණයන් පිළිබඳ සාරාංශයක් සම්පාදනය කරයි.

5.2 වගුව: ස්වාභාවික උවදුරුවල බලපෑම හා එය අවම කිරීම සඳහා යොදා ගත හැකි විධික්‍රම

| අංශය | ස්වාභාවික උවදුර | ජීවනෝපායන්ට කරන බලපෑම | අවම කිරීම සඳහා යොදා ගත හැකි විධික්‍රම |
|---|---|---|---|
| බෝග අංශය | ලවණතාව වැඩි වීම | පසේ ඵලදායිතාව අඩු වීම, වෙරළබඩ වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය ක්ෂය වීම | ලවණතාවට ඔරොත්තු දෙන අභිජනන ශාක වර්ග නිර්මාණය කිරීම |
| බෝග අංශය | මෝසම් වැසි හා එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වන නියඟය හා ගංවතුර | කෘෂි ඉඩමේ ඵලදායිතාව අඩු වීම | දේශගුණික විපර්යාසවල හා කල්තියා අනතුරු ඇඟවීමේ පද්ධතිවලින් එල්ල වන බලපෑම්වලට ඔරොත්තු දිය හැකි නව සහල් වර්ග නිපදවීම සඳහා ඉහළ අස්වැන්නක් සහිත සහල් වර්ගවලට (පොක්කලි වැනි) සාම්ප්‍රදායික සහල් වර්ගවල අන්තර්ගත අභිමත ලක්ෂණ හඳුන්වා දෙමින් අඩු ජල සම්පාදන අවශ්‍යතාවක් සහිත බීජ/අභිජනන ශාක වර්ග නිර්මාණය කිරීම |
| අභ්‍යන්තර ධීවර කර්මාන්තය | මෝසම් වැසි හා එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන නියඟය හා ගංවතුර | නියඟය වාරික වැව්වල ජල අස්වැන්න අඩුවීමටත් මිරිදිය හා කිවුල්දිය ජල සම්පත් අඩුවීමටත් හේතු වී අභ්‍යන්තර/ජලජ රෝපණ ධීවර කර්මාන්තය කෙරෙහි බලපායි | ද්විතීය ජීවනෝපායන් හඳුන්වාදීම හා කුඩු රෝපණය වැනි ජලජ රෝපණ ක්‍රියාකාරකම් විධිමත්ව සැලසුම් කිරීම |
| බෝග අංශය | මුහුදු මට්ටම ඉහළ යාම | වගා කිරීම සඳහා යොදා ගත හැකි ඉඩම් ප්‍රමාණය අඩු වීම | වගා කිරීම සඳහා ප්‍රදේශ හඳුනා ගැනීමට භූමිය කලාපවලට වෙන් කිරීම |
| මසුන් ඇල්ලීම | මුහුදු මට්ටම ඉහළ යාම | මාදැල් ක්‍රියාකාරකම් සඳහා පවතින වෙරළ ප්‍රදේශය අඩු වීම<br><br>මත්ස්‍ය අභිජනන ප්‍රදේශ කෙරෙහි අහිතකර ලෙස බලපා සම්පත් ක්ෂය වීම වැඩි වීම | ද්විතීය ජීවනෝපායන් හඳුන්වා දීම<br><br>ධීවරයන් අතර වඩා හොඳ කළමනාකරණ පරිචයන් හා දැනුවත්කම ඇති කිරීම |

මූලාශ්‍රය: පරිසර අමාත්‍යාංශය, 2010

පරිසර අමාත්‍යාංශය ආරම්භ කළ ගොදුරු වීමට ඇති ඉඩකඩ විශ්ලේෂණයට අනුව, වී වගාව හා පශු සම්පත් පාලනය කෙරෙහි අහිතකර ලෙස බලපාන නියඟ හා ගංවතුරවලට බෙහෙවින්ම ගොදුරු වියහැකි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ලෙස එරාවූර් පත්තු ප්‍රදේශය හඳුනාගෙන ඇත. මධ්‍යස්ථ ලෙස ගොදුරු වීමට ඉඩ ඇති ප්‍රදේශ ලෙස පොරතීවු පත්තු හා කින්නියා ප්‍රදේශ හඳුනාගෙන ඇත. මුහුදු මට්ටම ඉහළ යාමට බෙහෙවින්ම ගොදුරු වීමට ඉඩ ඇති ප්‍රදේශයක් ලෙස කුච්චවේලි හා මධ්‍යස්ථ ලෙස ගොදුරු විය හැකි ප්‍රදේශයක් ලෙස මුතූර් හඳුනාගෙන ඇත. මෙම ප්‍රදේශ සම්බන්ධ අනාගත ව්‍යාපෘති සැලසුම් කිරීමේදී මෙම අහිතකර බලපෑම් පිළිබඳව දැනුවත්ව සිටිය යුතු අතර, ඉහත සඳහන් කළ අවම කිරීමේ පියවරයන් එම ව්‍යාපෘතිවලට අන්තර්ගත කිරීමට උත්සාහ කළ යුතුය. උදාහරණයක් ලෙස, මුහුදු මට්ටම ඉහළ යාමට ගොදුරු විය හැකි ප්‍රදේශවල මාළු ගොඩ බෑමේ අඩවි හෝ නැංගුරම් පොළවල් ඉදිකිරීමට උපදෙස් නොදිය යුතුය. එරාවූර් පත්තුවෙහි කෙරෙන මැදිහත්

වීම්වලට නියඟයට ඔරොත්තු දෙන බෝග හා අභිජනන සත්ව වර්ග පිළිබඳ හැඳින්වීමක් ඇතුළත් කළ යුතුය. එපමණක් නොව, මෙම සිතියම්ගත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ලද්දේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම දක්වා පමණක් බැවින් ග්‍රාම නිලධාරි කොට්ඨාස හෝ ප්‍රජා මට්ටම්වලදී ගොදුරු වීමට ඉඩ ඇති අවස්ථා මග හැරී තිබිය හැකි අතර, මැදිහත් වීම් සැලසුම් කිරීමේදී මේ සුවිශේෂ කාරණා සැලකිල්ලට ගත යුතුවේ.

## 5.3 නිර්දේශ

නිර්දේශ ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් යටතේ සංවිධානය කොට ඇත. පළමු කොටස මෙම ප්‍රජාවන්ට ප්‍රතිලාභ සැලසීම අභිමතාර්ථය කොට ගත් සංවර්ධන ව්‍යාපෘති උදෙසා වන පොදු නිර්දේශ සම්පාදනය කරයි. දෙවන කොටස විවිධ මාදිලියේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් කෙරෙහි පොදුවේ බලපාන ගැටලු ජයගැනීම උදෙසා වන නිර්දේශ ඉදිරිපත් කරයි. ඊළඟට ඒ ඒ උපඅංශය උදෙසා වන නිර්දේශ සාකච්ඡා කරනු ලැබේ. අවසානයේ, මෙම අධ්‍යයනය තුළ සිටින ප්‍රජාවන් උදෙසා වන සුවිශේෂ නිර්දේශ ඉදිරිපත් කෙරෙන අතර, ඒවා ඒ ඒ ජීවනෝපාය අංශ පදනම් කරගෙන වෙනත් ඉලක්ක ප්‍රජාවන් තුළද ක්‍රියාත්මක කළ හැකි වේ (5.3 වගුව බලන්න).

### 5.3.1 පොදු නිර්දේශ

අධ්‍යයනය කළ කණ්ඩායම තුළ සිටින නිෂ්පාදකයන් බොහෝ විට සිතියම්ගත කෙරෙන්නේ ඉහත කොටස්වලදී සාකච්ඡා කළ පරිදි ඔවුන්ගේ ලාභදායකත්වයද වටිනාකම් දාමය තුළ ඔවුන්ට හිමි විය යුතු කාර්ය භාරය හා පාලනයද සීමා කරමින් ඔවුන්ට අදාළ වටිනාකම් දාමයන්හි පහළ මට්ටම්වලය. පසු ගිය දශක තුනේදී ගැටුම ආශ්‍රිතව ඔවුන් ලැබූ අනේකවිධ හා අහිතකර අත්දැකීම් හේතුවෙන් ප්‍රාග්ධනය, තාක්ෂණය හා (ප්‍රදේශ අතර සම්බන්ධතාව හා ව්‍යාප්ති සේවාවන් වැනි) සහායක ව්‍යුහයන් නොමැතිකමෙන් මෙන්ම ගංවතුර, නියඟය හා වල් අලි ප්‍රහාර වැනි පාරිසරික උවදුරුවලින්ද දැඩි සීමාවන් පැනවී පශ්චාත් ගැටුම් වාතාවරණය තුළදී ඔවුහු වඩාත් ගොදුරු විය හැකි තත්ත්වයට පත් වෙති.

ප්‍රචණ්ඩ ගැටුම අවසන් වීමෙන් පසු මෙම අධ්‍යයනයේ ඉලක්ක කණ්ඩායම සිටින්නේ සංක්‍රාන්තික තත්ත්වයක බැවින් මෙම අධ්‍යයනය පුරා සාකච්ඡා කෙරුණු පරිදි බාහිර කම්පනයන්ට ගොදුරු විය හැකිය. ගැටුම් කාල පරිච්ඡේදය මුළුල්ලේමත් ඔවුන් සාම්ප්‍රදායික ජීවනෝපායන්හි නිරත වී ඇතත් විශ්ලේෂණය පෙන්වා දෙන්නේ මේ අංශ ඒවා සතු හැකියාවේ උපරිම මට්ටම කරා ළඟා වී නැති බවත් යුද්ධයේ අවසානය හා නැවත පදිංචි වීම සමග සහාය සැපයීමේ අවශ්‍යතාව මතුව තිබෙන බවත්ය. විශාලතම වාසිය වන පවත්නා නිපුණතා පදනම නව තාක්ෂණය සැපයීමත් සමග වාසියට හරවා ගත යුතු අතර, එමගින් මෙම නිෂ්පාදකයන් වඩා තරගකාරී තත්ත්වයට පත් වනු ඇත. විශ්ලේෂණය අනුව අධ්‍යයන කණ්ඩායමට හැඟෙන්නේ දැනටමත් පවත්නා උපඅංශ ශක්තිමත් කිරීමෙන් ඉලක්ක ප්‍රජාවට කෙටි කාලයේදී හා මධ්‍ය කාලයේදී සාපේක්ෂව ස්ථාවර ආදායමක් සම්පාදනය වන බවයි. විශ්ලේෂණය ඉලක්ක කණ්ඩායම සම්බන්ධයෙන් යොදාගත හැකි අනාගත ප්‍රවණතා ලෙස වෙළඳ බෝග වගාව, රෝපණ ධීවර කර්මාන්තය, කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම් ආශ්‍රිත නඩත්තු හා අලුත්වැඩියා කටයුතු, සිල්ලර වෙළඳාම හා කෘෂිකර්මය පදනම් කරගත් නිෂ්පාදනද නිර්දේශ කරයි. පවත්නා නිපුණතාවන් හා කළමනාකරණ පරිචයන් වැඩිදියුණු කිරීම පිළිබඳ පුහුණු සැපයීමද වැදගත් වේ.

මෙම අධ්‍යයනයත් මෙම පර්යේෂණය සිදු කිරීමේදී ලද අත්දැකීමත් පෙන්වා දෙන්නේ යළි පණ ගැන්වෙමින් පවතින වාතාවරණයක් තුළ මුළුමනින්ම නව ජීවනෝපාය ක්‍රියාකාරකම් ආරම්භ කිරීම අවදානම් සහගත බවයි. මේ නිසා, එවැනි මුල පිරීම් ආරම්භ කළ යුත්තේ මෙම නව ජීවනෝපායන් සාර්ථක නොවුව හොත් ජනයාට යොදා ගත හැකි විකල්පයන් සහිතවය. කෙසේ වෙතත්, වෙළඳපොළ අධ්‍යයනය පවත්නා උපඅංශ තුළ නිෂ්පාදනය, ඵලදායිතාව, අගය එකතුකිරීම හා අලෙවිකරණය යන මට්ටම්වල පවතින හිදැස් පැහැදිලිව ඉස්මතු කර දක්වයි. ඉලක්ක ප්‍රජාවන්ගේ ආදායම වැඩි කිරීමට නම් මේ හිදැස් පිරවිය යුතු වේ.

මෙම අධ්‍යයනය පවත්නා උපඅංශ තුළ තිබෙන සහාය සපයා වර්ධනය කිරීමට සුදුසු වෙළඳ පොළවල්ද හඳුනාගනියි. ජනයා වෙළඳ බෝග වගාව හා රෝපණ ධීවර කර්මාන්තය වැනි විකල්ප ජීවනෝපායයන්හි නිරතව සිටීම හා ඒවාට අනාවරණය වීම පෙන්නුම් කෙරෙන්නේ මේ වටිනාකම් දාමයන් තුළ එම දාමයන්ට ගැළපෙන වෙනත් අංශ මතු වී ඒමට ඉඩකඩ නිර්මාණය වන බවයි. සුළු නිපුණතා පදනම යොදා ගනිමින් සාම්ප්‍රදායික අංශයන්ට ප්‍රතිලාභ ලැබිය හැකි සුදුසු ක්ෂේත්‍ර සමහරක්ද අධ්‍යයනයෙන් ඉස්මතු කර දැක්විණ. වඩා ඉහළ වෙළඳපොළ හැකියාවක් හා නිෂ්පාදකයාට වඩා ඉහළ ප්‍රතිලාභ රැගෙන එන ඉහළ වටිනාකමක් සහිත සාම්ප්‍රදායික වී වර්ග හඳුන්වා දීමට ඇති හැකියාව විමසා බැලීමේ අවශ්‍යතාව අවධාරණය කිරීම මීට උදාහරණයකි. ප්‍රදේශය තුළ පුළුල් වෙමින් පවත්නා සංචාරක ව්‍යාපාරය වැනි කර්මාන්තවලට ප්‍රජාවන් සම්බන්ධ කළ හැකි ක්ෂේත්‍ර පිළිබඳවද අධ්‍යයනයෙන් විමසා බැලිණ.

මැදිහත් වීම් හැම විට ම ඉලක්ක ප්‍රජාවන් තුළම සිදු විය යුතු නොවේ. වටිනාකම් දාමයේ වෙනත් තැනකදී කෙරෙන මැදිහත් වීම්වලට ඉලක්ක ප්‍රජාවන්ගේ ජීවනෝපායන් වැඩි දියුණු කළ හැකි ධනාත්මක ආපිට සම්බන්ධතා නිර්මාණය කළ හැකිය. උදාහරණයක් ලෙස, ඉලක්ක ප්‍රජාවන්ට අයිස් නිෂ්පාදනාගාරයක් සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය සම්පත් හෝ යටිතල පහසුකම් නැතත් ප්‍රජාවකට යාබද සමීප ප්‍රදේශයක වෙසෙන වැඩි ව්‍යවසායික හැකියාවක් සහිත පුද්ගලයෙකුට සහාය දීමෙන් ප්‍රජාවක් ලබන මත්ස්‍ය අස්වැන්නේ රාක්ක ජීවකාලය සැලකිය යුතු ලෙස ඉහළ යා හැකි අතර, වැඩි මිලක් ඉල්ලා සිටීමට ප්‍රජාවන්ට හැකියාව ලැබේ.

ඉලක්ක ප්‍රජාවන් මෑතදී නැවත පදිංචි වූ වාතාවරණය සැලකිල්ලට ගෙන ව්‍යාපෘති චක්‍රය පුරා ගැටුම් සංවේදී ප්‍රවිෂ්ටයක් යොදාගැනීම තීරණාත්මක අවශ්‍යතාවකි. සිද්ධි අධ්‍යයන වැඩසටහන් තුනක් මාර්ග යෙන් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය සමග එක්ව CEPA ආයතනය මෑතදී අරඹා අවසන් කළ අධ්‍යයනයකින් (Diprose et al., 2010) වැඩසටහන් සමාජීය වාතාවරණයන්ට ප්‍රතිචාර දැක්වීමේ වැදගත්කම අවධාරණය කෙරිණ. වෙනත් වචනවලින් කිවහොත්, වැඩසටහන් සම්පාදනයේදී පවත්නා ආතතීන් විවෘත ගැටුම් බවට වර්ධනය නොවන පරිදි සමාජීය බලවේග සමග අන්තර් ක්‍රියා කළ හැකි ක්‍රම කෙරෙහි අවධානය යොමු කිරීමේත් එම ක්‍රම හැසිරවීමේත් වැදගත්කම අවධාරණය කෙරිණ. එය ඉලක්ක ප්‍රජාවේ විවිධත්වය අවබෝධ කරගැනීමේ වැදගත්කමද විවිධ ප්‍රමාණයෙන් වුවත් සියලු ජනවාර්ගික ප්‍රජාවන් ඉලක්කකර ගැනීමේ වැදගත්කමද(මින් අදහස් වන්නේ වැඩි 'වරප්‍රසාද භුක්ති විඳින' ජනවාර්ගික කණ්ඩායම් සහිත සුවිශේෂ ප්‍රදේශවලදී එම කණ්ඩායම්වල සිටින වඩා දුප්පත් සාමාජිකයන් කෙරෙහි අවධානය යොමු කෙරෙන බවයි) අභ්‍යන්තර අවතැන්වූවන් හා සත්කාරක ප්‍රජාව අතර පවත්නා ආතතීන්, ප්‍රදේශ අතර පවත්නා ආතතීන් (සංකීර්ණ හදිසි අවස්ථාවලින් පසුව සමහර ප්‍රදේශවලට නොකඩවාම අනෙක්වාට වැඩි ප්‍රමුඛතාවක් දෙනු ලැබේ) හා මෑතදී ප්‍රදේශයේ නැවත පදිංචි වූ කණ්ඩායම් අතර පවත්නා ආතතීන් වැනි ප්‍රාදේශීය කණ්ඩායම් අතර පවත්නා බෙදීම් සැලකිල්ලට ගැනීමේ වැදගත්කමද අදාළ ප්‍රජාවන් අතර ව්‍යාපෘති සම්පත් සාධාරණව බෙදී යන තත්ත්වයක් ඇති කිරීමට ප්‍රයත්න දැරීමේ වැදගත්කමද හඳුනා ගත්තේය.

රජය, ජාත්‍යන්තර ආධාර දෙන්නන් හා පෞද්ගලික අංශය අරමුදල් සපයන ව්‍යාපෘති හා ආයෝජන සැලකිය යුතු ප්‍රමාණයක් ජීවනෝපායන් වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය කෙරෙහි අවධානය යොමු කරමින් දිස්ත්‍රික්ක දෙක තුළ ක්‍රියාත්මක වේ.[9] එකම ව්‍යාපෘතිය දෙවරක් ක්‍රියාත්මක වීම වැළැක්වීම සඳහා, ව්‍යාපෘති අතර පවත්නා සහයෝගී අන්තර් ක්‍රියාවන් සොයාගෙන ඒවා ශක්තිමත් කිරීම සඳහා, එමෙන්ම වඩාත්ම වැදගත් කරුණ වන එකම වැරදි නැවත නැවත් නොකිරීම සඳහා සහ සංවර්ධන ක්‍රියාකාරකම්වලට වෙන් කෙරෙන සම්පත්වලින් උපරිම ප්‍රතිලාභ සලසා ගැනීමට මෙම ව්‍යාපෘතිවලින් ලද ඉගෙනුම අන්තර්ගත කිරීම සඳහා මෙම ව්‍යාපෘතිවලින් ලද අත්දැකීම් හා උගත් පාඩම් අනාගත සංවර්ධන මුල පිරීම්වලට ඇතුළත් කළ යුතුය. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS) සම්පාදනය කළ කාර්ය ලියවිල්ලක් මහා පරිමාණ පෞද්ගලික අංශය ආයෝජනයේදී ලබා ඇති සමහර අත්දැකීම් මුළුමනින්ම ධනාත්මක නොවන බව අවධාරණය කරයි (විජේසිංහ, 2009). "උදාහරණයක්

[9] ත්‍රිකුණාමල හා මඩකලපු දිස්ත්‍රික්ක උදෙසා මුල පිරූ USAID (CORE) ජීවනෝපාය තක්සේරුව (2009 මැයි) ජාත්‍යන්තර සංවිධාන හා ඔවුන්ගේ දේශීය හවුල්කරුවන් හරහා අරමුදල් සැපයෙන ආධාර දෙන්නන්ගේ ව්‍යාපෘති ඇතුළත් ලැයිස්තුවක් සම්පාදනය කරයි (www.core.zunepile.com වෙබ් අඩවියෙන් ලබාගත හැකිය).

ලෙස, CIC සමාගම සඳහන් කළේ දැඩි නිලධාරිතාන්ත්‍රික හිරිහැර කිරීම් නිසා සමහර මූලික අනුමැතීන් ලබා ගැනීම සඳහා අනුපිළිවෙළින් පියවරයන් 20ක් පමණ පසු කරමින් වසර 3ක පමණ කාලයක් ගත කිරීමට සිදුවූ බවයි. නැගෙනහිර ගොවීන් සමග අත් හැරීමේ මොඩලයක් යටතේ ක්‍රියාත්මක හේලීස් ඇග්රෝ සමාගම සඳහන් කළේ ප්‍රාදේශීය ගොවීන් උපකාර කිරීමේ ගිවිසුම් උල්ලංඝනය කරන බැවින් සමහර අවස්ථාවලදී ප්‍රාදේශීය වශයෙන් කැපවීම අභියෝගයක් බවයි. මෙම අභියෝගයන්ට මුහුණදීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාවන්ට අධ්‍යාපනය ලබාදීම අත්‍යවශ්‍යය. විශාල විධිමත් පෞද්ගලික අංශය තම ප්‍රදේශවලට පිවිසීම කෙරෙහි ඔවුන් සංවේදී කළ යුතුය. එමෙන්ම, පෞද්ගලික අංශය තර්ජනයක් ලෙස දකිනු වෙනුවට ඒවා සමග සාර්ථක හවුල්කාරිත්වයන් ගොඩනගා ගන්නා ආකාරය ගැන ඔවුන් දැනුවත් කළ යුතුය.”

පිටතට ගලායාම උපරිම කිරීම සඳහා ඉලක්ක ප්‍රජාව වෙළඳ හා කාර්මික ව්‍යවසායන් වැඩි ප්‍රමාණයක් සහිත ප්‍රාදේශීය මධ්‍යස්ථාන සමග සම්බන්ධ කිරීමට ඇති හැකියාව සොයා බැලිය යුතුය. මේ ව්‍යවසායන්ගෙන් වැඩි හරියක් පිහිටා තිබෙන්නේ කාත්තන්කුඩි නගර සභා බල ප්‍රදේශය සහ ත්‍රිකුණාමල හා මඩකලපු මහනගර සභා බලප්‍රදේශ වැනි වඩා නාගරික ප්‍රදේශවලද පාසිකුඩා, කල්කුඩා හා නිලාවැලි වැනි ජනප්‍රිය සංචාරක ගමනාන්තවලද වේ. අධ්‍යයනය කළ ප්‍රදේශවල වෙසෙන සංවර්ධන ව්‍යාපෘතීන්ට ඉලක්ක වන ප්‍රජාව ආහාර සැකසීමේ ව්‍යවසායන් සඳහා අමුද්‍රව්‍ය වශයෙන් නැවුම් පලතුරු, එළවළු හා කිරි සපයන්නන් ලෙසත් සුළු පරිමාණ ඇඟලුම් හා වෙනත් සුළු පරිමාණ කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සපයන්නන් ලෙසත් මෙම මධ්‍යස්ථාන සමග සම්බන්ධ කළ යුතුය. කාත්තන්කුඩි වැනි මෙම මධ්‍යස්ථානවලින් සමහරක් පුළුල් කිරීමට අවශ්‍ය භෞතික ඉඩකඩ නොමැතිකම පිළිබඳ ගැටලුවද මෙම මුලපිරීම් සමගින් ජයගත හැකි වේ.

ලබා දෙන සහායේ තිරසර භාවය සහතික කරනු පිණිස එම සහායට අදාළව අඛණ්ඩව ප්‍රජාවන් නිරීක්ෂණය කිරීම, විමසීම හා පසුවිපරමට ලක් කිරීම වැදගත්ය. රාජ්‍ය නොවන සංවිධාන සැපයූ සහාය ඇසුරින් උගත් අතීත පාඩම්වලින් ඔප්පු වන්නේ පසුවිපරම හා නිරීක්ෂණය නොමැති විට ව්‍යාපෘති අසාර්ථක වන බවයි. සමහර ප්‍රජාවන් ලද සාර්ථකත්වයන් පිළිබඳ කතා අනෙක් ඉලක්ක ප්‍රජාවන් සමග බෙදාහදා ගැනීමද වැදගත් වේ. උදාහරණයක් ලෙස, වාකරේ පිහිටි කුන්ජාන්කට්කුලම් ගම්මානය තුළ දුම්ගසා වියළා මාළු සැකසීමේ විධික්‍රමය සඳහා ඉහළ ඉල්ලුමක් පවතින්නේය යන පුවත අභ්‍යන්තර ධීවර කර්මාන්තයෙහි නිරත අනෙක් ප්‍රජාවන් සමග බෙදාහදා ගත යුතු වේ.

### 5.3.2 පොදුවේ බලපාන ගැටලු

#### *ගොවි/ධීවර නිෂ්පාදක කණ්ඩායම් ශක්තිමත් කිරීම*

යුද්ධයෙන් පසුව ජීවනෝපායන් නැවත ආරම්භ වෙමින් පවත්නා වාතාවරණයකදී ගොවි සංවිධාන හා ධීවර සමිති වැනි නිෂ්පාදක කණ්ඩායම් ශක්තිමත් කළ යුතුය/නිර්මාණය කළ යුතුය. අගය එකතු කිරීමෙහි හා අලෙවිකරණයෙහි නිරත විය හැකි පරිදි මෙම කණ්ඩායම් බලගැන්වෙන බව සහතික කිරීම වැදගත් වේ. අගය එකතු කිරීම, අලෙවිකරණය හා තත්ව පාලනය සම්බන්ධ පුහුණුව ගොවි සංවිධාන මාර්ගයෙන් සම්පාදනය කළ යුතුය. සන්නාම යෙදීම, ඇසිරීම හා ගබඩා කිරීම ආශ්‍රිත නව සරල තාක්ෂණික ක්‍රමද මෙම පුහුණුවට ඇතුළත් කළ යුතුය. වී, පලතුරු, එළවළු හා කිරි පට්ටි අංශ සඳහාද මෙවැනි පුහුණුවක් අත්‍යවශ්‍ය වේ. මීට අමතරව, ගංවතුර, නියගය හා සතුන්ගෙන් එල්ල වන තර්ජන වැනි ඇති විය හැකි උවදුරු හා පාරිසරික ගැටලුවලට මුහුණදීම/විසඳුම් සෙවීම සම්බන්ධ දැනුවත්කම හා පුහුණුවද පැවතිය යුතුය. මේ නිෂ්පාදක කණ්ඩායම්වල සාමාජිකයන් ප්‍රදේශයේ අස්වැන්න බාහිර වෙළඳපොළවල් වෙත අලෙවි කිරීම සඳහා ගොඩ නැගූ ගම්මට්ටමේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හිද කොටස්කරුවන් විය යුතුය.

#### *යටිතල පහසුකම්*

සියලු ඉලක්ක ප්‍රජාවන්හිදී යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම තීරණාත්මක අවශ්‍යතාවකි. මාර්ග නොපැවතීම නිසා ප්‍රදේශ අතර සම්බන්ධතාවක් නොමැතිකම, නිෂ්පාදනය කරන විධිය, රජයේ ප්‍රවාහන පහසුකම් දුර්වල තත්ත්වයක පැවතීම, විදුලිබල සැපයුම දුර්වල වීම, භෞතික වෙළඳ මධ්‍යස්ථාන නොමැතිකම හා කුඩා වැව් ජරාවාස වීම යනු සියලු උපඅංශ මුහුණ දෙමින් සිටින යටිතල පහසුකම් ආශ්‍රිත බාධාවෝ වෙති. 'ඒ' වර්ගයේ හා 'බී' වර්ගයේ මාර්ග වැඩිදියුණු කිරීම සඳහා නැගෙනහිර පළාත

තුළ විශාල සංවර්ධන වැඩසටහන් පවතී. කෙසේ වෙතත්, ප්‍රජාවන් අතර සම්බන්ධතාව වැඩි දියුණු වීමට නම් ග්‍රාමීය මාර්ග නැවත ගොඩනැගිය යුතු වේ. ගොවිබිම ප්‍රධාන මාර්ග සමග සම්බන්ධ කරන මාර්ග නැවත ඉදි කළ යුතුය. වැව් පුනරුත්ථාපනය, කෘෂිකර්මය සඳහා පවත්නා අවහිරතා ඉවත් කර දෙකන්නයේදීම බෝග වගාවෙහි නිරත වීමටත් අභ්‍යන්තර ධීවර කර්මාන්තය උපරිම මට්ටම දක්වා දියුණු කිරීමටත් අවස්ථාව සම්පාදනය කරනු ඇත. විදුලි බලය නොමැති හෝ විදුලි බලය විටින් විට වෙනස් වන ප්‍රජාවන් තුළ අගය එකතු කිරීම සඳහා පවත්නා අවස්ථා සීමිතය. වී කෙටීම සඳහා අවස්ථා සහ අගය එකතු කිරීමට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර සම්පාදනය කිරීම වැනි සමහර මැදිහත් වීම් ඒ සඳහා අවශ්‍ය විදුලි බල සැපයුම නොමැතිව සිදු කළ නොහැකි වේ. මෙම ගම්මානවලට විදුලි බලය සැපයිය හැකි ක්‍රම සොයා බැලිය යුතුය.

*මූල්‍ය සේවා*

කිනම් උපඅංශයක් වුව තිරසර වීමට නම් මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය වැඩි දියුණු කළ යුතු වේ. මෙය ණය මත රඳා පැවතීමේ දුෂ්ට චක්‍රයෙන් මිදීමට නිෂ්පාදකයන්ට උදව් වනු ඇත. ගොවි මෙන්ම කෘෂිකාර්මික නොවන නිෂ්පාදකයන්ට හා ව්‍යවසායන්ටද ක්ෂුද්‍ර ණය සම්පාදනය කළ යුතුය. සංවර්ධන ව්‍යාපෘතිවලින් ක්ෂුද්‍ර ණය සැපයෙන තැන්වලදී සහාය අවශ්‍ය කරන ඒ ඒ දුප්පත් ගොවියාට හා ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්වලට ගැළපෙන පරිදි සැකසූ ක්ෂුද්‍ර ණය සම්පාදනය කිරීම වැදගත් වේ. පවත්නා විධිමත් මූල්‍ය සේවාවන් සහ විධිමත් මූල්‍ය සේවාවන් සම්බන්ධ ක්‍රියා පටිපාටි හා ලියකියවිලි ක්‍රියාවලි පිළිබඳව ප්‍රජා මට්ටමේදී දැනුවත්කම ඉහළ නැංවීමට මුල පිරිය යුතුය. සුවිශේෂ සංවර්ධන මැදිහත්වීම් යටතේ මූල්‍ය සහාය සම්පාදනය නොවන තැන්වලදී ඒ සඳහා සුදුසුකම් සහිත ප්‍රතිලාභීන් ක්ෂුද්‍ර ණය පහසුකම් සපයන වෙනත් රජයේ ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන වෙත යොමු කළ හැකිය.

### 5.3.3 උපඅංශ අනුව නිර්දේශ

පහත සඳහන් නිර්දේශ සාම්ප්‍රදායික කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන වටිනාකම් දාමවල සිටින ගොදුරු වීමට ඉඩ ඇති කාන්තාවන්ගේ හා පිරිමින්ගේ තත්වය වැඩි දියුණු කිරීම සඳහා මුල පිරිය හැකි මැදිහත් වීම් ඉස්මතු කර දක්වයි. පහත දැක්වෙන 5.3 වගුව වටිනාකම් දාමය සමන්විත ප්‍රධාන අංශ අනුව පැවතිය හැකි විසඳුම් සිතියම්ගත කරන අතර, ඒවා ක්‍රියාත්මක කළ හැකි ආයතන වර්ග හඳුනාගනියි. අනතුරුව මෙම කොටස ඒ ඒ අංශයට අදාළව යෝජනා කෙරෙන විසඳුම් වඩා සවිස්තරාත්මකව විස්තර කරයි.

**5.3 වගුව: වටිනාකම් දාමයට හා ක්‍රියාත්මක කිරීම සඳහා පැවතිය හැකි ආයතනවලට සම්බන්ධ කරමින් විසඳුම් සිතියම්ගත කිරීම**

| පැවතිය හැකි විසඳුම් | යෙදවුම් නිෂ්පාදකයෝ | සකසන්නෝ | අලෙවිකරණය හා විකුණුම් | ආයතන |
|---|---|---|---|---|
| වී වගා උපඅංශය - ඵලදායිතාව අඩු වීමට විසඳුම් | | | | |
| ඉඩම් ආරාවුල් විසඳීමේ යන්ත්‍රණයන් ශක්තිමත් කර ඉඩම වෙත ප්‍රවේශය විධිමත් කිරීම | | | | සංවර්ධන ආයතන, DOAS, DS |
| කුඩා වැව් හා වෙනත් වාරිමාර්ග යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම හා නිතිපතා නඩත්තු කිරීම | | | | සංවර්ධන ආයතන |

| | | | | |
|---|---|---|---|---|
| පොහොර සහනාධාරය වෙත ප්‍රවේශවීම පිළිබඳ දැනුවත්කම ඉහළ නැංවීම | | | | සංවර්ධන ආයතන |
| බිත්තර වී මිලදී ගැනීම පිළිබඳ දැනුවත්කම වැඩි කිරීම සහ ප්‍රාදේශීය බිත්තර වී නිෂ්පාදකයන්ට තාක්ෂණය හා පුහුණුව සපයා සහාය දීම. | | | | සංවර්ධන ආයතන, DOA, DOAS |
| **වී වගා උපඅංශය - අගය එකතු කිරීම අඩු වීමට විසඳුම්** | | | | |
| ප්‍රාදේශීය ප්‍රජාවන්ට සමීපව, වී කෙටීමේ අවස්ථා සම්පාදනය කිරීම | | | | සංවර්ධන ආයතන |
| සහල් පදනම් කර ගත් සුළු පරිමාණ නිෂ්පාදනයට හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට සහාය දීම | | | | සංවර්ධන ආයතන |
| ප්‍රාදේශීය මට්ටමේදී ගබඩා පහසුකම් සංවර්ධනය කිරීමට හා ගබඩා පහසුකම් ඉදි කිරීමට සහාය විය හැකි ප්‍රාදේශීය පුද්ගලයන් හඳුනාගැනීම | | | | සංවර්ධන ආයතන |
| මෙම නිෂ්පාදන අලෙවි කිරීමේ නිරත වීමේ දිගු කාලීන අභිමතාර්ථය ඇතිව දහයියා හා නිවුඩ්ඩ වැනි අපතේ යන ද්‍රව්‍ය සඳහා පැවතිය හැකි වෙළඳ පොළවල් පිළිබඳව තොරතුරු සැපයීම | | | | සංවර්ධන ආයතන |
| **වී වගා උපඅංශය - අලෙවි කිරීමේ හැකියාව අඩු වීමට විසඳුම්** | | | | |
| ගොවිපොළ පාරවල් වැඩි දියුණු කිරීම | | | | ප්‍රාදේශීය බලධාරි ආයතන |
| ප්‍රජාවන් වෙනත් ක්ෂුද්‍ර ණය සම්පාදකයන් සමග සම්බන්ධ කිරීම හා ඒ ඒ ප්‍රතිලාභීන්ට ගැළපෙන පරිදි සකස් කළ ක්ෂුද්‍ර ණය සම්පාදනය කිරීම | | | | සංවර්ධන ආයතන |
| ජීවනෝපායන් විවිධාංගීකරණය කිරීම සඳහා සහාය සැපයීම | | | | සංවර්ධන ආයතන, DOA, DOAS |

| | | | | |
|---|---|---|---|---|
| ඉහළ වටිනාකමක් සහිත සාම්ප්‍රදායික වී වර්ග හඳුන්වා දීම | | | | සංවර්ධන ආයතන |
| මිල ගණන් හා සිටිය හැකි මිලදී ගන්නන් පිළිබඳ වෙළඳ පොළ තොරතුරු සැපයීම | | | | සංවර්ධන ආයතන |
| පිටස්තර දිස්ත්‍රික්ක සමග වෙළඳපොළ සම්බන්ධතා ඇති කිරීම | | | | සංවර්ධන ආයතන |
| වී අලෙවි කිරීමට උදව් කිරීම සඳහා පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වයන්ට (උදා, කාගිල්ස්, CIC) පහසුකම් සැපයීම | | | | සංවර්ධන ආයතන |
| එළවළු හා පලතුරු අංශය | | | | |
| දේශීය කෘෂිකාර්මික බලධාරී ආයතනවල - DOA හා DOAS - සහ ප්‍රජා මට්ටමේ බීජ නිෂ්පාදන හැකියාව වැඩි කිරීම | | | DOA, DOAS, සංවර්ධන ආයතන | |
| කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම | | | සංවර්ධන ආයතන | |
| ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති හඳුන්වාදීම සඳහා ආරම්භක ප්‍රාග්ධන සහාය | | | සංවර්ධන ආයතන | |
| ව්‍යාප්ති නිලධාරීන් සංඛ්‍යාව වැඩි කිරීම හා වඩා හොඳින් ක්‍රියාත්මක වීමට ප්‍රමාණවත් සම්පත් සැපයීම | | | DOAS, DOA, සංවර්ධන ආයතන | |
| ව්‍යාප්ති නිලධාරීන්ගේ හැකියාවන් ගොඩ නැගීම | | | සංවර්ධන ආයතන | |
| සාම්ප්‍රදායික ආහාර සැකසුම් විධික්‍රම සඳහා ප්‍රාග්ධන සහාය සැපයීම | | | සංවර්ධන ආයතන | |
| අගය එකතු කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම | | | සංවර්ධන ආයතන, කර්මාන්ත දෙපාර්තමේන්තුව, | |
| ප්‍රජා මට්ටමේදී එළවළු සැකසීමේ යන්ත්‍රණයන් සම්පාදනය කිරීම | | | සංවර්ධන ආයතන | |

| | | | | |
|---|---|---|---|---|
| ජලය අඩුවෙන් අවශ්‍ය කරන පහතරට එළවළු ප්‍රවර්ධනය කිරීම | | | සංවර්ධන ආයතන | |
| මිශ්‍ර බෝග වගාව හා අන්තර් බෝග වගාව හඳුන්වා දීම | | | සංවර්ධන ආයතන | |
| බෝග විවිධාංගීකරණය හා අන්තර් වාරික එළවළු වගාව | | | සංවර්ධන ආයතන | |
| යොදා ගත හැකි අගය එකතු කිරීමේ විධික්‍රම පිළිබඳ දැනුවත්කම වර්ධනය කිරීම | | | සංවර්ධන ආයතන | |
| කිරි පට්ටි හා පශු සම්පත් අංශය | | | | |
| බලශක්තිය (විදුලි බලය) වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම හා මාර්ග වැඩි දියුණු කිරීම | | | මෙම ප්‍රදේශවලට විදුලි බලය සපයන ලෙස සංවර්ධන ආයතන වගකිව යුත්තන්ට බලපෑම් කිරීම | |
| කිරි අස්වැන්න වැඩිකිරීම සඳහා තණබිම් පුනරුත්ථාපනය කිරීම | | | රජයේ දෙපාර්තමේන්තු, සංවර්ධන ආයතන | |
| කිරි අස්වැන්න වැඩි කිරීම සඳහා වැඩිදියුණු තෘණ වර්ග හඳුන්වා දීම | | | DAHP, සංවර්ධන ආයතන | |
| කිරි අස්වැන්න වැඩි කිරීම සඳහා හොඳ ගුණාත්මක තත්වයේ දෙමුහුම් සත්ව වර්ග හඳුන්වා දීම | | | සංවර්ධන ආයතන | |
| උපකරණ මිලදී ගැනීම හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ආරම්භ කිරීම සඳහා ආරම්භක ප්‍රාග්ධනය සැපයීම | | | සංවර්ධන ආයතන | |
| පුහුණුව හරහා තාක්ෂණය පැවරීම | | | සංවර්ධන ආයතන, ප්‍රාදේශීය බලධාරි ආයතන | |
| සහාය දෙන ආයතනවල මානව සම්පත් වැඩි කිරීම | | | පළාත් කෘෂිකර්මය, සංවර්ධන ආයතනවල සහාය | |
| සමුපකාර කළමනාකරණ පද්ධති විධිමත් කිරීම | | | DAHP, සමුපකාර නිලධාරීහු | |

| | | | | |
|---|---|---|---|---|
| කිරි එකතු කිරීමේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ප්‍රජාව විසින් පාලනය කෙරෙන අලෙවි සල් පිහිටුවීම හා සෘජුව අලෙවි කිරීම සඳහා ඒවා ප්‍රාදේශීය ආපන ශාලා, අවන් හල්, කිරි හල් හා හෝටල සමග සම්බන්ධ කිරීම | | | සංවර්ධන ආයතන, ප්‍රාදේශීය බලධාරී ආයතන | |
| අභ්‍යන්තර ධීවර කර්මාන්ත උපඅංශය | | | | |
| ග්‍රාමීය මාර්ග වැඩිදියුණු කිරීම | | | ප්‍රාදේශීය බලධාරී ආයතන | |
| තෝරා ගත් කණ්ඩායම්වලට ආරම්භක ප්‍රාග්ධනයක් ලෙස ක්ෂුද්‍ර ණය සම්පාදනය කිරීම | | | සංවර්ධන ආයතන | |
| කුඩා වැව් පුනරුත්ථාපනය කිරීම හා ඒවා නඩත්තු කිරීමේ කටයුතුවලදී ප්‍රජාවන්ට සහාය වීම | | | සංවර්ධන ආයතන, ප්‍රාදේශීය බලධාරී ආයතන | |
| ප්‍රාදේශීය මට්ටමේදී ඇඟිල්ලන් බෝ කිරීමට සහ ක්ෂුද්‍ර පරිමාණ බෝ කිරීමේ ස්ථාන හා ක්ෂුද්‍ර පරිමාණ තවාන් ඉදිකිරීමට ඇති හැකියාව සොයා බැලීම | | | සංවර්ධන ආයතන | |
| සැපයෙන සතුන් ප්‍රමාණය හා සත්ව වර්ගවල ගුණාත්මකත්වය වැඩිදියුණු කිරීම සඳහා පවත්නා දිස්ත්‍රික්ක මට්ටමේ අභිජනන මධ්‍යස්ථානවලට මූල්‍ය හා තාක්ෂණික සහාය සැපයීම | | | සංවර්ධන ආයතන | |
| ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්වලට/ඔවුන්ට සහාය වන අයට ධීවර ආම්පන්න සැපයීම | | | සංවර්ධන ආයතන | |
| මසුන් රෝපණය කිරීමේ නව විධික්‍රම පිළිබඳව පුහුණු සැපයීම | | | ධීවර දෙපාර්තමේන්තුව, සංවර්ධන ආයතන | |
| සම්පත් කළමනාකරණය හා පමණ ඉක්මවා මසුන් ඇල්ලීම නතර කිරීම පිළිබඳව දැනුවත්කම ඇති කිරීම | | | ධීවර සමිති, සංවර්ධන ආයතන | |

| | | | | |
|---|---|---|---|---|
| ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ හා තත්ව පාලන යන්ත්‍රණයන් හඳුන්වා දීමේ අභිමතාර්ථය ඇතිව (විශේෂයෙන්ම පෞද්ගලික අංශය තුළ) රෝපණ ධීවර කර්මාන්තය පිළිබඳ දැනුවත්කම ඉහළ නැංවීම | | | ධීවර දෙපාර්තමේන්තුව, සංවර්ධන ආයතන | |
| ගොවි කණ්ඩායම් සමග ඒකාබද්ධ වූ ධීවර සමිති ඇති කිරීම සහ/හෝ ශක්තිමත් කිරීම | | | සංවර්ධන ආයතන | |
| අගය එකතු කළ නිෂ්පාදන සඳහා සන්නාම යෙදීම වැඩි දියුණු කිරීම - වෙළඳ නාමයක් හා ඇසුරුමක් හඳුන්වා දීම | | | සංවර්ධන ආයතන | |
| 'පොළ' වැනි පවත්නා ප්‍රාදේශීය වෙළඳපොළවල් සමග සම්බන්ධතා ඇති කිරීම, දිස්ත්‍රික්කය තුළ පිහිටි නාගරික මධ්‍යස්ථානවල අලෙවි සල් පිහිටුවීම හා නිෂ්පාදකයන් ඒවාට සම්බන්ධ කිරීම | | | සංවර්ධන ආයතන | |
| සාගරික ධීවර කර්මාන්ත අංශය | | | | |
| ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තයෙහි එනම් යාත්‍රා, උපකරණ හා සහායක සේවාවන්හි ආයෝජනය කිරීමට උනන්දුවක් දක්වන ආයතනයන්/පුද්ගලයන් හඳුනා ගෙන ධීවර ප්‍රජාව සමග සම්බන්ධ කිරීම | | | සංවර්ධන ආයතන | |
| දුප්පත් ධීවර ජනයාට ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සම්පාදනය කිරීම | | | ධීවර සමිති සමග එක්ව කටයුතු කරන සංවර්ධන ආයතන | |
| සහායක සේවාවන් (අයිස් නිෂ්පාදනාගාර, බෝට්ටු නිපදවීම යනාදිය) සම්පාදනය කිරීම සඳහා ව්‍යවසායික පුද්ගලයන් හඳුනා ගැනීම සහ පුහුණුව හා ආරම්භක ප්‍රාග්ධන පහසුකම් සැපයීම | | | සංවර්ධන ආයතන | |

| | | | | |
|---|---|---|---|---|
| ධීවර ආම්පන්න සහ ධීවර යාත්‍රා හා උපකරණ සඳහා ප්‍රාග්ධනය හා තාක්ෂණික සහාය සැපයීම | | | සංවර්ධන ආයතන | |
| එක් දින යාත්‍රා බහුදින යාත්‍රා බවට පරිවර්තනය කිරීම සඳහා සහාය දීම | | | සංවර්ධන ආයතන | |
| ඒ ඒ වාරිකවලට ගැළපෙන පරිදි සකස් කළ සුවිශේෂ ධීවර ආම්පන්න සම්පාදනය කිරීම | | | සංවර්ධන ආයතන, ධීවර දෙපාර්තමේන්තුව | |
| අවාරයේදී විකල්ප/ද්විතීය ජීවනෝපායන් හඳුන්වා දීම | | | සංවර්ධන ආයතන | |
| ශෝධක මසුන් හැසිරවීම පිළිබඳ පුහුණු සැපයීම | | | සංවර්ධන ආයතන, ධීවර දෙපාර්තමේන්තුව | |
| රෝපණ ධීවර කර්මාන්තය හඳුන්වා දීම | | | සංවර්ධන ආයතන | |
| ප්‍රජා මට්ටමේදී ටින් මාළු සැකසීම වැනි අගය එකතු කිරීම් හඳුන්වා දීම/ව්‍යාප්ත කිරීම | | | සංවර්ධන ආයතන | |
| මූල්‍ය කළමනාකරණය හා අලෙවිකරණය පිළිබඳ පුහුණුව | | | සංවර්ධන ආයතන | |
| ජංගම දුරකථන මගින් මිල තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රවේශ වීමට පහසුකම් සැපයීම | | | සංවර්ධන ආයතන | |
| ඉහළ වටිනාකමක් සහිත ධීවර අස්වනු හා රෝපණ මත්ස්‍යයන් අලෙවි කිරීම සඳහා වැඩි මිලදී ගැනීමේ හැකියාවක් සහිත වෙළඳ පොළවල් හඳුනා ගෙන සම්බන්ධතා ඇති කිරීම | | | සංවර්ධන ආයතන | |
| පෞද්ගලික අංශය සමග සෘජු වෙළඳපොළ සම්බන්ධතා ඇති කරගැනීමට පහසුකම් සැපයීම | | | සංවර්ධන ආයතන | |

***පොදුවේ බලපාන විසඳුම - කුඩා වැව් සඳහා ඒකාබද්ධ ගොවිතැන් ක්‍රමය***

කුඩා වැව් සාමාන්‍යයෙන් අයත් විය යුත්තේ ඉන් ප්‍රතිලාභ ලබන පවුල් 50-150ක් සහිත ප්‍රජාවකටය. වී වගාවේ ඒකාබද්ධ ගොවිතැන් ප්‍රවිෂ්ටය කුඩා වැව් ආශ්‍රිතව පහසුවෙන් යොදා ගත හැකිය. කව්පී, මුං ඇට හා සෝයා බෝංචි වැනි අන්තර් වාරික කෙටි කාලීන එළවළු/ධාන්‍ය වර්ග ඉතිරිව තිබෙන තෙතමනය සමගින් වගා කළ හැකිය. මේ මාදිලියේ ගොවිතැනට ඉතාම සුදුසු වන්නේ ගවයා හා

එළුවා වැනි පශු සම්පත්ය. වැව උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සඳහා කුඩා වැව්වලට මසුන් හඳුන්වා දිය හැකිය. උලා කන සතුන්ගෙන් එය ආරක්ෂා කිරීම සඳහා වගාව වටා පැළඉනි වැටක් යෙදීම වැදගත් වේ.

මෙම ගොවිතැන් ක්‍රමයෙහි වාසි ගණනාවක් ඇත. එය වසර පුරා ආදායමක් සපයමින් වාරිකත්වය නිසා ඇති වන ගැටලු ජයගැනීමට ගොවීන්ට උදව් කරයි. මේ අන්තර් වාරික රනිල එළවළු වගාව වඩා යහපත් පාංශු පෝෂක කළමනාකරණයකට උදව් වන අතර, ගොවියාට භූමි ඒකකයකින් වැඩි ප්‍රතිලාභ අත් කර දෙන වගා සූක්ෂ්මතාව වැඩි කරයි. මෙය වාරි ජලයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කළ හැකි තවත් ක්‍රමයකි. සත්ව අපද්‍රව්‍ය වගාව සඳහා පොහොරක් ලෙස හා අස්වනුවල ඉතිරිපහඳු හා පැළඉණි වැටවල් සත්ව ආහාර ලෙස යොදාගත හැකි අතර, මෙය සමස්ත පද්ධතියේම නිෂ්පාදන පිරිවැය අඩු කරනු ඇත. වැව් මාළු ගොවි පවුල්වලට ප්‍රමාණවත් සත්ව ප්‍රෝටීන වෙත ප්‍රවේශයක් සපයනු ඇත. කෙසේ වෙතත්, ඒකාබද්ධ පද්ධති හඳුන්වා දෙන විට ප්‍රජාවන් තුළ සිටින ගොවීන්ගේ සාම්ප්‍රදායික සාරධර්ම පද්ධති හා විශ්වාසයන් සැලකිල්ලට ගත යුතුය. උදාහරණයක් ලෙස, මස් සඳහා පශු සම්පත් පාලනය සිදුනොවන ප්‍රජාවකදී එළු පාලනය හඳුන්වා දීම සාර්ථක නොවනු ඇත. වගාව සඳහා ජලය සපයන වැව මිරිදිය මසුන් ඇති කිරීම හා මසුන් ඇල්ලීමේ නිරතවීම සඳහා යොදාගැනීම සමහර ප්‍රජාවන් විසින් ප්‍රතික්ෂේප කළ හැකිය.

### *1. වී වගා උපඅංශය*

මෙම විශ්ලේෂණය වී වගා උපඅංශයෙන් වැඩි හා තිරසර ආදායමක් උපදවා ගැනීමේ ක්‍රමයක් ලෙස, අ) ඵලදායිතාව වැඩි කිරීම, ආ) අගය එකතු කිරීම වැඩිදියුණු කිරීම හා ඇ) අලෙවි කිරීමේ හැකියාව වැඩි කිරීම හඳුනා ගනියි. දිස්ත්‍රික්ක දෙකෙහි පවත්නා අතිරික්ත නිෂ්පාදන මට්ටම් හා නිෂ්පාදන පරිමාව වැඩි වීමේ ප්‍රවණතාව නිසා නිෂ්පාදනය වැඩි කිරීම සඳහා තවදුර පරිශ්‍රමයන් දැරීමට දිරි නොගැන්වේ. සහල්වලට/සහල් පදනම් කරගත් අගය එකතු කළ නිෂ්පාදනවලට සම්බන්ධිතව වෙනත් ආදායම් උත්පාදන අවස්ථාවන් සම්පාදනය කිරීම, වෙනත් ජීවනෝපාය මාදිලීන්හි නිරත වීම හා වඩා සාධාරණ වෙළඳපොළ සම්බන්ධතා තහවුරු කිරීම දිරිගැන්වේ.

### *අ) ඵලදායිතාව වැඩි කිරීම*

#### *ඉඩම වෙත ප්‍රවේශය විධිමත් කිරීම*

ඉඩම් ආරාවුල්වලට විසඳුම් සැපයීම සඳහා විධික්‍රමයන් හා යන්ත්‍රණයන් හඳුන්වාදී මෙන් ගොවීන්ගේ උනන්දුවේ මට්ටම දෙයාකාරයකින් වැඩි වේ. පළමුව, ඉඩමේ සාරවත් බව කළමනාකරණය කිරීම සඳහා ආයෝජනය කිරීමට හා වගා කළ ඉඩමේ තිරසර භාවය පවත්වා ගැනීමට පොලඹවන දිරි දීමක් පවතිනු ඇත. දෙවනුව, ඉඩම වෙත පවත්නා ප්‍රවේශය විධිමත් කිරීමෙන් අදහස් වන්නේ රජයෙන් සැපයෙන ගුණාත්මක පොහොර හා බිත්තර වී සහනාධාර වෙත වඩා පහසුවෙන් හා නිසිකලට ප්‍රවේශ වන බව නිසා එමගින් කුඹුරු ඉඩමෙන් ලැබෙන අස්වැන්න ඉහළ යනු ඇත.

#### *කුඩා වැව් හා වෙනත් වාරිමාර්ග යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා නිතිපතා නඩත්තු කිරීම*

දිස්ත්‍රික්ක දෙකෙහි පවත්නා කුඩා වැව් හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ වැව්වලට වැඩි සේවයක් ඉලක්ක ප්‍රජාවන්ට සලසන නමුත් වර්තමානයේදී බාහිර ක්‍රියාකාරකයන් වැඩි අවධානයක් යොමු කරන්නේ මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ වැව් පුනරුත්ථාපනය කිරීම කෙරෙහිය. කුඩා වැව් පුනරුත්ථාපනය කොට නිතිපතා නඩත්තු කිරීම වැදගත් වන අතර, අදාළ බලධාරි ආයතන හා වැව් රැක බලා ගැනීමෙහි නිරතව සිටින ප්‍රජාවන් අතරේදී වැදගත් කරුණක් ලෙස ඉස්මතු කළ යුතුය. මෙහි ප්‍රතිඵලයක් ලෙස කලට වේලාවට හා ප්‍රමාණවත් ලෙස ජලය ලැබීමෙන් කුඹුරු ඉඩම්වල ඵලදායිතාව වැඩි වේ. ගොවි සංවිධාන හරහා ගොවීන් සම්බන්ධ වීමෙන් බාහිර ක්‍රියාකාරකයෙකු නොමැතිව වුව වාරිමාර්ග ආශ්‍රිත යටිතල පහසුකම් නොකඩවා නඩත්තු කෙරෙන බව සහතික වේ.

*ගුණාත්මක යෙදවුම් (බිත්තර වී හා පොහොර) වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම*

ස්වාධීන ගොවීන් මෙන්ම අඳ ගොවීන්/බද්දට වගා කරන්නන් අඩු පිරිවැයකින් හොඳ ගුණාත්මක තත්වයේ බිත්තර වී කලට වේලාවට ලබාගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුවත්කම ඉහළ නැංවිය යුතුය. දැනට බිත්තර වී නිෂ්පාදනයේ නිරතව සිටින ප්‍රාදේශීය මට්ටමේ බිත්තර වී නිෂ්පාදකයන්ට නව තාක්ෂණය පිළිබඳ පුහුණු හා ආරම්භක ප්‍රාග්ධනය සම්පාදනය කර සහාය වීමෙන් බිත්තර වී පැවතීම වැඩි වනු ඇත.

*ආ) අගය එකතු කිරීම*

*ගබඩා පහසුකම් වැඩි කිරීම*

වී, බිත්තර වී හා පොහොර ගබඩා කිරීමට පහසුකම් සැපයීම සඳහා ප්‍රජාවට වඩා සමීපව ගබඩා පහසුකම් සම්පාදනය කළ යුතුය. ප්‍රජාව සමග බෙදාහදා ගන්නා ගබඩා පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය පුද්ගලයන් හඳුනා ගෙන සහාය දීමෙන් හෝ ඉලක්ක ප්‍රජාවන්ට වඩා සමීපව වී/බිත්තර වී/පොහොර ගබඩා ඉදි කිරීමෙන් කන්න/වාරික ක්‍රමය නිසා ඇති වන වී මිල කම්පනයන්ගෙන් ගොවීන් ආරක්ෂා වේ. ඉන් ඔවුන්ට අස්වනු අතිරික්තය හිස් කිරීම සඳහාත් නිසි වෙළඳපොළ මිල ලැබෙන තෙක් පොරොත්තු වීම සඳහාත් ඉඩකඩක් සම්පාදනය වේ. ඊළඟ කන්නයට අවශ්‍ය බිත්තර වී ගබඩා කර තැබීමටද ගොවීන්ට හැකියාව ලැබෙන අතර, එමගින් ඔවුන් යෙදවුම් සපයන්නන් මත රඳාපැවතීම අඩු වේ.

*වී හා සහල් කෙටීම සඳහා ප්‍රජාවන්ට වඩා සමීපව අවස්ථා සම්පාදනය කිරීම*

මට්ටම් තුනකදී වීවලට අගය එකතු කිරීම අපේක්ෂා කෙරේ. එනම්, සහල්, සහල්පිටි පදනම් කරගත් නිෂ්පාදන (උදා. ආප්ප, ඉඳි ආප්ප හා පිට්ටු) හා වී ආශ්‍රිත අපතේ යන ද්‍රව්‍ය (දහයියා හා නිවුඩ්ඩ) පදනම් කරගත් නිෂ්පාදනයි. අගය එකතු කිරීමේ ක්‍රියාවලිවලට පවතින තාක්ෂණික හා ප්‍රාග්ධනමය බාධාවන් දෙයාකාරයකින් ජයගත හැකිය. එකක් නම්, අගය එකතු කිරීම සඳහා ප්‍රාග්ධනය හා අත්දැකීම් සපයා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් වැනි පුද්ගලයන්දිරි ගන්වා ඔවුන්ගේ ක්‍රියාකාරකම් පුළුල් හා වැඩි දියුණු කිරීම සහ වටිනාකම් දාමයේ නිෂ්පාදක මට්ටමේ සිටින්නන්ගේ ශ්‍රමය හා වී ලබාගෙන ඔවුන් එම ක්‍රියාකාරකම්වලට ඒකාබද්ධ කර ගැනීමයි. දෙවැන්න නම්,ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ වැනි සහල් හා සහල්පිටි පදනම් කරගත් සුළු පරිමාණ නිෂ්පාදකයන් ලාභ බෙදාහදා ගැනීමේ පදනමක් මත සම්බන්ධ කරගනිමින් ප්‍රජාමූල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට මුල පිරීමයි. මෙම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රාදේශීය වෙළඳපොළවල් හා දිගු කාලයේදී නාගරික මධ්‍යස්ථාන සමග සම්බන්ධ කර ඒවායේ තිරසර භාවය සහතික කළ යුතු වේ.

*ඉහළ වටිනාකමක් සහිත සාම්ප්‍රදායික වී වර්ග හඳුන්වා දීම*

දැනටමත් නිපුණතාවන් තිබෙන ප්‍රජාවන් තුළදී ආරම්භයක් ලෙස නියමු පදනමක් මත ඉහළ වටිනාකමක් සහිත සාම්ප්‍රදායික වී වර්ග හඳුන්වා දීමෙන් ඔවුන්ට වැඩි ප්‍රතිලාභ අත්වනු ඇත. සාම්ප්‍රදායික වී වර්ගවලින් ලැබෙන්නේ වඩා අඩු අස්වැන්නක් වුවත් ඒවායේ වෙළඳපොළ මිල ගණන් වඩා ඉහළ මට්ටමක පවතින අතර, ඉහළ මිලදී ගැනීමේ හැකියාවක් සහිත වෙළඳපොළවල් සමග සම්බන්ධ කළ විට හාමුල පිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය හා යෙදවුම් සම්පාදනය කළ විට වී නිෂ්පාදකයන් සාමාන්‍ය වී වර්ගවලින් බැහැර වී ඒවායේ මිල ඉහළ පහළ යාම් නිසා ඇති වන බලපෑම්වලින් ආරක්ෂා වනු ඇත.

*ඇ) අලෙවි කිරීමේ හැකියාව වැඩි කිරීම*

*සුදුසු වෙළඳ පොළවල් හඳුනාගැනීම*

ප්‍රාදේශීය මට්ටමෙන් මෙන්ම දිස්ත්‍රික්කයෙන් පිටතද වී හා අගය එකතු කළ නිෂ්පාදන සඳහා සුවිශේෂ වෙළඳපොළ අවස්ථා හඳුනාගත යුතුය. සහල්පිටි පදනම් කරගත් ආප්ප වැනි නිෂ්පාදනයන් සඳහා දේශීය සංචාරකයන් අතර ප්‍රචලිත ප්‍රදේශ ඉලක්ක කරගත හැකිය. ඉහළ වටිනාකමක් සහිත සාම්ප්‍රදායික වී වර්ග සඳහා සංචාරක ව්‍යාපාරය හා ඉහළ මිලදී ගැනීමේ හැකියාවක් සහිත ප්‍රාදේශීය නාගරික වෙළඳපොළවල් ඉලක්ක කර ගත යුතුය. වී වලින් කෙරෙන අතුරු නිෂ්පාදන සඳහා වෙළඳ පොළවල්

වනු ඇත්තේ දත් බෙහෙත්, විස්කෝතු හා සත්වාහාර නිෂ්පාදකයන්ය. පෞද්ගලික අංශය සමග (උදාහරණයක් ලෙස, කාගිල්ස් හා CIC වැනි සමාගම් සමග) සම්බන්ධතා ඇති කර ගත හැකි අවස්ථා හඳුනාගෙන එම අංශය සමගද සම්බන්ධතා ඇති කරගත යුතු වේ. පෞද්ගලික අංශයේ සමාගම් ආපිට මිලදීගැනීමේ පද්ධති කෙරෙහි දැනටමත් උනන්දුවක් පෙන්නුම් කරන හෙයින් හා ගැටුමෙන් පීඩාවට පත් උතුරු නැගෙනහිර නිෂ්පාදකයන් සමග හවුල්කාරිත්වයන් ගොඩනගා ගනිමින් සිටින හෙයින් මේ ඉඩකඩ ගැන සොයා බැලිය යුතු වේ.

### *වෙළඳපොළ තොරතුරු සම්පාදනය කිරීම හා වෙළඳපොළවල් සමග සම්බන්ධ කිරීම*

මිල ගණන් හා සිටිය හැකි මිලදී ගන්නන් පිළිබඳව නිවැරදි යාවත්කාලීන තොරතුරු සම්පාදනය කළ විට නිෂ්පාදකයන් සූරාකෑමේ කාර්ය භාරයක් ඉටු කරන බව පෙනෙන අතරමැදියන් මත රඳා පැවතීම අඩු වනු ඇත. ගොවි සංවිධාන වැනි නිෂ්පාදක කණ්ඩායම් හරහා නිෂ්පාදකයන් දිස්ත්‍රික්කයෙන් පිටත වෙළඳ පොළවල් සමග සම්බන්ධ කළ යුතුය. පෞද්ගලික අංශයේ සමාගම් වැනි වඩා විශාල පරිමාණ ගනුදෙනුකරුවන්ට අඛණ්ඩ සැපයුමක් සහතික කිරීම සඳහා සාමූහික අලෙවි කිරීම දිරිගැන්විය යුතුය.

### *ජීවනෝපායන් විවිධාංගීකරණය කිරීමට සහාය සැපයීම*

රතු ලූනු, ලොකු ලූනු හා මිරිස්ද කෙසෙල්, පැපොල්, අඹ හා අන්නාසි වැනි පලතුරුද යනාදී වෙළඳ බෝග වගාවන් හඳුන්වා දීම ඉලක්ක ප්‍රජාවන් උදෙසා ද්විතීය/විකල්ප ජීවනෝපාය අවස්ථා ලෙස නිර්දේශ කළ හැකිය (වෙළඳ බෝග පිළිබඳ වැඩි දුර තොරතුරු සඳහා 4.1 කොටස බලන්න). ඉහත සාකච්ඡා කළ පරිදි වෙළඳ හා වෙනත් ක්ෂේත්‍ර බෝග, පශු සම්පත් පාලනය හා ගමේ වැවේ අභ්‍යන්තර ධීවර කර්මාන්තයඑකට සම්බන්ධ කළ ඒකාබද්ධ ගොවිතැන් ක්‍රමයක් සඳහා පවතින ඉඩකඩ සොයා බැලීම විවිධාංගීකරණය වීම සඳහා ප්‍රජාවන්ට උදව්වක් වනු ඇත. වී සමග සසඳන විට ජල සම්පාදනය අඩුවෙන් අවශ්‍ය කරන වෙනත් බෝග වර්ග මහ කන්නයේදී පසේ රැඳුණු තෙතමනය යොදාගනිමින් එකම කුඹුරු ඉඩමෙහි යල කන්නයේ දීමෙන්ම කන්න අතර කාලවලදීද වගා කළ හැකිය. විවිධත්වයෙන් යුතු ජීවනෝපාය ආයෝජනය නිසා වී වගාවේ අවාරයේදී හා කන්න අතර කාලවලදී නිෂ්පාදකයන්ට ඇති වන බලපෑම අඩු වී සහ වෙළඳ පොළ අවස්ථා හා වී සඳහා ඉහළ මිලක් ඉල්ලා කේවල් කිරීමේ හැකියාව වැඩි වී වෙළෙන්දා/එකතු කරන්නා සමග පවත්නා ණය බන්ධනයෙන් ඔවුන් නිදහස් වනු ඇත.

### *ක්ෂුද්‍ර ණය පහසුකම් සම්පාදනය කිරීම/ඒ සඳහා පහසුකම් සැපයීම*

නිෂ්පාදකයන් ග්‍රාමීය ක්ෂුද්‍ර ණය පහසුකම් සමග සම්බන්ධ කිරීමෙන් ඔවුන් නොවිධිමත් ණය පද්ධති මත රඳා පැවතීම අඩු වනු ඇත. මෙම මෑතදී නැවත පදිංචි වූ ප්‍රජාවන්ට ණය ලබා දීමට තිබෙන හැකියාව විධිමත් (සණස සංවර්ධන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, මහජන බැංකුව) හා නොවිධිමත් (සමෘද්ධි අධිකාරිය, සේවා ෆිනෑන්ස්, SEEDS, BRAC SL,අර්ථාචාර්ය[10]) යන දෙපාර්ශ්වයම විමසා සොයා බැලිය යුතු අතර, ණය දීමට අදාළ පූර්ව ලියකියවිලි ක්‍රියාවලි පිළිබඳව ප්‍රජා මට්ටමේදී දැනුවත්කම ඇති කළ යුතුය. ක්ෂුද්‍ර ණය/චක්‍රීය ණය යෝජනාක්‍රමවලට ප්‍රජාවන් තුළ සිටින ආබාධිතත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයන් හා ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ වැනි වැඩි ගොදුරු වීමේ ඉඩක් ඇති කණ්ඩායම් ඉලක්ක කරගත හැකිය. ඔවුන්ට එම මුදල් ආරම්භක ප්‍රාග්ධනයක් ලෙසද එසේ නැත්නම් නිෂ්පාදන උපකරණ මිලදී ගැනීම මෙන්ම සහල් කෙටීම හා සහල්පිටි පදනම් කරගත් නිෂ්පාදනය වැනි අගය එකතු කිරීමේ ක්‍රියාකාරකම් සඳහාද යොදා ගත හැකිය.

## *2. කිරි පට්ටි හා පශු සම්පත් උපඅංශය*

ගව, එළු හා කුකුළු පාලනය දිස්ත්‍රික්ක දෙක තුළ සත්ව පාලනයට අදාළව වඩාත්ම දැකිය හැකි අංගයන්ය. එළු හා කුකුළු පාලනය සිදු වන්නේ මස් සඳහා වන අතර, ගව පාලනය සිදු වන්නේ කිරි හා මස් යන දෙකම සඳහාය.

---

[10] මූලාශ්‍රයඃ ගෝමස්, 2009 ජූනි

කිරි පට්ටි කර්මාන්තය මෙසේ ශක්තිමත් කළ හැකියඃ අ) ගැළපෙන හොඳ ගුණාත්මක තත්වයේ දෙමුහුම් සතුන් හඳුන්වාදී පට්ටිවල ඵලදායිතාව වැඩි දියුණු කිරීම, තණ බිම් පුනරුත්ථාපනය කිරීම හා වැඩි දියුණු තෘණ වර්ග හඳුන්වා දීම, ආ) දෙපාර්තමේන්තු තුළ පවත්නා මානව සම්පත්වල ගුණාත්මකත්වය හා හැකියාව වැඩි කර කර්මාන්තවලට ලබා දෙන ආයතනික සහාය වැඩි කිරීම, මූල්‍ය සේවා පහසුකම් සම්පාදනය කිරීම සහ අදාළ ආයතන, ග්‍රාමීය බැංකු හා රාජ්‍ය නොවන සංවිධාන හරහා විධිමත් මූල්‍ය සේවාවන්ට පහසුකම් සැපයීම, ඇ) විදුලි බලය, ග්‍රාමීය මාර්ග වෙත ප්‍රවේශය වැඩි කර අගය එකතු කිරීමේ අවස්ථා සම්පාදනය කිරීම, පුහුණු මගින් තාක්ෂණය පැවරීමට පහසුකම් සැපයීම හා උපකරණ සැපයීම, ඈ) කිරි එකතු කිරීමේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා වඩා හොඳ තත්වයේ ග්‍රාමීය මාර්ග ඇති කිරීම මගින් අලෙවි කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම, දේශීය වෙළඳපොළ සමග සම්බන්ධතා ඇති කිරීම හා සමුපකාර කළමනාකරණ පද්ධති විධිමත් කිරීම.

### *අ) පට්ටිවල ඵලදායිතාව වැඩි දියුණු කිරීම*

### *ගැළපෙන හොඳ ගුණාත්මක තත්වයේ දෙමුහුම් සතුන් හඳුන්වා දීම*

පට්ටිවල කිරි අස්වැන්න වැඩි කිරීම සඳහා දේශීය දේශගුණික තත්වයන්ට ගැළපෙන නව සත්ව වර්ග හඳුන්වා දිය යුතුය. දෙමුහුම් සතුන්ට අර්ධ/සූක්ෂ්ම කළමනාකරණ පද්ධති අවශ්‍ය බැවින් මෙය අවශ්‍ය තාක්ෂණික සහාය යොදාගනිමින් මුල පුරන ක්‍රමික ක්‍රියාවලියක් විය යුතුය. නව වාතාවරණයකට දෙමුහුම් සතුන් හඳුන්වා දීමේ ප්‍රතිවිපාක සම්බන්ධයෙන් උගත් පාඩම් මීට අන්තර්ගත කළ යුතුය. (නව සත්ව වර්ග දේශීය සත්ව වර්ගද විනාශ වන ආකාරයේ නොහඳුනන අසාමාන්‍ය ලෙඩරෝග දරා සිටිය හැකිය.)

### *සත්වාහාරවල ගුණය හා ප්‍රමාණය වැඩි කිරීම*

තණ බිම් පුනරුත්ථාපනය කිරීමෙන් හා ඉහළ ඵලදායිතාවක් සහිත නව තෘණ වර්ග හඳුන්වා දීමෙන් සත්වාහාරවල ගුණය හා ප්‍රමාණය වැඩි කළ හැකිය. අවශ්‍ය තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හවුල් කර ගනිමින් මෙය කළ යුතුය. පළමු පියවර විය යුත්තේ ප්‍රජාවන්ට සමීපාසන්නයේ පිහිටි, යුද්ධයට පෙර/යුද්ධය අතරතුර යොදාගත් තෘණ භූමි හඳුනාගැනීමයි. මේ සඳහා අදාළ පළාත් පාලන ආයතනවලින් හා දිස්ත්‍රික්ක/ප්‍රාදේශීය පරිපාලන ආයතනවලින් උපදෙස් හා අනුමැතිය ලබාගැනීමටද සිදු වනු ඇත. ඉහළ අස්වැන්නක් ලබා දෙන CO3 වැනි වැඩි දියුණු තෘණ වර්ග දැනටමත් ශ්‍රී ලංකාවට හඳුන්වා දී ඇති අතර, තණ බිම්වල ඵලදායිතාව වැඩි කිරීම සඳහා එය අත්හදා බැලිය හැකිය.

### *ආ) කිරි පට්ටි කර්මාන්තය සඳහා ලබා දෙන ආයතනික සහාය වැඩි කිරීම*

ව්‍යාප්ති සේවාවන් සඳහා පවතින ඉල්ලුම සැපිරීම පිණිස දිස්ත්‍රික්කය තුළ සිටින පශු සම්පත් සංවර්ධන නිලධාරීන් හා පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව වැඩි කළ යුතුය. යටත්පිරිසෙයින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන ප්‍රදේශවලවත් මිනිස් බලය වැඩි කිරීම සඳහා සංවර්ධන මූල පිරිමි සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට සහාය දිය යුතුය. සංවර්ධන ව්‍යාපෘතිවල සේවය කිරීමට නිලධාරීන්ට දිරි දීම් සැපයීමෙන් හෝ තාවකාලිකව උපාධිධාරීන් හෝ ඩිප්ලෝමාධාරීන් බඳවාගෙන ඔවුන්ට අවශ්‍ය පුහුණු සැපයීම සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට සහාය දීමෙන් මෙය කළ හැකිය. මෙමගින් කරුණයන් සඳහා රැකියා අවස්ථා නිර්මාණය වීම මෙන්ම දිගු කාලයේදී ව්‍යාපෘතිය තිරසර වීමද සිදු වනු ඇත.

### *මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය සැපයීම*

සියලු උපඅංශවලට බලපාන පොදු ගැටලුවක් බැවින් මූල්‍ය සේවාවන්ට අදාළ නිර්දේශ මෙම කොටස ආරම්භයේදී සාකච්ඡා කෙරිණ.

### *ඇ) අගය එකතු කිරීමේ අවස්ථා සම්පාදනය කිරීම*

### *ග්‍රාමීය මාර්ග, විදුලි බලය වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම*

යටිතල පහසුකම් නමැති පුළුල්, පොදු තේමාව යටතේ මෙය ඉහතදී සාකච්ඡා කෙරිණ. කිරි පට්ටි

උපඅංශයේ අගය එකතු කිරීම වැඩිදියුණු කිරීම සඳහා විදුලි බලය වෙත ප්‍රවේශය වැදගත් වන බව සඳහන් කළයුතුය.

*අගය එකතු කිරීම සඳහා පුහුණු හා උපකරණ සැපයීම*

ව්‍යාපෘතිය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමග ප්‍රමාණවත් සබඳතාවක් පවත්වා ගන්නේ නම් කිරි පට්ටි ආශ්‍රිත අගය පිළිබඳව උනන්දුවක් දක්වන නිෂ්පාදකයන්ට අගය එකතු කිරීම සම්බන්ධ තාක්ෂණික පුහුණු ලබා ගැනීමට අවස්ථාව සැලසිය හැකිය. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ලබා ඇති අත්දැකීමෙන් උගෙන ඇති පාඩම් නම් පුහුණු හා උපකරණ සැපයීමේ දී ඉලක්ක කර ගත යුත්තේ රැස් කර ගත් දැනුම ක්‍රියාත්මක කිරීමට උනන්දුවක් දක්වන්නන් පමණක් බවයි. මුදවපු කිරි හා යෝගට් සෑදීම සඳහා සැපයිය යුත්තේ පහසුවෙන් නඩත්තු කළ හැකි සරල උපකරණ ය. සැපයෙන උපකරණ භාවිතය සම්බන්ධයෙන්ද නිෂ්පාදකයන්ට පුහුණුව ලබා දිය යුතුය. වඩා පුළුල් වෙළඳපොළවල් වෙත ළඟා වීමේදී ඇසිරීම හා ලේබල් කිරීම පිළිබඳ පුහුණුවද වැදගත් වේ.

*ඇ) අලෙවි කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම*

*කිරි එකතු කිරීමේ ජාලය වැඩිදියුණු කිරීම*

අතරමැදියන් සම්බන්ධ වීම වැළැක්වීම හා ගොවීන්ගේ කේවල් කිරීමේ බලය වැඩි කිරීම සඳහා ගොවි සංවිධාන මාර්ගයෙන් ප්‍රජා මට්ටමේ කිරි එකතු කිරීමේ ජාල දිරිගැන්විය යුතුය. ක්‍රියාකාරිත්වය සුමට හා වග වන තත්වයට පත් කිරීම සඳහා වාර්තා තබා ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුය. එක් ප්‍රජාවකට/ගම්මානයකට/ග්‍රාම නිලධාරි කොට්ඨාසයකට අයත් ගොවි සංවිධානවලට වාහනයක් හෝ පාපැදියක්, කිරි එකතු කරන බඳුන් හා තාවකාලික ගබඩා පහසුකම් ලබා දිය හැකිය. එවිට කිරි එකතු කිරීමේ ක්‍රියාවලියට පවත්නා බාධාවන් බොහෝ දුරට අඩු වනු ඇත. කිරි එකතු කිරීම ආශ්‍රිත ක්‍රියාකාරකම් මෙහෙයවීම ගොවි සංවිධානවලට අයත් වැටුප් ලබන, කැප වුණු කාර්ය මාණ්ඩලිකයන්ට පැවරිය යුතුය. කිරි එකතු කරන මිල්කෝ හෝ නෙස්ලේ වැනි වඩා විශාල සමාගම්වලට සාධාරණ මිලකට ඍජුවම ගොවි සංවිධානවලින් කිරි මිල දී ගත හැකිය. මෙමගින් කිරි අපතේ යාම අඩු වනු ඇති අතර, මේ මොහොතේ ක්‍රියාත්මක නොවන පරිචයක් වන හවස් වරුවේ කිරි එකතු කිරීමටද හැකියාව ලැබෙනු ඇත.

*සමුපකාර කළමනාකරණ පද්ධති විධිමත් කිරීම*

මේ නිර්දේශයේ අභිමතාර්ථය වන්නේ සමුපකාරයට කිරි අලෙවි කිරීමෙන් පසුව ගොවීන්ට ගෙවීම් කිරීමේ දී සිදු වන පමා වීම් වැළැක්වීම සහ අතරමැදියන් මත රඳා පැවතීම හා අඩු මිල ගණන්වලට කිරි අලෙවි කිරීම අවම කිරීමයි. එවැනි පද්ධති ප්‍රවර්ධනය කිරීම සඳහාත් පියවර ගැනීමට උනන්දු කිරීම සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වැනි අදාළ ආයතන හමුවේ මේ බාධාවන් ඉස්මතු කර දැක්වීම සඳහාත් මුල පිරීම් කළ යුතුය.

*ප්‍රජාව විසින් පාලනය කෙරෙන අලෙවිසල් පිහිටුවීම*

නැවුම් කිරි මෙන්ම ගොවීන්ගේ අගය එකතු කළ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට හා අලෙවි කිරීමටද මේ අලෙවිසල් ප්‍රයෝජනවත් වනු ඇත. අලෙවිසල් පිහිටුවිය යුත්තේ නිෂ්පාදනවලට ප්‍රමාණවත් ඉල්ලුමක් හා ජනප්‍රියත්වයක් ලැබෙන පරිදි නගරයට හෝ ප්‍රධාන මාර්ගයට වඩා සමීපවය. මේ අලෙවිසල් බාහිර මිල දී ගන්නන් හමු වන ස්ථානයක් බවට පත් කළ හැකිය. ව්‍යාපෘතිවලදී මේ අලෙවි සල් බාහිර වෙළඳපොළවල් සමග සම්බන්ධ කළ හැකි හා ව්‍යාපාර ස්ථාවර වන තෙක් ඒවාට අඛණ්ඩව සහාය සැපයිය හැකි ක්‍රම සොයා බැලිය යුතුය.

*3. ධීවර කර්මාන්ත උපඅංශය*

*අභ්‍යන්තර ධීවර කර්මාන්තය හා ජලජ රෝපණය*

ප්‍රධාන වශයෙන් මේ පැතිකඩවලදී අභ්‍යන්තර ධීවර කර්මාන්තය ශක්තිමත් කළ යුතුයː අ) ඇඟිල්ලන්ගේ ගුණය හා ප්‍රමාණය වැඩි කිරීමෙන්, ගොඳුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්වලට ධීවර උපකරණ සැපයීමෙන් හා ප්‍රදේශ අතර සම්බන්ධතාව හා වැව් පුනරුත්ථාපනය වැනි යටිතල පහසුකම්වලට සහාය සැපයීමෙන්

නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩි කිරීම, ආ) ප්‍රාදේශීය මට්ටමේදී මෙන්ම දිස්ත්‍රික්කයෙන් පිටතදීද අභ්‍යන්තර නැවුම් මාළු අස්වැන්න සඳහා, රෝපණ මසුන් හා අගය එකතු කළ මසුන් සඳහා වෙළඳ පොළ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම.

*අ) නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩි කිරීම*

*දිස්ත්‍රික්කට දෙකට ඇඟිල්ලන් සපයන පවත්නා බෝ කිරීමේ මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම*

ඉහළ වෙළඳපොළ ඉල්ලුමක් සහිත මිරිදිය මත්ස්‍ය වර්ග ලෙස නැවුම් මාළු වශයෙන් කාප් හා තිලාපියා ද අගය එකතු කිරීම (දුම් ගසා වියළීම) සඳහා දේශීය මත්ස්‍ය වර්ග වශයෙන් සුන්ගන් හා වයිරල් ද හඳුනා ගැනිණ. වර්තමානයේ, නැගෙනහිර පිහිටි වාරික හා බහුවාර්ෂික වැව් පිරී ඇත්තේ ඉඟිනියාගල හා දඹුල්ලේ අභිජනන මධ්‍යස්ථානවලින් ලබා ගත් ඇඟිල්ලන්ගෙනි. බෝ කිරීමේ මධ්‍යස්ථාන දෙකේ නිෂ්පාදනය වැඩි කිරීමට මූල්‍ය හා තාක්ෂණික සහාය සඳහා පහසුකම් සැපයීමෙන් ඇඟිල්ලන් හිඟය අවම වනු ඇත.

*ක්ෂුද්‍ර පරිමාණ බෝ කිරීමේ මධ්‍යස්ථාන හා ක්ෂුද්‍ර පරිමාණ තවාන් ඉදි කිරීමේ හැකියාව*

දිස්ත්‍රික්ක දෙක තුළ නිසි ලෙස තාක්ෂණය පවරා ඉඟිනියාගල හා දඹුල්ලේ අභිජනන මධ්‍යස්ථානවලින් පාලනය වන ක්ෂුද්‍ර බෝ කිරීමේ මධ්‍යස්ථාන ඉදි කිරීමට ඇති හැකියාව සොයා බැලිය යුතුය. වර්තමානයේදී ප්‍රජාවන් සතුව මසුන් බෝ කිරීමේ තාක්ෂණය නො පවතී. දිස්ත්‍රික්ක තුළ ප්‍රවාහන විධි මෙන්ම ක්ෂුද්‍ර බෝ කිරීමේ මධ්‍යස්ථානද වැඩිදියුණු වීමෙන් ඇඟිල්ලන්ගේ ඉහළ මරණ අනුපාතිකය අවම වනු ඇත. වර්තමානයේ අම්පාර රජවැව ප්‍රදේශයේ තිබෙන ආකාරයේ භූමිය පදනම් කර ගත් ක්ෂුද්‍ර බෝ කිරීමේ මධ්‍යස්ථානද යෝජනා කෙරෙන අතර, ක්ෂුද්‍ර බෝ කිරීමේ මධ්‍යස්ථාන හා ක්ෂුද්‍ර තවාන් පාලනය කිරීමට ධීවර සමිති ශක්තිමත් කළ හැකිය. වෙනත් ධීවර ප්‍රජාවන්ට ඇඟිල්ලන් අලෙවි කිරීමෙන්ද සමිතිවලට වැවෙන් ලැබෙන සිය ආදායම වැඩි කර ගත හැකිය.

*රෝපණ ධීවර කර්මාන්තය හඳුන්වා දීම/ප්‍රවර්ධනය කිරීම*

වැඩි මිලක් උපයා දෙන අපනයන වෙළඳපොළ ඉලක්ක කොට අතිමහත් කිවුල්දිය සම්පත් පදනම් කර ගෙන බෝ කළ මසුන් (බෙල්ලන්, සී බාස්, සී කියුකම්බර්, කකුළුවා හා කුනිස්සා) රෝපණය කිරීම කෙරෙහි රජය ප්‍රබල උනන්දුවක් දක්වයි. තාක්ෂණය පැවරීමට පහසුකම් සැපයීමේ විධික්‍රමයක් ලෙස සලකා රජය හා රාජ්‍ය නොවන සංවිධාන (ස්ත්‍රී ගෘහ මූලිකයන් සහිත කුටුම්බ හා ආබාධිතත්වයන් සමග දිවි ගෙවන පුද්ගලයන් ඇතුළු) ඉලක්ක ප්‍රජාවන් මෙම පරිශ්‍රමයන් සමග සම්බන්ධ කළ යුතුය. අධ්‍යයනය කළ ප්‍රජාවන් තුළ ප්‍රාග්ධනය නොමැතිකම පැහැදිලිව පෙනෙන බැවින් රෝපණ ධීවර කර්මාන්තය ආරම්භ කිරීම සඳහා සහායක් වශයෙන් මූල්‍ය සේවාවන් හඳුන්වා දිය යුතු අතර, වෙළඳපොළ සම්බන්ධතාද ඇති කළ යුතු වේ. ජාත්‍යන්තර මට්ටමේ තත්ව පාලන යන්ත්‍රණයන් හඳුන්වා දීමේ අභිමතාර්ථය ඇතිව අත්දැකීම්/අපනයන වෙළඳ පොළ සමග පැවතිය යුතු වෙළඳ පොළ සම්බන්ධතා සහිත පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකයන්/ආයතනයන් හඳුනා ගෙන රෝපණ ධීවර කර්මාන්තයෙහි ආයෝජනය කිරීමට දිරිගැන්විය යුතුය.

*ආ) අලෙවිකරණය වැඩිදියුණු කිරීම*

මෙම විශ්ලේෂණයේදී අභ්‍යන්තර ධීවර කර්මාන්තයට හා ජලජ රෝපණයට සම්බන්ධිතව හඳුනා ගත් ප්‍රධාන නිෂ්පාදන වන්නේ මිරිදියෙන් අල්ලාගත් මාළු, අගය එකතු කළ මාළු (දුම් ගසා වියළන ලද මාළු) හා රෝපණ මාළු ය. මේ අස්වනු අලෙවි කිරීම සඳහා ධීවර සමිති හරහා පහසුකම් සැපයිය යුතුය. අයිස්වලින් තොර මාළුවලට කැමැත්තක් දක්වන ප්‍රාදේශීය පාරිභෝගිකයන්ට මිරිදියෙන් අල්ලා ගත් මාළු විකිණිය හැකිය. මේවා විකිණීම සඳහා වෙළඳ මධ්‍යස්ථානවලට වඩා සමීප ස්ථානයක/ඒවාට ඒකාබද්ධ කොට සිල්ලර අලෙවිසල් ඉදි කළ යුතු වේ.

සකසන ලද මාළු සඳහා වෙළඳපොළ සම්බන්ධතා ඇති කිරීමට ප්‍රාදේශීය වෙළඳපොළවලදී මෙන්ම ප්‍රදේශය තුළ පවත්නා නාගරික වෙළඳපොළවල්, හෝටල් හා අවන් හල්සමග එක්වද පහසුකම් සැපයිය

යුතුය. හඳුනාගත් ඉහළ ඉල්ලුමක් සහිත දුම් ගසා වියළා මාළු සැකසීමේ විධික්‍රමය අභ්‍යන්තර ධීවර කර්මාන්තයේ නිරතව සිටින ඉලක්ක ප්‍රජාවන් අතර ප්‍රචලිත කළ යුතුය. වඩා හොඳින් ඇසිරීම, ලේබල් කිරීම හා සන්නාම යෙදීම මගින් අගය එකතු කිරීමේ ගුණාත්මකත්වය වැඩිදියුණු කිරීමට ඒ පිළිබඳ පුහුණු සැපයීම මගින් දිරිගැන්විය යුතුය. ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් අගය එකතු කිරීමේ ක්‍රියාවලියට ඇතුළත් කර ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ හැකිය.

රෝපණ මසුන් සඳහා ප්‍රාදේශීය වෙළඳපොළ තුළ මෙන්ම අපනයනය පිණිසද පවතින ඉහළ ඉල්ලුම ප්‍රයෝජනයට ගෙන පෞද්ගලික අංශය සම්බන්ධ කර ගැනීම හරහා ප්‍රාදේශීය වෙළඳ පොළවල් මෙන්ම අපනයන වෙළඳපොළ සමගද වෙළඳපොළ සම්බන්ධතා ඇති කළයු තුය.

### *යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්වලට ධීවර උපකරණ සැපයීම*

කුඩා වැව් පුනරුත්ථාපනයට ප්‍රමුඛතාව දිය යුතු අතර, නිෂ්පාදකයන් වෙළඳ පොළවල් සමග සම්බන්ධ කිරීම සඳහා මාර්ග හා පාලම්/බෝක්කු වැනි ප්‍රදේශ අතර සම්බන්ධතාවට අදාළ යටිතල පහසුකම් ගොඩ නැගිය යුතුය. ඉහත සාකච්ඡා කළ පරිදි වෙළඳපොළ යටිතල පහසුකම්ද ගොඩනැගිය යුතුය. ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්වලට ධීවර උපකරණ නොමැතිකමත් ඒවා සම්පාදනය කිරීමෙන් උපඅංශය තුළ ඔවුන්ගේ සහභාගිත්වය වැඩි වී ඔවුන්ට වැඩි ආදායමක් ලැබෙන බවත් විශ්ලේෂණය අවධාරණය කළේය.

### *4. සාගරික ධීවර කර්මාන්ත උපඅංශය*

ධීවරයන්ට වැඩි ප්‍රතිලාභ ජනනය කර දීමට මෙම පියවරයන් ක්‍රියාත්මක කළ හැකිය: අ) සුවිශේෂ ධීවර ආම්පන්න සම්පාදනය කිරීමෙන් ඵලදායිතාව වැඩි දියුණු කිරීම, ශෝධක මත්ස්‍යයන් හා මසුන් වඩා හොඳින් හැසිරවිය හැකි යන්ත්‍රණයන් පිළිබඳව පුහුණු සැපයීම, ගැඹුරු මුහුදු ධීවර යාත්‍රා හා ආම්පන්න මිලදී ගැනීම සඳහා ප්‍රාග්ධන සහාය සැපයීම, බෝට්ටු නිපදවීම හා අයිස් නිෂ්පාදනාගාර වැනි සහායක සේවාවන් හඳුන්වා දී ප්‍රවර්ධනය කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් උපයෝගි කරගැනීම සහ ණය පහසුකම් සැපයීම, ආ) සෘජු වෙළඳපොළ සම්බන්ධතා ඇති කිරීම ඇතුළු විධික්‍රම මගින් අලෙවිකරණය වැඩි දියුණු කිරීම සහ විකල්ප/ද්විතීය ආදායම් මූලාශ්‍ර හඳුන්වා දී සහය දීම.

### *අ) ඵලදායිතාව වැඩිදියුණු කිරීම*

### *වාරිකත්වයට ගැළපෙන සුවිශේෂ ධීවර ආම්පන්න සම්පාදනය කිරීම හා එක්දින යාත්‍රා පරිවර්තනය කිරීමට සහාය වීම*

වාරිකත්වය අනුවසුලබ වන මසුන් ඇල්ලීම සඳහා සුවිශේෂ ධීවර ආම්පන්න වර්ග පවතිනවිට ඉහළ ප්‍රතිලාභ ලැබේ. වෙරළබඩ උපඅංශය සමග සසඳන විට ධීවරයන්ට වඩා හොඳ සම්පත් පදනමක් වෙත ප්‍රවේශයක් ලබා දෙන බැවින් මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළේදී වැඩි මිලක් උපයාගන්නා ටූනා වැනි මත්ස්‍ය වර්ග වෙත ප්‍රවේශ වීමට ඔවුන්ට හැකියාව ලැබෙන බැවින් එක්දින යාත්‍රා බහුදින යාත්‍රා බවට පරිවර්තනය කිරීමට දෙන සහාය දිරිගැන්විය යුතුය. ගැඹුරු මුහුදු උපඅංශයෙහි ආයෝජනය කර ඉහළ ලාභ ලැබෙන ව්‍යාපාරික ආයෝජනයක් ලෙස සලකා එම උපඅංශයට පිවිසෙන ධීවරයන් සමග සම්බන්ධතා ඇති කර ගැනීමට මූල්‍ය ආයතන දිරිගැන්විය යුතුය. ගැඹුරු මුහුදු අංශයට මාරු වීමෙන් වෙරළබඩ උපඅංශයේ සම්පත් ක්ෂය වීම නිසා ඇති වන බාධාව අවම වනු ඇත.

### *අයිස් නිෂ්පාදනය හා බෝට්ටු නිපදවීම වැනි සහායක සේවාවන් හඳුන්වාදීම හා ප්‍රවර්ධනය කිරීම*

සාගරික ධීවර ක්‍රියාකාරකම්වල නිරත වීමට නොකැමති තරුණයන් හා ඵලදායිතාව අඩු වෙරළබඩ උපඅංශයෙහි නිරත ධීවරයන් මසුන් ඇල්ලීම ආශ්‍රිත සහායක සේවා දාමයට එක්වන ලෙස දිරිගැන්විය යුතුය. බෝට්ටු ඉදිකිරීම, බෝට්ටු පිරිසුදු කිරීම හා නඩත්තු කිරීම, මාළු දැල් නිෂ්පාදනය, අයිස් නිෂ්පාදනය වැනි සේවාවන් සහ ප්‍රවාහනය, ආහාරපාන හා බෝට්ටු එන්ජින් සඳහා යාන්ත්‍රික කොටස් සැපයීම වැනි කර්මාන්තයට අවශ්‍ය වෙනත් සේවාවන් අදාළ බලධාරී ආයතන මාර්ගයෙන් මූල්‍ය ප්‍රාග්ධනය සමග තාක්ෂණික පුහුණුවද සපයාගෙන ප්‍රවර්ධනය කළ යුතු වේ.

වැඩි ව්‍යවසායික හැකියාවක් සහිත ධීවර ප්‍රජාවන්/සමිති හෝ ආරම්භක ප්‍රාග්ධනය සහිත පුද්ගලයන් මාර්ගයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් තහවුරු කළ හැකිය. ඉන් අනතුරුව, වැඩියෙන් ගොදුරු වීමට ඉඩ ඇති ධීවරයන් එම ව්‍යවසායන්ට සම්බන්ධ කළ හැකිය. එමගින් ඔවුන්ට ඵලදායක නොවන එක්දින මසුන් ඇල්ලීමෙන් ලැබෙනවාට වඩා ස්ථාවර ආදායමක් ලැබෙනු ඇත. ප්‍රාදේශීයව සහායක සේවාවන් ප්‍රවර්ධනය කිරීමෙන්ද නැගෙනහිර පුළුල් වන ධීවර කර්මාන්ත අංශය දියුණුවට පත් වන්නේය. ධීවරයන් වෙරළබඩ උපඅංශයෙන් වෙනත් සේවාවන්ට මාරු වීම සම්පත් ක්ෂය වීමේ ගැටලුවට පමණක් නොව ධීවර කර්මාන්තයේ තිරසර භාවය සහතික කිරීම පිළිබඳ ගැටලුවටද විසඳුමක් වනු ඇත.

### *ධීවරයන්ගේ හා ධීවර සමිතිවල හැකියාවන් ගොඩනැගීම*

මාළු සඳහා පවතින වෙළඳපොළ පුළුල් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පශ්චාත් අස්වනු හානිය අවම කිරීම හා අපනයන ප්‍රමිතීන් කරා ළඟා වීම සඳහා ශෝධක මත්ස්‍යයන් හැසිරවීම පිළිබඳ පුහුණු සම්පාදනය කිරීම අත්‍යවශ්‍යය. ශ්‍රම බලකායේ හා උපඅංශයේ නිපුණතා පදනම හා ඵලදායිතාව වැඩිදියුණු කරන අනෙක් ක්ෂේත්‍ර වන්නේ මූල්‍ය කළමනාකරණය (විශේෂයෙන්ම අවාරයේදී මූල්‍යමය වශයෙන් සුරක්ෂිත වනු පිණිස නිෂ්පාදනය උපරිම මට්ටමෙහි පවත්නා කාලයේදී ඉතිරි කිරීම), ව්‍යාපාර සැලසුම්කරණය හා අලෙවිකරණයයි.

### *ආ) අලෙවිකරණය*

### *අවාරය සඳහා විකල්ප ජීවනෝපයන් හඳුන්වා දීම*

ඒ ඒ ප්‍රජාවන් ජීවත් වන ස්ථානය සැලකිල්ලට ගනිමින් වෙළඳ බෝග වගාවන් සහ ත්‍රිරෝද රථ/යතුරුපැදි අලුත්වැඩියාව/සර්විස් කිරීම හා තොරතුරු තාක්ෂණයට සම්බන්ධ 'කමියුනිකේෂන් සෙන්ටර්' වැනි කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම් හඳුන්වා දීම ප්‍රවර්ධනය කළ හැකිය. උදාහරණයක් ලෙස, කල්ලරාව වැනි ප්‍රධාන මාර්ගයට වඩා හොඳ ප්‍රවේශයක් සහිත ප්‍රජාවන්ට කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම් හඳුන්වා දිය හැකිය. විකල්ප/ද්විතීය ජීවනෝපාය අවස්ථා මගින් ධීවර ප්‍රජාවන්ට මසුන් ඇල්ලීමේ අවාරයේදී පසුබැසිය හැකි ආරක්ෂිත ස්ථානයක් සම්පාදනය වන අතර, ඔවුන් මාළු එකතු කරන්නාට/වෙළෙන්දාට ණය වීමේ චක්‍රයෙන් ඈත් වනු ඇත.

### *ඍජු වෙළඳපොළ සම්බන්ධතා*

දිස්ත්‍රික්කය තුළ හා ඉන් පිටත පවත්නා තොග වෙළඳපොළවල් සමග ඍජු වෙළඳපොළ සම්බන්ධතා ඇති කර ගැනීමට පහසුකම් සැපයීමෙන් එකතු කරන්නාගේ/තොග වෙළෙන්දාගේ ඒකාධිකාරය අවම කළ හැකිය. ඍජු අලෙවිකරණයේදී ඉහත සාකච්ඡා කළ පරිදි (ප්‍රවාහනය හා අයිස් නිෂ්පාදනාගාර වැනි) සහායක සේවාවන් වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍යවේ. ඉහළ වටිනාකමක් සහිත වෙනත් මත්ස්‍ය නිෂ්පාදන අලෙවි කිරීම සඳහා හෝටල් හා අවන්හල් වැනි පෞද්ගලික අංශය සම්බන්ධ කරගැනීමට උත්සාහ කළ හැකිය.

### *5. එළවළු හා පලතුරු බෝග උපඅංශය*

දිස්ත්‍රික්ක දෙකේ එළවළු හා පලතුරු බෝග වගාව අනෙක් දිස්ත්‍රික්ක සමග තරගකාරී තත්වයට පත් වීම සඳහා නම් නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩිදියුණු කිරීමත් ඒ සමගින් අගය එකතු කිරීමේ තාක්ෂණයන් හා සක්‍රිය වෙළඳපොළවල් හඳුන්වා දීමත් කළ යුතු වේ. දිස්ත්‍රික්ක දෙක තුළ අතිරික්ත වී නිෂ්පාදනයක් පවතින අතර, නිසි ලෙස ක්‍රියාත්මක වාරිමාර්ග පහසුකම් නොපවතින තත්වය තුළ අඩු තෙතමනයකින් වගා කළ හැකි හා ඉහළ අගය එකතු කිරීමක් හෝ අලෙවි කිරීමේ හැකියාවක් සහිත එළවළු හා පලතුරු වර්ග හඳුන්වා දීම ප්‍රබල ලෙස දිරිගැන්විය යුතුය.

### *අ) නිෂ්පාදනය හා ඵලදායිතාව වැඩිදියුණු කිරීම*

### *බීජ පැවතීම වැඩිදියුණු කිරීම*

අවශ්‍ය නම් තාක්ෂණය හා ප්‍රාග්ධනය පැවරීම් සිදු කර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන හැකියාව වැඩි කිරීමට සහාය වෙමින් කෙටි කාලයක් තුළ පරිණත වන ඉහළ අස්වැන්නක් සහිත දෙමුහුම්

බීජ වර්ග ගොවීන්ට ලබාගැනීම සඳහා පවතින තත්වය ඇති කළ යුතුය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ප්‍රජා මට්ටමේදී බීජ නිෂ්පාදනය හඳුන්වා දිය හැකිය. ගොවීන් පෞද්ගලික අංශයේ බීජ නිෂ්පාදකයන් සමග සම්බන්ධ කිරීමට තිබෙන අවස්ථාවන්ද සොයාබලා පහසුකම් සැපයිය යුතුය.

### *කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම*

එළවළු හා පලතුරු සඳහා අවශ්‍ය වන්නේ සාපේක්ෂව කුඩා ඉඩම් කැබලි වීමත් ගැටුම කාබනික පොහොර භාවිතයෙන් වගා කිරීම ඉහළින්ම ලාභදායක ක්‍රියාකාරකමක් බවට පත් කිරීම හේතුවෙන් මේ ප්‍රදේශවල පවත්නා කුඹුරු ඉඩම් යම් කලක් වගා කළ හැකිව තිබීමත් නිසා එවැනි අස්වනුවලට සුදුසු වෙළඳපොළක් ලැබිණ. කාබනික පොහොර භාවිතයෙන් ඉහළ ප්‍රතිලාභ අත් කර ගැනීමට තිබෙන හැකියාව ගැන ගොවීන් දැනුවත් කළ යුතු අතර, අවශ්‍ය ගුණාත්මකත්වයෙන් යුතුව කාබනික පොහොර සකස් කිරීම පිළිබඳව ඔවුන්ට පුහුණුව ලබා දිය යුතුය.

### *මිශ්‍ර/අන්තර් වගාව, බෝග විවිධාංගීකරණය හා කන්න අතර වගාව හඳුන්වාදීම*

මිශ්‍ර හෝ අන්තර් බෝග ලෙසද කෙටි කාලීන බෝගවල මිශ්‍රණයක් ලෙසද බහුවාර්ෂික බෝග ලෙසද පලතුරු හා එළවළු වගා කළ හැකි බැවින් එමගින් ගොවීන්ට කෙටි කාලීන හා දිගු කාලීන ආදායමක් උපයාගත හැකිය. බෝග විවිධාංගීකරණය නිසා අස්වනු ගොඩගැසෙන සමයේදී මිල කම්පනයන්ගෙන් ගොවීන් ආරක්ෂා වන අතර, පසේ පෝෂක කළමනාකරණයද වැඩි වනු ඇත. අන්තර් වාරික හෙවත් කන්න අතර එළවළු වගාව හඳුන්වා දුන්විට වී අස්වනු නෙළීමෙන් පසු පසේ උපරිම තෙතමනයක් රඳා පවතින අතර, ගොවියා වසර තුළදී බිම් ඒකකයකින් ලබන ප්‍රතිලාභය වැඩි වනු ඇත. මීට අමතරව, සාපේක්ෂව ජලය අඩුවෙන් අවශ්‍ය කරන අන්නාසි වැනි එළවළු හා පලතුරු ප්‍රවර්ධනය කිරීමටද උපදෙස් දෙනු ලැබේ.

### *ක්ෂුද්‍ර වාරිමාර්ග ක්‍රම ප්‍රවර්ධනය කිරීම*

බින්දු හා වතුර මල් ජල සම්පාදනය වැනි ක්ෂුද්‍ර වාරිමාර්ග ක්‍රම යොදාගැනීමේ වාසි පිළිබඳ දැනුවත්කම වැඩි කිරීමෙන් හා ඒ සඳහා ආරම්භක ප්‍රාග්ධනය සම්පාදනය කිරීමෙන් ඉඩමේ වගා හැකියාව වැඩිදියුණු වන අතර, ගොවීන්ට දිගුකාලීන ප්‍රතිලාභ ලැබේ. එමෙන්ම, මේ ප්‍රදේශවල වියළි කලාපීය ස්වභාවයක් පවත්නා තත්වය තුළ එමගින් ජල භාවිතයේ කාර්යක්ෂමතාවද වැඩි වනු ඇත.

### *ව්‍යාප්ති සේවාවන් වැඩිදියුණු කිරීම*

ව්‍යාප්ති නිලධාරීන් සංඛ්‍යාව හා ඔවුන් ආවරණය කරන ප්‍රදේශය වැඩි කිරීම, වඩා හොඳින් ක්‍රියාත්මක වීම සඳහා ප්‍රමාණවත් ලෙස සම්පත් සම්පාදනය කිරීම සහ ව්‍යාප්ති නිලධාරීන්ගේ හැකියාවන් ගොඩනැගීම මගින් ගොවීන්ට මෑතම තාක්ෂණික දැනුම පැවරීමට පහසුකම් සැපයෙනු ඇත. මෙම බෝගවලින් සමහරක් ගොවීන්ට තරමක් අලුත් විය හැකි නිසා වගාවේදී එල්ල විය හැකි අභියෝග ජය ගැනීමට ශක්තිමත් ව්‍යාප්ති සේවා අත්‍යවශ්‍ය වේ.

### *ආ) අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම*

### *ප්‍රජා මට්ටමේ දී එළවළු හා පලතුරු සැකසීමේ යන්ත්‍රසූත්‍ර සම්පාදනය කිරීම*

යොදා ගත හැකි අගය එකතු කිරීමේ ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත්කම වැඩි කිරීම හා පුහුණු සැපයීමත් එළවළු හා පලතුරු සඳහා අගය එකතු කළ හැකි නව විධික්‍රම හඳුන්වා දීමත් මගින් නිෂ්පාදකයන්ගේ ප්‍රතිලාභ වැඩි වනු ඇත. බඩ ඉරිඟු, සෝයා බෝංචි හා කව්පී සඳහා යොදාගන්නා බීජ වෙන් කිරීමේ යන්ත්‍රය සහ නැවුම් පලතුරු යුෂ හා පල්ප සෑදීමේ යන්ත්‍රය වැනි එළවළු සැකසීමේ යන්ත්‍රසූත්‍රද හඳුන්වා දිය හැකිය.

### *සාම්ප්‍රදායික සැකසීමේ ක්‍රම වැඩිදියුණු කිරීම*

සූදුරු, අච්චාරු හා කුළුබඩු (මිරිස්, කහ) කුඩුකිරීම වැනි සාම්ප්‍රදායික අගය එකතු කිරීමේ විධික්‍රම සඳහා ප්‍රාග්ධන සහාය සැපයීමෙන් හා වෙළඳපොළ සම්බන්ධතා පහසුකම් සැපයීමෙන් නිෂ්පාදකයා

වටිනාකම් දාමය දිගේ වඩා ඉහළට යැවෙනු ඇත. අසුරන ලද හොඳ ගුණාත්මක තත්වයේ නිෂ්පාදන ප්‍රාදේශීය වෙළඳපොළවල් මෙන්ම සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත ව්‍යාපාරික ව්‍යවසායන් ඉලක්ක කරගෙනද අලෙවි කළහැකිය.

### *6. කෘෂිකාර්මික නොවන උපඅංශය*

මැතදී නැවත පදිංචි වූ ප්‍රජාවන් තුළ කෘෂිකාර්මික නොවන අංශය පවතින්නේ අවම වශයෙනි. එහෙත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා බෙහෙවින් අවශ්‍ය කරන යටිතල පහසුකම්වලට සහාය සපයා ඒවා වැඩිදියුණු කිරීමට රජය දරින ප්‍රබල පරිශ්‍රමය සහ ප්‍රදේශය තුළ විශේෂයෙන්ම කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත තුළ ආයෝජනය කිරීමට සමහර විශාල පෞද්ගලික සමාගම් දක්වන උනන්දුව පෙන්නුම් කරන්නේ මෙම උපඅංශය හඳුන්වාදීමට/වැඩි දියුණු කිරීමට පවතින හැකියාවයි. කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්තවලට අදාළ නිර්දේශ ඒ ඒ උපඅංශ යටතේ සාකච්ඡා කර ඇති අතර, මෙම කොටස කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම්වලට අදාළ ව්‍යවසායන් සඳහා නිර්දේශ සම්පාදනය කරයි.

### *රජයේ සේවාවන් ශක්තිමත් කිරීම හා ව්‍යවසායන් ආරම්භ කිරීමට කැමති පුද්ගලයන්/කණ්ඩායම් උනන්දු කිරීම*

දිස්ත්‍රික්ක දෙක තුළ පවතින ව්‍යාපාරවලට හැකියාව ලබා දෙන වාතාවරණය ආයෝජන හා ව්‍යාපාර ඇරඹීම සඳහා වඩා හිතකර වීමට නම් එවැනි ව්‍යාපාරික ව්‍යවසායන් ප්‍රධාන වශයෙන් සම්බන්ධකම් ඇති කර ගන්නා ස්ථාන වන ප්‍රාදේශීය බලධාරී ආයතනවල දැනුම - ව්‍යාපාර ලියාපදිංචි කිරීම හා බදුකරණ ප්‍රතිපත්ති පිළිබඳ දැනුම සහ ආරාවුල් විශේෂයෙන්ම ඉඩම් ආරාවුල් නිරාකරණය පිළිබඳ දැනුම - ශක්තිමත් කළ යුතු අතර, අවශ්‍ය ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමේදී ඒවා දැනට වඩා පෙලඹීමකින් කටයුතු කළයුතුය. ව්‍යවසායන් ආරම්භ කිරීමට හා කළමනාකරණය කිරීමට උනන්දුවක් දක්වන පුද්ගලයන්ගේ හැකියාවන් ගොඩ නැගීමද මේ සමගම හා අඛණ්ඩව උපදෙස් සැපයීමේ ක්‍රියාවලියක් හරහා සිදු කළ යුතුය.

### *ප්‍රජාවන් තුළ දැනට පවත්නා කර්මාන්ත හා ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීම*

බටපතුරු පදනම් කරගත් නිෂ්පාදනය සහ මැටි හා සිමෙන්ති ගඩොල් සෑදීමද සහල් මෝල් හා මුදවපු කිරි සෑදීම වැනි කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්තද අවන් හල්, කඩසාප්පු, බාබර් සාප්පු හා බේකරි වැනි වෙනත් සුළු පරිමාණ ව්‍යවසායන්ද බඳු ප්‍රදේශ දෙක තුළ දැනටමත් පවත්නා ව්‍යවසායන් ව්‍යාපාර සැලසුම්කරණය, ව්‍යාපාර කළමනාකරණය හා පාරිභෝගික සේවා පිළිබඳ අවශ්‍ය දැනුම සැ පයීමෙන් හා ඒවායේ නිෂ්පාදනවල අලෙවි කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීමෙන් ශක්තිමත් කළ යුතුය.

### *නව ව්‍යවසායන් හඳුන්වා දීම*

සාර්ථකත්වය ඔප්පු කර ඇති හා ව්‍යාපෘතියෙන් ඉලක්ක කර ගැනෙන ප්‍රජාවන්ගෙන් පිටත පවතින අදාළ ප්‍රදේශ තුළ සාපේක්ෂ සේවාදායක පිරිසක් තහවුරු කරගෙන ඇති ව්‍යවසායන් ශක්තිමත් ප්‍රාග්ධනයක්ද තාක්ෂණික සහායද සහිතව නියමු පදනමක් මත ප්‍රජාවන්ට හඳුන්වා දිය යුතුය. අත් යන්ත්‍ර රෙදිපිළි, කුඩා ඇඟලුම් හා සපත්තු නිෂ්පාදන කම්හල් මෙන්ම ජංගම දුරකථන අලුත්වැඩියාව හා 'කමියුනිකේෂන් සෙන්ටර්' වැනි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත ව්‍යාපාර, ත්‍රිරෝද රථ/යතුරුපැදි අලුත්වැඩියාව, වඩු කර්මාන්තය හා පෙදරේරු වෘත්තිය වැනි ඉදිකිරීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් යනු මේ ව්‍යවසායන්ගෙන් සමහරකි.

### *ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කරමින් දිස්ත්‍රික්ක දෙක තුළ ක්‍රියාත්මක වෙනත් ව්‍යාපෘතිවලින් උගත් පාඩම් ඇතුළත් කරගැනීම*

යෝජිත නව ව්‍යවසායන් තවමත් යම් තාක් දුරකට අත්හදා බැලීමේ මට්ටමක පවතින බැවින් ප්‍රදේශය තුළ ක්‍රියාත්මක ව්‍යවසාය සංවර්ධනය ආශ්‍රිත මේ හා සමාන ව්‍යාපෘතිවලින් උගත් දෑ අධ්‍යයනය කළ යුතු යැයි දැඩිව නිර්දේශ කරනු ලැබේ. අධ්‍යයනය තුළදී හඳුනාගත් මේ ව්‍යාපෘතිවලින් සමහරක්

වන්නේ USAID-CORE ව්‍යාපෘති, නියුක්ලියස් ආයතනය විසින් ප්‍රවර්ධනය කෙරෙන ව්‍යවසායික කණ්ඩායම්[11] සහ බෙරෙන්ඩිනා ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය විසින් ක්‍රියාත්මක කෙරෙන තිරසර සංවර්ධනය හරහා ජීවිත නැවත ගොඩනැගීමේ ව්‍යාපෘතියයි.[12]

### සංචාරක කර්මාන්තය සමග සම්බන්ධ කිරීම

නැගෙනහිර පුළුල් වෙමින් පවත්නා සංචාරක කර්මාන්තය අගය එකතු කළ හා අගය එකතු නොකළ යන දෙයාකාරයේම ගොවි හා කෘෂිකාර්මික නොවන නිෂ්පාදන සඳහා වෙළඳපොළක් නිර්මාණය කරයි. එළවළු හා වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදකයන්, අභ්‍යන්තර ධීවර නිෂ්පාදකයන් හා පශු සම්පත් නිෂ්පාදකයන් ප්‍රදේශයෙහි සරු වෙමින් පවත්නා සංචාරක කර්මාන්තය සමග සම්බන්ධ කිරීමට තිබෙන හැකියාව දේශීය හා විදේශීය සංචාරකයන්ට ආහාර හා නවාතැන් සපයන සේවා සම්පාදකයන් මාර්ගයෙන් දිරිගැන්විය යුතුය. දේශීය හා විදේශීය සංචාරකයන් අතර සුදුසු වෙළඳපොළක් පැවතිය හැකි අස්වැන්නක් ලෙස සලකා මීපැණි හා දුම් ගසා වියළන ලද මාළු සඳහා තිබෙන අවස්ථාද සොයා බැලිය හැකිය.

## 5.4 ඉලක්ක ප්‍රජාවන්ගේ අනාගත ප්‍රවණතා හා වැදගත් ජීවනෝපාය ක්‍රියාකාරකම්

### ඇති විය හැකි අනාගත ප්‍රවණතා

ඉලක්ක ගම්මානවල පැවතිය හැකි ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ලෙස පහත සඳහන් ඒවා හඳුනා ගන්නා ලදී. මේ ක්‍රියාකාරකම්වල නිරත වීමට ඇති අවස්ථාවන් හා බාධාවන් උපඅංශ විශ්ලේෂණය කිරීමේදී සවිස්තරාත්මක ලෙස සාකච්ඡාවට ලක් විය.

- ඉහළ වටිනාකමක් සහිත සාම්ප්‍රදායික වී වගාව
- වෙළඳ බෝග වගාව (එළවළු හා පලතුරු) හා සැකසීම (නැවුම් පලතුරු පාන, සූදුරු, අච්චාරු)
- කිරි පදනම් කරගෙන අගය එකතු කිරීම (මුදවපු කිරි, යෝගට්)
- ගැඹුරු මුහුදු ධීවර කර්මාන්තය, රෝපණ ධීවර කර්මාන්තය (කූනිස්සා, සී බාස්, කකුළුවා), ධීවර අංශයට අදාළ සහායක සේවා (අයිස් නිෂ්පාදනාගාර, බෝට්ටු අලුත්වැඩියාව/නිෂ්පාදනය, මාළු ප්‍රවාහනය) හා අගය එකතුකිරීම (කරවල, ටින් මාළු)
- කෘෂිකාර්මික නොවන ජීවනෝපායයෝ (නඩත්තුව හා අලුත්වැඩියාව, තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් සේවා, සිල්ලර වෙළඳාම, ක්ෂුද්‍ර පරිමාණ ඇගලුම් කම්හල්)
- සංචාරක කර්මාන්තයට අදාළ සහායක සේවා (නවාතැන්, අවන් හල්, වික්‍රමාන්විත සංචාරක ව්‍යාපාරය)

## 5.5 නිගමනය

සිය හැකියාවන් වර්ධනය කර ගැනීමටත් නව නිෂ්පාදන ක්ෂේත්‍රවලට පිවිසීමටත් මෑතදී නැවත පදිංචි වූ ප්‍රජාවන්ට සැලකිය යුතු කාලයක් ගතවනු ඇත. එම නිසා, තමන් සතුව දැනට පවත්නා නිපුණතාවන් පදනම් කරගෙන ගොඩනැගීමට සුළු නිෂ්පාදකයන් දිරිගැන්විය යුතු යැයිද තමන් දැනට නිරතව සිටින ජීවනෝපායට අදාළ වටිනාකම් දාමයේ ඉහළට නැගගැනීමට ඔවුන්ට සහාය විය යුතු යැයිද නිර්දේශ කරනු ලැබේ. අධ්‍යයනය කළ ග්‍රාම නිලධාරි කොට්ඨාසවල ප්‍රධාන ජීවනෝපාය මාදිලීන් වූයේ කෘෂිකර්මය හා ධීවර කර්මාන්තයයි. සත්ව පාලනය, ගෙවතු වගාව හා ගඩොල් සෑදීම යනාදියෙන් අමතර ආදායමක් උපයා ගත හැකි විකල්ප මාර්ග සම්පාදනය විය. පවත්නා වාතාවරණය තුළ ඔවුන්ගේ ව්‍යාපාර සඳහා අගය එකතු කිරීමට මෙන්ම දිස්ත්‍රික්ක දෙක ඇතුළත සංචාරක ව්‍යාපාරය වර්ධනය වීම හරහා ඇති විය හැකි වෙනස්කම් ප්‍රයෝජනයට ගැනීමටද සැලකිය යුතු අවස්ථාවක් පවතී.

---

[11] වැඩි දුර තොරතුරු www.nucleus.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය, ප්‍රවේශ වීම 2010 අගෝස්තු

[12] වැඩි දුර තොරතුරු www.berendina.org වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය, ප්‍රවේශ වීම 2010 අගෝස්තු

## References

Arunatilake, N., Gunawardena, A., Marawila, D., Samaratunga, P., Senaratne, A., & Thibbotuwawa, M., 2008. *Analysis of the fisheries sector in Sri Lanka: guided case studies for value chain development in conflict-affected environments*. Washington D.C.: USAID. Online. Accessed August 2010, <http://www.ips.lk/research/fishery_sector_020708/research%20_highligt_fishery_sector.pdf >.

Asia Foundation, 2009. *Qualitative assessment of the local enabling environment for privateenterprise in the Eastern Province of Sri Lanka.* Colombo: The Asia Foundation. Online. Accessed October 2010, <http://asiafoundation.org/publications/pdf/624>.

DCS, 2004. *Annual report of the Sri Lanka labour force survey 2004.* Colombo: Department of Census and Statistics. Online. Accessed August 2012, <http://www.statistics.gov.lk/samplesurvey/annual%20report-20041.pdf>.

DCS, 2007a. *Basic population information for Batticaloa 2007: Preliminary report based on a special enumeration.* Colombo: Department of Census and Statistics. Online. Accessed June 2010, <http://www.statistics.gov.lk/PopHouSat/Preliminary%20Reports%20Special%20 Enumerat ion%202007/Basic%20Population%20Information%20of%20Batticaloa%20 District%2020 07.pdf>.

DCS, 2007b. Basic population information for Trincomalee 2007: Preliminary report based on a special enumeration. Colombo: Department of Census and Statistics. Online. Accessed June 2012, <http://www.statistics.gov.lk/PopHouSat/Preliminary%20Reports%20Special%20 Enumerat ion%202007/Basic%20Population%20Information%20on%20Trincomalee%20 District%20 2007.pdf>.

DCS, 2008. *Household income and expenditure survey – 2006/07.* Colombo: Department of Census and Statistics. Online. Accessed August 2010, <http://www.statistics.gov.lk/HIES/HIES2006_07Website/Publications/HIES200607Final%20ReportWeb%20.pdf>.

DCS, 2009. *Statistical abstract.* Colombo: Department of Census and Statistics. Online. Accessed May 2013, <www.statistics.gov.lk/abstract2010/Pages/chap5.htm>.

DCS, 2010. *Estimated paddy production and excess/scarcity of paddy by season and by district.* Colombo: Department of Census and Statistics. Online. Accessed May 2013, <http://www.statistics.gov.lk/agriculture/Paddy%20Statistics/PaddyStatsPages/MarketableSurplusofPaddy2010.html>.

DCS, 2011. *Household income and expenditure survey – 2009/10*. Poverty Indicators, [Colombo: Department of Census and Statistics, Ministry of Finance and Planning] Vol. 1(2). Online. Accessed May 2011<http://www.statistics.gov.lk/poverty/PovertyIndicators2009_10.pdf>.

DCS, 2012. *Sri Lanka Census of Population and Housing, 2012.* Colombo: Department of Census and Statistics. Online. Accessed August 2010 <http://www.statistics.gov.lk/PopHouSat/CPH2011/index.php?fileName=pop42&gp=Activities&tpl=3>.

De Silva, D., 2009. "Rural institutions" in Ratnayake, I & Fernando, P. (eds.), *Opportunities for the productive poor: perspectives on agriculture and rural livelihoods in Sri Lanka.*Colombo: Centre for Poverty Analysis. Chapter 6, pp. 177-211. Print.

Diprose, R., Abdul Cader, A., & Thalayasingam, P., 2010 (unpublished). *Conflict-sensitivity, development effectiveness, inequalities, and conflict in Sri Lanka: Understanding aid programming, voice and action in local conflict-affected environments.* Oxford: Centre for Research on Inequality, Human security and Ethnicity (CRISE), Oxford University and Colombo: Centre for Poverty Analysis (CEPA).

District Secretariat-Batticaloa, 2008. *Statistical information of Batticaloa District.*

District Secretariat-Trincomalee 2008. *Statistical information of Trincomalee District.*

Siriwardena, P. P. G. S. N., 2004. *"National Aquaculture Sector Overview – Sri Lanka" in National Aquaculture Sector Overview Fact Sheets.* Rome: Fisheries and Aquaculture Department, Food and Agriculture Organisation of the United Nations. Online. Accessed June 2013. http://www.fao.org/fishery/countrysector/naso_sri-lanka/en.

FAO, 2007.Fisheries institutional analysis and capacity assessment to the Ministry of Fisheries and Aquatic Resources of Sri Lanka. Rome: Food and Agriculture Organisation of the United Nations. Online. Accessed August 2009,
<http://www.fao.org/docrep/010/ai532e/ai532e00.htm>.

Gomez, A., 2009. *Microfinance Sector Assessment.* USAID-CORE. Online. Accessed May 2013,
<http://www.core.zunepile.com>.

GOSL, 2010. *Mahinda Chinthana: Visions for a new Sri Lanka* – A ten-year horizon development policy framework 2006-2016, Colombo: Department of National Planning,
Ministry of Finance and Planning. Online. Accessed June 2013,
<http://www.treasury.gov.lk/publications/mahindaChintanaVision-2010full-eng.pdf>.

Ibrahim, M. N. M., 2000. *Dairy cattle production.* Peradeniya: University of Peradeniya.. Print.

IDMC, 2012. Sri Lanka: *A hidden displacement crisis.* Colombo: Internal Displacement Monitoring Centre. Online. Accessed May 2011,
<http://www.internal-displacement.org/8025708F004BE3B1/(httpInfoFiles)/0F7746546306FCB3C1257AA8005845A6/$file/srilanka-overview-oct2012.pdf>.

MFAR, 2007. *Ten-year development policy: Framework of fisheries and aquatic resources sector 2007-2016.* Colombo: Ministry of Fisheries and Aquatic Resources. Online. Accessed May 2010,
<http://www.fisheries.gov.lk>.

MOE, 2010. *Sector vulnerability profile; Agriculture and fisheries - Second Draft.* Colombo: Ministry of Environment, p 60. Print.

Ranaweera, N F S., 2009. Sri Lanka: *Opportunities for dairy sector growth*. Rome: FAO. Online. Accessed July 2013. <http://www.fao.org/docrep/011/i0588e/i0588e08.htm>.

Rengasamy, S., n.d. *A students' guide to sub-sector/value chain analysis for livelihood intervention.* Online. Accessed June

2013<http://www.scribd.com/doc/21453168/Sub-sector-Value-Chain-Analysis-for-Livelihood-Intervention>.

RIU, n.d. *The value chain approach to poverty reduction and development of livelihoods.* Research Into Use. Online. Accessed May 2013, <http://www.researchintouse.com/nrk/RIUinfo/valuechain/valuechain.htm>.

Permanent Mission of Sri Lanka to the United Nations in New York, 2008. *Information gateway to Eastern revival development programme.* Media release, accessed July 2013, <http://www.slmission.com/media-releases/38-other-media-releases/52-information-gateway-to-eastern-revival-development-programme.html>.

Samaratunge, H., Sommers, P., & Varley, J.W., 2009. *Assessment of horticulture in Eastern, Uva and North Central provinces of Sri Lanka.* USAID-CORE. Online. Accessed August 2010, <pdf.usaid.gov/pdf_docs/PNADT118.pdf>.

Saperstein, A., & Campbell, R., 2007. *Accelerating the transition from conflict to sustainable growth Value chain development in conflict affected environments. Micro Report No 111.* Washington D.C.: USAID. Print.

Sarvananthan, M., 2003. *An Introduction to the conflict time economy of the North and East province of Sri Lanka,* Working Paper 1. Point Pedro: Point Pedro Institute of Development (PPID), working paper 1.

Twigg, J., 1998. *"Understanding vulnerability: An introduction" in Twigg, J.,& Bhatt, M. R., (eds.), Understanding vulnerability: South Asian perspectives.* London: Intermediate Technology Publications/DuryogNivaran , pp. 1-12. Print.

USAID-CORE sector assessments. Online. Accessed July 2013, <http://www.core.zunepile.com>.

Wijesinghe, A., 2009. *Private enterprise growth in the regions: What is slowing it down?,* Colombo: Institute of Policy Studies. Online. Accessed July 2013, http://www.ips.lk/talkingeconomics/2009/11/private-enterprise-growth-in-the-regions-what-is-slowing-it-down/.

## ඇමුණුම්

### 1 ඇමුණුම

**1 වගුව: ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ අධ්‍යයනය කළ ප්‍රජාවන් තුළ යටිතල පහසුකම් පැවැත්ම**

| ප්‍රා.ලේ./ග්‍රා.නි. කොට්ඨාස | ප්‍රදේශ අතර සම්බන්ධතාව | | විදුලි බලය | ජලය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | පානීය | | වගා | |
| | ප්‍රධාන මාර්ග යට ඇති දුර | පොදු ප්‍රවාහනයේ නිරන්තරතාව | ඔව්/ නැහැ | ඔව්/ නැහැ | මූලාශ්‍රය | ඔව්/ නැහැ | මූලාශ්‍රය |
| කුච්චවේලි, තිරියාය | කි.මී. 1 | දිනපතා පෞද්ගලික හා ලංගම බස් රථ 4-5ක් ක්‍රියාත්මක වේ | ඔව් | ඔව් | නළළිං | ඔව් | වැසි ජලය |
| කින්නියා, අයිලාඩි | කින්නියා-කන්තලේ ප්‍රධාන මාර්ගයට කි.මී. 5කි. වාන් ඇළ-කින්නියා මාර්ගය ගම හරහා වැටී ඇත | ලංගම බස්රථ නැතත් වාන් ඇළ-කින්නියා මාර්ග යේ එක් පෞද්ගලික බස් රථයක් ගමන් කරයි. දිනකට ගමන් වාර දෙකකි (උදේ හා හවස). එහෙත් නිතිපතා ක්‍රියාත්මක නොවේ | නැහැ | ඔව් | ළිං | ඔව් | කුඩා වැව |
| ගෝමරන්කඩවල, මිලාවැව | හොරොව්පතානට කි.මී. 45කි | දිනකට ගමන් වාර දෙකකි (හොරොව්පතානේ සිට බෙලිකඩ දක්වා) | නැහැ | ඔව් | ළිං | ඔව් | වැසි ජලය |

මූලාශ්‍රය: අවධාන කණ්ඩායම් සාකච්ඡා දත්ත

**2 වගුව: මඩකලපු දිස්ත්‍රික්කයේ අධ්‍යයනය කළ ප්‍රජාවන් තුළ යටිතල පහසුකම් පැවැත්ම**

| ප්‍රා.ලේ./ග්‍රා.නි. කොට්ඨාස | ප්‍රදේශ අතර සම්බන්ධතාව | | විදුලි බලය | ජලය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | පානීය | | වගා | |
| | ප්‍රධාන මාර්ගයට ඇති දුර | පොදු ප්‍රවාහනයේ නිරන්තරතාව | ඔව්/ නැහැ | ඔව්/ නැහැ | මූලාශ්‍රය | ඔව්/ නැහැ | මූලාශ්‍රය |
| වාකරේ, මදුරන්කර්නිකුලම් | කි.මී. 12 (වාකරේ-මඩකලපුව) | බස් රථ සේවාවක් නැත(වැසියන් ගමන් කරන්නේ පයින්, පාපැදියෙන්, යතුරුපැදියෙන් හා ත්‍රිරෝද රථයෙන් යනාදියෙනි) | නැහැ | ඔව් | නළළිං හා ළිං | ඔව් | කුඩා වැව හා වැසි ජලය |
| කිරන්, පූලක්කාඩු | කිරන් හන්දියට කි.මී. 12 | බස් රථ සේවාවක් නැත (වැසියන් ගමන් කරන්නේ පයින්, පාපැදියෙන් හා බෝට්ටුවෙන් යනාදියෙනි) | නැහැ | ඔව් | ළිං | ඔව් | කුඩා වැව හා වැසි ජලය |
| එරාවූර් පත්තු, පුල්ලුමලේ | අධ්‍යයනය කළ ගම්මානය පිහිටා තිබෙන්නේ වෙන්කලාඩි-මහඔය ප්‍රධාන මාර්ග යේ (බදුලු පාරේ) ය. | ප්‍රවාහනය පිළිබඳ ගැටලු නැත | නැහැ | නැහැ | පානීය ජලය සැපයෙන්නේ සොල්දාදුවන් විසින්, කිරි බහාලුම් මගින් හා ප්‍රාදේශය සභාව විසිනි | නැහැ | --- |
| වෙල්ලාවේලි, විලන්තෝට්ටම් | මී. 500 | ප්‍රවාහන සේවා ඇත (ලංගම හා පෞද්ගලික). එහෙත් නිතිපතා ක්‍රියාත්මක නොවේ | නැහැ | ඔව් | ළිං | ඔව් | කුඩා වැව හා වැසි ජලය |

මූලාශ්‍රය: අවධාන කණ්ඩායම් සාකච්ඡා දත්ත

3 වගුව: අධ්‍යයන නියැදිය තුළ සිටි ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් පිළිබඳ විස්තර

| ප්‍රදේශය | ස්ත්‍රී-පුරුෂ භාවය | ගොදුරු වීමට ඇති ඉඩෙහි ස්වභාවය | වැන්දඹු බවට, ආබාධිතත්වයට හේතුව | වයස | අධ්‍යාපන මට්ටම | සුභසාධන ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|---|
| කුන්ජන්කාට්කුලම් | ස්ත්‍රී | ආබාධිතත්වය | වල් අලියෙකු විසින් පහර දීම | 56 | පාසල් ගොස් නැත | සමෘද්ධි+ භූමිතෙල් මුද්දර |
| කුන්ජන්කාට්කුලම් | පුරුෂ | ආබාධිතත්වය හා වයස්ගත බව | ලෙඩරෝග | 65 | පාසල් ගොස් නැත | වන්දි හා වයස්ගත පුද්ගල සුභසාධන ගෙවීම |
| පිරම්බඩිතීවු | පුරුෂ | ආබාධිතත්වය | යුද හමුදාව | 52 | දත්ත නොමැත | ප්‍රතිලාභ නො ලැබේ |
| පිරම්බඩිතීවු | පුරුෂ | ආබාධිතත්වය | ෂෙල් ප්‍රහාරය | 40 | 4 ශ්‍රේණිය | සමෘද්ධි |
| විලන්තෝට්ටම් | පුරුෂ | වයස්ගත බව | අදාළ නොවේ | 78 | 2 ශ්‍රේණිය | සමෘද්ධි හා වන්දි |
| අයිලාඩි | පුරුෂ | ආබාධිතත්වය | කිඹුලෙකු විසින් පහරදීම | 68 | 4 ශ්‍රේණිය | සමෘද්ධි, සුනාමි සහන මගින් බෝට්ටුව හා දැල සහ රොටරි සමාජයෙන් ත්‍රෙසිකලය |
| විලන්තෝට්ටම් | ස්ත්‍රී | වයස්ගත බව | අදාළ නො වේ | 60 | පාසල් ගොස් නැත | සමෘද්ධි |
| කිරන් | ස්ත්‍රී | වැන්දඹු බව | සැමියා ස්වාභාවිකව මිය යාම | 34 | 2 ශ්‍රේණිය | සමෘද්ධි, රාජ්‍ය නොවන සංවිධානයක් විසින් ණයක් ලෙස ලබා දුන් රු.10,000/- |
| කල්ලරාව | ස්ත්‍රී | වැන්දඹු බව | සැමියා ස්වාභාවිකව මිය යාම | 59 | 6 ශ්‍රේණිය | රතු කුරුසයෙන් ලැබුණු නිවස, ZOA ලබා දුන් සූර්ය පනේලය |
| විලන්තෝට්ටම් | පුරුෂ | වයස්ගත බව | අදාළ නොවේ | 80 | 3 ශ්‍රේණිය | සමෘද්ධි, වයස්ගත පුද්ගල සුභසාධන ගෙවීම හා ග්‍රාම නිලධාරිවරයා පෞද්ගලිකව දුන් රු.10,000/- |
| අයිලාඩි | ස්ත්‍රී | වැන්දඹු බව | සැමියා පැහැර ගෙන යාමට ලක් වීම | 42 | පාසල් ගොස් නැත | සමෘද්ධි |

මූලාශ්‍රය: දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, 2010



2009 දී ගැටුම අවසන් වීමෙන් පසුව ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් වල ප්‍රජාවෝ සිය ජීවිත හා ජීවනෝපායන් යළි ගොඩනගා ගැනීම ආරම්භ කළහ. ඔවුන්ගෙන් බොහෝදෙනා උතුරු හා නැගෙනහිර පළාත්වල පිහිටි සිය නිවහන් කරා ආපසු යමින් සිටි අවතැනට ගොදුරු වූ ප්‍රජාවෝ වූහ. මෙම ප්‍රජාවන්ගේ ද විශේෂයෙන්ම ඒ අතර සිටින යුද්ධයෙන් විනාශයට පත් ප්‍රදේශවල යළි පදිංචි වෙමින් සිටින ප්‍රජාවන්ගේ ද ජීවනෝපාය අවශ්‍යතා අනෙක් ප්‍රදේශවල ජනයාගේ එම අවශ්‍යතා වලට වඩා වෙනස්ය. යළි පදිංචි වෙමින් සිටින මෙම ප්‍රජාවන්ට උපකාර කිරීම සඳහා තාක්ෂණික සහයෝගිතා හා සංවර්ධන ආයතනය (ACTED) විසින් කරන ලද මූල පිරීමක කොටසක් ලෙස ගැටුමෙන් පීඩාවට පත් මඩකලපුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල පැවතිය හැකි වාසිදායක ආර්ථික ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහා 2010 දී දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) සමග ගිවිසුමකට එළඹිණ. මෙම විශ්ලේෂණයේ අභිමතාර්ථය වූයේ මෙම ප්‍රදේශවල පවත්නා ජීවනෝපාය රටාවන් සහ වෙළඳපොළ අවස්ථාවන් හා සීමාවන් පිළිබඳව අවබෝධයක් සම්පාදනය කිරීමයි. මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස කාන්තා ගෘහ මූලික කුටුම්බ, වැඩිහිටියන් හා ආබාධිත තත්වයන් සමග දිවිගෙවන ජනයා වැනි වඩාත් ම ගොදුරුවීමට ඉඩ ඇති ජනයා ඉලක්ක කරගැනීමට තිබෙන හැකියාවද විශ්ලේෂණය කරන ලදී. මෙම අධ්‍යයනය තුළ විස්තර කෙරෙන සොයා ගැනීම් වලින් සහාය අවශ්‍ය කරන විවිධ ජීවනෝපාය ක්ෂේත්‍ර කවරේ දැයි ඉස්මතු කර දක්වයි. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල ගැටුමෙන් පීඩාවට පත් මෙම ප්‍රදේශවල හා වෙනත් ප්‍රදේශවල ජීවත්වන ප්‍රජාවන් උදෙසා ජීවනෝපාය සංවර්ධන මූල පිරීම් ප්‍රශස්ත ආකාරයෙන් සීරුමාරු කිරීමට හා වඩා සාර්ථකව ඉලක්කගත කිරීමට යොදා ගත හැකි ය.

The Asia Foundation

ThinkTank Initiative

Initiative Thinktank

cepa
centre for poverty analysis

Centre for Poverty Analysis
29 R G Senanayake Mawatha,
Colombo 7, Sri Lanka
Tel: +94(011) 4690200, 2676955
Fax: +94(011) 2676959
Email: info@cepa.lk
Web: www.cepa.lk

ISBN 978-955-1040-88-8